# වාර්ෂික වාර්තාව

# 2018

## ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය

# ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ වාර්ෂික වාර්තාව -2018


| පටුන | | පිටුව |
|---|---|---|
| දැක්ම හා මෙහෙවර | | i |
| ඓතිහාසික පසුබිම | | ii-vi |
| 2018 වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය | | vii |
| ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය | | viii-ix |
| 2018 වර්ෂය සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සමාලෝචනය | | x |
| අධ්‍යක්ෂ මණ්ඩල සංෂිප්ත සටහන | | xi |
| 2018 විගණන කමිටු වාර්තාව | | xii |
| ඉකුත් වසර 7 තුළ වත්කම් හා වගකීම් | | xiii |
| ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතේ ස්ථාපිත සමාගම් වල අධ්‍යක්ෂ මණ්ඩල -2018 | | xiv |
| **01 -කොටස** | **පාලන වාර්තාව** | |
| **පළමුවැනි පරිච්ඡේදය** | **ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පිහිටුවීම** | **(01-07)** |
| | ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සංයුතිය හා කර්තව්‍යයන් | 02-03 |
| | ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සාමාන්‍ය පරිපාලන ව්‍යුහය | 04 |
| | මූලස්ථාන මෙහෙයුම් අංශය | 05 |
| | සැලසුම් හා මෙහෙයුම් අංශය | 13-14 |
| | අභ්‍යන්තර විගණන අංශය | 14 |
| | මහවැලි කලාප වල ව්‍යුහය හා පරිපාලනය | 05-11 |
| **දෙවැනි පරිච්ඡේදය** | **තාක්ෂණ සේවා අංශය** | **(15-38)** |
| | කාර්යභාරයන් | 15 |
| | ව්‍යාපෘති සැලසුම්කරණය හා ක්‍රියාත්මක කිරීම | 15-18 |
| | ගංගා ද්‍රෝණි කළමනාකරණ කාර්යාලය | 19 |
| | මූලික වැඩ පාලන ක්‍රියාකරවුම් හා නඩත්තු අංශය | 21-24 |
| | ජල කළමනාකරණ ලේකම් කාර්යාලය | 25-28 |
| | ඉඩම් පරිහරණ සැලසුම් අංශය | 29-33 |
| | වන හා පරිසර සංරක්ෂණ අංශය | 34-38 |

| පටුන | | | පිටුව |
|---|---|---|---|
| **තුන්වැනි පරිච්ඡේදය** | **සංවර්ධන අංශය** | | **(39-62)** |
| | ඉඩම් අංශය | | 39-42 |
| | කෘෂිකර්ම සංවර්ධන අංශය | | 43-49 |
| | ධීවර හා පශු සම්පත් සංවර්ධන අංශය | | 50-53 |
| | ආයතන සංවර්ධන අංශය | | 55-56 |
| | ව්‍යාපාර සංවර්ධන අංශය | | 57-63 |
| **සිව්වැනි පරිච්ඡේදය** | **මානව සම්පත් හා මූල්‍ය කළමනාකරණ අංශය** | | **(63-74)** |
| | මානව සම්පත් කළමනාකරණ අංශය | | 64-67 |
| | නීති අංශය | | 67-68 |
| | මුදල් අංශය | | 69 |
| | මහවැලි ආරක්ෂක බලකාය | | 70-71 |
| | මහවැලි කේන්ද්‍රය | | 72-73 |
| | ප්‍රවාහන අංශය | | 74 |
| **පස්වැනි පරිච්ඡේදය** | i කොටස | ශ්‍රී ලං.ම.අ.යටතේ පිහිටුවනු ලැබූ සමාගම් | 75 |
| | ii කොටස | වාර්ෂික ගිණුම් | 76-86 |
| | iii කොටස | විගණකාධිපතිවරයාගේ වාර්තාව | 87-102 |
| | iv කොටස | විගණකාධිපති වාර්තාව පිළිබඳ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ කරුණු දැක්වීම | 103-120 |
| | vi කොටස | ශ්‍රී ලං.ම.අ. සමස්ථ කාර්ය වාර්තාව හා ආයෝජන සැලැස්ම -2018 | 121-137 |

# දැක්ම

තිරසාර කෘෂිකර්මය, පුනර්ජනනීය බලශක්තිය, පරිසර සංරක්ෂණය සහ මහවැලි බල ප්‍රදේශවල පදිංචි පුරවැසියන්ගේ ජීවන තත්ත්වය ඉහළ නංවනු වස් භූමිය සහ ජලය ප්‍රශස්ත අයුරින් භාවිතා කිරීම සඳහා වන ශ්‍රී ලංකාවේ විශිෂ්ටතම ආයතනය බවට පත්වීම.

# මෙහෙවර

මහවැලි ප්‍රජාව සහ ඔවුන්ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම සඳහා පුනර්ජනනීය බලශක්ති උත්පාදනය, හරිත පරිසරය සහ පරිසර හිතකාමී සංචාරක කර්මාන්තය දායක කර ගනිමින් නවීන තාක්ෂණය මත පදනම් වූ නවෝත්පාදක හා තිරසාර කෘෂිකාර්මික ඵලදායිතාවය උදෙසා භූමිය හා ජල සම්පත් ප්‍රශස්ත අයුරින් භාවිතා කිරීම සඳහා මෙහෙයවීම.

# ඓතිහාසික පසුබිම.

මහවැලි සංවර්ධන ව්‍යාපාරය ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කරනු ලැබ ඇති දැවැන්ත භෞතික හා මානව සම්පත් සංවර්ධන වැඩසටහනකි. මූලික වශයෙන් වියළි කලාපයේ ග්‍රාමීය සංවර්ධනය අරමුණු කරගත් මෙම ව්‍යාපෘතිය 1968 වර්ෂයේදී එවකට පැවති රජය විසින් UNDP/FAO සංවිධානය මගින් ලද තාක්ෂණික සහායන් මත සැලසුම් කරන ලදී. මධ්‍යම කඳුකරයේ පවතින ස්වාභාවික ජල සම්පත වියළි කලාපයේ කෘෂි කර්මාන්තයට හා ජනාවාස සංවර්ධනය සඳහා යොදා ගැනීමේ කාර්යයේදී මහවැලි සංවර්ධන ව්‍යාපාරය මගින් විශාල කාර්යභාරයක් සිදු කරන ලදී.

ශ්‍රී ලංකාවේ ජනගහන වර්ධනය තීව්‍ර වීමත් සමග පැන නැඟුනු අතුරු ප්‍රශ්නවලට විසඳුම් සෙවීමේදී නිෂ්පාදන වේගය වැඩි කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතු විය. 1969 දී ශ්‍රී ලංකාවේ ජනගහනය මිලියන 11.8 ක් විය. මෙය 1940 ජනගහනයේ මෙන් දෙගුණයක් වූ අතර වාර්ෂික ජනගහන වර්ධන වේගය 3.1% ක් විය. මෙලෙස ජනගහනය වැඩිවීම නිසා ආහාර සඳහා 1980 වන විට සහල් මෙ.ටො. මිලියන 1.8ක් අවශ්‍ය යැයි උපකල්පනය කරන්නට විය. නමුත් 1969 දී සහල් නිෂ්පාදනය වූයේ මෙ.ටො. මිලියන 0.7 ක් පමණි. එමෙන්ම කර්මාන්ත වර්ධනයට හා ගෘහස්ත පරිභෝජනයට විදුලිය ගිගා වොට් පැය 2000 ක් පමණ විය. නමුත් 1969 වන විට විදුලිය නිෂ්පාදනය වූයේ වසරකට ගිගා වොට් 470 ක් පමණි. ඉන් ගිගා වොට් පැය 388 ක් ජල විදුලිය වූ අතර ඉතිරිය ඛනිජ තෙල් දහනයෙන් ලද තාප විදුලිය වේ. තවද 1960-1967 කාල සීමාව තුල සහල් මෙ. ටො. 466,000 ක් වාර්ෂිකව ආනයනය වූ අතර ඒ සඳහා වසරකට රු. මි. 200 බැගින් විදේශයන්ට ගලා යන්නට විය. මේ හැර අතිරේක බෝග සඳහා ද රු. මි. 139 ක් වාර්ෂිකව වැය වී ඇත. එම වියදම ඉතා ඉහළ අගයක් විය.

ශ්‍රී ලංකාවේ තෙත් කලාපය තුළ ජනගහනය ඒකරාශිවීමක් දක්නට ලැබුණි. තෙත් කලාපය තුළ ජනඝනත්වය වර්ග කිලෝමීටරයට 465 වූ අතර වියළි කලාපය තුල වර්ග කිලොමීටරයට 80 ක් පමණ විය. දිවයිනේ මුළු භූමි ප්‍රමාණයෙන් 66% ක්ම වියළි කලාපයට අයත් වන අතර ජනගහනයෙන් 70% ක් තෙත් කලාපයේ ජීවත් විය. මේ අනුව වියළි කලාපයේ විශාල බිම් ප්‍රදේශයක් පුරාම ඉතා අඩු ජනගහන ව්‍යාප්තියක් දක්නට ලැබිණි. ඒ අනුව ලංකාවේ අනෙකුත් ගංඟා හා සසඳන කළ තෙත් කලාපයේ මධ්‍යම කඳුකරයෙන් ඇරඹී දිවයිනේ මුළු භූමි ප්‍රමාණයෙන් 6න් 1කට ලැබෙන වර්ෂා ජලය සිය ග්‍රහනයට ගෙන වියළි කලාපය මැදින් මුහුද වෙත ගලායන මහවැලි ගඟ වසරේ සෑම කාලයකදීම සුපෝෂිත ගංඟාවකි. මේ අනුව මහවැලි ගඟ වියළි කලාපයට හරවා එයින් ලැබෙන ජලයෙන් වියලි කලාපයේ කෘෂිකාර්මික සංවර්ධනයක් ඇති කිරීමත්, ඉහළ මහවැලි බල ප්‍රදේශ ආශ්‍රිතව විදුලි බලාගාර ඉදිකිරීමත් මගින් ශ්‍රී ලංකාවේ අනාගත අවශ්‍යතා සපුරා ගත හැකි බව ප්‍රත්‍යක්ෂ විය. මේ පිළිබඳ ඉදිරිපත් වූ අදහස්වල ප්‍රතිඵලයක් ලෙස රජය කළ ඉල්ලීමකට අනුව එක්සත් ජනපද මෙහෙයුම් දූත මණ්ඩලය වියලි කලාපය ආශ්‍රිත ඉඩම් සංවර්ධනය පිළිබඳව ශක්‍යතා අධ්‍යයනයක් 1956 දී ආරම්භ කර ඇත. ඒ සමගම ශ්‍රී ලංකාවේ වාරිමාර්ග හා මිනුම් දෙපාර්තමේන්තු යන ආයතනවල සහය ඇතිව කැනේඩියානු රජයේ තාක්ෂණික ආධාර මත කැනේඩියන් හන්ටින් සර්වේ කෝපරේෂන් ආයතනයද ශ්‍රී ලංකා රජයේ ඉල්ලීම පරිදි මහවැලි ගඟ පිළිබඳ අධ්‍යයනයක් සිදු කරන ලදී. මෙම ආයතන එම අධ්‍යයනය පිළිබඳ ස්වායීන වාර්තා දෙකක් 1961 දී ඉදිරිපත් කරන ලදී. මෙම වාර්තාව අනුමැතිය සඳහා 1962 දී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.

සමස්ත මහවැලි ද්‍රෝණියේම ජල සම්පත පිළිබඳව පූර්ණ අධ්‍යයනයක් සිදු නොකර මහවැලි ජලයෙන් කොටසක් හරවා යැවීම අයහපත් ප්‍රතිඵල ජනනය කරන බැවින් දේශීය විද්වතුන්ගේ අදහස් හේතුවෙන් පාර්ලිමේන්තුව මෙම යෝජනා අනුමත නොකරන ලදී. ඉන්පසු මහවැලි ගඟ ඇතුළු වෙනත් ගංගා ආශ්‍රිත ඉඩම් හා ජල සම්පත් පිළිබඳ සමස්ත අධ්‍යයනයක් කර සංවර්ධනය සඳහා ප්‍රමුඛත්වය ලබාදිය යුතු ව්‍යාපෘති තෝරා ස්වාධීන නිර්දේශ ඉදිරිපත් කරන ලෙස 1962 දී එක්සත් ජාතීන්ගේ සංවිධානය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කරන්නට විය. එහි ප්‍රතිඵලයක් ලෙස එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන විසින් එහි ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ විශේෂඥ පිරිසකගෙන් සමන්විත කණ්ඩායමක් ශ්‍රී ලංකාවට එවන ලදී. එයට අමතරව එම කණ්ඩායමට සහාය සඳහා ශ්‍රී ලංකාවේ විශේෂඥ පිරිසක් හා කාර්ය මණ්ඩලයක් ද පත් කරන ලදී.

සිව් වසරක දැඩි අධ්‍යයන පරිශ්‍රමයකින් පසුව 1968 දී වෙන් වෙන් වූ විශේෂ වාර්තා 14 කින් යුතු කාණ්ඩ තුනක අධ්‍යයන වාර්තාව ප්‍රකාශයට පත් කරන ලදී. මෙසේ ඉදිරිපත් කරන ලද මහවැලි සංවර්ධන සැලැස්ම 1968 වසරේදී පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලදී.

උතුරු මැද පළාත් සහ නැගෙනහිර පළාත් ආශ්‍රිත ප්‍රතිලාභ ලබන ප්‍රදේශය කලාප 13 ක් ලෙස නම් කරන ලද අතර එය ඉංග්‍රීසි A සිට M දක්වා නම් කෙරුණි. ආර්ථික වශයෙන් වඩාත් ඵලදායී හා අඩු ආයෝජනයක් මගින් වැඩි ප්‍රතිලාභ ලැබිය හැකි ව්‍යාපෘති පළමු වන පියවර යටතට ගන්නා ලදී.

## මහවැලි මහ සැලැස්ම

මහවැලි මහ සැලැස්ම ප්‍රධාන අරමුණ වූයේ මහවැලි ගඟේ ජල සම්පතෙන් ඝන මීටර් මිලියන 6900 ක් පමණ වූ ජල ප්‍රමාණයක් විදුලි බල නිෂ්පාදනයට හා වාරි කටයුතු සඳහා සැපයීමයි. දෙවන අරමුණ වූයේ ජලාශ 15 ක් ඉදිකර 11 ක් ප්‍රධාන වශයෙන් විදුලි බලය නිෂ්පාදනය සඳහා යෙදවීමයි.

එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මගින් ආහාර හා කෘෂිකර්ම සංවිධානය විසින් ඉදිරිපත් කරන ලද මහවැලි මහ සැලැස්ම අනුව මහවැලි ගංගා ද්‍රෝණියේ සහ වියළි කලාපය තුළ වූ තවත් ගංගා ද්‍රෝණි වල පිහිටි ඉඩම්, හෙක්ටයාර් 364,372 ක් සඳහා යල මහ දෙකන්නයටම වගා කිරීමට වාරි ජල පහසුකම් සලසා දීමට යෝජනා කර තිබුණි. මෙයින් හෙක්ටයාර 264,777ක් අළුතින් අස්වැද්දීමට යෝජිත වූ අතර හෙක්ටයාර 110,404 ක් ඒ වන විට වසරක එක් කන්නයක් පමණක් වගා කළ ඉඩම් විය. සැලසුම් කළ ජලාශ හා ඇල මාර්ගවල විභවයන් ප්‍රයෝජනයට ගැනීමෙන් ගිගා වොට් පැය 2037 ක වාර්ෂික ස්ථාවර විදුලිය ප්‍රමාණයක් ජනනය කළ හැකි බවද එයින් පෙන්වා දී තිබුණි. මහවැලි මහා සැලැස්ම අනුව එම සංවර්ධන කටයුතු වසර 30 ක් තුළ නිම කිරීමට යෝජනා විය. අරමුදල් යෙදවීමේ හා ක්‍රියාත්මක කිරීමේ පහසුව මෙන්ම විශේෂයෙන්ම සංවර්ධන ප්‍රතිලාභ වල අවශ්‍යතාවය යන කරුණු පිළිබඳ අවධානය යොමුකර සංවර්ධන කටයුතු පියවර තුනකට බෙදා තිබුණි.

### I ප්‍රථම පියවර

1969-1980 අතර කාලය තුළ ක්‍රියාත්මක කිරීමට යෝජනා විය. මේ තුළින් අළුත් ඉඩම් හෙක්ටයාර් 74,494 කට පැරණි ඉඩම් හෙක්ටයාර් 58,300 කට වාරි ජලය සැපයීමටත් ගිගාවොට් පැය 820 ක් වාර්ෂික ස්ථාවර විදුලිය බල ප්‍රමාණයක් ජනනය කිරීමට සැලසුම් කර තිබුණි. මෙම පියවරේ වැඩ කටයුතු ව්‍යාපෘති තුනක ට බෙදන ලදී. එනම්,

- පොල්ගොල්ල හැරවුම (1969-1973)
- වික්ටෝරියා / මිනිපේ හැරවුම (1973-1977)
- මොරගහකන්ද බහුකාර්යය ඒකකය

## II දෙවන පියවර

මේ යටතේ මාදුරුඔය ජලාශය, තල්දෙන බහුකාර්ය සංකීර්ණය හා කන්දකාඩු අමුණ යන මූලස්ථ වැඩ කොටස් යටතේ මහවැලි හා මාදුරු ඔය නිම්නයන්හි ඉඩම් හෙක්ටයාර 93,117 ක් වගා කිරීමට වාරි පහසුකම් ලැබෙන අතර මෙයින් ඉඩම් හෙක්ටයාර 8,502 ක් ඒ වන විටත් වගා කරමින් තිබූ ඉඩම් යැයි ගණන් බලා තිබේ. මෙගා වොට් 15 ක ස්ථාපිත ජවයක් සහිත ජල විදුලි බලාගාරයක් තල්දෙනදී ඉදිකිරීමටද මාදුරුඔය ජලාශය පෝෂණය කිරීමට උල්හිටිය රත්කිඳ ජලාශයේ සිට උමඟක් ඉදිකිරීමටද මාදුරුඔය ජලාශය ආශ්‍රිතව මෙගා වොට් 4.9 ක ස්ථාපිත ජවයක් ඇති කුඩා ජල විදුලි බලාගාරයක් ඉදිකිරීම මෙහි ප්‍රධාන කාර්යයන් විය.

## III තෙවන පියවර

මෙමගින් දිවයිනේ උතුරු මධ්‍යම පළාතේ අලුත් ඉඩම් හෙක්. 105,668 ක් සංවර්ධනය කෙරේ. ජල විදුලිය නිපදවීමේ අවසන් සැලසුම ක්‍රියාත්මක කොට මෙගා වොට් 293 ක ප්‍රමාණයක ස්ථාපිත ජවයක් ඇති විදුලි බලාගාර ඉදිකරන අතර එමගින් වාර්ෂිකව ගිගා වොට් පැය 1169 ක ස්ථාවර විදුලි ජනනයක් කරනු ඇත. පැරණි මිනිපේ වම් ඉවුර ඇල වැඩි දියුණු කිරීම, කිලෝමීටර් 164 ක් උතුරු මධ්‍යම ඇල ඉදිකිරීම, රොටලාවල, උමාඔය, රන්ටැඹේ. කොත්මලේ, කළුගඟ ආදී ජලාශ ඉදිකිරීම මෙම පියවරට ඇතුලත් විය.

නමුත් කාලීන අවශ්‍යතාවයන්ට ප්‍රමුඛතාවය දෙමින් මහවැලි මහ සැලැස්ම සංවර්ධන අදියර 3 කින් ක්‍රියාවට නැංවෙමින් පවතී.

## <u>මහවැලි මහ සැලැස්ම ක්‍රියාත්මක කිරීම (1 වන සංවර්ධන අදියර)</u>

මහවැලි මහ සැලැස්ම යටතේ ප්‍රථම ව්‍යාපෘතිය ලෙස පොල්ගොල්ල හා බෝවතැන්න ව්‍යාපාර 1970 දී ආරම්භ කරනු ලැබූ අතර, 1976 වන විට ඉදිකිරීම් කටයුතු අවසාන කිරීමට හැකි විය. මෙමගින්, පෙර පැවති ඉඩම් හෙක්ටයාර් 16,000 කට හා නව ඉඩම් හෙක්ටයාර 23,000 කට වාරි ජලය සැපයීමටද , මෙගා වොට් 40 ක ස්ථාපිත ධාරිතාවයකින් යුත් ජල විදුලිය නිපදවීමට ද හැකි විය. මේ ව්‍යාපාරය යටතේ මහවැලි එච් කලාපයට අයත් කලා වැව නිම්නයේ ගොවි පවුල් 23,000 ක් 1977 වන විට පදිංචි කරනු ලැබිණි. මේ වන විට මහවැලි ව්‍යාපාරය යටතේ එච් කලාපයේ සියලු ජනාවාස කටයුතු අවසන් කර ඇති අතර, එහි පදිංචි කරනු ලැබ ඇති මුළු පවුල් සංඛ්‍යාව 39,500 කි.

1977 වන විට ශ්‍රී ලංකා ආර්ථිකය ගැටලු රැසකට මුහුණ දී තිබිණි. සහල් ඇතුලු කෘෂි නිෂ්පාදන ආනයන වියදම ඉහළ යෑම ප්‍රධාන ගැටළුවක් විය. රට තුල සහල් අවශ්‍යතාවයෙන් නිපදවූයේ 69%ක් වූ අතර 31% ක් ආනයනය මත රඳා පැවතිනි. එයට අමතරව තවත් අත්‍යවශ්‍ය කෘෂි නිෂ්පාදන රැසක්ද ආනයන කරන ලදී.

විදුලි බල නිෂ්පාදනය 1977 වන විට විදුලිබල මණ්ඩලයේ විදුලි ධාරිතාවය මෙගා වොට් 408 ක ප්‍රමාණයක් රටේ විදුලිබල ඉල්ලුම සැපයීමට එය ප්‍රමාණවත් නොවුනි. විදුලි බිඳ වැටීම් සාමාන්‍ය දෙයක් වූ අතර එය වසරකට දින 70 ක විදුලිය විසන්ධිවීමක් දක්වා වර්ධනය වී තිබිණි.

ශ්‍රී ලංකාවේ විරැකියාව 17% දක්වා වර්ධනය විය. විරැකියාව පහළ දැමීම අත්‍යවශ්‍ය කරුණක් විය. මෙම ගැටලුවට කඩිනම් විසඳුම් ලබාදීම අත්‍යවශ්‍ය විය.

මෙම ගැටළු ඉක්මනින් විසඳීමේ පියවරක් ලෙස මහවැලි සංවර්ධන මහ සැලැස්ම කඩිනම් කල යුතු බවට 1977.10.12 දින එවකට පැවැති රජය තීරණය කරන ලදී.

## මහවැලි කඩිනම් වැඩසටහන (දෙවන සංවර්ධන අදියර)

මහවැලි මහ සැලැස්මට අයත් තෝරාගත් ව්‍යාපෘති කිහිපයක් එක විට අරඹා වසර 6 ක් වැනි කෙටි කාලයකදී නිම කිරීමට 1977 දී රජය තීරණය කළේය. එය ක්‍රියාත්මක කිරීම සඳහා වෙනම අමාත්‍යාංශයක් ද ආරම්භ කරනු ලැබීය. ඒ අනුව කොත්මලේ, වික්ටෝරියා, රන්දෙණිගල හා මාදුරු ඔය ජලාශ යෝජනා ක්‍රම අරඹා ක්‍රියාත්මක කිරීමට අවස්ථාව උදා විය. පසුව මෙයට රන්ටැඹේ ව්‍යාපාරය ද ඇතුළත් කෙරිණි. මෙයින් මාදුරුඔය හැර අනෙකුත් ජලාශ පාදක කොට ගෙන ජල විදුලිය උත්පාදනය කරනු ලබන අතර, එම ජලයම වාරි කර්මාන්තය සඳහා ද භාවිත කෙරේ. මේ අනුව මහවැලි සී හා බී කලාප සංවර්ධනය කොට ගොවි ජනයා පදිංචි කිරීමද මහවැලි කඩිනම් වැඩසටහනට අයත් විය. ඒ අනුව බී කලාපයේ පවුල් 30,465 ක් ද සී කලාපයේ පවුල් 45,488 ක් ද පදිංචි කර ඇත.

මෙම ව්‍යාපෘති සඳහා පිලිවෙලින් ස්වීඩනය, මහා බ්‍රිතාන්‍ය, ජර්මනිය, හා කැනඩාවත්, පහළ නිම්න සංවර්ධනය සඳහා ලෝක බැංකුව, EEC, ජපන් හා කුවෙට් යන රටවල් මූල්‍ය ආධාර සපයන ලදී. මෙම ව්‍යාපෘති දියත් කිරීම සඳහා 1979 දී ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය ස්ථාපනය කරන ලද අතර, ඉංජිනේරු හා නිර්මාණ කාර්යයන් සඳහා මහවැලි ඉංජිනේරු හා නිර්මාණ ඒජන්සියත් නැවත පදිංචි කිරීම සඳහා මහවැලි ආර්ථික ඒජන්සියත් ස්ථාපිත කරන ලදී. එමෙන්ම කඩිනම් මහවැලි සංවර්ධනය මගින් ඉදිවුණු විශාල ජලාශ පාලනය සඳහා මූලික වැඩ පාලන ක්‍රියාකරවුම් හා මෙහෙයුම් අංශය 1986 දී ස්ථාපිත කරන ලදී.

1990 වර්ෂය වන විට කඩිනම් මහවැලි සංවර්ධන ව්‍යාපෘති නිමවූ අතර එමගින් විදුලිබල ක්ෂේත්‍රය හා කෘෂිකර්මාන්තය නැංවීමට විශාල ආයෝජනයක් සිදුවිය. මේ නිසා තවදුරටත් කෘෂිකර්මාන්තය ආයෝජනය සිදු කිරීමට රජය මැලි වූ බැවින් මහවැලි මහ සැලසුමට අදාළ මොරගහකන්ද ජලාශ ව්‍යාපෘතිය යටපත් විය. කෙසේ නමුත් දීර්ඝ කාලයක් මුළුල්ලේ සැලසුම් වලට පමණක් සීමා වී තිබූ මෙම සංවර්ධන ව්‍යාපෘතිය වර්තමානය වන විට ක්‍රියාත්මක තත්වයට පැමිණ තිබීම මහවැලි සංවර්ධන ව්‍යාපාරයේ ප්‍රතිලාභ තවදුරටත් පුළුල් කිරීමට ඉවහල් වේ.

## මහවැලි ව්‍යාපාරයේ වර්තමාන කාර්යභාරය හා අනාගත සැලසුම් (තෙවන සංවර්ධන අදියර)

මහවැලි සංවර්ධන වැඩසටහන රටේ සිව් දෙස ව්‍යාප්තවීමේ අදියර ලෙස තෙවන සංවර්ධන අදියර හැඳින්විය හැකිය. මොරගහකන්ද කළුගඟ ජලාශ යෝජනා ක්‍රමය හරහා උතුර, උතුරු මැද, නැගෙනහිර, වයඹ, මධ්‍යම පළාත්වල කුඩා පරිමාණ වැව් 1200 කට ජලය සැපයීමේ අරමුණින් මොරගහකන්ද හා කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන ලදී. ඇලහැර ප්‍රදේශයේ කුඹුරුවලට, පොළොන්නරුව ප්‍රදේශයේ සියලු ජලාශ වලට හා ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ සියලු ප්‍රධාන ජලාශ වලට වර්ෂය පුරා අඛණ්ඩ ජල සැපයුමක් ලබා දී නව වගා ඉඩම් හෙක්. 81,000 සඳහා ජලය සම්පාදනය කරමින් කෘෂිකාර්මික දියුණුවක් ඇති කිරීම මගින් දෘය ස්වයංපෝෂිත කිරීමට දායකවීමත්, එහි විදුලි බලාගාරයේ විදුලි උත්පාදනය මගින් ජාතික විදුලි බල පද්ධතියට මෙ.වො. 25 ක ධාරිතාවක් එක් කරමින් ජාතික බලශක්ති අවශ්‍යතාවයට දායකවීමත් මෙහි මූලික අරමුණු අතර වේ. එමෙන්ම ව්‍යාපෘතිය හරහා අවතැන් වූ ජනතාවට අවශ්‍ය ජනාවාස ඉදිකර දීමෙන් නොනැවතී, සියලු යටිතල පහසුකම් සපිරි

ලග්ගල නගරය අලුතින්ම ඉදිකර ජනතා අයිතියට පත් කිරීමේ මහඟු මෙහෙවරද මේ වන විට සාර්ථකව නිම කර ඇත. මෙම ව්‍යාපෘතිය 2019 අගෝස්තු මස අවසන් වන විට ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත පවරා ගැනීමෙන් අනතුරුව ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ දැවැන්ත සංවර්ධන වැඩසටහන් අතරින් තවත් එක් පියවරක සාර්ථක නිමාවක් දකිනු ඇත.

මහවැලි සංවර්ධන අධිකාරිය තම කර්තව්‍ය තවදුරටත් පුළුල් කිරීමේ අරමුණින් උමාඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය ආරම්භ කරන ලදි. මේ මගින් උමාඔය ගංගා ද්‍රෝණියේ ජලය වැලිමඩ ප්‍රදේශයේ ඉදිකළ ජලාශය දෙකක එක්රැස් කර, දිවයිනේ ප්‍රථමවරට කි.මී. 15.6 ක උමං මාර්ගයක් ඔස්සේ කිරිදිඔය ද්‍රෝණියට හරවා යැවේ. එමගින් ආසියාවේ විශාලතම භූගත විදුලි බලාගාරය හරහා මෙ.වො. 120 ක ධාරිතාවක් ජාතික විදුලිබල පද්ධතියට එක් කරමින් ජාතික බලශක්ති අවශ්‍යතාවයට දායක වීමටත්, අතිදුෂ්කර ඌව පළාතේ කෘෂිකාර්මික ඵලදායිතාව ඉහළ නැංවීම හා ජනතාවගේ පානීය ජල අවශ්‍යතාවය සපුරාලීම යන තම මූලික අරමුණු කරා මෙම ව්‍යාපෘතිය සාර්ථකව ගමන් කරමින් සිටී. මෙම ව්‍යාපෘතිය 2019 අවසන් වන විට ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සක්‍රීය ජල කළමනාකරණ ව්‍යුහයට අන්තර්ගත වනු ඇත.

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ දැවැන්ත ජලාශ හා අනෙකුත් ජලාශ පිරිසිදු ව්‍යාපෘතියක් මෙන්ම ජල පෝෂක ප්‍රදේශ, ගංගා ද්‍රෝණි ආරක්ෂා කිරීමේ ව්‍යාපෘතියක් ද මේ වන විට ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ පරිසර හා වන සංරක්ෂණ අංශය මගින් ක්‍රියාත්මක වෙමින් පවතී.

සුනිත්‍ය බල ශක්ති වැඩසටහන යටතේ මහවැලි ජලාශවල පාවෙන සූර්ය බලශක්ති පද්ධති සවි කිරීම හා කුඩා පරිමාණ ජල විදුලි උත්පාදන ව්‍යාපෘති සංවර්ධනය කිරීම මගින් පරිසර හිතකාමී ලෙස ජාතික බලශක්ති අවශ්‍යතාවයට දායක වීමටත් ඒ මගින් විශාල ආදායම් උත්පාදනයක් සිදුකිරීම හරහා ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය නව උපායමාර්ගික අදායම් මාර්ග හඳුනා ගනිමින් සිටී.

මේ අතරම මාදුරු ඔය දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපෘතිය, වලව කලාපය, රඹකැන්ඔය, මහවැලි බී කලාපය, මහවැලි එච් කලාපය යන කලාප ආශ්‍රිතව තවත් දැවැන්ත සංවර්ධන ව්‍යාපෘති ආරම්භ කිරීම මගින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය තෙවන සංවර්ධන අදියරේ සියලු මූලික අරමුණු ඉටුකර ගැනීමේදී රටේ සිව් දෙස ව්‍යාප්ත වෙමින් ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා කෘෂිකාර්මික, වාරිමාර්ග හා පශු සම්පත්, බලශක්ති උත්පාදනය, පරිසර සංරක්ෂණය යන ක්ෂේත්‍ර වලින් උපරිම දායකත්වය ලබා දීමේ අදියර වෙත ක්‍රම ක්‍රමයෙන් ගමන් කරමින් සිටී.

**2018 වර්ෂය තුල අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය**

| අනු අංකය | නම / තනතුර | කාලය |
|---|---|---|
| 01 | එස්.එම්. ගෝඨාභය ජයරත්න මහතා<br>අධ්‍යක්ෂ ජනරාල්<br>ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය | 2018 ජනවාරි සිට<br>2018 මාර්තු දක්වා |
| 02 | ආර්.ඒ. ආර්. රූපසිංහ මහතා<br>අධ්‍යක්ෂ ජනරාල් (වැ.බ.)<br>ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය | 2018 මාර්තු |
| 03 | සරත් චන්ද්‍රසිරි විතාන මහතා<br>අධ්‍යක්ෂ ජනරාල්<br>ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය | 2018 මාර්තු සිට<br>2018 ඔක්තෝම්බර්<br>දක්වා |
| 04 | ආචාර්ය ඩී.එම්.එස්. දිසානායක මහතා<br>අධ්‍යක්ෂ ජනරාල්<br>ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය | 2018 ඔක්තෝම්බර්<br>සිට |
| 07 | එච්. හේමාල් කස්තුරිආරච්චි මහතා<br>අධ්‍යක්ෂ ජනරාල්<br>මුදල් අමාත්‍යංශය | 2018 මාර්තු සිට<br>2018 දෙසැම්බර්<br>දක්වා |
| 05 | ඉංජි. එස්. මෝහන රාජා මහතා<br>අධ්‍යක්ෂ ජනරාල්<br>වාරිමාර්ග දෙපාර්තමේන්තුව | 2018 ජනවාරි සිට<br>දෙසැම්බර් දක්වා |
| 09 | ඉංජි. සී. එච්. දේවේන්ද්‍රා මහත්මිය<br>අතිරේක ලේකම්<br>මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යංශය | 2018 ජනවාරි සිට<br>දෙසැම්බර් දක්වා |
| 06 | එම්.ඩී.ජේ.සී. මුරගේ මහතා<br>සහකාර අධ්‍යක්ෂ<br>මුදල් අමාත්‍යංශය | 2017 ජනවාරි සිට<br>2018 පෙබරවාරි<br>දක්වා |
| 10 | තිලක් බණ්ඩාර මහලේකම් මහතා - සාමාජික | 2018 ජනවාරි<br>දෙසැම්බර් දක්වා |

2018- ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය

| අ/අ | තනතුරු නාමය | නම |
|---|---|---|
| 01 | අධ්‍යක්ෂ ජනරාල් | ගෝඨාභය ජයරත්න මහතා<br>2018 ජනවාරි සිට 2018 මාර්තු දක්වා |
| | | ආර්.ඒ. ආර්. රූපසිංහ මහතා (වැ.බ.)<br>2018 මාර්තු |
| | | සරත් චන්ද්‍රසිරි විතාන මහතා<br>2018 මාර්තු සිට 2018 ඔක්තෝම්බර් දක්වා |
| | | ආචාර්ය ඩී.එම්.එස්. දිසානායක මහතා<br>2018 ඔක්තෝම්බර් සිට |
| 02 | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් | එම්.එච්.ජී. බණ්ඩාර මහතා - 2018 අගෝස්තු සිට |
| 03 | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා මුදල්) | කේ.සී.එස්. ප්‍රනාන්දු මහත්මිය - වැ.බ. |
| 04 | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (තාක්ෂණ සේවා) | ඉංජි. කේ.ජී. පෙරේරා මහතා |
| 05 | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන) | - |
| 06 | අධ්‍යක්ෂ (පිරිස් හා පාලන) | කේ.සී.එස්. ප්‍රනාන්දු මහත්මිය -<br>2018 ජනවාරි සිට මාර්තු දක්වා |
| | | එම්.එච්.ජී. බණ්ඩාර මහතා - වැ.බ.<br>2018 අගෝස්තු සිට |
| 07 | ව්‍යාපෘති අධ්‍යක්ෂ (වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම් ව්‍යාපෘතිය) | ඉංජි. ඩී.සී.එස්. ඇලකන්ද මයා |
| 08 | ව්‍යාපෘති අධ්‍යක්ෂ (මොරගහකන්ද කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය) | ඉංජි. ආර්.බී. තෙන්නකෝන් මයා |
| 09 | ව්‍යාපෘති අධ්‍යක්ෂ (මහවැලි ඒකාබද්ධ ව්‍යාපෘතිය) | ඉංජි. එම්.පී.එම්. පෙරේරා මයා |
| 10 | ව්‍යාපෘති අධ්‍යක්ෂ (උමා ඔය බහුකාර්ය සංවර්ධන ව්‍යාපෘතිය) | ආචාර්ය.ඉංජි. එන්.එස්.කේ.එන්. ද සිල්වා මහතා |
| 10 | අධ්‍යක්ෂ (මුදල්) | ටී.ඩී.ප්‍රියන්ත මයා |
| 11 | අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන) | කේ.ඒ.එම්.සී.එම්. පීරිස් මිය (වැ.බැ) |
| 12 | අධ්‍යක්ෂ (මහවැලි කේන්ද්‍රය) | අරුණ ප්‍රභාත් ලේකම්ගේ මයා<br>කොන්ත්‍රාත් පදනම මත |
| 13 | අධ්‍යක්ෂ (කෘෂිකර්ම) | ආර්.එම්. නෙවිල් රාජපක්ෂ මයා |
| 14 | අධ්‍යක්ෂ (ධීවර හා පශු සම්පත්) | ආර්.එම්. නෙවිල් රාජපක්ෂ මයා<br>රාජකාරි ආවරණය |
| 15 | අධ්‍යක්ෂ (ඉඩම්) | ඩී.ඒ.ඒ.යූ.ගුණසේකර මයා<br>2018 පෙබරවාරි දක්වා (ද්විතියික පදනම මත) |
| | | ඩබ්ලිව්.කේ.පී.සී. පෙරේරා මයා<br>2018 මාර්තු සිට 2018 අගෝස්තු දක්වා |
| 16 | අධ්‍යක්ෂ (ආයතන සංවර්ධන) | එම්.එල්.ඩී.සී. අබේවර්ධන මයා<br>රාජකාරි ආවරණය |
| 17 | අධ්‍යක්ෂ (ව්‍යාපාර සංවර්ධන) | ඩබ්ලිව්.කේ.පී.සී. පෙරේරා මයා |
| 18 | අධ්‍යක්ෂ (ඉංජිනේරු නිර්මාණ හා සැලසුම්) | ඉංජි. ටී.එම්. අතපත්තු මිය |
| 19 | අධ්‍යක්ෂ (පහළ නිම්න සංවර්ධන) | ඉංජි. පී.ජී. ගුණපාල මයා |
| 20 | අධ්‍යක්ෂ (මූලික වැඩ පාලන ක්‍රියාකරවුම් හා නඩත්තු) | ඉංජි.එස්.ආර්.කේ. අරුප්පොල මයා |

| අ/අ | තනතුරු නාමය | නම |
|---|---|---|
| 21 | අධ්‍යක්ෂ (ගංගා ද්‍රෝණි කළමනාකරණ) | ඉංජි. චන්ද්‍රා සෙනරත් මෙය |
| 22 | අධ්‍යක්ෂ (ඉඩම් පරිහරණ සැලසුම්) | ජේ.එම්.අයි.එච්. ජයවර්ධන මිය<br>රාජකාරි ආවරණය |
| 23 | අධ්‍යක්ෂ (වන හා පරිසර) | ඒ.එම්.කේ.බී. අත්තනායක මයා |
| 24 | අධ්‍යක්ෂ (ජල කළමනාකරණ ලේකම් කාර්යාලය) | ඉංජි. ජී.කේ.ටී. සමරතුංග මෙය |
| 25 | අධ්‍යක්ෂ (සැලසුම් හා නියාමන) | බී.එල්.බී. සේනාරත්න මයා<br>රාජකාරි ආවරණය |
| 26 | අධ්‍යක්ෂ (මූලස්ථාන මෙහෙයුම්) | ඩී.කේ.වී. විජයවීර මිය<br>2018 ජනවාරි සිට 2018 සැප්තැම්බර් දක්වා |
| 27 | අධ්‍යක්ෂ (ආරක්ෂක) | මේජර්. එල්.ඒ.පී. ජයවර්ධන මයා |
| 28 | අධ්‍යක්ෂ (නීති) | ආර්.එල්. රාජපක්ෂ මිය |
| 29 | අධ්‍යක්ෂ (පර්යේෂණ සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති) | ඩී.කේ.වී. විජයවීර මිය<br>2018 සැප්තැම්බර් සිට |
| 30 | නේවාසික ව්‍යාපාර කළමණාකාර ( බී කලාපය) | එස්.ටී. තුෂාර දන්තනාරායන මයා-වැ.බැ. |
| 31 | නේවාසික ව්‍යාපාර කළමණාකාර ( සී කලාපය) | කේ.ඒ.සී.විමල් කුමාර මයා - වැ.බැ. |
| 32 | නේවාසික ව්‍යාපාර කළමණාකාර ( ඩී කලාපය) | ජේ. ප්‍රසන්න ජයතිලක මයා<br>රාජකාරි ආවරණය |
| 33 | නේවාසික ව්‍යාපාර කළමණාකාර ( එල් කලාපය) | එච්.කේ.පී.ජයනාද මයා<br>2018 මාර්තු දක්වා |
| | | පී.ජී. නොයෙල් ජයසිරි මහතා<br>2018 මාර්තු සිට |
| 34 | නේවාසික ව්‍යාපාර කළමණාකාර ( ජී කලාපය) | ඒ.ජී.ටී. හේමන්ත ජයසිංහ මයා<br>රාජකාරි ආවරණය |
| 35 | නේවාසික ව්‍යාපාර කළමණාකාර ( එච් කලාපය) | අයි.එම්.යූ.කේ.කුමාර මයා<br>2018 ජූනි මස දක්වා වැ.බැ.<br>2018 ජූනි මස සිට ස්ථිර |
| 36 | නේවාසික ව්‍යාපාර කළමණාකාර ( වික්ටෝරියා කලාපය) | අයි.එම්.යූ.කේ.කුමාර මයා<br>2018 ජූනි මස දක්වා |
| | | ඒ.එම්.ඒ.පී.ජී. ගුණවර්ධන මයා<br>2018 ජූනි මස සිට |
| 37 | නේවාසික ව්‍යාපාර කළමණාකාර ( හුරුළුවැව කලාපය) | ඊ.එච්. ජයරත්න මයා - රාජකාරි ආවරණය |
| 38 | නේවාසික ව්‍යාපාර කළමණාකාර (රඹකැන්ඔය කලාපය) | ඒ.එම්.ඒ.පී.ජී. ගුණවර්ධන මහතා<br>2018 ජූනි දක්වා |
| | | එච්.එම්.විජේරත්න මහතා<br>2018 ජූනි සිට |
| 39 | නේවාසික ව්‍යාපාර කළමණාකාර ( වලව කලාපය) | ඒ.එල්. ඔස්මන් ද සිල්වා මහතා |

**2018 වසර සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සමාලෝචන සටහන.**

මහවැලි සංවර්ධන බහුකාර්ය සංවර්ධන වැඩ සටහන ක්‍රියාත්මක කිරීම සඳහා 1979 අංක 23 දරණ පනතින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය ස්ථාපිත කරන ලදී. දැනට ශ්‍රී ලංකාවේ 1/3 කට අධික භූමි ප්‍රදේශයක් පුරා ව්‍යාප්තව පවතින මහවැලි බල ප්‍රදේශ තුල වාසය කරන ජනගහනය දශ ලක්ෂයකට ආසන්නය. මහවැලි සංවර්ධන වැඩසටහනේ ආරම්භක අරමුණු අතර වියළි කලාපයේ කෘෂිකාර්මික, ධීවර, විදුලිබල, පශු සම්පත් යනාදි ක්ෂේත්‍රයන්හි නිෂ්පාදන ඵලදායිතාවය වැඩි කිරීම, ගංවතුර පාලනය, නව රැකී රක්ෂා ජනනය ඇතුළුව බත බුලතින් රට සශ්‍රීක කිරීම ආදිය විය.

දැනට මහවැලි ප්‍රදේශවල පවතින ඵලදායිතාව වැඩිකිරීම සඳහා කෘෂිකාර්මික, කෘෂි ව්‍යාපාරික, ජල පාලන, සත්ත්ව නිෂ්පාදන ක්‍රියාවලියන් සහ සුනිත්‍ය බලශක්ති නිෂ්පාදනය සඳහා ව්‍යවසායකයන් හඳුනාගෙන ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් අදාළ ආයතනවල මැදිහත්වීම ලබා ගැනීමට සැළසුම් කොට ඇත. මේ සම්බන්ධයෙන් විෂයභාර අමාත්‍යාංශ හා අනෙකුත් රාජ්‍ය දෙපාර්තමේන්තු හා එක්ව කටයුතු කිරීමට බලාපොරොත්තු වේ. දැනට මෙම ක්ෂේත්‍ර සම්බන්ධයෙන් කරගෙන යනු ලබන පර්යේෂණ කටයුතු වලින් සාර්ථක ප්‍රතිඵල ලබා ගෙන එයින් ඉදිරියේදී මහවැලි නිෂ්පාදන වල ඵලදායිතාවය වැඩි කර ගැනීමට ද බලාපොරොත්තු වේ. ඒ අනුව ක්‍රියාත්මක කරගෙන යනු ලබන ලිහිණියාගම, කොත්මලේ පටක රෝපණ ආයතනයේ කටයුතු වල සාර්ථක ප්‍රතිඵල ද මෙම මහවැලි කලාප වල කෘෂි ආදි ක්ෂේත්‍රවල ඵලදායිතාව වැඩි කර ගැනීමේ බලාපොරොත්තුවෙන් ක්‍රියාත්මක කෙරෙන පර්යේෂණ ව්‍යාපෘතීන් අතර වේ.තරුණ කණ්ඩායම් කෘෂිකර්මාන්තයට යොමු කිරීම සඳහා දිරි ගැන්වීමක් ලෙස ඉදිරියේදී කෘෂි ව්‍යාපාර සංවර්ධන ව්‍යාපෘති හා නව තාක්ෂණ ක්‍රමද හඳුන්වා දීමට කටයුතු කර ඇත.

දැනට මහවැලි ව්‍යාපාරය යටතේ රටේ විශාල වපසරියක් ආවරණය වන පරිදි පිහිටුවා ඇති වාරි පද්ධතිය මගින් රටේ විශාල ප්‍රදේශයක් සඳහා කෘෂි ජලය, පානීය ජලය මෙන්ම විදුලි උත්පාදනයටද විශාල දායකත්වයක් සපයනු ලැබේ. එහෙත් ඉදිරියේදී පවතින විශාල ජල ඉල්ලුම හමුවේ යම් යම් ජල හිඟතා ඇතිවන ප්‍රදේශවලට, විශේෂයෙන්ම තද වියළි කාලගුණ තත්ත්ව වලදී හිඟතාවයකින් තොරව ජල සැපයුමක් ලබා දීමේ අරමුණින් (කැළණි ගඟ) කෙහෙල්ගමු ඔය ඉහළ ජාලාධාර ප්‍රදේශයෙන් හරවා මහවැලි ගඟේ ජල ධාරිතාවය වැඩි කර උපරිම ඵල නෙලා ගැනීමට ඇති හැකියාව පිළිබඳ මූලික විමර්ශන කටයුතු දැනටමත් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ඉංජිනේරුවරුන් මගින් සිදුකෙරෙමින් පවතී. තවද මේ මගින් කොත්මලේ ජලාශයේ ජල ධාරිතාව ඉහළ නැංවීමටද අවශ්‍ය මූලික සැලසුම්/ පරීක්ෂණ කටයුතු අරඹා ඇත.

මේ වන විට දැවැන්ත ව්‍යාපෘතියක් ලෙස විශාල ජලාශ පිරිසිදු කිරීමේ ව්‍යාපෘතියක් හා ජල පෝෂක ප්‍රදේශ ගංගා ද්‍රෝණි ආරක්ෂා කිරීමේ ව්‍යාපෘතියක් ද පරිසර හා වන සංරක්ෂණ අංශය මගින් ක්‍රියාත්මක වෙමින් පවතී. මේ වන විට ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය බස්නාහිර පළාත හැර දිවයිනේ අනෙක් සෑම පළාතකම ව්‍යාප්ත වෙමින් දැවැන්ත වැඩසටහනක්ව ක්‍රියාත්මක වේ.

ඉහත කාර්යයන් සපුරා ගැනීම සඳහා අවශ්‍ය වන දර්ශනය, මඟ පෙන්වීම සහ උපදේශකත්වය සපයන මහවැලි, කෘෂිකර්ම, වාරිමාර්ග, ග්‍රාමීය සංවර්ධන හා අභ්‍යන්තර වෙළඳ, ආහාර සුරක්ෂිතතාව හා පාරිභෝගික සුබසාධන ගරු අමාත්‍යතුමන් වන ගරු චමල් රාජපක්ෂ මැතිතුමාගෙන් ලැබෙන ධෛර්යය ඉතා අගය කොට සලකමි. එමෙන්ම ගරු මහවැලි සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා, අමාත්‍යාංශ ලේකම්තුමාගේ මෙන්ම රාජ්‍ය ලේකම්තුමාගේ ද මෙහෙයවීම මත ඉහත ඉලක්ක සාර්ථකව ජය ගැනීම සඳහා කටයුතු කරන සමස්ථ ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ කාර්ය මණ්ඩලය හා සමස්ථ ව්‍යාපෘති කාර්ය මණ්ඩලය වෙත ප්‍රණාමය පිරිනැමීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

ඉංජි. බී.ඒ.එස්.එස්. පෙරේරා
අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය

**අධ්‍යක්ෂ මණ්ඩල සංෂිප්ත සටහන.**

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව 2018-12-31 දිනට සංවිධානයේ විගණනය කරනු ලැබූ මූල්‍ය ප්‍රකාශන සමඟ කාරුණිකව ඉදිරිපත් කරමු.

**වර්ෂය පිළිබඳ සමාලෝචනය.**
**අධ්‍යක්ෂ ජනරාල් විසින් ඉදිරිපත් කර ඇති සමාලෝචනයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ සිදුකරන ලද සංවිධානයේ මෙහෙයුම් පිළිබඳ සවිස්තර ප්‍රකාශයක් අන්තර්ගත කර ඇත.**

**එසේම සංවිධානයේ වත්කම්, සුරකීම්, වංචා, දූෂණ හා වෙනත් අක්‍රමිකතා සොයා බැලීම සහ අවදානම් අවම කිරීමේ අරමුණින් අභ්‍යන්තර පාලනය පිළිබඳ මනා කළමනාකාරීත්වයකින් කටයුතු කර ඇත.**

**තවද, ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සියළුම කාර්ය මණ්ලය විසින් ඔවුන් වෙත පැවරී ඇති කාර්යයන් ඉටු කිරීමේදී දක්වා ඇති ඉමහත් කැපවීම පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල සමාජිකයන් වශයෙන් අපගේ ප්‍රශංසාව මෙයින් පල කරමු.**

එච්. හේමාල් කස්තුරිආරච්චි මහතා
අධ්‍යක්ෂ ජනරාල්
මුදල් අමාත්‍යාංශය

ඉංජි. එස්. මෝහනරාජා මහතා
අධ්‍යක්ෂ ජනරාල්
වාරිමාර්ග දෙපාර්තමේන්තුව

එම්. ඩී. ජේ. සී. මුරගේ මහතා - සාමාජික
සහකාර අධ්‍යක්ෂ
වෙළඳ සහ ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

C. H. D.
ඉංජි. සී.එච්. දේවේන්ද්‍රා මහත්මිය - සාමාජික
ලේකම්
මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය

තිලක් බණ්ඩාර මහලේකම් මහතා - සාමාජික

# 2018 විගණන කමිටු වාර්තාව

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ විගණන කමිටුව අධ්‍යක්‍ෂ මණ්ඩලයේ විධායක නොවන අධ්‍යක්‍ෂවරු තිදෙනෙකුගෙන් සමන්විත වන අතර, එහි සභාපතිත්වය මහා භාණ්ඩාගාරය නියෝජනය කරන නිලධාරියෙකු විසින් දරනු ලබයි.

**වර්ෂය තුළ විගණන කමිටු සාමාජිකත්වය:**

- හේමාල් කස්තුරිආරච්චි මහතා - කමිටු සභාපති - භාණ්ඩාගාර නියෝජිත
- තිලක් බණ්ඩාර මහලේකම් මහතා - සාමාජික
- ඉංජි. සී. එම්. දේවේන්ද්‍රා මිය - සාමාජික

**කමිටුව සඳහා සහභාගිත්වය:**

- අධ්‍යක්‍ෂ (මුදල්)
- අධ්‍යක්‍ෂ (අභ්‍යන්තර විගණන)
- විගණකාධිපති නියෝජනය කරමින් රජයේ විගණන අධිකාරි
- අවශ්‍යතාවය අනුව කැඳවුම් ලබන අනෙකුත් අදාල නිලධාරීන්

**කමිටුවේ කාර්යභාරය:**

❖ අභ්‍යන්තර පාලන ක්‍රම සමාලෝචනය හා අවශ්‍ය අවස්ථාවන්හිදී ප්‍රතිසංවිධානය සඳහා උපදෙස් ලබාදීම හා වාර්ෂික විගණන සැලසුම කෙරෙහි අවධානය යොමු කිරීම.

❖ විගණකාධිපති වාර්තා හා අභ්‍යන්තර විගණන වාර්තා පිළිබඳ අවධානය යොමු කර විගණන විමසුම් ආශ්‍රයෙන් අධිකාරියේ පවතින ගැටළු හඳුනාගැනීම හා ගැටළු විසඳීමට අවශ්‍ය උපදෙස් ලබාදීම.

❖ 1971 අංක 38 දරණ මුදල් පනතේ 142(ඇ) අනු වගන්තිය ප්‍රකාරව විගණකාධිපතිවරයා විසින් මතු කර ඇති කරුණු පිළිබඳව විශේෂ අවධානය යොමුකර අධිකාරියේ අභ්‍යන්තර පාලන කටයුතු විධිමත් කිරීමට උපදෙස් ලබාදීම.

❖ ආයතනික කාර්ය සාධන වාර්තා කාර්තුමය වශයෙන් සමාලෝචනය.

**අභ්‍යන්තර විගණන අංශය:**

මහවැලි අධිකාරියේ ඵලදායි කාර්යසාධනය තහවුරු කිරීම සඳහා මූල්‍ය විගණනය, පද්ධති විශ්ලේෂණය හා කාර්යසාධන විශ්ලේෂණය හා විශේෂ විමර්ශන සිදු කිරීම අරමුණු කර ගනිමින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ පිහිටුවා ඇති අභ්‍යන්තර විගණන අංශය 2018 වර්ෂය තුල විගණන කමිටු උපදෙස් පරිදි අභ්‍යන්තර විගණන සැලැස්මක් ඔස්සේ අධිකාරියේ අභ්‍යන්තර විගණන කටයුතු ක්‍රියාත්මක කළ අතර අකාර්යක්‍ෂම ක්‍රියාපිළිවෙත් පිටුදකිමින්, අභ්‍යන්තර පාලනය වැඩි දියුණු කරමින්, වංචා දූෂණ සිදුවිය හැකි අවස්ථා අවම කරමින් කටයුතු කිරීම සඳහා මෙම අංශය තුලින් පද්ධති විගණන ක්‍රමවේදයක් ක්‍රියාවට නැංවීමට කටයුතු කර ඇත.

**2018 වර්ෂය තුළ අත්කරගත් ප්‍රගතිය**

- අභ්‍යන්තර විගණන සැලැස්ම යටතේ වර්ෂය තුළ විගණන වාර්තා 17 ක් නිකුත් කිරීම.
- විමර්ශන 18 ක් පවත්වා විමර්ශන වාර්තා ලබා දීම.
- විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 03 ක් පැවැත්වීම.
- විගණන විමසුම් සඳහා ලබාදුන් පිළිතුරු පසුවිපරම් කර නිර්දේශ ක්‍රියාත්මක කිරීමට උපදෙස් ලබාදීම.

**නිර්දේශය:**

ඉහත කරුණු වලදී හඳුනාගත් ගැටළු නිවැරදි කිරීමට උපදෙස් දෙමින් කමිටුව විසින් සැපයූ නිර්දේශ මත කළමනාකාරීත්වය විසින් ආයතනයේ අවශ්‍ය නිවැරදි කිරීම් සිදු කිරීමට පියවර ගෙන ඇත.

# ඉකුත් වසර 07 ක වත්කම් හා වගකීම්

| | 2018 | 2017 | 2016 | 2015 | 2014 | 2013 | 2012 |
|---|---|---|---|---|---|---|---|
| | රු 000 | රු 000 | රු 000 | රු 000 | රු 000 | රු 000 | රු 000 |
| **වත්කම්** | | | | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | | | | |
| දේපල යන්ත්‍රෝපකරණ හා උපකරණ | 4,675,657 | 4,116,187 | 4,195,724 | 4,294,893 | 4,259,208 | 4,549,301 | 3,733,498 |
| නොනිමි වැඩ | 84,947 | 78,552 | 41,301 | 74,286 | 62,506 | 48,362 | 12,821 |
| ආයෝජන | 171,313 | 187,531 | 178,556 | 152,577 | 175,359 | 166,731 | 135,392 |
| ජංගම නොවන වත්කම්වල එකතුව | **4,931,917** | **4,382,270** | **4,415,581** | **4,521,756** | **4,497,073** | **4,764,394** | **3,881,711** |
| | | | | | | | |
| ජෛව වත්කම් පාග්ධන | 167,027 | 134,578 | 101,940 | | | | |
| ලියා හැරීම් | - | 859 | 859 | | | | |
| | | | | | | | |
| **ජංගම වත්කම්** | | | | | | | |
| ගබඩා/ තොග | 180,342 | 184,815 | 168,173 | 157,428 | 180,900 | 174,028 | 161,801 |
| ජෛව වත්කම් වෙළඳ | 26,312 | 15,875 | 22,630 | | | | |
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ | 2,032,715 | 2,084,069 | 1,730,015 | 1,307,077 | 1,274,329 | 1,150,958 | 898,804 |
| කලින් ගෙවීම් | 4,767 | 3,896 | 8,754 | 5,172 | | 38 | 1,548 |
| බැංක ඇපකර | 6,292 | 6,164 | 4,153 | 1,372 | 837 | 905 | 2,210 |
| මුදල් සහ මුදල් සමායනයන් | 312,702 | 343,312 | 312,750 | 429,588 | 190,391 | 140,950 | 121,802 |
| ජංගම වත්කම් එකතුව | 2,563,130 | 2,638,131 | 2,246,475 | 1,900,637 | 1,646,457 | 1,466,879 | 1,186,165 |
| **මුළු වත්කම්වල එකතුව** | **7,662,074** | **7,155,838** | **6,764,855** | **6,422,393** | **6,143,530** | **6,231,273** | **5,067,876** |
| **වගකීම්** | | | | | | | |
| **ජංගම බැරකම්** | | | | | | | |
| ණය හිමියන්ට ගෙවියයුතු දෑ | 651,986 | 879,967 | 376,737 | 341,286 | 491,622 | 528,482 | 478,223 |
| ඒලයන්ස් මුල්‍ය සමාගම කල් බදු | - | 2,153 | 3,080 | | | | |
| උපචිත වියදම් | 102,067 | 175,733 | 122,286 | 46,159 | 207,705 | 87,145 | 61,525 |
| **ජංගම වගකීම් එකතුව** | **754,053** | **1,057,853** | **502,103** | **387,445** | **699,327** | **615,627** | **539,748** |
| | | | | | | | |
| **ජංගම නොවන වගකීම්** | | | | | | | |
| පාරිතෝෂිත දීමනා සදහා වෙන්කිරීම් | 1,379,494 | 1,388,101 | 1,489,288 | 1,551,379 | 1,311,876 | 1,157,688 | 1,077,205 |
| බැංකු ණය | | | 2,455 | | | | |
| විලම්බිත බදු | 612 | 612 | 612 | 612 | 612 | 612 | 612 |
| කල්බදු | 219 | 271 | 2,653 | 11,247 | 14,329 | 6,243 | 9,269 |
| **ජංගම නොවන බැරකම් වල එකතුව** | 1,380,325 | 1,388,984 | 1,495,008 | 1,563,238 | 1,326,817 | 1,164,543 | 1,087,086 |
| **මුළු වගකීම්** | 2,134,378 | 2,446,837 | 1,997,111 | 1,950,683 | 2,026,144 | 1,780,170 | 1,626,834 |
| **ශුද්ධ වත්කම් එකතුව** | **5,527,696** | **4,709,001** | **4,767,744** | **4,471,710** | **4,117,386** | **4,451,103** | **3,441,042** |
| | | | | | | | |
| **ශුද්ධ වත්කම්/හිමිකම්** | | | | | | | |
| සමුච්චිත අරමුදල | 24,649,830 | 24,407,260 | 24,066,161 | 23,702,950 | 23,383,849 | 23,224,435 | 23,116,473 |
| ඉ/ගෙ ආදායම් හා වියදම් ගිණුමේ ගෙ | (24,040,551) | (23,755,208) | 52,121 | 53,992 | 67,466 | 53,560 | 53,560 |
| ආදායම් - සංචිත සමාගම් වල | 50,865 | 4,006,082 | 4,019,027 | 4,021,721 | 3,837,266 | 3,851,627 | 3,061,097 |
| ප්‍රත්‍යාගන ලාභය | 4,867,551 | 50,865 | (23,369,566) | (23,276,474) | (23,171,205) | (22,678,520) | (22,787,889) |
| **ශුද්ධ වත්කම්/හිමිකම් එකතුව** | **5,527,696** | **4,708,999** | **4,767,743** | **4,502,189** | **4,117,376** | **4,451,102** | **3,443,241** |

## ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතේ ස්ථාපිත සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩලය - 2018

| අනු අංකය | සමාගම් | සභාපති | අධ්‍යක්ෂ මණ්ඩලය | ප්‍රධාන කාර්යාලීය ලිපිනය |
|---|---|---|---|---|
| 01. | සී/ස මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යාපාර (පුද්ගලික)සමාගම | | 1. එඩ්වඩ් ද මැල් මයා (අධ්‍යක්ෂ)<br>2. ඔස්මන් ද සිල්වා (අධ්‍යක්ෂ)<br>3. පරාක්‍රම අබේවර්ධන මයා | අංක 260/20, බේස්ලයින් පාර, කොළඹ 09 |
| 02. | සී/ස මහවැලි උපදේශක සේවා කාර්යාංශය | වෛද්‍යා හර්ෂ සමරවීර මයා | 1. කේ.එල්.එස්.සහබන්දු මයා<br>2. ඉංජි එල්.ආර්.එච්.පෙරේරා | අංක 11, ජාවත්ත පාර, කොළඹ 05 |
| 03. | ස්වභාවික සම්පත් කළමනාකරණ සේවා (පුද්) සමාගම | ඉංජි.ඒ.ඒ.වී. ඩයස් මයා | 1. ඉංජි.බී.ඩබ්.එන්.ඩබ්. සෙනවිරත්න බණ්ඩා මයා.<br>2. එන්.එම්.කේ.බී. අත්තනායක මයා<br>3. එල්.එම්.ධර්මසිරි මයා<br>4. එම්.ජී.අබේරත්න බණ්ඩාර (සමාගම් ලේකම්) | වේල්ල පෙදෙස, පොල්ගොල්ල, මහනුවර |

# පාලන වාර්තාව

## I කොටස

# පළමු පරිච්ඡේදය

## ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පිහිටුවීම.

**එහි සංයුතිය.**

1979 අංක 23 දරණ පනතින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පිහිටුවා ඇති අතර එකී පනතේ 12 වන වගන්තිය යටතේ යම් විශේෂිත ප්‍රදේශයක් සම්බන්ධයෙන් අධිකාරියෙහි කර්තව්‍ය පහත පරිදි පැහැදිලි කර ඇත.

(අ) ජලාශ, වාරිමාර්ග බෙදාහැරීමේ ක්‍රම සහ විදුලි බලය නිපදවීම සහ සැපයීම සඳහා වූ යාන්ත්‍රස්ථාන ඉදිකිරීම සහ මෙහෙයවීම ඇතුළු මහවැලි ගඟ සංවර්ධන යෝජනා ක්‍රමය සැලසුම් කිරීම සහ ක්‍රියාවට නැගීම.එසේ වුවද විදුලි බලය බෙදා හැරීමට අදාළ කර්තව්‍ය වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ එසේ කිරීමට බලය ඇති වෙනත් යම් අධිකාරියක් විසින් කරනු ලැබිය හැකිය.

(ආ) පූර්ණ හා ඒකාග්‍ර සංවර්ධනයට ප්‍රතිෂ්ඨාධාර වීම සහ එම සංවර්ධන සුරක්ෂිත කිරීම.

(ඇ) කෘෂිකාර්මික ඵලදායි වර්ධනය සහ සේවා නියුක්ති හැකියාවන් උපරිම තත්ත්වයට පත් කිරීම සහ කෘෂි ආර්ථික සංවර්ධනය ඇති කිරීම හා සුරක්ෂිත කිරීම.

(ඈ) භෞතික පරිසරය සංරක්ෂණය කිරීම හා පවත්වාගෙන යාම.

(ඉ) ජනතා පොදු සුබසාධනය හා සංස්කෘතික ප්‍රගතිය දියුණු කිරීම සහ පරිපාලනය කිරීම.

(ඊ) අභ්‍යන්තර සහ බාහිර පෞද්ගලික ප්‍රාග්ධනය කෘෂිකාර්මික සංවර්ධනයෙහි යෙදවීම ප්‍රවර්ධනය හා සුරක්ෂිත කිරීම.

(උ) මහවැලි ගඟ සංවර්ධන යෝජන ක්‍රමය සැලසුම් කිරීමේදී සහ ක්‍රියාවට නැංවීමේදී රාජ්‍ය දෙපාර්තමේන්තු රාජ්‍ය ආයතන පළාත් පාලන ආයතන රජයේ සංස්ථා ව්‍යවස්ථාපිත ආයතන පෞද්ගලික හෝ වෙනත් තැනැත්තන්ගේ සහයෝගය ලබා ගැනීම සහ සුරක්ෂිත කිරීම.

## ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ කර්තව්‍යයන්

අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ එක් එක් විෂය ක්ෂේත්‍රයන් යටතේ ස්ථාපිත කර ඇති ව්‍යාපෘති හා ක්ෂේත්‍ර කාර්යාලයන්හි කටයුතු සම්බන්ධීකරණය නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරුන්, අධ්‍යක්ෂවරුන්, ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන් හා නේවාසික ව්‍යාපාර කළමනාකාරවරුන් මගින් සිදුකරනු ලැබේ.

ඒ අනුව පහත සඳහන් කර්තව්‍යයන් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් ඉටුකර ඇත.

- සංයුක්ත සැලැස්ම හා වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම අනුව ආයතනයේ ප්‍රගතිය මාසිකව විමර්ශනය කොට අවශ්‍ය මැදිහත්වීම් මගින් නියමිත ඉලක්ක සපුරා ගැනීම.
- වත්කම් නඩත්තුව හා පරිපාලනය පිළිබඳ නිසි සැලැස්මක් අනුව කටයුතු කිරීම තුලින් වත්කම් අපහරණය කිරීම.
- කාලරාමුවකට අනුව මොරගහන්ද කළුගඟ ජලාශය හා කිවුල් ඔය ජලාශය ඉදිකිරීම.
- බී කලාපය දකුණු ඉවුර හා එල් කලාපයේ වාරි බිම් ප්‍රමාණය වැඩිකර ගැනීම සඳහා ප්‍රදේශ හඳුනාගෙන මූලික පරිසර අධ්‍යයනයක් සිදුකිරීම.
- කෘෂිකාර්මික සහාය සේවා ප්‍රවර්ධනය කෘෂිකාර්මික ප්‍රවර්ධනය හා ආදායම් උත්පාදන වැඩසටහන් දියුණු කිරීම හා රටේ සුරක්ෂිතතාවය ඇති කිරීම.
- වාරි පද්ධති නඩත්තුව හා කළමනාකරණය ගොවි සංවිධානවලට පැවරීමට හැකිවන පරිදි ගොවි සංවිධාන ශක්තිමත් කිරීම පිලිබඳ නිලධාරීන් හා ගොවි නියෝජිතයන් බල ගැන්වීම.
- “සමෘද්ධිමත් දැයකට මහවැලි සත්ත්ව නිපැයුම්” තේමාව යටතේ මහවැලි ජානපදික ප්‍රජාවගේ ජීවනෝපාය සංවර්ධනයට පශු සම්පත් ක්ෂේත්‍ර බලගැන්වීම.
- කෘෂිකාර්මික ඉඩම් සීමිත සම්පතක් වන මහවැලි ජානපදිකයන්ගේ දෙවන, තෙවන පරම්පරාවල ආර්ථික සංවර්ධනය හා රැකියා ජනනය උදෙසා සාම්ප්‍රදායික කෘෂිකර්මාන්තයෙන් බැහැර වූ රැකියා ආයෝජන ව්‍යාපෘති සඳහා යොමු කිරීම හා මග පෙන්වීම.
- සියළුම මට්ටම් වල නිලධාරීන් හා සේවකයින්ගේ ධාරිතා සංවර්ධනය සඳහා කටයුතු කිරීම හා කාර්යය මණ්ඩල තොරතුරු පරිඝනක ගත කර ඊ මානව සම්පත් කළමනාකරණ පද්ධතියක් හඳුන්වා දීමට කටයුතු කිරීම.
- රේඛීය ආයතන සමඟ සාකච්ඡා කරමින් කන්න මෙහෙයුම් සැලසුම් ක්‍රියාවලිය තුළින් ප්‍රධාන ජලාශ මගින් වාරිමාර්ග ජනාවාස ව්‍යාපෘති ප්‍රධාන ජලවිදුලි නිෂ්පාදනය හා ගෘහස්ථ ජල විදුලිබලය හා ගෘහස්ථ ජල සම්පාදනය සඳහා ජලය වෙන් කර දීම.
- බී, සී, එච්, එල්, ඩී, මොරගහකන්ද, හුරුළුවැව, වලව, වික්ටෝරියා සහ නව කලාපයක් ලෙස ප්‍රකාශයට පත් කරන ලද රඹුක්කන්ඔය යන ව්‍යාපෘති වල භෝග විවිධාංගීකරණය, සමාජආර්ථික සංවර්ධනය රැකියා උත්පාදනය සඳහා කටයුතු කිරීම.
- ජල කළමනාකරණය, මානව සම්පත් සංවර්ධනය, පශු සම්පත් සංවර්ධනය කෘෂිකාර්මික සංවර්ධනය පස සහ ජලය සංරක්ෂණය දියබෙත්ම කලමනාකරණය පාරිසරික දූෂණය හා ජල දූෂණය පිළිබඳ ප්‍රජාව දැනුවත් කිරීම.
- ප්‍රධාන ජලාශවල හැරවුම නිර්මිත සුරක්ෂිතාවය සිදු කිරීම සඳහා සඵලදායි මෙහෙයුම් නඩත්තු වැඩසටහන් සැකසීම ක්‍රියාත්මක කිරීම හා ඒ තුළින් ගොවි සංවිධාන දැනුවත් කිරීම.

# ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ පරිපාලන ව්‍යුහය.

**අධ්‍යක්ෂ ජනරාල්**

- **අතිරේක අධ්‍යක්ෂ ජනරාල්**
  - **නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (තාක්ෂණ සේවා)**
    - අධ්‍යක්ෂ - මූ.වැ.පා.ක්‍රි හා න. අංශය
    - අධ්‍යක්ෂ - ඉංජිනේරු නිර්මාණ
    - අධ්‍යක්ෂ - පහළ නිම්න සංවර්ධන
    - අධ්‍යක්ෂ - ගංගා ද්‍රෝණි කළමනාකරණ
    - අධ්‍යක්ෂ - පරිසර හා වන සංරක්ෂණ අංශය
    - අධ්‍යක්ෂ - ඉඩම් පරිහරණ සැළසුම්
    - අධ්‍යක්ෂ - ජල කළමනාකරණ ලේකම් කාර්යාලය
  - **නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා මුදල්)**
    - අධ්‍යක්ෂ - පිරිස් හා පාලන
    - අධ්‍යක්ෂ - මුදල්
    - අධ්‍යක්ෂ - නීති
    - අධ්‍යක්ෂ - මහවැලි කේන්ද්‍රය
    - අධ්‍යක්ෂ - මහවැලි ආරක්ෂක බලකාය
  - **නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන)**
    - අධ්‍යක්ෂ - ඉඩම්
    - අධ්‍යක්ෂ - කෘෂිකර්ම
    - අධ්‍යක්ෂ - ආයතන සංවර්ධන
    - අධ්‍යක්ෂ - ව්‍යාපාර සංවර්ධන
    - අධ්‍යක්ෂ - පශු සම්පත් සංවර්ධන
    - අධ්‍යක්ෂ - පර්යේෂණ සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති (2018 නොවැම්බර් සිට)
  - නේවාසික ව්‍යාපාර කළමනාකාරවරුන් බී,සී,ඩී,එච්,එල්, මොරගහකන්ද, වික්ටෝරියා, රඹකැන්ඔය, හුරුළුවැව, වලව
  - අධ්‍යක්ෂ - අභ්‍යන්තර විගණක
  - අධ්‍යක්ෂ - සැළසුම් හා මෙහෙයුම්
  - අධ්‍යක්ෂ - මූලස්ථාන මෙහෙයුම් (2018 නොවැම්බර් දක්වා)

# මහවැලි කලාප - ව්‍යුහය හා පරිපාලනය

මහවැලි ගංගා ද්‍රෝණි සංවර්ධන මහ සැලැස්මට අනුව ඇති කරන ලද ජනාවාස පරිපාලනය වාරි පද්ධති මෙහෙයවීම නඩත්තුව හා පරිපාලනය සඳහා මහවැලි බල ප්‍රදේශ කලාප වශයෙන් පරිපාලන ඒකක 10 ක් පිහිටුවා ඇත. මහවැලි ගංගා නිම්නය ආශ්‍රිතව බී,සී,ඩී,එච්, මොරගහකන්ද, වික්ටෝරියා, හුරුළු වැව යන කලාපද උඩවලව, වැලිඔය (එල් කලාපය) සහ රඹුක්කන්ඔය කලාප වැනි විශේෂ කලාප ද මෙසේ ආරම්භ කර ඇත.


මහවැලි කලාප වල හා විශේෂිත ප්‍රදේශයන්හි සංවර්ධනය හා කළමනාකරණ කර්තව්‍යයන් නේවාසික ව්‍යාපාර කළමනාකරුවන්ගේ බලතල යටතට පවරා ඇත. නේවාසික ව්‍යාපාර කළමනාකාරවරුන් සෘජුවම අධ්‍යක්ෂ ජනරාල් හා අතිරේක අධ්‍යක්ෂ ජනරාල් වෙත වගකිව යුතු අතර, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරුන්ගේ අධීක්ෂණය යටතේ කලාප මට්ටමින් සිදුවිය යුතු කාර්යයන් සඳහා ප්‍රධාන කාර්යාලයෙන් එක් එක් විෂය ක්ෂේත්‍රය සඳහා පත්කර ඇති අධ්‍යක්ෂවරුන්ගේ සහාය ලබා දෙනු ඇත.

එසේම සෑම කලාපයකටම ප්‍රධාන විධායක නිලධාරිවරයා නේවාසික ව්‍යාපාර කළමණාකරු වන අතර තාක්ෂණ, ඉඩම්, කෘෂිකර්ම හා සංවර්ධන ක්ෂේත්‍රයන් සඳහා අධීක්ෂණ නිලධාරීන් ලෙස නියෝජ්‍ය නේවාසික ව්‍යාපාර කළමනකාරවරුන් අනුයුක්ත කර ඇත. ඒකක කිහිපයකට එක් කොට්ඨාස කළමනාකාර කාර්යාලයක් ද එම කාර්යාලයේ එක් එක් විෂය ක්ෂේත්‍රය සඳහා කොට්ඨාස කළමනාකාරවරුන්ගේ සෘජු අධීක්ෂණය යටතේ වාරිමාර්ග ඉංජිනේරුවරයෙකු, ආයතන සංවර්ධන නිලධාරියෙකු, කෘෂිකර්ම නිලධාරිවරයෙකු හා ඉඩම් නිලධාරිවරයෙකු ස්ථාන ගත කර ඇත. එම සියලු නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ සියළුම විෂය ක්ෂේත්‍රයන්ගේ රාජකාරි ඉටුකිරීම හා එක් එක් ඒකකයකට එක් ඒකක කළමනාකාරවරයෙකු බැගින් ස්ථාන ගත කොට ඇත. මෙම ඒකකයක් සාමාන්‍යයෙන් පවුල් 250-300 අතර ප්‍රමාණයක ඉඩම් ලාභීන් පිරිසක් පදිංචි කිරීම සිදුකර ඇත.

මහවැලි කලාපයන්හි ඉඩම් පරිපාලනය සිදුකරනු ලබන්නේ ඉඩම් සංවර්ධන ආඥා පනත හා රජයේ ඉඩම් ආඥා පනත ප්‍රමුඛ කරගත් රජයේ ඉඩම් ප්‍රතිපත්තියට අනුව ය. රජයේ ඉඩම් සංවර්ධන කටයුතු සඳහා බැහැර කිරීමේ සිට ප්‍රධාන පත්‍ර නිකුත් කිරීම දක්වා මූලික කටයුතු එම ඉඩම් වලට අදාළ පසු කටයුතු ද සිදු කරනු ලැබේ. මීට අමතරව වාණිජ හා ආයෝජන කටයුතු සඳහා ඉඩම් බදු පදනම මත බැහැර කිරීමට අදාළ මූලික කටයුතු සිදුකරනු ලබන්නේ ද, මුල් ජානපදිකයන්ට අමතරව දෙවන, තුන්වන පරම්පරාවට ඉඩම් ලබා දීම ද කලාප කාර්යාල තුළින් සිදු කෙරේ.

එසේම වාරි ජල කළමනාකරණය, ආයතනික සංවර්ධනය මගින් වාරි පද්ධති නඩත්තුව, කළමනාකරණය හා වැඩි දියුණු කිරීම ද කෘෂිකාර්මික සංවර්ධනය යටතේ බීජ නිෂ්පාදනය ගොවිපල සංවර්ධනය, පුහුණු හා ආදර්ශ කටයුතු ද පශු සම්පත්, ධීවර හා පරිසර සංරක්ෂණ කටයුතු ව්‍යාපෘති සංවර්ධනය කුඩා හා මධ්‍ය පරිමාණ ණය වැඩසටහන් ක්‍රියාවට නැංවීම, වාණිජ කෘෂි ව්‍යාපාර මෙහෙයවීම, කෘෂි කර්මාන්ත හා සම්බන්ධ ස්වයං රැකියා වැඩසටහන් ක්‍රියාවට නැංවීමද කලාපීය පරිපාලනය යටතේ සිදු කෙරේ.

මහවැලි කලාප -සිතියම



# බී කලාපය


## කලාපය පිළිබඳ හැඳින්වීම




මහවැලි බී කලාපය මාදුරු ඔය ජලාශය යටතේ පහළ නිම්නයේ මුළු දළ බිම් ප්‍රමාණය හෙක්. 75,441.5 ක පැතිරි පවතින අතර පොළොන්නරුව හා මඩකලපුව පරිපාලන දිස්ත්‍රික්ක යටතට ගැනෙන විශාලතම ව්‍යාපෘතිය ලෙස හැඳින්විය හැකිය. වාරිමාර්ග කළමනාකරණ අභිප්‍රාය පෙරදැරිව ව්‍යාපෘති ප්‍රදේශය පරිපාලන කොට්ඨාස 08 ට බෙදා ඇත. එසේම වාරි කළමනාකරණය යටතේ පවතින ප්‍රධාන ඇල කි.මී. 54 කින් ද, පිඹුරත්තෑව ප්‍රධාන ඇළ කි.මී. 23.16 ද අතු ඇළ පද්ධතිය කි.මී. 67.08 ද, බෙදුම් ඇළ පද්ධතිය කි.මී. 459.03 ක් ද, කෙත් ඇළ පද්ධතිය කි.මී. 2135.9 කින්ද සමන්විත වේ.

# සී කලාපය


## කලාපය පිළිබඳ හැඳින්වීම




ශ්‍රී ලංකාවේ නැගෙනහිර මධ්‍ය කොටසේ මහවැලි ගඟේ දකුණු ඉවුර සී කලාපයට අයත් වන අතර පොළොන්නරුව, බදුල්ල හා අම්පාර යන පරිපාලන දිස්ත්‍රික්ක 03 ක් අයත් වේ. මෙම කලාපයෙහි දළ භූමි ප්‍රමාණය හෙක්. 30,760 ක් වන අතර මේ වන විට අස්වද්දා ඇති භූමි ප්‍රමාණය හෙක්. 22,406 කි. මෙම කලාපයේ ප්‍රධාන ජීවනෝපාය වී අතිරේක බෝග වගාව හා පශු සම්පත් නිෂ්පාදන වේ. එසේම කලාපය සඳහා වාරි ජල කළමනාකරණය සිදුකරන ප්‍රධාන ජලාශ උල්හිටිය හා රත්කිඳ වේ. මෙම කලාපය කොට්ඨාස 07 කින් හා ඒකක 31කින් සමන්විත වේ.

## ඩී කලාපය


### කලාපය පිළිබඳ හැඳින්වීම



ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශේෂ ගැසට් නිවේදනයක් මඟින් ප්‍රකාශයට පත් කර මැදිරිගිරිය ප්‍රදේශයේ 2004 වර්ෂයේ ස්ථාපිත කර ඇති ලද මහවැලි ඩී කලාපය කොට්ඨාශ 02 කින් යුක්ත වේ. ඒ බිසෝපුර සහ සූරියපුර වේ. බිසෝපුර කොට්ඨාශය ඒකක 04 කින් සමන්විත වේ. උතුරින් ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ කන්තලේ ප්‍රදේශය දක්වාත්, නැගෙනහිරින් සේරුවිල ප්‍රදේශය දක්වාත්, දකුණින් හා බටහිරින් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ලංකාපුර, හිඟුරක්ගොඩ ප්‍රදේශය දක්වාත් විහිදි පවතී.

## ජී කලාපය

### කලාපය පිළිබඳ හැඳින්වීම





මහවැලි ජී කලාපය ඇලහැර යෝධ ඇලෙන් පෝෂණය වන අතීත වාරි ශිෂ්ඨාචාරයක උරුමය පවතින භූමි ප්‍රදේශයකි.

ජන ශූන්‍ය වීම නිසා වල් වැදී ගිය ඇළහැර යෝධ ඇල නැවත ගරු අග්‍රාමාත්‍ය ඩී.එස්. සේනානායක මැතිතුමන් විසින් 1947 ඉඩම් ලාභීන් පදිංචි කරවීම සිදු කරන ලදි. එයින් නව ජනාවාස බිහිවීම ආරම්භ විය. 2001 වසරේ මහවැලි බී කලාපය යටතේ කොට්ඨාස කලමනාකාර ප්‍රදේශයක්ව මෙම ප්‍රදේශය පාලනය කෙරුණි. පසුව 2004 වර්ෂයේ සිට නැවත මහවැලි ජී කලාපය ලෙස පරිපාලන කටයුතු ආරම්භ කරන ලදි.

2012 වසරේ මුල් භාගයේදී මොරගහකන්ද කළු ගඟ ජලාශ ඉදිකිරීම ආරම්භ වීමත් සමඟ එම ජලාශ වලට යට වන ඉඩම් වල පදිංචි පවුල් ඉවත් කර නැවත පදිංචි කිරීමේ කටයුතු ආරම්භ කරමින් ගුරුවෙල හා වැල්ලේවෙල නමින් කොට්ඨාස කළමනාකාර කාර්යාල දෙකක් ආරම්භ කරන ලදි. 2013 වර්ෂයේදී මෙම කොට්ඨාස දෙකෙහි ගොවි පවුල් පදිංචි කර වීම සමඟ කොට්ඨාස කළමනාකාරවරුන් 4 දෙනෙකු යටතේ බකමූණ, අත්තනකඩවල, ගුරුවෙල, වැල්ලේවෙල නමින් කොට්ඨාස හතරක් මගින් පාලන කටයුතු ක්‍රියාත්මක කෙරේ.

## එච් කලාපය

### කලාපය පිළිබඳ හැඳින්වීම





මහවැලි සංවර්ධන ව්‍යාපාරයේ ප්‍රථම අදියර පොල්ගොල්ලෙන් මහවැලි ගඟ හැරවීමත් සමඟ දියත් කෙරුන මහවැලි සංවර්ධන ක්‍රියාවලිය 'ඒ' කලාපයේ සිට 'එච්' කලාපය දක්වා වූ කලාප ප්‍රමාණය මේ වන විට වලව විශේෂ බල ප්‍රදේශය, රඹකැන්ඔය, .එල්' කලාපය ආදී වශයෙන් කලාප 10 දක්වා වර්ධනය වී ඇත.මෙම නාමකරණයට අනුව කලා වැව කේන්ද්‍ර කොටගත් අළුත් ඉඩම් අක්කර 57,000ක් එළිපෙහෙලි කොට ජනාවාස බිහිකළ මුල්ම මහවැලි වාරි මාර්ග පද්ධතිය වශයෙන් සැලකෙනුයේ කලා වැව ජලයෙන් පෝෂණය වන 'එච්' කලාපයයි.

මෙය 1976 දී මුල්ම පදිංචිකරුවා බිහිවීමෙන් පසු දැනට අවුරුදු 42ක් සම්පූර්ණ කරයි. පිහිටීම අනුව බටහිරින් , අනුරාධපුර-පුත්තලම් මහා මාර්ගයත් , උතුරින් දකුණු ඉවුරු ඇලත් දකුණින් , බලලු වැව ඉවුරු උස්ගල සියඹලන්ගමුව ඔස්සේ රාජාංගන ඉවුරු ඇලෙනුත් සීමාවී පවතින අතර අමතර වශයෙන් කාගම කටියාව හා උස්ගල සියඹලන්ගමුව වැනි පැරණි ජනපද ප්‍රදේශද ඇතුළුව එච්' කලාපය සමන්විත වේ.

## එල් කලාපය


### කලාපය පිළිබඳ හැඳින්වීම.




1984 වර්ෂයේ ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව විසින් ජනාවාසකරණ කටයුතු ආරම්භ කර ඇති මෙම ප්‍රදේශය 1988 වර්ෂයේදී 562 දරණ ගැසට් නිවේදනය මගින් මහවැලි කලාපයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇත. හෙක්. 163,000 ක් වන මෙම කලාපයේ භූමි ප්‍රදේශය උතුරටත්, මුලතිව් වව්නියා ප්‍රධාන මාර්ගයද, නැගෙනහිරින් මුලතිව් මුහුදු වෙරළ තීරයෙන්ද, දකුණින් පුල්මුඩේ කැබිතිගොල්ලෑව ප්‍රධාන මාර්ගයෙන්ද බස්නාහිරින් සිංහයා උල්පතහින්න ත්‍රිකෝණමිතික ස්ථානය ඔස්සේ මහහෙට්ටියාවහින්න කඳුවැටිය ඔස්සේ රේඛාව පුලියන්කුලිම වව්නියාව මාර්ගයෙන්ද සීමා වෙන ප්‍රදේශයක් පුරා විහිදී ඇත.

# හුරුළුවැව කලාපය

## කලාපය පිළිබඳ හැඳින්වීම





ශ්‍රී ලාංකික ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ 1997-07-16 වන දිනැති අංක: 984/5 දරණ නිවේදනය මගින් හුරුළුපෝෂිත ඇලෙහි ජල කළමනාකරණය ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත පවරන ලද අතර 1998-05-09 වන දින හුරුළුවැව නේවාසික ව්‍යාපාර කළමනාකරණ කාර්යාලය දඹුල්ල පැල්වෙහෙරෙහි ස්ථාපිත කරන ලදි.

ඒ අනුව  අනුරාධපුර දිස්ත්‍රික්කයේ කැකිරාව, පලාගල හා ගලෙන්බිඳුණුවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස වලට අයත් ග්‍රාම නිලධාරි වසම් 49 ක් ද, මාතලේ දිස්ත්‍රික්කයේ දඹුල්ල හා නාවුල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්  ග්‍රාම නිලධාරි වසම්  32 ක් ද,  ගල්කිරියාගම, මඩාටුගම, පළුගස්වැව, කළුන්දැව හා සීගිරිය  යන කොට්ඨාස පහට අයත් වේ.

# රඹකැන්ඔය කලාපය


## කලාපය පිළිබඳ හැඳින්වීම




1979 අංක 23 දරණ මහවැලි අධිකාරි පනතේ 3/1 වගන්තිය යටතේ විශේෂ ව්‍යාපෘති  ප්‍රදේශයක් ලෙස  2000-05-07 දින අංක1130(13) දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජන රජයේ අති විශේෂ ගැසට් නිවේදනයෙන්  ප්‍රකාශයට පත් කරන ලද කලාපයකි. ඒ අනුව 2010-09-01 දින සිට මහඔය සහ පදියතලාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයන්හි පවතින ජලය සහ අනෙකුත් ස්වභාවික සම්පත් උපයෝගී කර ගනිමින් ප්‍රදේශයේ තිරසාර සංවර්ධනය ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය මගින් සිදුකරන බවට ප්‍රකාශයට පත් කරන ලදි. මෙම ප්‍රදේශයේ පවතින දිළිඳුභාවය තුරන් කිරීම  සහ දළ දේශීය නිෂ්පාදනයට ලබා දෙන්නා වූ දායකත්වය ඉහළ  නැංවීම උදෙසා සකස් කර ඇති මෙම සංවර්ධන වැඩසටහන වාරිමාර්ග දෙපාර්තමේන්තුව සහ රේඛීය ආයතන හා ඒකාබද්ධ සංවර්ධන සැලැස්මක්  ලෙස ක්‍රියාත්මක කරනු ලබයි.මේ අනුව රඹකැන්ඔය ජලාශ ව්‍යාපෘතියේ වාරි ඉඩම් සංවර්ධන කටයුතු සහ පරිපාලන කටයුතු ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය මගින්  ඉටු කරනු ලබයි.

# වලව කලාපය

## කලාපය පිළිබඳ හැඳින්වීම




උඩ වලව බහුකාර්ය යෝජනා ක්‍රමය 1963 ජුලි මස 12 වැනිදා ගංගා නිම්න සංවර්ධන මණ්ඩලය විසින් ආරම්භ කර ඇති අතර, උඩ වලව ජලාශය ඉදි කිරීමත් එය සමගාමීව ජනාවාසකරණය සහ ගොවි බිම් සංවර්ධනය 1981 දක්වා ක්‍රියාත්මක කරන ලද්දේ ගංගා නිම්න සංවර්ධන මණ්ඩලය මගිනි.

1979 අංක 23 දරන ශ්‍රී ලංකා මහවැලි අධිකාරි පනතේ 3(1) වගන්තිය යටතේ පැවරී ඇති බලතල ප්‍රකාරව1981/04/16 දින අංක 137 දරන ගැසට් පත්‍රය මගින් ගරු ඉඩම් සංවර්ධන හා මහවැලි සංවර්ධන අමාත්‍යවරයා වූ ගාමිණී දිසානායක මැතිතුමා විසින් වලව කලාපය වලව විශේෂ බල ප්‍රදේශය පත් කරනු ලැබ ඇත. ඒ අනුව 1982-01-01 දින සිට වලව කලාපයේ පරිපාලන කටයුතු ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතට පත් වී ඇත.

වලව කලාපයේ පරිපාලන කටයුතු ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතට පත්ව දැනට වසර 34 ක් ගතවී ඇති අතර, මෙම කාලය තුළ කලාපය සීඝ්‍ර දියුණුවක් ලබා ඇත. අඟුණකොළපැලැස්ස, මුරවැසිහේන, සූරියවැව, මයුරපුර, චන්ද්‍රිකා වැව හා කිරිඉබ්බන්වැව යන කොට්ඨාස 06 කින් සමන්විත වන අතර, ඒකක 39 කට බෙදී ඇත.

# වික්ටෝරියා කලාපය

## කලාපය පිළිබඳ හැඳින්වීම

ශ්‍රී ලංකාවේ මධ්‍ය කඳුකරයේ මහනුවර හා නුවරඑළිය දිස්ත්‍රික් දෙක යා කරමින් ලෝක උරුමයන් වූ සුන්දර නකල්ස් කඳුකරයෙන් ද පෝෂණය වී සශ්‍රීක දුම්බර මිටියාවත යටපත් කරමින් ඉදි කෙරුණු මහවැලි මහ ගංගාවෙන් පෝෂණය වන කලාපය වික්ටෝරියා/ කොත්මලේ කලාපයට අයත් ය.

වික්ටෝරියා ව්‍යාපෘතිය බල ප්‍රදේශය මාපාකඩ කාර්යභාර ඉංජිනේරු කාර්යාලය අත්පත් කරගත් ප්‍රදේශයන් ආශ්‍රිතවද, රන්දෙණිගල, රන්ටැඹේ හා වික්ටෝරියා ජලාශ බල ප්‍රදේශ මැදි වන ලෙසද පොල්ගොල්ල ජලාශය සුදු ගඟ දෙපසද බෝවතැන්න බල ප්‍රදේශය හා ඉබ්බන්කටුව වැව සීමාව තෙක් ද විහිදී පවතී.

මෙය ඉහළ මහවැලි කලාපය කොත්මලේ සිට රන්ටැඹේ දක්වා ප්‍රදේශය ද පහළ මහවැලිය රන්ටැඹේ සිට මහවැලි ගඟ හා නැගෙනහිර උතුර හා උතුරු මැද පළාත් වල පිහිටි ස්වභාවික ඔයවල් හා ජල ධාරාවන්හි නිම්නයන් ආශ්‍රිත ප්‍රදේශයන්ද ඇතුළත් වන්නේ ය.

## 2018-12-31 දිනට මූල්‍ය ප්‍රගතිය - කලාප වශයෙන්

| අ/අ | කලාපය | 2018 වර්ෂයට වෙන්කළ මුදල (රු.මි.) | 2018-12-31 දිනට වියදම් කළ මුදල (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය ( % ) |
|---|---|---|---|---|
| 1 | බී | 189.03 | 189.03 | 100% |
| 2 | සී | 206.51 | 203.81 | 99% |
| 3 | ඩී | 73.12 | 72.85 | 100% |
| 5 | එච් | 165.57 | 178.86 | 108% |
| 6 | එල් | 2.79 | 2.79 | 100% |
| 4 | මොරගහකන්ද | 74.08 | 73.12 | 99% |
| 7 | උඩවලව | 200.56 | 189.81 | 95% |
| 8 | හුරුළුවැව | 88.67 | 79.66 | 90% |
| 9 | වික්ටෝරියා | 67.30 | 65.30 | 97% |
| 10 | රඹකැන්ඔය | 22.17 | 21.98 | 99% |
| | මුළු එකතුව | **1089.80** | **1077.20** | **99%** |

## අධ්‍යක්ෂ ජනරාල්ගේ ඍජු අධීක්ෂණය යටතේ කළමනාකරණය වන අංශ:

1. මූලස්ථාන මෙහෙයුම් අංශය **(මෙම අංශය 2018 ඔක්තෝම්බර් මස සිට යටපත් කර ඇත.)**
2. සැලසුම් හා මෙහෙයුම් අංශය
3. අභ්‍යන්තර විගණන අංශය

## 01. මූලස්ථාන මෙහෙයුම් අංශය

### කාර්යභාරයන්

- ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පැවැත්වීම හා එහි කාර්යයන් සම්බන්ධ සියලු අදාළ කටයුතු මෙහෙයවීම.
- ආයතනයට ලැබෙන තැපැල සම්බන්ධීකරණය කළමනාකරණය හා පසු විපරම
- අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් පවත්වනු ලබන සියලුම අභ්‍යන්තර හා බාහිර රැස්වීම් සම්මන්ත්‍රණ ආදිය සැලසුම් කිරීම හා මෙහෙයවීම.
- කලාපීය ජාතික හා ජාත්‍යන්තර සම්මන්ත්‍රණවලට අදාළ කටයුතු හා විදේශ ආධාර දූත මණ්ඩල පැමිණීම් වලට අදාළ සංවිධාන කිරීම හා මෙහෙයවීම.
- විදේශීය ශිෂ්‍යත්ව, සම්මන්ත්‍රණ හා වැඩමුළු සඳහා නාම යෝජනා ඉදිරිපත් කිරීම හා ඊට අදාළ සම්බන්ධීකරණ කටයුතු
- ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ කාර්යභාරයන්ට අදාළ පාර්ලිමේන්තුව, ජනාධිපති කාර්යාලය හා මුදල් අමාත්‍යංශය ඇතුළු අනෙකුත් සියළු අමාත්‍යංශ දෙපාර්තමේන්තු හා ජාත්‍යන්තර ආයතන ආදි සියලුම ආයතන සම්බන්ධීකරණය.
- අමාත්‍ය මණ්ඩල සංදේශ කෙටුම්පත් ඉදිරිපත් කිරීම හා අමාත්‍ය මණ්ඩල අනුමැතීන් වලට අනුව ක්‍රියා කිරීම.
- ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය තුළ ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටු අනුමැතියෙන් සිදුකරන ප්‍රසම්පාදනයන් සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ කාර්ය අනුමැතිය හා ප්‍රසම්පාදන අනුමැතිය ලබා දීමට කටයුතු කිරීම. දේශීය ප්‍රසම්පාදන අනුමැතියෙන් සිදුකළ යුතු කාර්ය සඳහා ප්‍රසම්පාදන අනුමැතිය හා කාර්ය අනුමැතිය ලබා දීමට කටයුතු කිරීම.
- විධායක කළමනාකරණ/ විගණන කළමනාකරණ කමිටු රැස්වීම් සම්බන්ධීකරණය ලේඛන ගත කිරීම හා තීරණ දැනුම් දීම.
- විශේෂ ව්‍යාපෘති සම්බන්ධ ව්‍යාපාර මෙහෙයුම් කමිටු පැවැත්වීමට අදාළ සම්බන්ධීකරණය.
- මෙම අංශය 2018 ඔක්තෝම්බර් මාසයේ සිට යටපත් කිරීමට ලක්ව ඇත.

## 02. සැලසුම් හා නියාමන අංශය

### කාර්යභාරයන්

- ආයතනයේ දැක්ම හා මෙහෙවරට අනුව සංයුක්ත ක්‍රියාකාරී සැලැස්මක් සැකසීම හා වාර්ෂික සැලැස්ම අනුව කටයුතු කිරීම.
- විශේෂ ව්‍යාපෘති වාර්තා සැකසීම හා ආර්ථික සාමාජීය සමීක්ෂණ හා විශ්ලේෂණ සිදු කිරීම.
- ක්‍රියාකාරී සැලැස්මේ සහ ව්‍යාපෘති වාර්තාවල ඇති ප්‍රගතිය මාසිකව, ත්‍රෛමාසිකව හා වාර්ෂිකව සමාලෝචනය කිරීම. ව්‍යාපෘති ඇගයීම් සම්බන්ධීකරණය හා මෙහෙයුම් ඇගයීම් පද්ධතියක් සහතික කිරීම.
- තාක්ෂණ වාර්තා, ශක්‍යතා වාර්තා මෙහෙයුම් හා ඇගයීම් වාර්තා සංරක්ෂණය හා භාවිතයට ලබා දීම.
- මහවැලි පරිගණක ජාලය මෙහෙයවීම නඩත්තුව හා නිල වෙබ් අඩවිය ස්ථාපිත කිරීම. යාවත්කාලීන කිරීම හා තොරතුරු තාක්ෂණ සහාය පැතීම.
- බලපෑමට ලක්වන ක්ෂේත්‍ර පිළිබඳ අධ්‍යයනයන් සම්බන්ධීකරණය කිරීම.

## 03. අභ්‍යන්තර විගණන අංශය

### කාර්යභාරයන්

- ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්, යහපාලනය සඳහා වූ පොදු ව්‍යාපාර ප්‍රතිපත්ති චක්‍ර ලේඛන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූල්‍යමය විධිවිධාන හා මුදල් සහ ප්‍රතිපත්ති සැලසුම් අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ප්‍රතිපත්ති සහ නීති රීති ව්‍යවස්ථා හා කළමනාකරණ තීරණ වලට අනුකූලව අභ්‍යන්තර විගණන විෂය පථය සකස් වී ඇත.
- ශිල්පීය හෝ ගිණුම්කරණ දෘෂ්ඨි කෝණයකින් මෙන්ම කළමනාකරණ දෘෂ්ඨි කෝණයකින් ද යුතුව ආයතනයේ මෙහෙයුම් කාර්යයන් පිරික්සා බැලීම. විගණනය හා වාර්තා කිරීම.
- වැඩ යෝජනා ක්‍රම ව්‍යාපෘති වල ප්‍රගතිය සහ ඒ පිළිබඳ වැඩසටහන් නියමිත කාල රාමුව තුළ කොතෙක් සාක්ෂාත් කර ගැනීමට කටයුතු කර ඇත්දැයි නිරන්තරව ඇගයීම් කිරීම.
- අදාළ කාලවකවානුව තුළ සිදුකළ යුතු වැඩ ක්‍රියාත්මක වීම ප්‍රමාද වීමට තුඩු දෙන ගැටළු සහගත ක්ෂේත්‍රයන් පිළිබඳ යාවත් කාලීනව ස්ථානීය විමර්ශනයක් පැවැත්වීම.
- මෙහෙයුම් කාර්යයන් අධීක්ෂණය කිරීමෙහිලා භාවිතා කරනු ලබන කළමනාකරණ ක්‍රමවේදය සහ පාලනයන් ඇගයීම හා සමාලෝචනය කිරීම.

# දෙවන පරිච්ඡේදය

## 2.1 තාක්ෂණ සේවා අංශය

### 2.1.1 පහළ නිම්න සංවර්ධන අංශය

මහවැලි බල ප්‍රදේශයන්හි ඇති වාරි පද්ධති මෙහෙයවීම සහ නඩත්තු කිරීම, ගොඩනැගිලි පරිශ්‍ර නඩත්තු කිරීම සහ කළමනාකරණය කිරීම, මාර්ග පද්ධති අළුත්වැඩියාවන් හා ඊට අදාළ ඉදිකිරීම්, ඇස්තමේන්තු කිරීම්, ඉදිකිරීම් තත්ත්ව පාලනය කිරීම් සහ ප්‍රගති සමාලෝචනය මෙම අංශයේ ප්‍රධාන කාර්යයන් වේ.

2018 වසර සඳහා මහා භාණ්ඩාගාරය මගින් ඒ ඒ කලාපය සඳහා වෙන් කළ ප්‍රතිපාදන වැය කිරීම පහත පරිදි වේ.

**ව්‍යාපෘති යටතේ :**

| අනු අංකය | ව්‍යාපෘතිය | 2018 වර්ෂයේ තා.සේ. අංශයට වෙන් කළ මුදල රු. මිලියන | 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය රු. මිලියන | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|---|
| 1 | රිදීමාලියද්ද සංවර්ධන ව්‍යාපෘතිය | 50.15 | 50.48 | 100% |
| 2 | රඹකැන්ඔය සංවර්ධන ව්‍යාපෘතිය | 93.02 | 98.35 | 100% |
| 3 | වැලිඔය ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය | 174.02 | 174.48 | 100% |
| 4 | ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය බී - කලාපය | 278.00 | 278.00 | 100% |
| 5 | මාදුරුඔය දකුණු ඉවුරු සංවර්ධන ව්‍යාපෘතිය බී - කලාපය | 59.15 | 59.82 | 100% |
| 6 | කුඩා හා මධ්‍යම පරිමාණ වාරිමාර්ග පද්ධති පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය | 150.00 | 142.49 | 95% |
| | උප එකතුව 1 | **804.34** | **803.62** | **99.91** |

**ආයතනික ප්‍රාග්ධනය යටතේ:**

| අනු අංකය | කලාපය/ අංශය | 2018 වර්ෂයේ තා.සේ. අංශයට වෙන් කළ මුදල රු. මිලියන | 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය රු. මිලියන | මූල්‍ය ප්‍රගතිය % |
|---|---|---|---|---|
| 1 | බී කලාපය | 116.0 | 115.92 | 100% |
| 2 | සී කලාපය | 136.39 | 136.42 | 100% |
| 3 | ඩී කලාපය | 37.90 | 37.27 | 98% |
| 4 | ජී කලාපය | 47.89 | 47.32 | 98.8% |
| 5 | එච් කලාපය | 96.50 | 96.36 | 100% |
| 6 | එල් කලාපය | 2.17 | 2.17 | 100% |
| 7 | වලව කලාපය | 116.21 | 116.90 | 100% |
| 8 | හුරුළුවැව කලාපය | 70.19 | 69.66 | 99% |
| 9 | රඹකැන්ඔය කලාපය | 10.10 | 10.10 | 100% |
| 10 | වික්ටෝරියා කලාපය | 50.17 | 50.96 | 100% |
| 11 | ප්‍රධාන කාර්යාලය (තා/සේ) | 55.0 | 18.02 | 33% |
| 12 | යාන්ත්‍රික වැඩපල - තඹුත්තේගම | 5.0 | 4.36 | 87% |
| 13 | ගංගා ද්‍රෝණි කළමනාකරණ අංශය | 2.5 | 2.50 | 100% |
| 14 | ප්‍රධාන වේලි හා ජලාශ මෙහෙයුම් අංශය | 230.0 | 229.2 | 100% |
| උප එකතුව 2 | | 976.0 | 937.2 | |
| මුළු එකතුව (2+1 උප එකතුව) | | **1780.36** | **1740.78** | |

## 2.1.2 ඉදිකරමින් පවතින කුඩා පරිමාණ ජල විදුලි බලාගාර වල ප්‍රගති වාර්තාව

මහවැලි ගඟ හා ඊට සම්බන්ධ අතු ගංගා වල ජලය උපයෝගීකොට ගෙන කුඩා පරිමාණ ජල විදුලි බලාගාර ක්‍රියාත්මක වේ. මෙයින් ජනනය කරන විදුලිය ශ්‍රී ලංකා විදුලි බල මණ්ඩලය යටතේ ඇති ජාතික විදුලි බල පද්ධතියට (National Grid) සපයනු ලැබේ. මාස් පතා සපයනු ලබන මෙම විදුලි ඒකක ප්‍රමාණය අනුව ශ්‍රී ලංකා විදුලි මණ්ඩලය විසින් එම සැපයූ විදුලි ඒකක ප්‍රමාණයට ගෙවීමක් එම කුඩා පරිමාණ ජල විදුලි ව්‍යාපෘතියේ ආයෝජකයාට ගෙවනු ලබන අතර, ආයෝජනකයා විසින් එයින් ප්‍රතිශතයක් මහවැලි ගඟේ ජලය භාවිතා කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට ගෙවනු ලැබේ.

මේ දක්වා කුඩා පරිමාණ ජල විදුලි බලාගාර 11 ක වැඩ නිමවා ඇති අතර එවායින් මෙගාවොට් 33.35 ක ප්‍රමාණයක් ජාතික විදුලි බල පද්ධතියට තම දායකත්වය සපයයි. එමගින් මහවැලි අධිකාරියට මහවැලි ජල හැරවුම් අයිතිය වෙනුවෙන් ගෙවනු ලබන බද්ද ලෙස යම් ප්‍රතිශතයක් හිමි වේ.

මීට අමතරව ශ්‍රී ලංකා මහවැලි අධිකාරියෙහි අනුමැතිය සහිතව කුඩා පරිමාණ ජල විදුලි බලාගාර 10 ක් ඉදිකරමින් පවතී.

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියෙහි අනුමැතිය රහිතව ඉදිකරන ලද කුඩා පරිමාණ ජල විදුලි බලාගාර 46 දැනට වාර්තා වී ඇති අතර තවත් ජල විදුලි බලාගාර ඉදිවෙමින් පවතී.

| අනු අංකය | ව්‍යාපෘතියේ නම | ආයෝජකයාගේ නම | ධාරිතාවය /MW | ප්‍රගතිය |
|---|---|---|---|---|
| 1 | Ukuwela | Onyx Hydro Power Company (Pvt) Ltd. | 2.2 | ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාවෙන් ජනන බලපත්‍රය (Generation License) ලබා ගැනීමේ කාර්යය සිදු කරමින් පවතී. |
| 2 | Ankanda | Escas Ankanda Power (Pvt) Ltd. | 6.5 | විදුලි ජනන කටයුතු ආරම්භ කොට ඇත. |
| 3 | Diggala | Escas Diggala Power (Pvt) Ltd. | 4.4 | ඉදිකිරීම් කටයුතු සිදු කරමින් පවතී. |
| 4 | Kiula | Escas Kiula Power (Pvt) Ltd. | 2.8 | සැලැස්ම වෙනස් කිරීම නිසා නව පාරිසරික ඇගයීමක් (EIA) සිදු කළ යුතුව ඇත. |
| 5 | Nayakkubura | Ralic hydro Power Generation (Pvt) Ltd./N.G.P. Panditharathna | 0.5 | මෙම ව්‍යාපෘතිය සඳහා ආයෝජකයින් දෙදෙනෙකු ඉදිරිපත්ව ඇති බැවින් එම ගැටළුව නිරාකරණය කර ගැනීමට නීතිපති උපදෙස් ලබා ගැනීම සඳහා යොමු කර ඇත. |
| 6 | Chandrikawewa | Mahaweli Consultancy Bureau (Pvt) Ltd. | 0.63 | පාරිසරික ඇගයීම (EIA) අවසන් කර ඇත. |
| 7 | Kubaloluwa I | Noorwood Hydro Power (Pvt) Ltd. | 2.4 | මෙම ව්‍යාපෘති දෙක සුදු ගඟෙහි ආසන්නව පිහිටා ඇති බැවින් ව්‍යාපෘති දෙකම එකවර ක්‍රියාත්මක කරවීමේ ගැටළුවක් පවතී. ව්‍යාපෘති දෙකෙහි ශක්‍යතාවය අධ්‍යයනය කිරීම සඳහා බිම් මැනුමක් (Survey) සිදු කිරීමට කටයුතු සැලසුම් කර ඇත. |
| 8 | Kubaloluwa II | Kumballoluwa Hydro Power (Pvt) Ltd. | 1.0 | |
| 9 | Maduruoya offtake of LBL3 | Nippon Knit (Pvt) Ltd. | 0.15 | පාරිසරික ඇගයීම (EIA) සිදු කරමින් පවතී. |
| 10 | Moragolla Mini Hydro Power Project | Zhejiang Young Energy Co. (Pvt) Ltd. | 2.1 | පාරිසරික ඇගයීම (EIA) සිදු කරමින් පවතී. |

### 2.1.3 ඉංජිනේරු නිර්මාණ හා සැලසුම් අංශය

ඉංජිනේරු නිර්මාණ හා සැලසුම් අංශය මගින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් සංවර්ධනය කරන ලද, ක්‍රියාත්මක වෙමින් පවතින සහ යෝජිත ව්‍යාපෘතිවල ඉංජිනේරු නිර්මාණ හා සැලසුම් සකස් කිරීම සිදු කරනු ලබයි.

පහත කාර්යභාරයන් මෙම අංශය මගින් සිදු කරනු ලබයි.

- මහවැලි ජල සම්පත් සැලැස්ම යාවත්කාලීන කිරීම.
- රාජ්‍ය හා පුද්ගලික ව්‍යාවසායකයින් විසින් ඉදිරිපත් කරනු ලබන කුඩා පරිමාණ ජල ව්‍යාපෘති යෝජනා හා සැලසුම් විශ්ලේෂණය.
- ක්‍රියාත්මක වන ජලසම්පත් හා අනෙකුත් යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිවල නිර්මාණ හා සැලසුම් සකස් කිරීම හා විශ්ලේෂණය කිරීම.
- නිර්මාණ හා සැලසුම්වලට අදාල ඉංජිනේරු ඇස්තමේන්තු සහ ප්‍රමාණ බිල්පත් ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා සකස් කිරීම.
- ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ පිළිගත් තත්වයන්ට අනුව ඉංජිනේරු නිර්මාණ හා සැලසුම්කරණය පිළිබඳව නවක ඉංජිනේරුවරුන් පුහුණු කිරීම.

### 2.1.4 ඉදිකරන ලද ඉංජිනේරු නිර්මාණ හා සැලසුම්

**ගොඩනැගිලි**

1. මොරගහකන්ද කළුගඟ ව්‍යාපෘතිය යටතේ අඹන රෝහලෙහි බාහිර රෝගී අංශය සඳහා දෙමහල් ගොඩනැගිල්ල
2. මොරගහකන්ද කළුගඟ ව්‍යාපෘතිය යටතේ ලග්ගල සංස්කෘතික ශාලාව සඳහා ගොඩනැගිල්ල.
3. මොරගහකන්ද කළුගඟ ව්‍යාපෘතිය යටතේ අඹන නගරයෙහි පොල සඳහා ගොඩනැගිල්ල.
4. මොරගහකන්ද කළුගඟ ව්‍යාපෘතිය යටතේ අඹන නගරයෙහි මාළු වෙළඳසැල සඳහා ගොඩනැගිල්ල.
5. මොරගහකන්ද කළුගඟ ව්‍යාපෘතිය යටතේ බිසෝපුර නගරයේ බස්නැවතුම්පල ගොඩනැගිල්ල.
6. මොරගහකන්ද කළුගඟ ව්‍යාපෘතිය යටතේ බිසෝපුර නගරයේ මාළු වෙළඳසැල සඳහා ගොඩනැගිල්ල.
7. මොරගහකන්ද කළුගඟ ව්‍යාපෘතිය යටතේ බිසෝපුර නගරයේ පොළ සඳහා ගොඩනැගිල්ල.
8. මොරගහකන්ද කළුගඟ ව්‍යාපෘතිය යටතේ මැදිරිගිරිය ක්‍රීඩාපිටියෙහි ඔලිම්පික් පහන සඳහා සැලසුම.
9. මොරගහකන්ද කළුගඟ ව්‍යාපෘතිය යටතේ අඹන උපතැපැල් කාර්යාල ගොඩනැගිල්ල.
10. මොරගහකන්ද කළුගඟ ව්‍යාපෘතිය යටතේ කුඹියන්ගහ ඇල පාසල සඳහා දෙමහල් ගොඩනැගිල්ල.
11. රඹකැන්ඔය පුහුණු මධ්‍යස්ථානය සඳහා ප්‍රතීක ටැංකිය සහ ගවරවල හි සැලැස්ම.
12. මහවැලි කලාප වල හෙළ බොජුන් හල සඳහා පොදු සැලැස්ම.

**2.1.5 වාරිමාර්ග**

1. මොරගහකන්ද කළුගඟ ව්‍යාපෘතියෙහි දකුණු ඉවුර ප්‍රධාන ඇළ අංක 02 එල්. සී. 2 ($LC_2$) හි ඇතුළුවීම් නිර්මිතය (Inlet Structure)
2. මොරගහකන්ද කළුගඟ ව්‍යාපෘතියෙහි දකුණු ඉවුර ප්‍රධාන ඇළ අංක 02 එල්. සී. 3 ($LC_3$) හි වාන් නිර්මිතය
3. මොරගහකන්ද කළුගඟ ව්‍යාපෘතියෙහි දකුණු ඉවුර ප්‍රධාන ඇළ අංක 02 එල්. සී. 4 ($LC_4$) හි සැලැස්ම
4. මොරගහකන්ද කළුගඟ ව්‍යාපෘතියෙහි දකුණු ඉවුර ප්‍රධාන ඇළ අංක 02 එල්. සී. 4 ($LC_4$) හි ලැබ්රිනින් වාන් නිර්මිතය සමඟ පාලම
5. මොරගහකන්ද කළුගඟ ව්‍යාපෘතියෙහි දකුණු ඉවුර ප්‍රධාන ඇළ අංක 02 කිලෝමීටර් 1+554 ස්ථානයේ යටි පැන්නුම් නිර්මිතය
6. මොරගහකන්ද කළුගඟ ව්‍යාපෘතියෙහි දකුණු ඉවුර ප්‍රධාන ඇළ අංක 02 කිලෝමීටර් 2+133 ස්ථානයේ යටි පැන්නුම් නිර්මිතය
7. මොරගහකන්ද කළුගඟ ව්‍යාපෘතියෙහි දකුණු ඉවුර ප්‍රධාන ඇළ අංක 02 කිලෝමීටර් 3+282 ස්ථානයේ යටි පැන්නුම් නිර්මිතය
8. මොරගහකන්ද කළුගඟ ව්‍යාපෘතියෙහි දකුණු ඉවුර ප්‍රධාන ඇළ අංක 02 කිලෝමීටර් 4+953 ස්ථානයේ යටි පැන්නුම් නිර්මිතය
9. මොරගහකන්ද කළුගඟ ව්‍යාපෘතියෙහි දකුණු ඉවුර ප්‍රධාන ඇළ අංක 02 කිලෝමීටර් 1+243 ස්ථානයේ යටි පැන්නුම් නිර්මිතය
10. මොරගහකන්ද කළුගඟ ව්‍යාපෘතියෙහි දකුණු ඉවුර ප්‍රධාන ඇළ අංක 02 කිලෝමීටර් 2+490 ස්ථානයේ යටි පැන්නුම් නිර්මිතය
11. මොරගහකන්ද කළුගඟ ව්‍යාපෘතියෙහි දකුණු ඉවුර ප්‍රධාන ඇළ අංක 02 එල්. සී. 04 හි පිටවීම් (අවුට්ලට්) නිර්මිතය
12. මොරගහකන්ද කළුගඟ ව්‍යාපෘතියෙහි දකුණු ඉවුර ප්‍රධාන ඇළ අංක 02 කිලෝමීටර් 3+608 ස්ථානයේ අවසාන පාලන නිර්මිතය
13. මොරගහකන්ද කළුගඟ ව්‍යාපෘතියෙහි දකුණු ඉවුර ප්‍රධාන ඇළ අංක 02 කිලෝමීටර් 1+750 ස්ථානයේ පාලන නිර්මිතය, අවහැරවුම සමඟ ඇල වාන් නිර්මිතය
14. මොරගහකන්ද කළුගඟ ව්‍යාපෘතියෙහි දකුණු ඉවුර ප්‍රධාන ඇළ අංක 02 මිලි මීටර් 900 හා 1200 බැස්සුම් නිර්මිත පොදු සැලැස්ම.
15. මොරගහකන්ද කළුගඟ ව්‍යාපෘතියෙහි දකුණු ඉවුර ප්‍රධාන ඇල අංක 01 කොන්ක්‍රීට් ආස්ථරණය සඳහා සැලැස්ම.
16. මැදිරිගිරිය කලාපයේ මුවන්වත්ත හේන වැවෙහි සියළුම නිර්මිත සමඟ වැව සැලසුම් කිරීම.
17. සී - කලාපයේ මල්දෙණිය වැවේ වානෙහි පහළ කොටස නවීකරණය සඳහා සැලැස්ම.
18. මැදිරිගිරිය වාරි ව්‍යාපෘතිය වැඩිදියුණුකිරීම සම්බන්ධ ශක්‍යතා අධ්‍යයන වාර්තා විශ්ලේෂණය කිරීම.
19. වලව දකුණු ඉවුර පුනරුත්ථාපන කටයුතු සඳහා ඉදිරිපත් කරන ලද වර්තා සහ සැලසුම් විශ්ලේෂණය කිරීම.

## 2.2 ගංගා ද්‍රෝණි කළමනාකරණ කාර්යාලය.


### හැඳින්වීම

ගංගා ද්‍රෝණි කළමනාකරණ කාර්යාලය, මඩාටුගම මහවැලි පරිශ්‍රයේ පිහිටා ඇති අතර අධ්‍යක්ෂ (ගංගා ද්‍රෝණි කළමනාකරණ) යටතේ ක්‍රියාත්මක වේ. ගංගා ද්‍රෝණි කළමනාකරණ සංකල්පයට අනුකූලව පාරිසරික හා ස්වභාවික සම්පත් කළමනාකරණයට අදාලවන කාර්යයන් ඉටු කිරීම සහ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතේ සිදු කරනු ලබන ඉදිකිරීම් හා නඩත්තු කාර්යයන්හි ප්‍රමිතිය පරීක්ෂා කිරීම මෙම කාර්යාලයේ මූලික වගකීම වේ. ඒ අනුව මෙම කාර්යාලය යටතේ පවත්වාගෙන යනු ලබන ජල තත්ව විද්‍යාගාරය මඟින් මහවැලි ගඟ සහ මහවැලි පද්ධතිය හා සහ සම්බන්ධ ගංගා ද්‍රෝණිවල පිහිටි ජල ප්‍රභව වල ජලයෙහි ගුණාත්මය පරීක්ෂා කිරීම සිදු කරනු ලබන අතර එම දත්ත ඇසුරින් ජලයේ ගුණාත්මක භාවය ස්ථානීයව හා කාලීනව වෙනස් වන අයුරු අධ්‍යනය කිරීම සිදු කරනු ලැබේ.

### 2.2.1 මූල්‍ය ප්‍රගතිය

| අනු අංකය | විස්තරය | වෙන් කිරීම රු. මි. | ප්‍රගතිය රු. මි. |
|---|---|---|---|
| 1 | ප්‍රාග්ධන වියදම් | 2.500 | 2.500 |
| 2 | පුනරාවර්තන වියදම් | 18.833 | 21.502 |

**2018 වර්ෂයේ තැබූ ඉලක්ක හා අත්පත් කරගත් ප්‍රගතිය**



### 2.2.2 ජාතික ආර්ථිකයට හා සමාජයට ලබාදුන් දායකත්වය

ගංගා ද්‍රෝණි කළමනාකරණ කාර්යාලය මගින් සැලකිය යුතු මූල්‍යමය ඉපයීමක් ඍජු ලෙසම සිදු නොකරන නමුත් ජාතික ආර්ථිකය සහ සමාජීය ප්‍රගමනය කෙරෙහි වක්‍ර දායකත්වයක් ලබා දෙයි. ජල තත්ව විද්‍යාගාරයේ ක්‍රියාත්මක වීම මගින් පාරිසරික වශයෙන් ජලයේ සිදුවන ගුණාත්මකභාවයන්හි විචල්‍යයන් පහසුවෙන් හඳුනාගැනීමේ හැකියාව ලැබී ඇති අතර මෙම විචල්‍යයන්ගේ දීර්ඝ කාලීන හැසිරීම් අධ්‍යනය කිරීම තුළින් පරිසරයට මූලිකව එකතුවී ඇති පරිසර දූෂකයන්ද නිගමනය කිරිමේ හැකියාව ලැබේ. එය වඩාත් නිවැරදිව හඳුනාගැනීම තුළ ඊට නිසි ක්‍රියාමාර්ගයන්ට එළඹීමේ හැකියාවද ලැබෙන අතර එය අනාගත පරපුර සඳහා වන පාරිසරික ආයෝජනයක්ද වේ.

සෞඛ්‍ය සම්පන්න සමාජයක් උදෙසා ජලයේ ගුණාත්මකභාවය පවත්වාගැනීමේ අවශ්‍යතාවය, ජල දූෂණය වලක්වා ගැනීමේ අතිශය වැදගත්කම හා ඒ සඳහා ගතහැකි ක්‍රියාමාර්ග පිලිබඳව ප්‍රජාව හා විශේෂයෙන් පාසල් සිසුන් දැනුවත් කිරීම හරහා ආකල්පමය වෙනසක් තුලින් ජල මූලාශ්‍ර වල පවිත්‍රතාවය රැකගැනීමට දායකත්වය ලබා දෙයි. මෙම දැනුවත් කිරිමේ වැඩසටහන් බොහෝ විට ග්‍රාමීය හා වකුගඩු රෝගයන්ගෙන් පිඩා විඳින්නා වූ ප්‍රදේශයන් තුළ දියත් කිරිම මගින් එම ප්‍රදේශවල ජනතාවගේ සෞඛ්‍ය තත්ත්වයන් නගා සිටුවීමට ප්‍රබල පිටිවහලක්ද සපයනු ලැබේ.

තත්ව පාලන පරීක්ෂණ සිදුකිරීම මගින් ප්‍රමිතිය නියමිත මට්ටමට නොමැති ඉදිකිරීම් හඳුනාගැනීමට හැකිවන අතර ඒවා යථාවත් කිරිම සඳහා ඒ අවස්ථාවේදීම පිලියම් යෙදීමට මග පාදාගත හැකිවේ. එමගින් නිර්මිත වල ආයුකාලය සැලසුම් කල පරිදි පවත්වාගත හැකිවන අතර වරින්වර අළුත්වැඩියා කිරීමේ අවශ්‍යතාවය අවම කරවයි. එනිසා ඒවායේ ප්‍රතිලාභ ප්‍රජාව වෙත අඛණ්ඩව ලබාදීමට හැකියාව ලැබෙන අතර ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා දැරිය යුතු පිරිවැය අවම කරගැනීමටද හැකියාව ලැබේ. එය රටෙහි නිෂ්පාදන ආර්ථිකය කෙරෙහි ධනාත්මක බලපෑමක් ඇති කරයි.

## 2.3 මූලික වැඩ පාලන ක්‍රියාකරවුම් හා නඩත්තු අංශය

### 2.3.1 මෙම අංශයට පැවරී ඇති ප්‍රධාන කාර්යයන්

**පරිපාලනය** - වේලි හා ජලාශ වල ජලදේහය, ස්වාරක්ෂක කලාපය(100m Buffer zone) හා ඊට අයත් රක්ෂිත ආරක්ෂා කර ගැනීම උදෙසා වූ රෙගුලාසි ක්‍රියාත්මක කරමින් ජලාශ හා රක්ෂිත වලට අයත් බල ප්‍රදේශ පරිපාලන කටයුතු කිරීම.

**ක්‍රියාකරවීම** - ජල කළමණාකරණ ලේකම් කාර්යාලයෙන් නිතිපතා ගන්නා තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා ජලාශ හා අන්තර් නිම්න ඇල මට්ටමේ සොරොව් ගේට්ටු ක්‍රියාත්මක කිරීම හා ජලාශවල ඉහල සහ පහල නිම්නවල ගංවතුර අවම කරලීම පිණිස ගංවතුර පාලනය සඳහා ගේට්ටු ක්‍රියාකරවීම.

**නඩත්තුව** - ජලාශ හා එම ජලාශ වලට අනුබද්ධිත වේලි, ගේට්ටු, ජලාශ පර්යන්ත ප්‍රදේශ හා ජලාශයට අනුබද්ධිත සියලු නිර්මිතයන් අන්තර්ජාතික ප්‍රමිතීන්ට අනුව (ICOLD) නඩත්තු කිරීම මෙන්ම වැඩිදියුණු කිරීම.

### 2.3.2 ප්‍රධාන වේලි හා ජලාශ මෙහෙයුම් අංශයෙන් පාලනය වන ජලාශ

| ජලාශ | නඩත්තු කරනු ලබන අංගයන් |
|---|---|
| කොත්මලේ | වේල්ල, වාන්දොරටු, සියලුම සොරොව් ගේට්ටු සහ ජලාශ පර්යන්ත ප්‍රදේශ |
| පොල්ගොල්ල හැරවුම | වේල්ල, වාන්දොරටු, සියලුම සොරොව් ගේට්ටු සහ උමං මාර්ග |
| බෝවතැන්න | වේල්ල, වාන්දොරටු, සියලුම සොරොව් ගේට්ටු සහ ජලාශ පර්යන්ත ප්‍රදේශ |
| දඹුලු ඔය | වේල්ල, වාන්දොරටු, සියලුම සොරොව් ගේට්ටු සහ ජලාශ පර්යන්ත ප්‍රදේශ |
| කණ්ඩලම | වේල්ල, වාන්දොරටු, සියලුම සොරොව් ගේට්ටු සහ ජලාශ පර්යන්ත ප්‍රදේශ |
| කලාවැව | වේල්ල, වාන්දොරටු, සියලුම සොරොව් ගේට්ටු සහ ජලාශ පර්යන්ත ප්‍රදේශ |
| වික්ටෝරියා | වේල්ල, වාන්දොරටු, සියලුම සොරොව් ගේට්ටු සහ ජලාශ පර්යන්ත ප්‍රදේශ |
| රන්දෙනිගල | වේල්ල, වාන්දොරටු, සියලුම සොරොව් ගේට්ටු සහ ජලාශ පර්යන්ත ප්‍රදේශ |
| රන්ටැඹේ | වේල්ල, වාන්දොරටු, සියලුම සොරොව් ගේට්ටු සහ ජලාශ පර්යන්ත ප්‍රදේශ |
| මිණිපේ අමුණ | සොරොව් ගේට්ටු, වාන්දොරටු, අන්තර් නිම්න ඇල, බදුලු ඔය ජල පාලම, උමං මඟ සහ ජල පැන්නුම් වල නිර්මිත |
| ලොග්ගල්ඔය, හැපොල ඔය හා දිහබාන ඔය මට්ටම් පැන්නුම් | වේල්ල, වාන්දොරටු, සියලුම සොරොව් ගේට්ටු සහ ජලාශ පර්යන්ත ප්‍රදේශ |
| උල්හිටිය-රත්කිඳ | වේල්ල, වාන්දොරටු, සියලුම සොරොව් ගේට්ටු සහ ජලාශ පර්යන්ත ප්‍රදේශ |
| මාදුරුඔය | වේල්ල, වාන්දොරටු, සියලුම සොරොව් ගේට්ටු සහ ජලාශ පර්යන්ත ප්‍රදේශ |
| උඩවලව | වේල්ල, වාන්දොරටු, සියලුම සොරොව් ගේට්ටු සහ ජලාශ පර්යන්ත ප්‍රදේශ |
| චන්ද්‍රිකාවැව | වේල්ල, වාන්දොරටු, සියලුම සොරොව් ගේට්ටු සහ ජලාශ පර්යන්ත ප්‍රදේශ |
| මොරගහකන්ද | වේල්ල, වාන්දොරටු, සියලුම සොරොව් ගේට්ටු සහ ජලාශ පර්යන්ත ප්‍රදේශ |

### 2.3.3 ජලාශ ආශ්‍රිත පරිසර සංරක්ෂණ කටයුතු

| අනු අංකය | විස්තරය | භෞතික ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය රුපියල් |
|---|---|---|---|
| 01 | ඩෙංගු මර්ධන ශ්‍රමදාන වැඩසටහන් දිගන, නිලගම සහ කාර්යාල පරිශ්‍රය | 5 | 47,244.00 |
| 02 | වික්ටෝරියා සහ පොල්ගොල්ල ජලාශ රක්ෂිතයේ ප්ලාස්ටික් සහ පොලිතීන් ඉවත්කිරීමේ ශ්‍රමදාන වැඩසටහන් | 3 | 34,605.00 |
| 03 | වික්ටෝරියා ජලාශ රක්ෂිතයේ ප්ලාස්ටික් සහ පොලිතීන් ඉවත් කිරීමේ මාසික වැඩසටහන් | 12 | 180,000.00 |
| 04 | ජලාශ රක්ෂිතයේ උණපැල සිටුවීම | පැල 1000 | 70,000.00 |
| අනු අංකය | විස්තරය | භෞතික ප්‍රගතිය | මූල්‍ය ප්‍රගතිය රුපියල් |
| 05 | ජලාශ රක්ෂිතයේ වනවගා පැල සිටුවීම් | පැල 2260 | 100,250.00 |
| 06 | කාර්යාල පරිශ්‍රවල ගෙවතු වගා කිරීම් | පැල 410 | 75,350.00 |
| 07 | කර්මාන්ත හා පරිසර දූෂණ ආයතන සහ ස්ථාන සම්බන්ධ ක්ෂේත්‍ර පරීක්ෂාවන් | 50 | 20,000.00 |
| 08 | ඩෙංගු කමිටු, පරිසර කමිටු සහ සම්බන්ධීකරණ කමිටු සඳහා සක්‍රීය දායකත්වය සැපයූ වැඩසටහන් | 40 | 20,000.00 |
| | එකතුව | | 547,449.00 |

# 2018 වර්ෂයේ තැබූ ඉලක්ක හා ලබාගත් ප්‍රගතිය (මූල්‍ය හා භෞතික)

## ඉදිකිරීම් හා තාක්ෂණ අංශය

| අනු අංකය | විස්තරය | | භෞතික | | මූල්‍ය රුපියල් මිලියන | |
|---|---|---|---|---|---|---|
| | | | ඉලක්කය | ප්‍රගතිය | ඉලක්කය | ප්‍රගතිය |
| 01 | කාර්යාල හා නිවාස ගොඩනැගිලි ඉදිකිරීම හා වැඩිදියුණු කිරීම | | ගොඩනැගිලි ගණන 20 | ගොඩනැගිලි ගණන 20 | 37.630 | 29.939 |
| 02 | ජල සැපයුම යෝජනා ක්‍රම නඩත්තුවමෙහෙයවීම (කොත්මලේ,බෝවතැන්න, මාදුරුඔය,රන්දෙනිගල,උඩවල) | | යෝජනා ක්‍රම 05 | යෝජනා ක්‍රම 05 | 8.460 | 10.694 |
| 04 | නිල නිවාස, කඳවුරු නඩත්තු කිරීම හා සුළු අලුත්වැඩියා කටයුතු කිරීම (කාර්යභාර ඉංජිනේරු කාර්යාල වලට අයත් කඳවුරු ඇතුළුව) | | 60 | 56 | 47.184 | 54.500 |
| 05 | ජලාශ හා වේලි නඩත්තු කටයුතු(වේලි පරිවය) දෙවන වර වැඩුනු කැලෑ කපා පිරිසිදු කිරීම | | හෙක්. 400 | හෙක්. 400 | 93.042 | 94.156 |
| 06 | වේලි ආරක්ෂණ කටයුතු ගේට්ටු අලුත්වැඩියා කටයුතු | | ගේට්ටු 64 | ගේට්ටු 64 | 66.955 | 73.081 |
| 07 | ප්‍රධාන ජලාශවලට අදාල යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය කිරීම | සුදු ගඟ ඉවුරු ආරක්ෂා කිරීම සඳහා පැති බැම්ම ඉදිකිරීම | දිග මී. 40 | දිග මී. 40 | 3.00 | 2.683 |
| | | ලොග්ගල් ඔය පිටවාන් ජලය පිටවන ඇල (Tail canal) ප්‍රතිසංස්කරණය කිරීම | දිග මී. 40 | දිග මී.25 | 4.00 | 2.683 |
| | | උල්හිටිය වේල්ලේ කාන්දු ජලය බැස යන කාණුව (Toe drain) ප්‍රතිසංස්කරණය කිරීම | දිග මී. 48 | දිග මී.46 | 1.00 | 0.974 |
| | | අන්තර් නිම්න ඇළ මාර්ග (TBC) ප්‍රතිසංස්කරණය | දිග මී. 90 | දිග මී.86 | 0.5 | 0.468 |
| 08 | කර්මාන්තශාලා යන්ත්‍රෝපකරණ සහ යන්ත්‍ර | | 17 | 15 | 10.268 | 8.551 |
| 09 | වාහන අලුත්වැඩියා කටයුතු | | 80 | 76 | 18.731 | 18.580 |
| 10 | කාර්යාලීය උපකරණ හා කම්හල් උපකරණ සපයා ගැනීමේ කටයුතු | | 76 | 48 | 14.230 | 6.168 |
| | එකතුව | | | | **305.00** | **302.47** |

## 2018 වර්ෂය තුල සිදුකල විශේෂ ප්‍රගතිය හා ඒ තුලින් ජාතික ආර්ථිකයට සිදුකල දායකත්වය

| අනු අංකය | ජලාශය | විදුලිබල නිශ්පාදනය සඳහා ජලය සැපයීම (MCM) | විදුලිබල නිශ්පාදන ධාරිතාවය (KWH) | ජාතික ආදායම (රුපියල්මිලියන) |
|---|---|---|---|---|
| 01 | වික්ටෝරියා kwh සඳහා රු. 18.50 | 2115.08 | $863.91 \times 10^6$ | 13,978.00 |
| 02 | රන්දෙනිගල kwh සඳහා රු. 18.50 | 2055.98 | $418.35 \times 10^6$ | 5,783.66 |
| 03 | රන්ටැඹේ kwh සඳහා රු. 18.50 | 2204.92 | $201.66 \times 10^6$ | 2,799.63 |
| 04 | කොත්මලේ kwh සඳහා රු. 18.50 | 1071.88 | $590.51 \times 10^6$ | 10,924.44 |
| 05 | බෝවතැන්න kwh සඳහා රු. 18.50 | 680.884 | $83.47 \times 10^6$ | 1,544.30 |
| 06 | මාදුරුඔය kwh සඳහා රු. 18.50 | 88.65 | $15.33 \times 10^6$ | 182.86 |
| 07 | පොල්ගොල්ල kwh සඳහා රු. 18.50 | 1117.418 | $195.93 \times 10^6$ | 3,526.74 |
| 08 | මොරගහකන්ද kwh සඳහා රු.18.50 | 652.07 | $54.50 \times 10^6$ | 977.84 |
| එකතුව | | | | **39,717.47** |

## <u>කෘෂිකර්මික කටයුතු සඳහා ජලය නිකුත් කිරීම</u>

| අනු අංකය | ජලාශය | | සපයන ලද ජල ධාරිතාවය සණ මීටර් මිලියන (MCM) |
|---|---|---|---|
| 01 | පොල්ගොල්ල හැරවුම (බෝවතැන්න ජලාශයට) | | 1,110.176 |
| 02 | මිණිපේ ඇල | වම් ඉවුර | 19.40 |
| | | දකුණු ඉවුර | 911.976 |
| 03 | මොරගහකන්ද ජලාශය | | 652.07 |
| 04 | උඩවලව | වම් ඉවුර | 453.287 |
| | | දකුණු ඉවුර | 467.787 |
| | | එකතුව | **3,614.696** |

## 2.4 ජල කළමනාකරණ ලේකම් කාර්යාලය


ජල කළමනාකරණ ලේකම් කාර්යාලය මගින් වාර්ෂික යල සහ මහ කන්නයන් සඳහා මෙහෙයුම් ප්‍රතිපත්ති නිර්දේශ කර මහවැලි පද්ධති සඳහා මෙහෙයුම් සැලසුම් සකස් කිරීම සිදුකරන අතර මෙය මූලික ලෙස වාරිමාර්ග හා බලශක්ති අවශ්‍යතා මත පදනම් ව ප්‍රධාන ලෙස වී හා අතුරු වැවිලි නිෂ්පාදන බෝග නිෂ්පාදනය සඳහා පුළුල් දායකත්වයක් ලබා දෙන ජාතික වැඩසටහන වේ. මෙය සඳහා අවශ්‍ය තාක්ෂණික විශේෂඥ උපදෙස් සපයන ඒකකයක් ලෙස ජල පාලන ලේකම් කාර්යාලය මගින් ජල පාලන කමිටුවට අයත් සාමාජික ආයතන සම්බන්ධීකරණය කර ගනිමින් සියලු මෙහෙයුම් සැලසුම් සතිපතා අධීක්ෂණය කරමින් එහි ප්‍රගතිය සමාලෝචනය හා ඉදිරි සති ජල මෙහෙයුම් සැළසුම් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය උපදෙස් සැපයීම සිදුකරන අතර, එය කෘෂි විදුලි හා පානීය ජල අවශ්‍යතා ද සලකමින් සමස්ථ පද්ධතිය තුළ නිර්දේශිත ජල අවශ්‍යතාවය සපුරාලීම සඳහා කටයුතු කරනු ලබන්නකි.

### 2.4.1 2017 මහ කන්නය (2017 ඔක්. 01- 2018 මාර්තු 31)

2017/2018 මහ කන්නය සඳහා වූ මහවැලි ජල පාලන කමිටු රැස්වීම 2017 ඔක්තෝම්බර් මස 04 දින පේරාදෙණිය ගන්නෝරුව පැළැටි හා ජාන සම්පත් මධ්‍යස්ථානයේදී පවත්වන ලදි. ඒ වන විට පද්ධතියේ අපේක්ෂිත සියලු ජලාශ වල සක්‍රීය ජල මට්ටම කොත්මලේ, වික්ටෝරියා 36%, වලව 9.5%, හුරුළුවැව 7.5%, මාදුරුඔය 11.2% ලෙස පහත් මට්ටමක පැවතීය.


ඒ වන විට ලැබී තිබූ දෙවන අන්තර් මෝසම් හා ඊසාන දිග මෝසම් වැසි අපේක්ෂිත ප්‍රදේශවලට ලැබී නොතිබීම හේතු කොට ජලය නිකුත් කිරීම ප්‍රමාද කරන ලෙස දන්වන ලද අතර ඒ අනුව ජලය නිකුත් කිරීම කලාප ජී, ඩී 01, 2017 දෙසැම්බර් 15 තෙක් ප්‍රමාද කරමින් ආරම්භ කිරීමට සිදුවිය. ඒ අනුව 2017/18 මහ කන්නයේ මුළු වගා වපසරිය හෙක්. 127,466 වූ අතර, එය සමස්ථ ලෙස 71% පමණ විය.

තවද මහවැලි පද්ධතියට අලුතින් එක්වූ ඉදිකිරීම් කටයුතු නිමවෙමින් පැවති මොරගහකන්ද ජලාශයේ වේලි බැම්ම හා එම ගේට්ටු හා විදුලි ජනක යන්ත්‍රවල සමීක්ෂණ කටයුතු සඳහා ජලාශය පිරවීමට මෝසම් වැසි හා හැරවුම් ජලය උපයෝගී කර ගත් අතර, 2017 දෙසැම්බර් 29 දින වනවිට එම ජලාශයේ සක්‍රීය ජල ධාරිතාවය 98.7% දක්වා ඉහළ දැමීන.මෙම කන්නය තුළ මහවැලි පද්ධතියෙන් ගිගාවොට් පැය 300 ක විදුලි බල උත්පාදනයක් සිදුකරන ලදි. විදුලි බල උත්පාදන ප්‍රගතිය 2017/18 මහ කන්නය තුළ පැවති ආකාරය පළමුවන රූප සටහනින් දැක්වේ.




පළමුවන රූප සටහන

ජල පාලන කමිටුව යටතේ ඇති කලාපවල 2017/18 මහ කන්නයේ වගාව සැලසුම හා එහි ප්‍රගතිය දෙවන රූප සටහනින් දැක්වේ.





දෙවන රූප සටහන

## 2.4.2 2017 යල කන්නය (2018 අප්‍රේල් 01- 2018 සැප්. 30)

2018 යල කන්නය සඳහා වූ මහවැලි ජල පාලන කමිටු රැස්වීම 2018 අප්‍රේල් මස 06 දින පේරාදෙණිය ගන්නෝරුව පැලැටි හා ජාන සම්පත් මධ්‍යස්ථානයේදී පවත්වන ලදි. ඒ වනවිට කොත්මලේ ජලාශයේ සක්‍රීය ජල මට්ටම 35.0% ද මාදුරුඔය 57.4% ද, කලාවැව 35.6% ද, හුරුළුවැව 2.9% ලෙස පහත ජල මට්ටමක් පැවති අතර පරාක්‍රම සමුද්‍රය ජල මට්ටම උපරිම ජල මට්ටම ආසන්නව පැවතිනි.


එබැවින් සමස්ථයක් ලෙස IH, MH, H කලාප වල 50-60% උපරිම සීමාවකට ද, පරාක්‍රම සමුද්‍රය, කන්තලේ, අල්ලෙයි, මාදුරුඔය, රාජාංගනය 100% ලෙසද යොජිත විය. ඒ අනුව 2018 යල කන්නයේ මුලු වගා වපසරිය හෙක්. 174,808 වූ අතර එය ආසන්න ලෙස මුලු වගාවෙන් 91.25% ක ප්‍රමාණයක් විය.

මෙම කන්නය තුළ මහවැලි පද්ධතියෙන් ගිගාවොට් පැය 522 ක විදුලිබල උත්පාදනයක් සිදුකරන ලදි. විදුලිබල උත්පාදන ප්‍රගතිය 2018 යල කන්නය තුළ පැවති ආකාරය තුන්වන රූප සටහනින් දැක්වේ.




තුන්වන රූප සටහන

ජල පාලන කමිටුව යටතේ පවතින කලාපවල 2018 යල කන්නයේ සැලසුම හා ලබාගත් ප්‍රගතිය සිව්වැනි රූප සටහනින් දැක්වේ.




සිව්වැනි රූප සටහන


## 2.4.3 2018/2019 මහ කන්නය (2018 ඔක්තෝම්බර් 01- 2019 මාර්තු 31 දක්වා)

2018/19 මහ කන්නය සඳහා වූ මහවැලි ජල පාලන කමිටුව 2018 ඔක්තෝම්බර් 19 දින පේරාදෙණිය ගන්නෝරුව ජාතික කෘෂිකර්ම තොරතුරු සන්නිවේදන මධ්‍යස්ථානයේදී පැවැත්වූ අතර, ඒ වන විට පද්ධතියේ අපේක්ෂිත සියලු ජලාශවල සක්‍රීය ජල මට්ටම කොත්මලේ 87.2%, වික්ටෝරියා -83.1%, මොරගහකන්ද 42.9%, වලව 55.5%, හුරුළුවැව 23.5%, මාදුරුඔය 38.9% ලෙස පැවතීය.

ඒ වන විට ලැබී තිබූ දෙවන අන්තර් මෝසම් හා ඊසාන දිග මෝසම් වැසි අපේක්ෂිත ප්‍රදේශවලට ලැබී තිබීම හේතු කොට ජලය නිකුත් කරන ලෙස දන්වන ලද අතර, ඒ අනුව ජලය නිකුත් කිරීම, 2018


ඔක්තෝම්බර් මැද භාගය වන විට ආරම්භ කිරීමට හැකි විය. ඒ අනුව 2018/19 මහ කන්නයේ මුලු වගා වපසරිය හෙක්. 191,561 වූ අතර එය සමස්ථයක් ලෙස 100% විය.

මෙම කන්නය තුළ මහවැලි පද්ධතියෙන් ගිගාවොට් පැය 509 ක විදුලිබල උත්පාදනයක් සිදුකරන ලදි. විදුලිබල උත්පාදන ප්‍රගතිය 2018/19 මහ කන්නය තුළ පැවති ආකාරය පස්වන රූප සටහනින් දැක්වේ.




පස්වන රූප සටහන

ජල පාලන කමිටුව යටතේ ඇති තලාප වල 2018/19 මහ කන්නයේ වගාව සැලසුම හා එහි ප්‍රගතිය හයවන රූප සටහනින් දැක්වේ.




හය වන රූප සටහන

## 2.5 ඉඩම් පරිහරණ සැලසුම් අංශය

### හැඳින්වීම:

මහවැලි බල ප්‍රදේශ තුළ තිරසාර සංවර්ධනය අරමුණු කරගත් භෞතික, ආර්ථික, සමාජයීය සංවර්ධනය හා පරිසර කළමනාකරණ ඉලක්ක ඔස්සේ ඒකාබද්ධ සැලසුම්කරණය ඉඩම් පරිහරණ සැලසුම් අංශයේ කාර්යභාරයයි. මහවැලි මහසැලැස්ම අනුව සංවර්ධන ප්‍රදේශ වල ස්වභාවය අධ්‍යයනය කර අනාගත සංවර්ධන ඉලක්ක සඳහා පුරෝකථනයන් සිදුකර ව්‍යුහාත්මක සැලසුම්, කලාපීය සැලසුම්, නැවත පදිංචි කිරීමේ සැලසුම්, නගර හා ග්‍රාමීය මධ්‍යස්ථාන සැලසුම් සකස් කිරිමට කටයුතු කරනු ලබයි.

### 2.5.1 ඉඩම් පරිහරණ සැලසුම් අංශයේ මූලික කාර්යය.

1. සංවර්ධන ව්‍යාපෘති සඳහා ඉඩම් හඳුනාගැනීම
2. සංවර්ධන ව්‍යාපෘති ප්‍රදේශ වල මූලික දත්ත රැස්කිරීම, විශ්ලේෂණය හා පුරෝකථනයන් සිදුකිරීම
3. ව්‍යාපෘති ප්‍රදේශ වලට අදාළ සංවර්ධන සැලසුම් සකස් කිරීම
4. මහවැලි බල ප්‍රදේශ වල සැලසුම් යාවත්කාලීන කිරීම
5. තිරසාර භූමි භාවිතය තහවුරු කරමින් ඉඩම් බෑහැර කිරීම් සඳහා වන භෞතික සැලසුම් නිර්දේශ ලබාදීම
6. අනවසර ඉඩම් අත්පත් කරගැනීම පාලනය හා සංවේදී පරිසර පද්ධති හා රක්ෂිත ප්‍රදේශ ආරක්ෂා කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කිරිම.

## 2.5.2 2018 වර්ෂයේ ඉලක්ක හා ප්‍රගතිය

| ක්‍රියාකාරකම | වාර්ෂික මුදල් වෙන්කිරීම (රු.මි.) | 2018.12.31 දක්වා වූ ඉලක්ක | | 2018.12.31 දක්වා වූ ප්‍රගතිය | |
|---|---|---|---|---|---|
| | | මූල්‍ය (රු.මි.) | භෞතික | මූල්‍ය (රු.මි.) | භෞතික |
| වැව් 09 ක රක්ෂිත මායිම් භූමියේ සළකුණු කිරීම | 1.84 | 1.84 | වැව් 09 ක් | 1.79 | වැව් 09 ක රක්ෂිත සළකුණු කර ඇත. |
| කොට්ඨාශ සැලසුම් යාවත්කාලීන කිරීම | 0.64 | 0.64 | සැලසුම් ඒකාබද්ධ කිරීම | 0.54 | සැලසුම් ඒකාබද්ධ කිරීම කර ඇත. |
| වැව් 18 ක රක්ෂිත මායිම් මැනුම් කිරීම. | 14.29 | 14.29 | වැව් 18 ක් | 10.644 | වැව් 18 ක රක්ෂිත මැනුම් කර ඇත. |
| මහවැලි ගඟ මීටර් 60 රක්ෂිත සීමා මැනුම් කිරීම | 1.0 | 1.0 | මහවැලි ගඟ මීටර් 60 රක්ෂිතය කි.මී. 50 ක | 1.0 | කි.මී. 50 ක මැනුම් කටයුතු අවසන් කර ඇත. |
| සිතියම් ස්කෑන් කිරීම හා විද්‍යුත් දත්ත පද්ධති සැකසීම, මුද්‍රණය, මූලික දත්ත සමීක්ෂණය, ක්ෂේත්‍ර පරීක්ෂණ සහ නගර සංවර්ධන සැලසුම් කටයුතු | 2.7 | 2.7 | ඊ කලාපය ආශ්‍රිත සමීක්ෂණ | 2.479 | ඊ කලාපය ආශ්‍රිත සමීක්ෂණ අවසන් කර ඇත |
| කට්ටි සැලසුම් සකස් කිරීම | 1.8 | 1.8 | හුරුළු වැව කලාපයේ කට්ටි සැලසුම් 01 | 1.75 | කට්ටි සැලසුම් සකස් කර ඇත |
| ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම | 0.825 | 0.825 | ඊ කලාපය ආශ්‍රිත ව්‍යාපෘති යටිතල පහසුකම් ක්‍රියාත්මක කිරීම | 0.821 | ඊ කලාපයේ යටිතල පහසුකම් ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත |
| ප්ලොටර් යන්ත්‍රය මිළදී ගැනීම | 1.563 | 1.563 | යන්ත්‍ර 01 ක් | 1.563 | යන්ත්‍ර 01 ක් මිළදී ගෙන ඇත. |
| | **24.658** | **24.658** | | **20.587** | |

## 2.5.3 2018 වර්ෂයේ නිම කරන ලද කාර්යයන්

- **මහවැලි ගඟ මීටර් 60 රක්ෂිත සීමා සළකුණු කිරීම**

1986.12.26 දිනැති ගැසට් පත්‍රය මගින් ප්‍රකාශිත මහවැලි ගඟ මීටර් 60 රක්ෂිත සීමාව භූමිය තුල ස්ථාපිත කර නොමැති වීම හේතුවෙන් රක්ෂිත ප්‍රදේශ දැඩි ලෙස අනවසරකරුවන්ගේ ග්‍රහණයට හසුවීම ක්‍රමිකව සිදුවෙමින් පවතී. මෙම තත්ත්වය හේතුවෙන් ගං ඉවුරු ඛාදනය, ජල පෝෂක ප්‍රදේශ හායනයට ලක්වීම මෙන්ම අනවසර
ඉදිකිරීම් හේතුවෙන්ගං ඉවුරු ආශ්‍රිත සංවේදී පරිසර පද්ධති විනාශ වී යාමද සිදුවෙමින් පවතී.

මෙම තත්ත්වය වැළැක්වීම හා අනවසර ඉඩම් භාවිතයන්ගෙන් මහවැලි ගඟ රක්ෂිත ප්‍රදේශ ආරක්ෂා කිරීම අරමුණු කර ගනිමින් මීටර් 60 රක්ෂිත ප්‍රදේශ මැන සළකුණු කිරීම කි.මී. 50 ක කොටසක පමණක් අවසන් කර ඇත.

## 2.5.4 වැව් රක්ෂිත සීමා මැනුම් කිරීම

එක් එක් කලාප මට්ටමින් පවතින වැව් ආශ්‍රිත රක්ෂිත සීමා සලකුණු කිරීම සිදුකරනු ලබන අතර 2018 වර්ෂය තුළ වැව් 18 ක රක්ෂිත සීමා මැන අවසන් කර ඇත. එම තොරතුරු පහත පරිදි වේ.


| **කලාපය** | **මැනුම් කරන ලද වැව් ප්‍රමාණය** |
|---|---|
| බී කලාපය | 02 |
| සී කලාපය | 05 |
| එච් කලාපය | 02 |
| එල් කලාපය | 03 |
| වලව කලාපය | 04 |
| හුරුළු වැව කලාපය | 02 |
| **එකතුව** | **18** |

- <u>වැව් රක්ෂිත සීමා සලකුණු කිරීම</u>

2017 වර්ෂයේ රක්ෂිත සීමා මැනුම් කටයුතු අවසන් කරන ලද වැව් 09 ක මායිම් ගල් යොදා රක්ෂිත සීමා සළකුණු කිරීම කටයුතුද මෙම වර්ෂයේ අවසන් කර ඇත. තවද වැව් කිහිපයක රක්ෂිත ප්‍රදේශ සංරක්ෂණය සඳහා පැල සිටුවීම් කටයුතුද සිදු කෙරිනි.

- <u>නගර සැලසුම් යාවත්කාලීන කිරීම</u>

මහවැලි එල් කලාපයේ ප්‍රධාන නගර මධ්‍යස්ථානය වන සම්පත්නුවර නගරය වර්තමාන සංවර්ධන ප්‍රවණතා සැලකිල්ලට ගෙන පැරණි නගර සැලැස්ම යාවත්කාලීන කිරීම් කටයුතු සිදුකරන ලදී. එමෙන්ම එම සැලැස්ම එම කලාපයේ නගර සැලැස්මෙහි පාර්ශවකරුවන් වෙත ඉදිරිපත් කර අදහස් ලබාගැනීම් කටයුතුද සිදුකරන ලදී.



### 2.5.5 ඊ කලාපයේ සමාජ ආර්ථික සමීක්ෂණය


මිනිපේ වම් ඉවුර ඇළ ව්‍යාපෘතියට සමගාමීව මහවැලි මහ සැලැස්මට අනුව යෝජිත ඊ කලාපය ව්‍යාපෘති ප්‍රදේශ ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ විශේෂ ප්‍රදේශයක් ලෙස ගැසට් මගින් ප්‍රකාශයට පත්කර සංවර්ධනය කිරීමට යෝජිත වේ. ඒ අනුව මිනිපේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී වසම් 44 ක් හා විල්ගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී වසම් 27 ක් ඒකාබද්ධ කර මහවැලි ඊ කලාපය සංවර්ධනය කෙරේ.

හෙක්.21,800 ක භූමි ප්‍රදේශයක් ආවරණය වන පරිදි පවුල් 25,500 ක් සඳහා ප්‍රතිලාභ බෙදී යන පරිදි භෞතික, සමාජයීය, ආර්ථික හා පාරිසරික යන අංශ සංවර්ධනය කිරීම අරමුණු කරගත් සංවර්ධන සැලැස්මක් සකස් කිරීම සඳහා අවශ්‍ය මූලික තොරතුරු රැස් කිරීමට අදාලව සමාජ ආර්ථික සමීක්ෂණය සිදුකර අවසන් කර ඇත.


තවද ඊ කලාපයේ සංවර්ධනය කිරීමට අපේක්ෂිත බල ප්‍රදේශ සීමා සිතියම් ගත කිරීම හා එම කලාපයේ යටිතල පහසුකම් සංවර්ධනය අදාල කටයුතුද සිදුකරමින් පවතී.

### 2.5.6 අඹන නගර මධ්‍යස්ථාන සැලැස්ම සකස් කිරීම.

මොරගහකන්ද කලාපයට අයත් අඹන නගර මධ්‍යස්ථාන සැලැස්ම සකස් කිරීමේ කටයුතු අවසන් කර ඇත. වාණිජ කටයුතු සඳහා ඉඩම් වෙන්කිරීම, රෝහල පොළ භූමිය හා පුස්තකාල ගොඩනැගිල්ල යනාදිය ස්ථාපිත කෙරෙන ආකාරය නැවත සලකා බැලීමෙන් අනතුරුව සැලැස්ම සම්පූර්ණ කිරීම් සිදුකර ඇත.




මොරගහකන්ද කළුගඟ කෘෂිකාර්මික සංවර්ධන ව්‍යාපෘතියට සමගාමීව එම ප්‍රදේශයේ ප්‍රජාවගේ ආර්ථික තත්ත්වය ඉහල නැංවීම සඳහා කර්මාන්ත කලාපයක් ස්ථාපිත කිරීම සඳහා හෙක්. 21.1 ක භූමි ප්‍රමාණයක් පැපොල්වත්ත ප්‍රදේශයෙන් හඳුනාගෙන ඒ සඳහා සැලැස්මක් සකස් කිරීමට අදාල සම්බන්ධීකරණ කටයුතු කර්මාන්ත මණ්ඩලය සමග සිදුකර ඇත.




## 2.5.7 සංචාරක කලාප සංවර්ධන සැලැස්ම සකස් කිරීම.

මොරගහකන්ද කළුගඟ කෘෂිකාර්මික සංවර්ධන ව්‍යාපෘතියට සමගාමීව එම ප්‍රදේශයේ පවතින සංචාරක ආකර්ශණය ස්ථාන ඒකාබද්ධ කර කළුගඟ ආශ්‍රිත ප්‍රදේශයේ හෙක්. 408 ක භූමියක් හඳුනාගෙන එහි පුහුණු හා සේවා මධ්‍යස්ථානයක්,දේශීය ගම්මාන, පාපැදි හා ඇවිදින මංතීරු හා බෝට්ටු අංගන ඉදිකිරීමට යෝජිතය.



# 2.6 වන හා පරිසර අංශය

## 2018 මූල්‍ය ප්‍රතිපාදන වෙන්කිරීම හා ප්‍රගතිය

| අඅ/ | අංශය/ කලාපය | මූල්‍ය ප්‍රතිපාදන වෙන්කිරීම (රු.මි.) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | 2019 වර්ෂයේදී ගෙවීමට යොමුකළ බිල්පත් (රු.මි.) | එකතුව (රු.මි.) | ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| 01 | පරිසර හා වන සංරක්ෂණ අංශය- කොත්මලේ | 3500. | 30.66 | 2.67 | 33.33 | 95.2% |
| 02 | බී,සී,ඩී,ජී,එච්,වලව ,හුරුළුවැව, වික්ටෝරියා, රඹකැන්ඔය කලාප | 34.56 | 34.39 | 0 | 34.39 | 99.5 % |
| 03 | මහවැලි විශේෂ ව්‍යාපෘති වැලිඔය ඒකාබද්ධ ව්‍යාපෘතිය, | 13.91 | 7.72 | 0 | 7.72 | 55.5% |
| 04 | බී කලාපය දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපෘතිය (මල්වැන්න හා මහවැලිතැන්න) | 0.7 | 0 | 0.7 | 0.7 | 100% |
| | **එකතුව** | **84.17** | **72.77** | **3.37** | **76.14** | **90.5%** |

### 2.6.1 වන හා පරිසර අංශය මගින් 2018 වර්ෂයේදී ඉටු කරන ලද ක්‍රියාකාරකම්:

- ඉහළ පහළ මහවැලි ජල පෝෂක ඉහළ මහවැලි ජල පෝෂක ප්‍රදේශයේ නුවරඑළිය හා මහනුවර දිස්ත්‍රික්කවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 04 ක් ආවරණය කරමින් ගොවි පුහුණුව ඇතුළු ස්වභාවික සම්පත් කළමනාකරණ වැඩසටහන් 2018 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලදී.
- මහනුවර හා නුවරඑළිය දිස්ත්‍රික්කයේ බෑවුම් සහිත කෘෂිකාර්මික ඉඩම් වල පාංශු සංරක්ෂණය පිළිබඳ ගොවීන් දැනුවත් කිරීම හා පාංශු සංරක්ෂණ ක්‍රමවේදයන් අනුගමනය කිරීම වෙනුවෙන් ගෙවීම් සිදුකර දිරි ගැන්වීම තුලින් ගොවි බිම් වල පාංශු සංරක්ෂණය කිරීමේ වැඩ සටහන ක්‍රියාත්මක කරන ලදි .







යාන්ත්‍රික පාංශු සංරක්ෂණය - නෙත්ති කානු (හගුරන්කෙත උඩගල වසම)

යාන්ත්‍රික පාංශු සංරක්ෂණය - කුට්ටි කානු (පේරවත්ත නැගෙනහිර වසම)

- විවිධ රුක් රෝපණ වැඩසටහන් පරිසර හා වන සංරක්ෂණ අංශය මගින් ක්‍රියාත්මක කරනු ලැබූ අතර අනෙකුත් රාජ්‍යය ආයතන, ප්‍රදේශයේ පළාත් පාලන ආයතන, පාසල් මෙන්ම උනන්දුවක් දක්වන පරිසර සංවිධාන ද සමඟ එක්ව එවැනි වැඩසටහන් 32 ක් ක්‍රියාත්මක කරන ලදී.

- දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පේරවත්ත නැගෙනහිර ග්‍රාම නිලධාරී වසමේ හපුවැල්මාන ගම්මානය මෙවර හරිත ගම්මානයක් ලෙස සංවර්ධනය කිරීම ආරම්භ කරන ලදි .

- **ජලපෝෂක ප්‍රදේශයේ ගුණාත්මක බව ඉහළ නැංවීම සඳහා දිරිගැන්වීමේ වැඩසටහන**
  - i 50% ගොවි දායකත්වය යටතේ ගුණාත්මක රෝපණ ද්‍රව්‍යය ලබා දීම
  - ii. පුද්ගලික පැල තවාන් ඇති කිරීම
  - iii. ගෙවතු ආශ්‍රිත මී මැසි පාලන වැඩසටහන
  - iv. කොම්පෝසට් පොහොර නිෂ්පාදන වැඩසටහන

- **ආක්‍රමණශීලී ආගන්තුක ශාක මර්දන වැඩසටහන**

  කොත්මලේ ජලාශ රක්ෂිතයේ සංගිලි පාලම ප්‍රදේශයේ හෙක්ටහාර 01 ක් සහ කොත්මලේ ජලාශයේ වටද්දර ප්‍රදේශයේ හෙක්. 2ක් සහ බෝවතැන්න ජලාශ රක්ෂිතයේ වම්බටුයාය ප්‍රදේශයේ හෙක්. 7.13 ක යෝධ නිදිකුම්බා ආක්‍රමණික ශාක ඉවත් කිරීම ලියාපදිංචි ගොවි සංවිධාන වෙත සෘජු කොන්ත්‍රාත් පැවරීමෙන් සිදුකරන ලදි. මෙහිදී රුපියල් 111,709 ක මුදලක් 2018 වර්ෂයේ ප්‍රතිපාදන වෙන් කිරීමෙන් ගෙවීම් කරන ලදි. නිම කර ඇති කාර්යයන්ට අදාලව ගෙවීම් කලයුතුව ඇති රු. 819,435.23ක මුදලක් 2019 වර්ෂයේ ප්‍රතිපාදන යටතේ ගෙවීම් කිරීම සඳහා කටයුතු කරන ලදි.



දැනුවත් කිරීමේ නාම පුවරු සවි කිරීම - පොල්ගොල්ල





යෝධ නිධිකුම්බා ඉවත්කිරීම - බෝවතැන්න ජලාශ රක්ෂිතය

- ඉහළ මහවැලි ජල පෝෂක කළමනාකරණ වැඩසටහන යටතේ ජල පෝෂකයේ ජෛව විවිධත්වය වැඩිවන පරිදි ශාක ගහණය, වැඩි කිරීම හඳුනාගත් ප්‍රධාන කාර්යයකි ඒ .සඳහා, අවශ්‍ය විවිධ පැල වර්ග නිෂ්පාදනය කර ගැනීම නවදෙවිට මධ්‍යම පැල තවාන තුලදී සිදුකරනු ලබයි.
- පාරිසරික හා ජලාධාර කළමනාකරණය ප්‍රවර්ධනය සඳහා දොරගල හා පල්ලේකැලේ ප්‍රදේශවල පාරිසරික ප්‍රවර්ධන මධ්‍යස්ථාන 02 ක් පිහිටුවා ඇත.





2018 වර්ෂය තුළ වැඩිදියුණු කිරීම් කටයුතු හා ගොවිපළ තුළ කාබනික එළවළු නිෂ්පාදනය

## 2.6.1 මහවැලි පවිත්‍ර ගංගා වැඩසටහන

### 01. ජලවිද්‍යා අංශය (Hidrology Section)

ඉහළ මහවැලි ජලපෝෂකය තුල පිහිටි උප ජලපෝෂකයන්හි ජල කඳුරුවල, ප්‍රධාන ඔයවල් වල හා මහවැලි ගංගාවේ ගලා යන ජල ප්‍රමාණය එම ජල මාර්ග හරහා ගමන් කරන රොන්මඩ ප්‍රමාණය ගණනය කිරීම මෙම ක්‍රියාකාරකම් මඟින් සිදුකෙරේ .

### 02. ජලතත්ව අධ්‍යයනය

මෙම වැඩසටහන මඟින් ඉහළ මහවැලි ජලපෝෂකය තුල වෙනස්වන ඉඩම් පරිහරණ රටාවන්, විවිධ ජල පෝෂක ගැටළු හා සංරක්ෂණ වැඩසටහන් හමුවේ ඉහළ මහවැලි ජල පෝෂක ප්‍රදේශයේ උප ජලාධාර 02 ක එනම් කොත්මලේ හා පොල්ගොල්ල ජලාශවල ජලාධාර ප්‍රදේශ වල කොත්මලා ඔය, මහවැලි ගඟ හා එහි අතු ගංගා ඇතුළුව නිර්දේශිත ස්ථාන 19ක ජලයේ භෞතික හා රසායනික (chemical & physical), බැර ලෝහ (heavy metals), ක්ෂුද්‍ර ජීවීන් (Microbiology) පරාමිතීන් සඳහා ජල තත්ව අධ්‍යයනය 2018 වර්ෂය සඳහා සිදුකරන ලදී.

## 2.6.3 කසළ කළමනාකරණය සඳහා දැල් වැට ඉදිකිරීම

**කසළ කළමනාකරණය සඳහා කොත්මලේ ජලාශය ආශ්‍රිතව වැට ඉදිකිරීම මීටර් 87.4ක් හා පොල්ගොල්ල ජලාශය ආශ්‍රිතව කටුගස්තොට මීටර් 52ක වැටක් ඉදිකරන ලදී**




කොත්මලේ වේල්ල අසල වැට ඉදිකිරීම



කටුගස්තොට දැල් වැට ඉදි කිරීම.

## 2.6.4 අලිමිනිස් ගැටුම අවම කිරීමේ වැඩසටහන

- නේවාසික ව්‍යාපාර කාර්යාලය වටා කි.මි. 1.6 ක විදුලි වැට ඉදිකිරීමට අවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීම.
- සිංහපුර සූරියවැව විදුලිවැට නඩත්තුව සඳහා හා පැලැටියාව විදුලිවැට නඩත්තුව සඳහා අවශ්‍ය භාණ්ඩ ලබා දීම.
- ඉහළ ඇල්ලේවැව පාසල ඉදිරිපිට හා සුසාන භූමිය දෙපස යටි කැලය ඉවත් කිරීම සඳහා ශ්‍රමදානයක් පැවැත්වීම. අසේලපුර කොට්ඨාසයේ විදුලි වැට නඩත්තුව පිළිබඳ ශ්‍රමදානයක් පැවැත්වීම. ඇල්ලේවෙල රක්ෂිතය ආශ්‍රිතව අලි මිනිස් ගැටුම අවම කිරීමට අදාළව පාර දෙපස එළිපෙහෙළි කිරීම සඳහා ශ්‍රමදානයක් පැවැත්වීම.




ජීව අලි වැට

ජීව අලි වැට

## 2.6.5 පරිසර හා වන සංරක්ෂණ අංශය මගින් ඉටු කරනු ලබන වෙනත් විශේෂ කටයුතු

- පරිසර හා වන සංරක්ෂණ අංශය ක්ෂේත්‍ර කටයුතු වලට අමතරව මහවැලි අධිකාරිය මගින් ක්‍රියාත්මක කරනු ලබන මහා පරිමාණ ව්‍යාපෘතිවල පරිසර සංරක්ෂණ කටයුතුවල පරිසර අනුමැතියේ කොන්දේසි ක්‍රියාත්මක කරවීමට අදාල කටයුතු මෙහෙයවීම හා පසුවිපරම් කිරීම සහ මහවැලි අධිකාරිය මගින් ක්‍රියාත්මක කරවීමට යෝජිත ව්‍යාපෘතිවල තාක්ෂණික කමිටු, මෙහෙයුම් කමිටු හා ස්ථාවර කමිටු නියෝජනය කිරීම සිදුකරන ලබයි .
- පරිසර හා වන සංරක්ෂණ අංශය අනෙකුත් රාජ්‍ය ආයතන මගින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති සඳහා තාක්ෂණික කමිටුව නියෝජනය කිරිමද සිදුකරනු ලබයි .
- ජාතික පාරිසරික පනත යටතේ ව්‍යාපෘති අනුමත කිරීමේ ආයතනයක් ලෙස පාරිසරික බලපෑම් ඇගයීම් ක්‍රියාවලියේ පරිපාලනය කටයුතු හා පසුවිපරම් කටයුතු සිදුකිරීම.

# තුන්වන පරිච්ඡේදය

## සංවර්ධන අංශය

**සංවර්ධන අංශය ප්‍රධාන අංශ 05 කින් සමන්විත වන අතර එම අංශ පහත පරිදි වේ.**

**01. ඉඩම් අංශය**

**02. කෘෂිකර්ම සංවර්ධන අංශය**

**03. පශු සම්පත් සංවර්ධන අංශය**

**04. ආයතන සංවර්ධන අංශය**

**05. ව්‍යාපාර සංවර්ධන අංශය**

## 3.1 ඉඩම් අංශය

### 3.1 .1 හැඳින්වීම

සීමිත සම්පතක් වන ඉඩම් යහපත් කළමණාකරණ විධි මගින් මහවැලි බල ප්‍රදේශ තුල පදිංචි ප්‍රතිලාභී ජනතාවගේ ඉඩම් අයිතිය තහවුරු කිරීම තුළින් ඔවුන්ගේ ආර්ථික හා සමාජීය තත්වය වැඩි දියුණු කිරීමට දායකවීම.

### 3.1 .2 ඉඩම් අංශයේ කාර්යභාරය

01.ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ පුද්ගලයින් වෙත ඉඩම් ලබා දීම හා පසු කටයුතු.
02.රජයේ ඉඩම් ආඥා පනත යටතේ පුද්ගලයින් හා ආයතන වෙත ඉඩම් ලබා දීම හා පසු කටයුතු

### 3.1 .3 අවසරපත්‍ර ලබා දීම - ඉඩම් සංවර්ධන ආඥා පනත - 2018

| කලාපය | ඉලක්කය | ප්‍රගතිය |
|---|---|---|
| බී | 4500 | 2562 |
| සී | 4300 | 4257 |
| ඩී | 1000 | 145 |
| එච් | 2900 | 288 |
| එල් | 1600 | 1434 |
| වික්ටෝරියා | 100 | 24 |
| හුරුළුවැව | 500 | 92 |
| මොරගහකන්ද | 1000 | 705 |
| වලව | 3700 | 3597 |
| රඹකැන්ඔය | 1100 | 982 |
| **එකතුව** | **20,700** | **14,086** |

### 3.1 .4 ප්‍රදානපත්‍ර ලබා දීම - ඉඩම් සංවර්ධන ආඥා පනත -2018

| කලාපය | ඉලක්කය | ප්‍රගතිය |
|---|---|---|
| බී | 3800 | 1270 |
| සී | 4000 | 2478 |
| ඩී | 950 | 514 |
| එච් | 2000 | 374 |
| එල් | 1100 | 1065 |
| වික්ටෝරියා | 250 | 29 |
| හුරුළුවැව | 800 | 193 |
| මොරගහකන්ද | 750 | 385 |
| වලව | 4900 | 4638 |
| රඹකැන්ඔය | 200 | - |
| **එකතුව** | **18,750** | **10,946** |

### 3.1 .5 දීර්ඝ කාලීන බදුකර ලබා දීම - රජයේ ඉඩම් ආඥා පනත - 2018

| කලාපය | ඉලක්කය | ප්‍රගතිය |
|---|---|---|
| බී | 200 | 32 |
| සී | 80 | 64 |
| ඩී | 10 | - |
| එච් | 200 | 18 |
| එල් | 10 | - |
| වික්ටෝරියා | 70 | 43 |
| හුරුළුවැව | 10 | 4 |
| මොරගහකන්ද | 30 | 1 |
| වලව | 350 | 317 |
| රඹකැන්ඔය | 10 | - |
| **එකතුව** | **970** | **479** |

## 3.1 .5 රාජ්‍ය ආයතන සඳහා ඉඩම් ලබා දීම - 2018

| කලාපය | පැවරුම් නියෝග | | ඉඩම් භාරදීම | |
|---|---|---|---|---|
| | ඉලක්කය | ප්‍රගතිය | ඉලක්කය | ප්‍රගතිය |
| බී | 50 | 39 | 50 | - |
| සී | 20 | - | 10 | - |
| ඩී | 5 | - | 5 | - |
| එච් | 10 | - | 10 | - |
| එල් | 5 | - | - | 3 |
| වික්ටෝරියා | 10 | 2 | - | - |
| හුරුළුවැව | 20 | - | 20 | - |
| මොරගහකන්ද | 5 | 1 | 5 | - |
| වලව | 5 | 1 | 5 | 9 |
| රඹකැන්ඔය | 20 | - | 20 | - |
| **එකතුව** | **150** | **43** | **125** | **12** |

## 3.1 .6 රජයේ ඉඩම් ආඥා පනත යටතේ විහාරස්ථාන දීමනා පත්‍ර ලබා දීම - 2018

| කලාපය | ඉලක්කය | ප්‍රගතිය |
|---|---|---|
| බී | 50 | 15 |
| සී | 10 | 6 |
| ඩී | 5 | - |
| එච් | 20 | 1 |
| එල් | - | - |
| වික්ටෝරියා | 10 | - |
| හුරුළුවැව | 6 | - |
| මොරගහකන්ද | 5 | - |
| වලව | 5 | 4 |
| රඹකැන්ඔය | 5 | - |
| **එකතුව** | **116** | **26** |

### 3.1 .7 රජයේ ඉඩම් ආඥා පනත යටතේ නිවාස (දීමනාකර) ලබා දීම - 2018

| කලාපය | ඉලක්කය | ප්‍රගතිය |
|---|---|---|
| බී | 100 | - |
| සී | 10 | 3 |
| ඩී | 5 | - |
| එච් | 50 | 17 |
| එල් | 5 | - |
| වික්ටෝරියා | 100 | 75 |
| හුරුළුවැව | 4 | 1 |
| මොරගහකන්ද | 5 | 4 |
| වලව | 15 | 14 |
| රඹකැන්ඔය | 5 | - |
| එකතුව | **299** | **114** |

## 3.2 කෘෂිකර්ම සංවර්ධන අංශය

- ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් මහවැලි කලාප වල පදිංචි ගොවියන්ගේ ආර්ථිකය ඵලදායි ලෙස වැඩිදියුණු කිරිම උදෙසා පරිසර හිතකාමි කෘෂි තාක්‍ෂණික ක්‍රම හඳුන්වාදීම හා හුරුකිරීම සඳහා ගොවීන් පුහුණු කිරීම.

- ආහාර නිෂ්පාදන ජාතික ඉලක්කයන්ට අනුව මහවැලි වාරි හා වාරි නොවන ඉඩම් වල බෝග වගාව, සත්ව නිෂ්පාදනය හා කෘෂි ව්‍යාපාර ඇති කිරීම සඳහා වාර්ෂික ඉලක්කයන් සකසා ගැනීම.

- වාර්ෂික බෝග නිෂ්පාදන ඉලක්ක ලඟාකර ගැනීම සඳහා ලබාදෙන වාර්ෂික ප්‍රතිපාදන වලට අනුකූලව ව්‍යාප්ත ඉලක්ක හා උපක්‍රම සැලසුම් සකස් කිරීම, ඒවා කලාප මට්ටමින් සංවිධානය කිරීම, ක්‍රියාත්මක කරවීම, පසුවිපරම අධීක්‍ෂණය හා වාර්තා කිරීම.

- කෘෂිකාර්මික සංවර්ධන කටයුතු වලදී මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය, කෘෂිකර්ම, ග්‍රාමීය කටයුතු පශුසම්පත්, ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා අනෙකුත් රාජ්‍ය ආයතන හා පෞද්ගලික ආයතන හා සියළුම බාහිර ආයතන සම්බන්ධීකරණය කිරීම.

### 3.2.1 2018 වර්ෂයේ කෘෂි ඵලදායිතා වැඩසටහනේ භෞතික ප්‍රගතිය

| ක්‍රියාකාරකම | ඒකකය | ඉලක්කය | ප්‍රගතිය |
|---|---|---|---|
| වී වගා ප්‍රවර්ධනය | | | |
| යාය වැඩසටහන් | සංඛ්‍යාව | 278 | 209 |
| අස්වනු සමීක්ෂණ | සමීක්ෂණ | 614 | 600 |
| පැරෂුට් ක්‍රමයට වී වගා ව්‍යාප්තිය | හෙක්. | 17 | 17 |
| පත්‍ර වර්ණ දර්ශක භාවිතය | හෙක්. | 2,000 | 2,000 |
| ස්වයං බීජ වී නිෂ්පාදනය | හෙක්. | 2,447 | 2,603 |
| වෙනත් ක්ෂේත්‍ර භෝග | | | |
| බඩඉරිඟු වගා ආදර්ශන | සංඛ්‍යාව | 56 | 49 |
| සහන පදනම මත බඩඉරිඟු බීජ බෙදාදීම | කි. ග්‍රෑම් | 2,185 | 1,687 |
| සෝයා වගා ආදර්ශන | සංඛ්‍යාව | 11 | 11 |
| සෝයා අලෙවි ප්‍රවර්ධන වැඩසටහන | සංඛ්‍යාව | 2 | 1 |
| සෝයා බීජ නිෂ්පාදනය සඳහා ටාපොලීන් ලබාදීම | සංඛ්‍යාව | 50 | 43 |
| මව් බල්බ නිෂ්පාදනය සඳහා බීළුණු බීජ මිලදී ගැනීම | කි. ග්‍රෑම් | 112 | 113 |
| බීළුණු මව් බල්බ වසන්තිකරණය | කි. ග්‍රෑම් | 36,000 | 10,000 |
| ක්‍ෂුද්‍ර ජල සම්පාදන පද්ධති ලබාදීම | සංඛ්‍යාව | 112 | 95 |
| ක්‍රියාකාරකම | ඒකකය | ඉලක්කය | ප්‍රගතිය |
| බීළුණු ප්‍රවාහනය සඳහා ප්ලාස්ටික් කූඩා ලබාදීම | සංඛ්‍යාව | 49 | 36 |

| | | | |
|---|---|---|---|
| සහන පදනම මත මිරිස් බීජ බෙදාදීම | කි. ග්‍රෑම් | 197 | 194 |
| වගා මළු තුල මිරිස් නිෂ්පාදනය ප්‍රවර්ධනය | වගාමළු | 20,000 | 17,395 |
| මිරිස් වගා ගම්මාන | හෙක්. | 18 | 33 |
| සහන පදනම මත මුං බීජ බෙදාදීම | කි. ග්‍රෑම් | 2,096 | 3,182 |
| අතරමැද කන්නයේ මුං වගාව | කි. ග්‍රෑම් | 900 | 850 |
| සහන පදනම මත රටකජු බීජ බෙදාදීම | කි. ග්‍රෑම් | 6,150 | 5,889 |
| රටකජු බීජ නිෂ්පාදන වැඩසටහන සඳහා බීජ බෙදාදීම | කි. ග්‍රෑම් | 660 | 1,041 |
| සහන පදනම මත කව්පි බීජ බෙදාදීම | කි. ග්‍රෑම් | 1,234 | 907 |
| සහන පදනම මත උඳු බීජ බෙදාදීම | කි. ග්‍රෑම් | 667 | 617 |
| සහන පදනම මත කුරක්කන් බීජ බෙදාදීම | කි. ග්‍රෑම් | 155 | 150 |
| කුරක්කන් බීජ නිෂ්පාදනය සඳහා බීජ බෙදාදීම | කි. ග්‍රෑම් | 360 | 601 |
| කෘෂි ළිං ලබා දීම | සංඛ්‍යාව | 44 | 44 |
| ජල පොම්ප ලබා දීම | සංඛ්‍යාව | 66 | 67 |
| ගෙවතු සංවර්ධන වැඩසටහන | ගෙවතු | 10,203 | 7,894 |
| **කෘෂි ව්‍යාප්ති කටයුතු** (නිලධාරී/ගොවි පුහුණු/ ක්ෂේත්‍ර දින/බෝග සායන) | සංඛ්‍යාව | 1,634 | 1,470 |
| **පලතුරු බෝග සංවර්ධනය** | | | |
| අඹ ගස් පුනරුත්තාපන වැඩසටහන් | සංඛ්‍යාව | 126 | 101 |
| පළතුරු මැස්සා පාලන වැඩසටහන් | සංඛ්‍යාව | 71 | 67 |
| නව පළතුරු වගාව | හෙක්. | 111 | 175 |

සියළුම කලාප වල 2018 වර්ෂයේ ලබාදී ඇති ප්‍රතිපාදන වලට අනුව භෞතික ක්‍රියාකාරකම් සාර්ථකව ඉටුකිරිමට කාර්ය මණ්ඩලය උනන්දුවෙන් මෙම භෞතික ප්‍රගතිය අත්කර ගැනීමට ක්‍රියාකර ඇත.

### 3.2.2 බෝග නිෂ්පාදනය ප්‍රගතිය සහ දායකත්වය - 2017/18 මහ සහ 2018 යල කන්නය

**කන්න බෝග**

| බෝගය | වපසරිය (හෙක්) | මහවැලි නිෂ්පාදනය (මෙ.ටො) | ජාතික නිෂ්පාදනය (මෙ.ටො) | මහවැලි දායකත්වය (%) |
|---|---|---|---|---|
| වී | 165,421 | 906,051 | 3,806,000 | 24% |
| බඩ ඉරිඟු | 3,930 | 16,083 | 306,801 | 5% |
| මුං | 520 | 769 | 10,858 | 7% |
| කව්පි | 443 | 503 | 16,031 | 3% |
| සෝයා | 1,510 | 3,471 | 3,621 | 96% |
| අමු මිරිස් | 683 | 5,246 | 61,141 | 9% |
| රටකජු | 704 | 1,349 | 24,178 | 6% |
| උඳු | 138 | 173 | 8,566 | 2% |
| තල | 164 | 117 | 7,821 | 1% |
| කුරක්කන් | 323 | 498 | 5,688 | 9% |
| ලොකුළූණු | 572 | 11,358 | 31,880 | 36% |
| එළවළු | 6,176 | 87,130 | | |

පළතුරු බෝග

| බෝගය | වපසරිය (හෙක්) | නිෂ්පාදනය (මෙ.ටො) |
|---|---|---|
| කෙසෙල් | 9,131 | 136,964 |
| පැපොල් | 694 | 12,488 |
| අඹ | 2,048 | 8,596 |

(ජාතික නිෂ්පාදන දත්ත කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සමාජ ආර්ථික හා සැලසුම් මධ්‍යස්ථානය මගින් නිකුත්කරනු ලබන 2016/17 මහ සහ 2017 යල බෝග අස්වනු අනාවැකි වාර්ථා වලින් ලබා ගන්නා ලදි.)

ජාතික ආහාර සුරක්ෂිතතාවය ඇතිකිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය ක්‍රියාත්මක කරන ලද කෘෂිකාර්මික සංවර්ධන වැඩසටහන තුල ජාතික ආහාර නිෂ්පාදනයට දායක වෙමින් හෝ ආර්ථිකය සරු කිරීම හා නිෂ්පාදන ඵලදායිතාවය ඉහල නැංවීම ඉතා සාර්ථකව ඉටුකර ඇත.

වී වගා ආදර්ශ යාය වැඩසටහන





පැල සිටුවන යන්ත්‍ර භාවිතය මගින් ඉහළ අස්වනු ලබා ගැනීම සහ කාර්යක්ෂම වල් පාලනය - ක්ෂේත්‍ර ආදර්ශන





වී වගාව සඳහා පැරෂුට් තැටි භාවිතය





පත්‍ර වර්ණ දර්ශක භාවිතයෙන් යූරියා පොහොර භාවිතය අවම කිරීම



VAT ආදර්ශන



ඒකාබද්ධ පළිබෝධ පාලන පුහුණු වැඩසටහන



බීජ වී නිෂ්පාදන වැඩසටහන




සෝයා බෝංචි - පෙර ගිවිසුම් ගත වගාව ප්‍රවර්ධනය



සෝයා බෝංචි අලෙවි සම්බන්ධීකරණ වැඩසටහන



ජල අර්බුදයට පිළියමක් ලෙස විසිරුම් ජල සම්පාදන පද්ධති හා බිංදු ජල සම්පාදන පද්ධති ලබා දීම





බී ළූණු සත්‍ය බීජ නිෂ්පාදනය

රටකජු වගා ව්‍යාප්තිය





බඩඉරිඟු වගා ව්‍යාප්තිය දෙමුහුම් බඩඉරිඟු බීජ නිෂ්පාදනය

මිරිස් වගා ව්‍යාප්තිය - මිරිස් බීජ නිෂ්පාදනය





50% දායකත්වය යටතේ අතිරේක බෝග බීජ බෙදාදීම

ක්ෂේත්‍ර දින





කෘෂි ප්‍රදර්ශන

මහවැලි මහ ගොවියා තේරීමේ තරඟය





විශේෂ කෘෂි ප්‍රවර්ධන සතිය වැඩසටහන





මහවැලි ක්‍රීඩා උළෙල හා සමගාමී රුක් රෝපණ වැඩසටහන හා පැන විසඳුම් තරඟය





දේශගුණ විපර්යාස සඳහා අනුගත වීමේ වැඩසටහන





ගෘහ ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා බිම්මල් නිෂ්පාදනගෘහ, මී මැසි පෙට්ටි හා සෙවන ගෘහ ලබා දීම





කාබනික පොහොර නිෂ්පාදනය සහ භාවිතය ප්‍රවර්ධනය

නිලධාරී/ ගොවි පුහුණු වැඩසටහන්





ගෙවතු සංවර්ධන වැඩසටහන්

අඹ ගස් කප්පාදු වැඩසටහන





පළතුරු මැස්සා පාලන වැඩසටහන

සේනා දළඹුවා මර්ධන වැඩසටහන





## 3.3 ධීවර හා පශු සම්පත් සංවර්ධන අංශය

### 3.3.1 හැඳින්වීම

මහවැලි කලාප වල සුළු පරිමාණ හා ව්‍යාපාරික මට්ටමේ කිරි ගොවීන් 46,185ක් ව්‍යාප්තව සිටින අතර එම ගොවිපල ආශ්‍රිතව එළගවයින් 93,575ක් හා මී ගවයින් 15,175ක් ලෙස මුළු ගව ගහනය 108,760 ක් ලෙස201 8 වර්ෂයේ වාර්ථා වී ඇත. මෙම වර්ෂයේ දියර කිරි ලීටර් මිලියන 30.1ක් නිෂ්පාදනය කර මුළු ජාතික නිෂ්පාදනයෙන් 08 %ක දායකත්වයක් දරයි. එය දෛනිකව සාමාන්‍යය කිරි ලීටර 82,000 පමණ වේ. කිරි මිලදී ගැනීමේ ආයතන වන මිල්කෝ,කොත්මලේ, නෙස්ලේ, රිච්ලයිෆ්, සීඅයිසී,මහවැලි, ඇන්කර්, කඩුවෙල වැනි රාජ්‍ය හා පෞද්ගලික කිරි එකතුකිරීමේ හා කිරි ආශ්‍රිත නිෂ්පාදන ආයතන විසින් සිදුකරණු ලබයි. කිරි ලීටරයක් සඳහා සම්මත මිල රු.70.00ක් වුවද කිරි වල පවතින මේදය හා මේද නොවන සනද්‍රව්‍ය අනුව මිල වෙනස්වන අතර එය සියළු මහවැලි කලාප හා සැලකීමේදී දියර කිරි ලීටර එකක සාමාන්‍ය මිල රු.68 කි. ඒ අනුව නිෂ්පාදිත මුළු දියර කිරි අලෙවිය තුලින් 2018 වර්ෂයේ මහවැලි කිරි ගොවිපලහිමියන් සඳහා රු. මිලියන 2046.8ක මුදලක් උපයාගැනීමට හැකියාව ලැබී ඇත. මෙම වර්ෂය තුලදී මහවැලි කිරි ගොවිපල 2540ක් සඳහා ඍජුව ප්‍රතිලාභ සැලසීමට ධීවර හා පශු සම්පත් ප්‍රවර්ධන වැඩසටහනට හැකියාව ලැබී ඇත. 2020දී වාර්ෂිකව දියර කිරි ලීටර් මිලියන 35ක් නිෂ්පාදනය කිරීමට අපේක්ෂිත අතර එය ජාතික දියර කිරි නිෂ්පාදනයට දක්වන දායකත්වය 8% සිට 10% දක්වා වැඩි කිරීමකි.

මහවැලි කලාප ආශ්‍රිතව ප්‍රධාන ජලාශ 10ක් ඇතුළුව ජලාශ 324ක් ඇත .ධීවර ප්‍රජාව 4860ක් පමණ වන අතර 2018 වාර්ෂයේ මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය මෙ.ටො. 15,580 ක් හා මිරිදිය ඉස්සන් මෙ.ටො. 125.3ක් නිෂ්පාදනය කර දේශීය මෙන්ම සුළු වශයෙන් ඉලක්ක ගතව විදේශීය වෙළඳපල සඳහා සැපයීම සිදුකර ඇත. ජලාශයේ තොටුපලෙන් අලවිවන මිරිදිය මත්ස්‍ය කිලෝවක සමාන්‍ය සිල්ලර මිල රු. 230.00ක් හා මිරිදිය ඉස්සන් කිලෝවක සමාන්‍ය සිල්ලර මිල රු.1050.00 ක් ලෙස මහවැලි කලාප වලින් වාර්තා විය. එමගින් 2018 වර්ෂයේදී රු. මිලියන 3714.9ක මුදලක් මහවැලි කලාප තුල ධීවර ප්‍රජාවට උපයා ගැනීමට හැකි වී ඇත. 2020දී වාර්ෂික මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනය මෙ.ටො. 20,000 ක් හා මිරිදිය ඉස්සන් මෙ.ටො.300ක් නිෂ්පාදනය කරමින් ජාතික මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනයට දක්වන මහවැලි දායකත්වය 21% සිට 25% දක්වා වැඩි කිරීමට අපේක්ෂා කර ඇත.


ගෙවතු ආශ්‍රිත ගම්කුකුළු පාලනයේ නිරත ගොවීන් හා ව්‍යාරික මට්ටමේ බිත්තර සහ බ්‍රොයිලර් (මස් සඳහා) කුකුළු පාලනයේ නිරත ගොවීන් 17,940 කි .වාර්ෂික බිත්තර නිෂ්පාදනය බිත්තර මිලියන 50ක් පමණ වන අතර කුකුළු මස් නිෂ්පාදනය මෙ.ටො. 17,450කි. ගම්කුකුළු බිත්තරයක සාමාන්‍ය මිල රු. 19.00ක් වන අතර සාමාන්‍ය බිත්තරයක් රු. 15.30ක සාමාන්‍ය මිලකට අලවි කරයි. ජීව බර කිලෝවක සාමාන්‍ය මිල රු. 275.00ක් වන අතර 2018 වර්ෂය තුල කුකුළු ගොවිපල ආශ්‍රිත නිෂ්පාදන තුලින් රු. මිලියන 5563ක් පමණ මහවැලි කලාප තුල පිහිටි ගෙවිපල තුලින් උපයාගෙන ඇත.

මහවැලි බලප්‍රදේශ වල විසිතුරු මත්ස්‍ය වගා සඳහා යොමුකල ගොවීන් 848ක් වන අතර 2018 වර්ෂයේ දේශීය මෙන්ම විදේශීය වෙළඳපල සඳහා විසිතුරු මසුන් මිලියන 14.7ක් නිෂ්පාදනය කරමින් මහවැලි

ජනපදිකයින් සඳහා රුපියල් මිලියන 367කට වැඩි අදායමක් උත්පාදනය කරගැනීමට කටයුතු කර ඇත. 2020 දී විසිතුරු මසුන් මිලියන 20ක් නිෂ්පාදනය කිරීමට අපේක්ෂා කරයි.

පාසල් ළමුන් අතර දියර කිරි භාවිතය ප්‍රචලිත කිරීමට 2018 වර්ෂය තුල දුෂ්කර පාසැල් 15ක් තොරාගෙන කිරි ගොවි සමිති සමග සම්බන්ධීකරනයෙන් පාසැල් පවත්වන කාලයේදී සතියකට දින 2 හෝ 3ක් දියර කිරි ලබාදීමත්, දරුවන් සත්ත්ව පාලන විෂය කරුණු පිළිබඳ දැනුවත් කරමින් පුහුණු වැඩසටහන් ද ක්‍රියාත්මක කිරීම.

වාර්ෂිකව පාසල් හැරගිය තරුණ තරුණියන් 35ක් ස්වයං රැකියාවක් ලෙස සත්ත්ව පාලන කටයුතු සඳහා සත්ත්ව පාලන ගොවිපවුල අතරට එකතු කිරීමට කටයුතු කිරීම හා මග පෙන්වීම.




### 3.3.2 කිරි ගව සංවර්ධනය

මහවැලි කිරි ගොවිපල අතුරින් වාර්ෂිකව කිරි නිෂ්පාදනය හා පවතින විභවයන් පදනම් කර කිරි ගොවිපල කාණ්ඩ කිරීම, ඒ අතරින් සංවර්ධනයට සුදුසු ගොවිපල තෝරා ගැනීම හා එක් එක් ගොවිපල තුල නිෂ්පාදනය පදනම් කරගත් සංවර්ධන වැඩසටහන් සැකසීම සිදු කරයි. ඒ අනුව තෝරාගත් ආදර්ශ එක් ගොවිපලක් වටා තවත් ගොවිපල දහයක් (10) ආවරණය වන පරිදි කිරි ගොවිපල 2400 ක් ඉලක්ක කර ගනිමින් සංවර්ධනය කාර්යයන් සිදුකරන ලදි.


### 3.3.3 2018 වර්ෂයේ දී ක්‍රියාත්මක කල සංවර්ධන වැඩසටහන්වල භෞතික ප්‍රගතිය ගොවිපල යටිතල පහසුකම් සංවර්ධනය නව ගව නිවාස ඉදිකිරීම හා අළුත්වැඩියා කිරීම

කලාපයේ තෝරාගත් කිරි ගොවිපල සඳහා මහවැලි දායකත්වය යටතේ අවමය කිරි දෙනුන් තුනක් හා පැටවුන් දෙකක් සඳහා ගව නිවාස මෙන්ම දෙනුන් දහයකට වැඩි අභිජනන ගොවිපල සඳහා අළුතින් ගව නිවාස ඉදිකිරීම හෝ අළුත්වැඩියා කිරීම තුලින් ගොවිපල විධිමත් කිරීමට කටයුතු කරයි.

| අ.අ | ක්‍රියාකාරකම් | ඉලක්කය | ප්‍රගතිය |
|---|---|---|---|
| 01 | ගව නිවාස ඉදිකිරීම හා නඩත්තුව (ගව නිවාස) | 103 | 101 |
| 02 | ජීව වායු ඒකකය පිහිටුවීම (ඒකක) | 7 | 7 |
| 03 | තෘණ කැබලි කිරීමේ යන්ත්‍ර | 24 | 23 |
| 04 | තෘණ කපන යන්ත්‍ර | 38 | 38 |
| 05 | කිරිදෙවීමේ යන්ත්‍ර | 25 | 24 |
| 06 | සයිලේජ් සැකසීමට බැරල් | 390 | 400 |
| 07 | වැඩි දියුණු කිරි දෙනුන් හඳුන්වාදීම (දෙනුන්) | 56 | 54 |
| 08 | ගව අභිජනන ඒකක පිහිටු වීම හා නඩත්තුව | 35 | 34 |
| 09 | වැඩි දියුණු පුං ගවයින් හඳුන්වා දීම (ගවයින්) | 26 | 21 |
| 10 | කෘතිම සිංචනය සඳහා යොමුකල ගොවිපල | 350 | 307 |
| 11 | තෘණ වගාව (අක්. ¼ ඒකක පිහිටුවීම) | 126 | 116 |
| 12 | සාන්ද්‍ර ආහාර හා ඛණිජ භාවිතය (කි.ග්‍රෑ.) | 2150 | 2150 |
| 13 | සත්ත්ව සායන වැඩසටහන් | 64 | 57 |
| 14 | සතුන් රක්ෂණය සඳහා යොමුකල ගොවිපල | 55 | 49 |
| 15 | නව කිරි එකතු කිරීමේ මධ්‍යස්ථාන පිහිටු වීම | 3 | 2 |
| 16 | කිරි ප්‍රවාහනයට කිරි භාජන ලබාදීම (සංඛ්‍යාව) | 54 | 49 |
| 17 | පාසැල් ළමුන් දැනුවත් කිරීමේ වැඩසටහන් | 15 | 15 |
| 18 | ගොවි පුහුණු වැඩසටහන් | 60 | 65 |
| 19 | ක්ෂේත්‍ර දින වැඩසටහන් | 10 | 6 |
| 20 | ප්‍රතිලාභ ලද සමස්ථ ගොවීන් සංඛ්‍යාව | **2400** | **2320** |

ගොවිපල ආශ්‍රිතව කිරි නිෂ්පාදනය ඉහළ දැමීමත්, පිරිසිදු කිරි නිෂ්පාදනය සඳහා යොමු කිරීමත්, නව තාක්ෂණය සමගින් කිරි ගව පාලනය ගොවීන් අතර ප්‍රචලිත කිරීම හා තරුණයින් ඒ සඳහා යොමුකර ගැනීම අපේක්ෂාවෙන් 50% ක මහවැලි දායකත්වය සමග ජංගම කිරි දොවන යන්ත්‍ර ආදර්ශ ගොවිපල සඳහා හඳුන්වාදීම සිදු කරයි.



කිරි දොවන යන්ත්‍ර භාවිතය දිරිගැන්වීම



කිරි එකතු කිරීමේ මධ්‍යස්ථාන පිහිටුවීම

## 3.3.4 කුකුළු පාලන ප්‍රවර්ධනය

පවුලේ ආර්ථිකයට අමතර අදායමක් එකතුකර ගැනීම හා පවුලේ පෝෂණය සඳහා ඉහළ දායකත්වයක් ලබා ගැනීම මෙන්ම අඩු වියදමකින් වැඩි ප්‍රතිලාභයක් ලබා ගැනීම මූලිකව අරමුණු කර ගනිමින් ගෙවතු ආශ්‍රිතව ගම්කුකුළු පාලනය ව්‍යාප්ත කරලීම සිදු කරයි. මෙම වර්ෂය අවසානයේ ගෙවතු ආශ්‍රිතව ගම්කුකුළු ගොවිපල 16,940ක් මහවැලි කලාප ආශ්‍රිතව ව්‍යාප්තව ඇත.





**2018 වර්ෂයේ දී ක්‍රියාත්මක කල සංවර්ධන වැඩසටහන්**

| අ.අ | ක්‍රියාකාරකම | ඉලක්කය | ප්‍රගතිය | ප්‍රතිලාභීන් |
|---|---|---|---|---|
| 01 | කුකුළු නිවාස ඉදිකිරීම | 195 | 192 | 192 |
| 02 | කුකුළු පැටවුන් | 43800 | 33523 | 1196 |
| 03 | සත්ත්ව සායන | 35 | 29 | 310 |
| 04 | පුහුණු වැඩසටහන් | 40 | 35 | 420 |
| 05 | අභිජනන ගොවිපල | 20 | 12 | 12 |
| | එකතුව | | | 2130 |

## 3.3.5 එළු පාලන සංවර්ධන වැඩසටහන

**2018 වර්ෂයේ දී ක්‍රියාත්මක කල සංවර්ධන වැඩසටහන්**

| අ.අ | ක්‍රියාකාරකම | ඒකකය | ඉලක්කය | ප්‍රගතිය | ප්‍රතිලාභීන් |
|---|---|---|---|---|---|
| 01 | එළු නිවාස ඉදිකිරීම | සංඛ්‍යාව | 44 | 42 | 42 |
| 02 | අභිජනනය සඳහා එළු පැටවුන් ලබාදීම | සංඛ්‍යාව | 44 | 45 | 15 |
| 03 | සත්ත්ව සායන වැඩසටහන් | වැඩස. | 20 | 17 | 136 |
| 04 | පුහුණු වැඩසටහන් පැවැත්වීම | වැඩස. | 24 | 20 | 240 |
| | එකතුව | | | | 433 |

### 3.3.6 මිරිදිය මත්ස්‍ය වගා සංවර්ධන වැඩසටහන

මහවැලි කලාප මට්ටමින් ජල ප්‍රභවයන් 324ක් ව්‍යාප්තව ඇත. ඒ අතරින් ප්‍රධාන ජලාශ 11කි. බොහෝ ජලාශ ජලජීවී වගාව සඳහා යොදා ගනිමින් කෘෂිකර්මාන්තයට අමතරව මිරිදිය මත්ස්‍ය නිෂ්පාදන මෙ.ටො1.5,580 ක් හා මිරිදිය ඉස්සන් මෙ.ටො. 125.3ක් නිෂ්පාදනය කර ජාතික මිරිදිය මත්ස්‍ය නිෂ්පාදනයට 21%ක දායකත්වයක් ලබාදී ඇත.








### 3.3.7 විසිතුරු මත්ස්‍ය වගාව ප්‍රවර්ධනය

**2018 වර්ෂයේ දී ක්‍රියාත්මක කල සංවර්ධන වැඩසටහන්**

| අ.අ | ක්‍රියාකාරකම | ඉලක්කය | ප්‍රගතිය |
|---|---|---|---|
| 01 | මඩ පොකුණු ඉදිකිරීම | 46 | 44 |
| 02 | මසුන් නිරෝධායන ටැංකි | 29 | 27 |
| 03 | මසුන් අභිජනන ඒකක පිහිටුවීම | 28 | 22 |
| 04 | රෝග නිවාරණ සායන වැඩසටහන් | 20 | 12 |
| 05 | පුහුණු වැඩසටහන් පැවැත්වීම | 50 | 46 |
| 06 | ප්‍රතිලාභී ගොවීන් | 450 | 380 |



### 3.3.8 දිළිඳු පවුල් නගාසිටුවීමේ වැඩසටහන

සංවර්ධනය සඳහා අඩු ආදායම්ලාභී පවුල් තෝරා ගැනීමේ දී....

- මහවැලි ජනපදිකයින් / ඉඩම්ලාභීන්
- සාමාන්‍ය මාසික අදායම රු. 30,000 කට අඩු
- විශේෂ අවශ්‍යතා ඇති සාමාජිකයින් සිටින පවුලක්
- අඩු අවධානයන් යොමුවන ප්‍රදේශවලින් යන කරුණු කෙරෙහි අවධානය යොමු කරන ලදි.

| ක්‍රියාකාරකම | දිළිඳු පවුල් | | | ක්‍රියාකාරකම් |
|---|---|---|---|---|
| | ඉලක්කය | තෝරාගත් | ප්‍රගතිය | |
| කිරිගව පාලනය | 240 | 240 | 40 | • ගව නිවාස - 45<br>• අභිජනන ඒකක - 8<br>• කිරි දෙනුන් -10<br>• කුකුළු පැටවුන් ලබාදීම 18000<br>• කුකුළු නිවාස -85<br>• මත්ස්‍ය ඇඟිල්ලන් 1,000,000<br>• මිරිදිය ඉස්සන් 100,000 |
| කුකුළු පාලනය | 580 | 570 | 25 | |
| එළු පාලනය | 90 | 90 | 10 | |
| මිරිදිය මත්ස්‍ය වගාව | 200 | 200 | 50 | |
| විසිතුරු මත්ස්‍ය වගාව | 140 | 131 | 18 | |
| එකතුව | 1250 | 1231 | 143 | |

# 3.4 ආයතන සංවර්ධන අංශය.

## ආයතන සංවර්ධන අංශයේ කාර්යභාරය

## 3.4.1 ප්‍රජා සංවර්ධනය

මහවැලි කලාප තුළ මතින් තොර, හිංසනයෙන් තොර, අපචාරයන්ගෙන් තොර, සාරධර්ම සපිරි නිරෝගිමත් ගොවි ප්‍රජාවක් බිහිකිරීම සඳහා මගපෙන්වීම ප්‍රජා සංවර්ධන වැඩසටහන්හි මූලික අරමුණ වේ.

මේ යටතේ,

- මත්ද්‍රව්‍ය භාවිතය වැලැක්වීම සඳහා ග්‍රාමීය ස්වේච්ඡා නායක නායිකාවන් පුහුණු කිරීම හා පාසල් ළමුන් හා ප්‍රජාව දැනුවත් කිරීම
- ළමා අපචාර, කාන්තා හිංසනය, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය, අඩුවයස් විවාහ හා ගැබ්ගැනීම් වැලැක්වීම සඳහා දැනුවත් කිරීම
- බෝ නොවන රෝග පිළිබඳ දැනුවත් කිරීම හා සෞඛ්‍ය සායන පැවැත්වීම (විශේෂයෙන් සීග්‍ර ලෙස පැතිරියන වකුගඩු රෝගයෙන් ආරක්ෂා වීම පිළිබඳ දැනුවත් කිරීම හා හඳුනාගත් රෝගීන් ප්‍රතිකාර සඳහා යොමු කිරීම)
- අධ්‍යාපන සම්මන්ත්‍රණ පැවැත්වීම (පහ වසර ශිෂ්‍යත්ව විභාගය, අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගය හා අ.පො.ස. උසස්පෙළ විභාගය සඳහා)
- මහවැලි පදනම ශිෂ්‍යත්ව ලබා දීම (දෙමාපියන් ඉතා දිළිඳු, ආබාධිත හෝ මියගිය, සාමාන්‍ය පෙළ සමත් දරුවන් සඳහා ලබා දේ)

2018 වර්ෂයේ ප්‍රජා සංවර්ධනය වැඩසටහන් වලට අදාල ඉලක්ක ගත වැඩසටහන් සංඛ්‍යාව 630 කි. ඉන් වැඩසටහන් 531 ක ප්‍රගතිය ලබා ගෙන ඇති අතර මූල්‍ය ඉලක්කය රුපිල් මිලියන 24.2ක් හා මූල්‍ය ප්‍රගතිය රුපියල් මිලියන 23.9 කි.

## 3.4.2 ජානපදික හැකියා හා වෘත්තීය පුහුණු

- මහවැලි ජානපදිකයින්ගේ ආර්ථික මට්ටම රුපියල් 30,000.00 වඩා ඉහළ නැංවීම අරමුණු කර ගනිමින් වෘත්තීය පුහුණු ලබා දීම හා ඒ ඔස්සේ ඔවුන් රැකියා ගත කිරීම මූලික අපේක්ෂාව වේ.

- ගොවි සංවිධාන නිලධාරීන් සඳහා ගිණුම් පුහුණුව ලබාදීම හා පොල්ගොල්ල ජාතික අධ්‍යාපන සමූපකාර සංවර්ධන ආයතනය යටතේ මහවැලි කලාප වල උසස් පෙළ සමත් තරුණ තරුණියන්ට විගණනය සඳහා අවශ්‍ය පුහුණුව ලබා දී ගොවි සංවිධාන විගණනය සඳහා බලය ලබා දීම හා කලාපයේ ගොවි සංවිධාන වාර්ෂිකව විගණනය කිරීම ඔවුන් විසින් සිදු කිරීම.

- 2018 වර්ෂය තුළ මේ යටතේ වැඩසටහන් 136ක් ඉලක්ක ගතව තිබූ අතර ඉන් වැඩසටහන් 136ක ප්‍රගතියක් හා රුපියල් මිලියන 10.8ක මූල්‍ය ඉලක්කයක් හා 10.8 ක මූල්‍ය ප්‍රගතියක් ලබා ගන්නා ලදී. තවද දිළිඳුකම තුරන් කිරීමේ වැඩසටහන යටතේ 2018 වර්ෂයේ මාසික ආදායම රුපියල් 30,000.00 ට වැඩියෙන් උපයන පවුල් සංඛ්‍යාව 1171 ක් ලෙස රැකියාගත කිරීම සිදුකරන ලදී.

### 3.4.3 කාන්තා සංවර්ධනය

- ඉතිරිකිරීම් ප්‍රවර්ධනය කිරීම හා ගෘහස්ථ මූල්‍ය කළමනාකරණ කටයුතු සඳහා මගපෙන්වීම මෙහි ප්‍රධාන අරමුණ වේ.
- මහවැලි කලාප තුළ සිටින කාන්තාවන් සවිබල ගැන්වීම සඳහා මේ යටතේ විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි
- තම නිවසේ සිටම ආදායම් උත්පාදනය සඳහා ඇයට කටයුතු කළහැකි වන පරිදි ස්වයංරැකියා හා විවිධ වෘත්තීය පුහුණු ලබාදීම සිදුකරන අතර ඒ සඳහා අවශ්‍ය උපකරණ ලබාදීමද මේ යටතේ සිදුකරයි.
- 2018 වර්ෂයේ මෙහි වැඩසටහන් ඉලක්කය 62 ක් වන අතර ප්‍රගතිය වැඩසටහන් 53කි. මූල්‍ය වියදම රුපියල් මිලියන 3.8කි.

### 3.4.4 ගොවි සංවිධාන ප්‍රවර්ධනය

ගොවි සංවිධාන නිලවරණ පැවැත්වීම හා ගොවි සංවිධාන සඳහා අදාලවන අණපනත්, නීති රීති, ජලකළමනාකරණය ආදිය පිළිබඳ ගොවීන් දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වනු ලබයි. එමෙන්ම ගොවීන්ගේ ආකල්ප වර්ධනය හා ධාරිතා සංවර්ධනය සඳහා විවිධ පුහුණු වැඩසටහන් සිදුකරන අතර කළමනාකරණ කමිටු යටතේ ගොවි ගැටලු සඳහා විසඳුම් ලබාදීම සිදු කරයි.

### 3.4.5 ප්‍රජා සහභාගිත්ව වාරිපද්ධති කළමනාකරණය

- ඇළ පද්ධතිවල නඩත්තු හා මෙහෙයුම් කටයුතු කාර්යක්ෂම කිරීම මගින් කෙත් ඇළ නවීකරණය කිරීමේ ප්‍රජා සහභාගිත්ව කළමනාකරණ වැඩසටහන
- ප්‍රතිසංස්කරණය කළයුතු මට්ටමේ ඇති කෙත්ඇළ ප්‍රජාවගේ සහභාගිත්වයෙන් හා ශ්‍රමදායකත්වයෙන් අමුද්‍රව්‍ය සඳහා වන පිරිවැය පමණක් දරා ප්‍රතිසංස්කරණය කිරීම.

(කාර්යක්ෂම ජල භාවිතයකට ගොවීන් හුරුකිරීම හා ජල කළමනාකරණය පිළිබඳ ආකල්පමය වෙනසක් ප්‍රායෝගිකවම මේ තුළින් ඇතිකරවනු ලබන අතර විශාල පිරිවැයක් දැරීමට සිදුවන කටයුත්තක් ප්‍රජාවගේම ශ්‍රමයෙන් වඩා ඵලදායී ලෙස සිදු කරයි.)

2018 වර්ෂයේ දී මෙම වැඩසටහන මහවැලි බී, සී,එච්, මොරගහකන්ද, එල්, වලව හා හුරුළුවැව යන කලාපයන්හි ක්‍රියාත්මක කරන ලදී. උපරිමය රුපියල් ලක්ෂ පහකට(5) යටත්ව ඇළ මාර්ග ප්‍රතිසංස්කරණය සඳහා මුදල් ලබාදෙන අතර එහි නිමැවුම් වටිනාකම රුපියල් ලක්ෂ 15ක් පමණ වෙතැයි ගණන් බලා ඇත.

ඒ අනුව කි.මී.45.871 ක දිගින් යුතු වාරි පද්ධති ප්‍රමාණයක් රුපියල් මිලියන 13.446ක ඉතිරියකින් යුතුව නිමකර අත.

# 3.5 ව්‍යාපාර සංවර්ධන අංශය.

## 3.5.1 ව්‍යාපාර සංවර්ධන අංශයේ කාර්යභාරය

- සත්ව පාලන, විසිතුරු මත්ස්‍ය, පොල් වගාව, වෙනත් බෝග හා පළතුරු වගා ආදී ආයෝජන ව්‍යාපෘති සඳහා ඉඩම් ලබාදීම මත බදු ආදායම් ලබා ගැනීම.

- පරිසර හිතකාමී සංචාරක අවස්ථා පුළුල් කිරීම උදෙසා ජලාශවල සංචාරක බොට්ටු සේවා සඳහා අවසර ලබාදී වාර්ෂික බදු මුදලක් ලබා ගැනීම.

- මහවැලි බල ප්‍රදේශවල ඉතා ආකර්ෂණීය ස්ථානවල පිහිටි සංචාරක බංගලා නවීකරණය කරමින් දෙස් විදෙස් සංචාරකයින්ට විවෘත කිරීම තුලින් අදායම් උත්පාදනය.

- සූර්ය බල ශක්ති, ජෛව ස්කන්ධ විදුලි බල ශක්ති , ජල විදුලි බල ශක්ති ආදි විදුලිබල ව්‍යාපෘති සඳහා ලබාදුන් ඉඩම් වල බදු අදායම්/මහවැලි අධිකාරිය සමඟ හවුල් ව්‍යාපාර ලෙස ආරම්භ කිරීම තුලින් ලාභ ඉපයීම.

- ප්‍රදේශිය ආර්ථික සංවර්ධනයට සෘජුවම දායකවන ව්‍යාපෘති සඳහා අවශ්‍ය ජලය සැපයීම තුලින් ආදායම් ලබා ගැනීම.

- ජලාශ මතු පිට පාවෙන සූර්ය බල ශක්ති විදුලි ව්‍යාපෘති සඳහා මහවැලි ජලාශ මතුපිට ආයෝජන අවස්ථා සලසාදීම.

- දේශීය සීනි අවශ්‍යතාවය මෙරට තුලදීම නිෂ්පාදනය කිරීම සඳහා සීනි කර්මාන්ත ශාලා වැනි ව්‍යාපෘතිවල ඉඩම් සහ ප්‍රදේශයේ ගොවීන් අතර ඉඩම් බෙදා දීම මඟින් බදු අදායම මෙන්ම රාජ්‍යභාගය ලබා ගැනීම.

- කළුගල් /ඛණිජ ද්‍රව්‍ය (ඩොලමයිට්, තිරුවානා, ඇපටයිට්, මයිකා, හුණුගල් ) ආශ්‍රිත කර්මාන්ත සඳහා ලබාදෙන ඉඩම් වල බදු හා ඉවත් කරනු ලබන කියුබ් ප්‍රමාණය අනුව අයකිරීම.

- කර්මාන්ත උද්‍යාන පවත්වා ගෙන යාම මඟින් ප්‍රදේශීය මට්ටමේ ආර්ථිකය ශක්තිමත් කිරීම.

- තිලාපියා වැනි මිරිදිය මත්ස්‍යයින් ජලාශ වල දැල් කුඩු තුල ඇති කිරීමේ ව්‍යාපෘති මඟින් විදේශීය විනිමය ඉපයීම සඳහා කුඩා සහ මධ්‍යම පරිමාණ ව්‍යවසායකයින් දිරි ගැන්වීම.

- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකින් දිරිමත් කිරීම සඳහා සහනශීලි පොලී අනුපාතයක් යටතේ රාජ්‍ය බැංකු හා එක්ව ණය ලබා දීම.

### 3.5.2 ව්‍යාපාර සංවර්ධන අංශයේ අරමුණු:-

01. අධිකාරියේ වාර්ෂික ආදායම් තත්වය ඉහල නැංවීම.
02. මහවැලි බල ප්‍රදේශවල තරුණ තරුණියන්ට රැකියා අවස්ථා ජනනය කිරීම.
03. ආයෝජන තුලින් ප්‍රාදේශීය සංවර්ධනය.
04. සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් බිහි කිරීම.
05. ස්වයං රැකියා පුහුණුව මඟින් කුඩා පරිමාණයේ නිෂ්පාදන ක්ෂේත්‍රයට දායකත්වය ලබාදීම.
06. ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලීම සඳහා අවශ්‍ය මැදිහත්කරුවෙකු වීම.
07. වෙළඳපල සම්බන්ධිකරණය මඟින් මහවැලි බල ප්‍රදේශවල නිෂ්පාදනවලට ඉහල වටිනාකමක් ලබාදීම
08. ව්‍යවසායකත්ව හැකියා වර්ධනය හා තාක්ෂණ නිපුනතාවය ලබා දීම.
09. ජාතික නිෂ්පාදනයට දායකත්වයක් ලබාදීම හා අපනයන ප්‍රවර්ධනය.
10. ව්‍යාපාර උපදේශණය/ව්‍යාපාර සැලසුම් සකස්කිරීමට සහය ලබාදීම හා ඇගයීම.
11. ජාතික විදුලි නිෂ්පාදනය සඳහා පුනර්ජනනීය විදුලි බල නිෂ්පාදන දායකත්වය ලබා දීම.

### 3.5.3 ව්‍යාපාර සංවර්ධන අංශයේ කාර්යභාරය:-

- සත්ව පාලන,විසිතුරු මත්ස්‍ය, පොල් වගාව, වෙනත් බෝග හා පළතුරු වගා ආදී ආයෝජන ව්‍යාපෘති සඳහා ඉඩම් ලබාදීම මත බදු ආදායම් ලබා ගැනීම.
- පරිසර හිතකාමී සංචාරක අවස්ථා පුළුල් කිරීම උදෙසා ජලාශවල සංචාරක බෝට්ටු සේවා සඳහා අවසර ලබාදී වාර්ෂික බදු මුදලක් ලබා ගැනීම.
- මහවැලි බල ප්‍රදේශවල ඉතා ආකර්ෂණීය ස්ථානවල පිහිටි සංචාරක බංගලා නවීකරණය කරමින් දෙස් විදෙස් සංචාරකයින්ට විවෘත කිරීම තුලින් අදායම් උත්පාදනය.
- සූර්යබල ශක්ති,ජෛව ස්කන්ධ විදුලි බල ශක්ති, ජල විදුලි බලශක්ති ආදි විදුලිබල ව්‍යාපෘති සඳහා ලබාදුන් ඉඩම් වල බදු අදායම්/මහවැලි අධිකාරිය සමඟ හවුල් ව්‍යාපාර ලෙස ආරම්භ කිරීම තුලින් ලාභ ඉපයීම.
- ජලාශ මතු පිට පාවෙන සූර්ය බල ශක්ති විදුලි ව්‍යාපෘති සඳහා මහවැලි ජලාශ මතුපිට ආයෝජන අවස්ථා සලසාදීම.
- දේශීය සීනි අවශ්‍යතාවය මෙරට තුලදීම නිෂ්පාදනය කිරීම සඳහා සීනි කර්මාන්ත ශාලා වැනි ව්‍යාපෘතිවල ඉඩම් සහ ප්‍රදේශයේ ගොවීන් අතර ඉඩම් බෙදා දීම මඟින් බදු අදායම මෙන්ම රාජ්‍යභාගය ලබා ගැනීම.
- කර්මාන්ත උද්‍යාන පවත්වා ගෙන යාම මඟින් ප්‍රදේශීය මට්ටමේ ආර්ථිකය ශක්තිමත් කිරීම.
- කෘෂිකාර්මික හා සත්ව පාලන ව්‍යාපෘති මඟින් විදේශීය විනිමය ඉපයීම සඳහා කුඩා සහ මධ්‍යම පරිමාණ ව්‍යවසායකයින් දිරි ගැන්වීම.
- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකින් දිරිමත් කිරීම සඳහා සහනශීලි පොලී අනුපාතයක් යටතේ රාජ්‍ය බැංකු හා එක්ව ණය ලබා දීම.
- පාරම්පරික දේශීය ආහාර ප්‍රචලිත කිරීම හා කාන්තා ව්‍යවසායකත්වය වර්ධනය සඳහා මහවැලි හෙල බොජුන් හල් ආරම්භ කිරීම.
- පිළිගත් වෘත්තීය පුහුණු සහතිකපත් ලාභීන් බවට මහවැලි කලාපීය දූවා දරුවන් පත්කර රැකියා ගත කිරීම.

### 3.5.4 2018 වර්ෂයේ ව්‍යාපාර සංවර්ධන අංශය මඟින් ක්‍රියාත්මක කරන ලද වැඩසටහන්

- ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් සංචාරක බංගලා නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය.
- "මොරගහකන්ද අත්වැල" ණය වැඩ සටහන හා "මහවැලි සවිය" ණය යෝජනා ක්‍රමය
- "මහවැලි හෙළ බොජුන් හළ" ව්‍යාපෘතිය.
- මහවැලි ජලාශවල/වැව්වල පරිසර හිතකාමී බෝට්ටු සේවා ආරම්භ කිරීම.
- මහවැලි කලාපවල රැකියා විරහිත තරුණ තරුණියන් සඳහා වෘත්තීය පුහුණු වැඩසටහන් පවත්වා ශිෂ්‍යත්ව ලබා දීමේ වැඩසටහන.
- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාවසායකයන් නඟා සිටුවීම, දායකත්වය සැපයීම සහ ස්වයං රැකියා පුහුණුව සඳහා අවශ්‍ය තාක්ෂණික දැනුම ලබා දීම.
- නව ව්‍යවසායකයින් හඳුනා ගැනීම සහ පුහුණුව සඳහා ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ධාරිතා සංවර්ධන හා තාක්ෂණික හුවමාරු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- ආයෝජන ප්‍රවර්ධන හා වෙළඳපල ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

### 3.5.5 මහවැලි අධිකාරියට අයත් සංචාරක බංගලා නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය

| අනු අංකය | කලාපය | සංචාරක බංලාවේ නම | | සංචාරක බංගලා සංඛ්‍යාව | ආසන්න නගරය | කාමර ගණන |
|---|---|---|---|---|---|---|
| 1 | බී | රුහුණුකෙත | | 1 | වැලිකන්ද | 10 |
| | | පිඹුරත්තෑව | | 2 | අරලගංවිල | 4 |
| 2 | සී | දෙහිඅත්තකන්ඩිය i | | 3 | දෙහිඅත්තකන්ඩිය | 10 |
| | | දෙහිඅත්තකන්ඩිය ii | | 4 | දෙහිඅත්තකන්ඩිය | 5 |
| | | දෙහිඅත්තකන්ඩිය iii | | 5 | දෙහිඅත්තකන්ඩිය | 3 |
| | | ගිරාඳුරුකෝට්ටේ පුහුණු මධ්‍යස්ථානය | VIP | 6 | ගිරාඳුරුකෝට්ටේ | 1 |
| | | | සාමාන්‍ය | | ගිරාඳුරුකෝට්ටේ | 3 |
| | | | A ශ්‍රේණිය | | ගිරාඳුරුකෝට්ටේ | 20 |
| | | | B ශ්‍රේණිය | 7 | ගිරාඳුරුකෝට්ටේ | 8 |
| | | උල්හිටිය / රත්කිඳ | I | | මැදගම | 2 |
| | | | II | | මැදගම | 3 |
| 3 | ඩී | සූරියපුර | | 8 | කන්තලේ | 6 |
| | | බිසෝපුර(නව) | | 9 | මැදිරිගිරිය | 6 |
| 4 | ජී | මොරගහකන්ද විශේෂ ව්‍යාපෘතිය | | 10 | මොරගහකන්ද | 4 |
| | | බකමූණ | | 11 | බකමූණ | 6 |
| 5 | එච් | කලාවැව | VIP | 12 | කලාවැව | 2 |
| | | | සාමාන්‍ය | | කලාවැව | 3 |
| | | තඹුත්තේගම | | 13 | තඹුත්තේගම | 4 |
| | | නොච්චියාගම | | 14 | නොච්චියාගම | 6 |
| | | නිරාවිය | | 15 | තඹුත්තේගම | 4 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 6 | එල් | වැලිඔය | 16 | සම්පත් නුවර | 4 |
| 7 | වික්ටෝරියා | 222 නේවාසික ව්‍යාපාර කාර්යාල සංචාරක බංගලාව | 17 | දිගන | 4 |
| | | නුවර එළිය (නව ඉදිකිරීමකි) | 18 | නුවර එළිය | 6 |
| | | කොත්මලේ119 2 | 19 | කොත්මලේ | 3 |
| | | බූවැලිකඩ | 20 | මහනුවර | 3 |
| **අනු අංකය** | **කලාපය** | **සංචාරක බංලාවේ නම** | **සංචාරක බංගලා සංඛ්‍යාව** | **ආසන්න නගරය** | **කාමර ගණන** |
| 8 | වලව | උඩවලව | 21 | ඇඹිලිපිටිය | 4 |
| | | ඇඹිලිපිටිය | 22 | ඇඹිලිපිටිය | 8 |
| | | මයුරපුර | 23 | සූරිය වැව | 5 |
| 9 | රඹකැන්ඔය | මහඔය | 24 | මහඔය | 4 |
| | | බදුල්ල | 25 | බදුල්ල | 6 |
| 10 | මු.වැ.පා.ක්‍රි.න | පොල්ගොල්ල | 26 | මහනුවර | 4 |
| | | කොත්මලේ 119 1 | 27 | කොත්මලේ | 4 |
| | | රන්දෙණිගල VIP 1 | 28 | මහියංගනය | 3 |
| | | බෝවතැන්න | 29 | නාවුල | 3 |
| | | මාදුරු ඔය | 30 | අරලගංවිල | 4 |
| 11 | රත්මලාන | රත්මලාන | 31 | රත්මලාන | 8 |

2017/04/03 දින සිට ක්‍රියාත්මක වන පරිදි අධිකාරිය සතු සියලුම සංචාරක බංගලා ආදායම් උත්පාදන ව්‍යාපෘතියක් ලෙස පරිවර්තනය කිරීම පිණිස අධ්‍යක්ෂ (ව්‍යාපාර සංවර්ධන) යටතට පත්කරනු ලැබු අතර, ව්‍යාපාර සංවර්ධන අංශය තුල ස්ථාපිත කරනු ලැබූ මෙහෙයුම් ඒකකය සහකාර අධ්‍යක්ෂවරයෙකු (ව්‍යාපාර සංවර්ධන) යටතේ ක්‍රියාත්මක කෙරේ.

## 3.5.6 2018 නවීකරණය කරන ලද සංචාරක බංගලා

උල්හිටිය රත්කිඳ සංචාරක බංගලාවේ පූර්ණ අළුත්වැඩියාවක්ද, නොච්චියාගම ගොඩනැගිලි අළුත්වැඩියාවක්ද, කොත්මලේ සහ බකමූණ ගොඩනැගිලි අළුත්වැඩියාව සමඟ නව ලී බඩු සහ උපකරණ යොදා නවීකරණය සිදු කරන ලදි. වික්ටෝරියා, තඹුත්තේගම, රන්දෙනිගල, බූවැලිකඩ සහ ඇඹිලිපිටිය





සංචාරක බංගලා ලී බඩු සහ උපකරණ යොදා නවීකරණය කටයුතු සිදු කෙරිණි.




කලාවැව, නුවරඑළිය, බකමූණ හා නොච්චියාගම සංචාරක බංගලාවන්හි නවීකරණ කටයුතු තව දුරටත් සිදු වෙමින් පවතී.

### 3.5.7 2018 වර්ෂයේ සංචාරක බංගලා ආදායම් උත්පාදනය

2017 වර්ෂයේ සංචාරක බංගලා ආදායම් උත්පාදන ව්‍යාපෘතියක් ලෙස පරිවර්ථනය කිරීමත් සමඟ 2016 වර්ෂයට සාපේක්ෂව ආදායම් උත්පාදනය **රු.මි.3.6 කින්** ඉහළ ගොස් ඇත.

| වර්ෂය | ආදායම (රු) |
|---|---|
| **2016** | 1,661,000.00 |
| **2017** | 5,260,450.00 |
| **2018** | 11,145,605.00 |




### 3.5.8 සංචාරක බංගලා සම්බන්ධ වර්තමාන තත්වයන් -

- අන්තර්ජාල ඔස්සේ වෙන් කිරීමේ පහසුකම් සළසා ඇති සංචාරක බංගලා ගණන - 13
- අන්තර්ජාල පහසුකම් ඔස්සේ වෙන්කිරීමේ පහසුකම් නොමැති සංචාරක බංගලා ගණන- 10
- ඉදිකිරීම් කටයුතු සිදුවෙමින් පවතින සංචාරක බංගලා ගණන- 03
- 2018 වසරේ ආදායම් උත්පාදනය - රු.මි.11.4
- අන්තර්ජාල පහසුකම් මත උපයාඇති මුදල - රු.මි. 3.45
- අන්තර්ජාල පහසුකම් නොමැතිව උපයා ඇති මුදල - රු.මි.7.85

### 3.5.9 මහවැලි සවිය" ණය යෝජනා ක්‍රමය (2018 දෙසැම්බර් දක්වා)

2018 වර්ෂය තුළ මහවැලි අධිකාරිය ප්‍රාදේශීය සංවර්ධන බැංකුව හා එක්ව රු. මිලියන 39.67ක ණය මුදලක් ව්‍යවසායකයින් 225 දෙනෙකු සඳහා ලබා දී ඇත.

### 3.5.10 "මොරගහකන්ද අත්වැල" ණය වැඩ සටහන

මොරගහකන්ද කලාපය තුළ නැවත පදිංචි කළ ජානපදිකයන් අතරින් ව්‍යාපාරික කටයුතු ආරම්භ කිරීම සඳහා 2018 වර්ෂයේ දී ව්‍යාවසායකයින් 11 දෙනෙකු සඳහා රු.මි.3.1 ක ණය පහසුකම් ලබා දී ඇත.

### 3.5.11 මහවැලි හෙළ බොජුන්හළ ව්‍යාපෘතිය

පාරම්පරික දේශීය ආහාර ප්‍රචලිත කිරීම හා කාන්තා ව්‍යවසායකත්වය වර්ධනය තුළින් කුටුම්භ වල ආර්ථිකය නඟා සිටුවීම, දේශීය ආහාර අවම මිලක් යටතේ පාරිභෝගිකයන්ට ලබා දීමට හා කලාපීයව සෘජු හා වක්‍ර රැකියා උත්පාදනය යන මූලික අරමුණු පදනම් කරගනිමින් නව ව්‍යාපෘතියක් ලෙස මහවැලි හෙළ බොජුන්හල් බී හා සී කලාපයේ ආරම්භ කර ඇත. 2018 වර්ෂයේ අගෝස්තු මස 02 වන දින බී කලාපයේ මනම්පිටිය හෙළබොජුන් හල විවෘත කිරීමත් සමඟම හෙළ බොජුන්හල් 02ක් දැනට ස්ථාපිතව ඇත.

මෙම හෙළබොජුන්හල් ස්ථාපිත වීම මගින් වස විසෙන් තොර දේශීය ආහාර පොදු ජනයා වෙත ලබා දීමට අපේක්ෂා කෙරේ.මෙම හෙළ බොජුන් සැල් මගින් බී හා සී කලාප වල සෘජු රැකියා අවස්ථා 40 ක් ද වක්‍ර රැකියා අවස්ථා රසක්ද ජනිත වී ඇත.





## 3.5.12 මහවැලි ජලාශවල බෝට්ටු සේවා ආරම්භ කිරීම.

| අනු අංකය | ජලාශය/ ගංගාව | ආයෝජකයා පිළිබඳ තොරතුරු (ලිපිනය) | බදු කාලසීමාව | මූලික තැන්පතුව රු | වාර්ෂික බදු මුදල රු. |
|---|---|---|---|---|---|
| 01 | වික්ටෝරියා | වික්ටෝරියා ලෙෂර් (පුද්) සමාගම 339/6, මීගමු පාර, පැලියගොඩ | 2016.01.06 සිට 2021.01.05 දක්වා | 100,000.00 | පළමු වර්ෂ 2 සඳහා 75000 බැගින් වන අතර පසුව 5% බැගින් වාර්ෂිකව වැඩි වේ. |
| 02 | පොල්ගොල්ල | මහවැලි රිච් හෝටලය 35, පී.බී.ඒ. වීරකෝන් මාවත, මහනුවර (මෝටර් බෝට්ටු) | 2016.02.09 - 2019.02.08 දක්වා | 100,000.00 | 181,912.50 |
| | | සිනමන් සිටාඩෙල් අංක 117, සර් චිත්තම්පලම් ඒ. ගාර්ඩිනර් මාවත, කොළඹ 02 | 2016.02.09 සිට 2019.02.08 දක්වා | 100,000.00 | 181,912.50 |
| | | මහවැලි රිච් හෝටලය, අංක 35, පී.බී.ඒ වීරකොන් මාවත,මහනුවර (කායක්) | 2016.08.02 සිට 2018.08.02 | 100,000.00 | 300,000.00 |
| 04 | දඹුලුඔය | ඩී.පී.තලගල ප්ලෙෂර් අයිලන්ඩ්, ජලාශ පාර,දඹුල්ල | අවු 01 | 100,000.00 | 330,000.00 |
| 05 | මහවැලි ගඟ | එල්.එල් දිමුතු දයානන්ද | අවු 01 | 25,000.00 | 25,000.00 |
| 06 | ලොග්ගල් ඔය හා හෙප්පොල ඔය | වෝටර් වේස් ඇඩ්වෙන්චර්ස් (පුද්) සමාගම ( ස්ටෑන්ඩ් පැඩ්ල් බෝට්) | මාස 06 | 50,000.00 | 40,000.00 (පළමු මාස 6 සඳහා) |

### 3.5.13 පරිසර හිතකාමී සංචාරක බෝට්ටු සේවා ක්‍රියාත්මක කිරීම.

වික්ටෝරියා හා පොල්ගොල්ල ජලාශයන් සහ ලොග්ගල්ඔය සහ දඹුළුඔය ආශ්‍රිතවද පරිසර හිතකාමී සංචාරක බෝට්ටු සහ ඔරු සේවාවන් ක්‍රියාත්මක විය. එමගින් වාර්ෂිකව රු.මි.1,091,670.62 ක ආදායමක් උපයා ගන්නා ලදි.



### 3.5.14 ව්‍යාවසායකයන් සඳහා පුහුණු වැඩසටහන්.

- කුසලතා සංවර්ධන සහ තාක්ෂණික සම්බන්ධ වැඩසටහන් 168ක් මහවැලි කලාපයක් තුළ 2018 වර්ෂයේ ක්‍රියාත්මක කරන ලදි.
- නව ව්‍යාවසායක් ඇති කිරීම සඳහා ආයෝජන ප්‍රවර්ධන වැඩසටහන් 62 ක් මහවැලි කලාපයන් තුළ 2018 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලදි.
- වෙළඳපළ ප්‍රවර්ධන වැඩසටහන් 11ක් සහ ව්‍යාවසායකත්ව සංවර්ධන වැඩසටහන් 51ක් 2018 වර්ෂය තුළ ක්‍රියාත්මක විය. රැකියා අවස්ථා 600ක් මහවැලි ප්‍රදේශ තුළ 2018 වර්ෂය තුළ ක්‍රියාත්මක විය.
- රැකියා අවස්ථා 600 ක් මහවැලි ප්‍රදේශ තුළ 2018 වර්ෂය තුළ ජනිත වී ඇත.
- 2018 වර්ෂයේ ව්‍යාපාර සංවර්ධන අංශය විසින් මහවැලි කලාපවල දරුවන් සඳහා වෘත්තීය නිපුණතාව ලබා දීම සඳහා වෘත්තීය පුහුණු අධිකාරිය හා එක්ව මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදි. ඒ සඳහා රු.මි.3.52 ක් වටිනා ශිෂ්‍යත්ව 227ක් ලබා දෙන ලදි.

# සිව්වන පරිච්ඡේදය

## මානව සම්පත් හා මූල්‍ය කළමනාකරණ අංශය

## 4.1 පිරිස් හා පාලන අංශය

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ මානව සම්පත් කළමනාකරණය පිළිබඳ සියලුම කටයුතු සිදුකරනු ලබනුයේ පිරිස් හා පාලන අංශය මගිනි.

**පිරිස් හා පාලන අංශය වෙත පැවරි ඇති කාර්යභාරයන්:**

පිරිස් හා පාලන අංශය ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ප්‍රධාන අංශ අතරට ඇතුළත් වන අතර, එම අංශය වෙත පැවරි ඇති කාර්යභාරයන් අතිවිශාලය.

- සේවක සංඛ්‍යා අංශය හඳුනා ගැනීම.
- සේවක සංඛ්‍යාව සැළසුම් කිරීම.
- සේවක සංඛ්‍යා සංශෝධනය කිරීම.
- කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම හා සේවකයින් ස්ථානගත කිරිම.

**මානව සම්පත් ආකර්ෂණය කර ගැනීම.**

- ⋆ පුරප්පාඩු සඳහා අයදුම්පත් කැඳවීම.
- ⋆ විභාග/ සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම.
- ⋆ සුදුස්සන් තෝරා පත් කර ගැනීම

**මානව සම්පත් පුහුණුව හා සංවර්ධනය**

- ⋆ අතහුරු කිරීමේ වැඩසටහන්
- ⋆ පුහුණු කිරීමේ වැඩසටහන් පැවැත්වීම.
- ⋆ දේශීය විදේශීය ශිෂ්‍යත්ව ලබා දීම.
- ⋆ උසස්වීම් හා වැටුප් වර්ධක ලබා දීම.
- ⋆ සේවය ස්ථිර කිරීම.

- මානව සම්පත් අභිප්‍රේරණය හා ආකල්ප වර්ධනය
- ස්ථාන මාරු
- විශ්‍රාම ගැන්වීම.
- සේවය අවසන් කිරීම.
- පාරිතෝෂික දීමනා ප්‍රතිලාභ නිදහස් කිරීම.
- සේ.අ.අ./සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් සම්බන්ධ කටයුතු

- විනය කටයුතු
- දිරිගැන්වීම
- කාර්ය සාධනය ඇගයීම
- කාර්ය මණ්ඩල අධීක්ෂණය හා සුපරීක්ෂණය
- මෙහෙයවීම හා සංවිධානය
    - ★ පාලන
    - ★ ප්‍රවාහන
    - ★ සැලසුම් හා මෙහෙයුම්
    - ★ ආරක්ෂක
    - ★ ඉඩම් අංශය
    - ★ නීති අංශය
- සම්බන්ධීකරණය (විවිෂ අංශ හා බාහිර පාර්ශවයන් අතර)

- මහජන සම්බන්ධතාවය
    - ★ නිල උත්සව සම්බන්ධ කටයුතු
    - ★ පරිපාලන කටයුතු සම්බන්ධයෙන් පාර්ලිමේන්තු උපදේශන කාරක සභා
    - ★ මහජන පෙත්සම් කාරක සභා
    - ★ පාර්ලිමේන්තු වාචික ප්‍රශ්න වලට පිළිතුරු සැපයීම සහභාගී වීම හා අනෙකුත් අංශ සම්බන්ධීකරණය

- පාලන අංශයට අදාළ වාර්ෂික ඇස්තමේන්තු සකස් කිරීම.
- කාර්යාල ක්‍රම ක්‍රියාත්මක කිරීම.
- ඇගයීම හා නව ක්‍රමවේද හඳුන්වා දීම.

## 4.1 -1 2018 වර්ෂයේ තැබූ ඉලක්ක හා අත්කරගත් ප්‍රගතිය

**2018 වර්ෂයේ තැබූ ඉලක්ක:**

- සියලු අංශ වල සේවක පුරප්පාඩු හඳුනාගැනීම හා පුරප්පාඩු සඳහා අයදුම්පත් කැඳවීමට කටයුතු කිරීම.
- ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අංශවල වාර්ෂික ස්ථානමාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම.

### 4.1.2 ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ පවතින පුරප්පාඩු සඳහා වර්ෂයේ තනතුරු උසස්වීම්/ නව බඳවා ගැනීම් පිළිබඳ තොරතුරු වාර්තාව.

| අනු අංකය | තනතුර | අභ්‍යන්තර සංඛ්‍යාව |
|---|---|---|
| 1 | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සංවර්ධන -කොන්ත්‍රාත්) | 1 |
| 2 | සහකාර අධ්‍යක්ෂ/ නියෝජ්‍ය අධ්‍යක්ෂ (නීති) | 2 |
| 3 | ඉංජිනේරු/ ප්‍රධාන ඉංජිනේරු (සිවිල්) | 24 |
| 4 | ගිණුම් නිලධාරි | 5 |
| 5 | ඒකක කළමනාකාර | 1 |
| 6 | සංවර්ධන සහකාර | 8 |
| 7 | ජල තත්ත්ව සහකාර | 5 |
| 8 | පශු සම්පත් සංවර්ධන සහකාර | 26 |
| 9 | ඉංජිනේරු සහකාර (සිවිල්) | 8 |
| 10 | කාර්මික සහකාර | 48 |
| 11 | කළමනාකරණ සහකාර | 13 |
| 12 | සංචාරක බංගලා භාරකරු | 9 |
| 13 | ආරක්ෂක නියාමක | 53 |
| 14 | වාරිමාර්ග සේවක (කොන්ත්‍රාත්) | 8 |
| | **එකතුව** | **211** |

### 4.1.3 ශ්‍රී ලංකා මහවැලි අධිකාරියෙහි 2018 වර්ෂයේ අභ්‍යන්තර උසස්වීම් පිළිබඳ තොරතුරු වාර්තාව.

| අනු අංකය | තනතුර | අභ්‍යන්තර සංඛ්‍යාව |
|---|---|---|
| 1 | අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණක) | 1 |
| 2 | අධ්‍යක්ෂ (ධීවර හා පශු සම්පත්) | 1 |
| 3 | සහකාර අධ්‍යක්ෂ (සැලසුම් හා නියාමන) | 1 |
| 4 | නියෝජ්‍ය නේවාසික ව්‍යාපාර කළමනාකාර (ඉඩම්) | 4 |
| 5 | නියෝජ්‍ය නේවාසික ව්‍යාපාර කළමනාකාර (කෘෂිකර්ම) | 2 |
| 6 | කොට්ඨාස කළමනාකාර | 7 |
| 7 | පටක රෝපණ නිලධාරි | 1 |
| 8 | ධීවර හා පශු සම්පත් සංවර්ධන නිලධාරි | 1 |
| 9 | තාක්ෂණ ඉංජිනේරු (සිවිල්) | 1 |
| 10 | ගිණුම් නිලධාරි | 1 |

| අනු අංකය | තනතුර | අභ්‍යන්තර සංඛ්‍යාව |
|---|---|---|
| 11 | අභ්‍යන්තර විගණක නිලධාරි | 1 |
| 12 | සැලසුම් නිලධාරි | 2 |
| 13 | ආයතන සංවර්ධන නිලධාරි | 11 |
| 14 | ව්‍යපාර සංවර්ධන නිලධාරි | 2 |
| 15 | ඉඩම් නිලධාරි | 4 |
| 16 | සැපයුම් නිලධාරි | 2 |
| 17 | ප්‍රවාහන නිලධාරි | 1 |
| 18 | ඉඩම් නිලධාරි | 1 |
| 19 | පරිපාලන නිලධාරි | 3 |
| 20 | ප්‍රගති පාලන නිලධාරි | 1 |
| 21 | ව්‍යාපෘති සැලසුම් නිලධාරි | 1 |
| 22 | ඒකක කළමනාකාර | 10 |
| 23 | සංවර්ධන සහකාර | 14 |
| 24 | ඉංජිනේරු සහකාර (සිවිල්) | 35 |
| 25 | කළමනාකරණ සහකාර | 4 |
| 26 | ක්ෂේත්‍ර සහකාර | 14 |
| 27 | වැඩ මූලික | 3 |
| 28 | රියදුරු | 1 |
| | එකතුව | **130** |

### 4.1.4 ශ්‍රී ලංකා මහවැලි අධිකාරියෙහි 2018 වර්ෂයේ පුහුණු කිරීම් අංශයේ පුහුණු වැඩසටහන් වල සාරාංශය

| අනු අංකය | වැඩසටහන් වර්ගීකරණය | සහභාගී වූ සංඛ්‍යාව | පැවැත්වූ පුහුණු වැඩසටහන් ගණන | වියදම (රු.) |
|---|---|---|---|---|
| 01 | අභ්‍යන්තර පුහුණු වැඩසටහන් | 19 | 926 | 8,003,288.00 |
| 02 | කෙටි කාලීන පුහුණු වැඩසටහන් | 23 | 111 | 5,92426.00 |
| 03 | දේශීය ශිෂ්‍යත්ව සඳහා නිලධාරි සහභාගීත්වය | 22 | 23 | 919,900.00 |
| | එකතුව | 64 | 1060 | 9,515,614.66 |

# 4.2 නීති අංශය

**හැඳින්වීම:**

1979 අංක 23 දරණ මහවැලි අධිකාරි පනත හා ඊට අනුශාංගික පනත් 23 ට අදාළ නීතිමය කටයුතු සැළසුම් කිරීම, විවිධ ආයතන හා පුද්ගලයන් අතර සිදුවන නෛතික ගිවිසුම් සැකසුම් හා ක්‍රියාවට නැංවීම, සේවා හා සේවක ගැටළු සම්බන්ධයෙන් යොමුවුණු පැමිණිලි සම්බන්ධව පාර්ලිමේන්තු උපදේශන කාරක සභාව, පෙත්සම් කාරක සභාව, පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්, බේරුම්කරණය, කම්කරු විනිශ්චය සභාව, මානව හිමිකම් කොමිෂන් සභාව වැනි නෛතික ආයතන සමග සම්බන්ධීකරණය මෙම අංශය පැවරි ඇති රාජකාරි අතර ප්‍රධාන තැනක් ගනී.

## 4.2.1 නීති අංශය විසින් මෙහෙයවනු ලබන නඩු

01. ශ්‍රේෂ්ඨාධිකරණය
02. අභියාචනාධිකරණය
03. සිවිල් අභියාචනාධිකරණය
04. මහාධිකරණය
05. දිසා අධිකරණය
06. මහේස්ත්‍රාත් අධිකරණය
07. කාර්මික අධිකරණය
08. කම්කරු විනිශ්චය සභාව

## 4.2.2 2018 වර්ෂයේ නීති උපදෙස් ලබා දෙන විෂය ක්ෂේත්‍ර

01. සේවක ගැටළු
02. වාහන අනතුරු
03. ගිවිසුම් සම්බන්ධ
04. ජලාශවල මීටර් 100 රක්ෂිත සම්බන්ධ කටයුතු කළ යුතු ආකාරය
05. අධිකාරියට අයවිය යුතු මුදල් අයකිරීම සම්බන්ධයෙන් උපදෙස් ලබාදීම
06. කුඩා පරිමාණ විදුලි උත්පාදන ව්‍යාපෘති සඳහා අවශ්‍ය අදාල උපදෙස් ලබාදීම
07. ලංකා මහවැලි අධිකාරියට අයත් සමාගම් සම්බන්ධ කටයුතු කිරීම හා උපදෙස් ලබාදීම

## 4.2.3 හිඟ බදු අයකර ගැනීමට අදාලව ගෙන ඇති පියවර

01. නඩු පැවරීම
02. දැන්වීම් යැවීම
03. එන්තරවාසි යැවීම
04. රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබාගැනීමේ) පනත යටතේ අස්කිරීමේ නිවේදන යැවීම

# 4.3 මුදල් අංශය

ආයතනයේ සංයුක්ත සැලසුම  හා වාර්ෂික සැලසුම අනුව ඇස්තමේන්තු පිළියෙල කිරිම, ජාතික අයවැය ලේඛනය යටතේ මහවැලි අධිකාරිය සඳහා කරනු ලබන ප්‍රතිපාදන මත අයවැය යෝජනා සැලැස්ම, මාසිකව අවශ්‍ය මුදල් පිළිබඳ පූරෝකථනය කිරීම හා භාණ්ඩාගාරයේ අක් මුදල් ලබා ගැනීම, දේශිය හා විදේශීය ව්‍යාපෘති වල වාර්ෂික ඇස්තමේන්තු පිළියෙල කිරීම හා ප්‍රතිපාදන ලබා ගන්නා වු සේවක වැටුප් හා අනෙකුත් ගෙවීම් කළමණාකරන ආයතනයක් භෞතික සම්පත් කළමණාකරණය, විගණන විමසුම, සහ රාජ්‍ය ව්‍යයසාය පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභාවේ විමසුම, අනුව තොරතුරු සැපයීම වැනි මූල්‍ය කළමණාකරන කටයුතු මෙම අංශය වෙත පැවරෙන විශේෂ කාර්යභාරය වේ.

## 4.3.1 ප්‍රතිපාදන වියදම් පිළිබඳ විස්තරය

| | ප්‍රාග්ධන මූල | ප්‍රතිපාදන | වියදම |
|---|---|---|---|
| පුනරාවර්තන වියදම් | | 269,384 | 269,384 |
| ප්‍රාග්ධන වියදම් | | 1,108,000 | 1,108,000 |
| මහවැලි ව්‍යාපෘති | | | |
| MCP "B" ව්‍යාපෘතිය | දේශීය | 290,000 | 290,000 |
| මාදුරුඔය දකුණු ඉවුර | දේශීය | 60,000 | 60,000 |
| රිදීමාලියද්ද සංවර්ධන ව්‍යාපෘතිය | දේශීය | 64,000 | 64,000 |
| රඹකැන්ඔය ව්‍යාපෘතිය | දේශීය | 94,000 | 94,000 |
| වැලිඔය ඒකාබද්ධ ව්‍යාපෘතිය | දේශීය | 247,200 | 247,200 |
| ප්‍රධාන හා මධ්‍යම වාරිමාර්ග පද්ධතිය පුනරුත්ථාපනය කිරීම | දේශීය | 137,000 | 137,000 |
| මහවැලි ගැටඹේ ව්‍යාපෘතිය | දේශීය | - | - |
| කිවුල්ඔය ව්‍යාපෘතිය | දේශීය | 12,800 | 12,800 |
| කෘෂි හා පශු සම්පත් | දේශීය | 175,000 | 175,000 |
| එකතුව | | 2,188,000 | 2,188,000 |

## 4.3.2 වත්කම් හා දේපල උපකරණ

| විස්තරය | 01.01.2018 දිනට පිරිවැය | මිලදී ගැනීම් | විකිණීම්, ඉවත් කිරීම්, මාරු කිරීම් | 31.12.2018 දිනට පිරිවැය | ක්ෂයවීම් | රු'000<br>31.12.2018 ක්ෂය අඩු කළ පසු |
|---|---|---|---|---|---|---|
| ඉඩම් | - | - | - | 762,325 | - | 762,325 |
| ගොඩනැගිලි හා කාර්යාල | 2,056,990 | 57,413 | 103,140.84 | 2,144,885 | 520,926 | 1,623,958 |
| ගොඩනැගිලි - වෙනත් | 2,767,143 | 32,184 | 46,328.22 | 2,764,578 | 1,376,730 | 1,387,848 |
| රථ වාහන | 1,149,045 | 17,477 | 81,209.33 | 1,167,395 | 943,219 | 224,176 |
| කාර්යාල උපකරණ හා සුබ සාධක අයිතම | 111,355 | 20,508 | 18,932.05 | 135,879 | 54,255 | 81,624 |
| විදුලි ජනක යන්ත්‍ර | 19,098 | 4,562 | 5.70 | 23,655 | 10,007 | 13,647 |
| යන්ත්‍ර හා උපකරණ - වැඩමුළු සේවා | 52,095 | 3,048 | 16,465.53 | 43,365 | 26,793 | 16,572 |
| යන්ත්‍ර හා උපකරණ - ඉදිකිරීම් | 362,932 | 1,238 | 79,404.03 | 388,731 | 232,400 | 156,331 |
| යන්ත්‍ර හා උපකරණ - පොදු | 97,884 | 13,312 | 5,784.71 | 112,397 | 40,057 | 72,340 |
| ගෘහ උපකරණ හා සවි කිරීම් | 242,319 | 28,321 | 256,826.06 | 243,518 | 5,397 | 238,121 |
| පරිගණක හා උපාංග | 139,194 | 33,968 | 53,320.40 | 184,522 | 89,710 | 94,812 |
| පොත් සහ අත් පොත් | 3,557 | 325 | 114.47 | 3,996 | 94 | 3,902 |
| එකතුව | 7,001,612 | 212,356 | 661,531 | 7,975,245 | 3,299,588 | 4,675,657 |

## 4.4 මහවැලි ආරක්ෂක බලකාය

**හැඳින්වීම :**

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ප්‍රධාන ඉදිකිරීම්, අවශේෂිත ගොඩනැගිලි සංකීර්ණ සහ දේපල ආරක්ෂා කිරීම ප්‍රධාන කොටගෙන ද, මහවැලි නිළධාරින් හා කාර්ය මණ්ඩලය / ජනපදිකයින් ආරක්ෂා කරනු වස් ද 1985 වර්ෂයේ මැද භාගයේ දී මහවැලි ආරක්ෂක බලකාය පිහිටුවන ලදි.

මෙම අවධියේ දී මහවැලි ආර්ථික ඒජන්සිය හා මහවැලි ඉංජිනේරු හා නිර්මාණ ඒජන්සියේ ආරක්ෂක කටයුතු එම ආයතන මඟින්ම ආරක්ෂක නිළධාරින් සුළු පිරිසකින් ඉටු කර ගත් අතර, එම සංඛ්‍යාව ප්‍රමාණයෙන් ඉතා සුළු පිරිසක් වූහ. ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ආරක්ෂක කටයුතු විමධ්‍යගත කිරීමේ පරමාර්ථයෙන් හා විධිමත්ව පාලන හා මෙහෙයුම් කටයුතු ඉටු කිරීම සඳහා මහවැලි අධිකාරියේ උපදෙස් පරිදි මහවැලි ආර්ථික ඒජන්සියේ හා මහවැලි ඉංජිනේරු හා නිර්මාණ ඒජන්සියේ සේවය කල ආරක්ෂක නිලයන් 1989 වර්ෂයේ දී මහවැලි ආරක්ෂක බලකාය වෙත අන්තර්ග්‍රහණය කරන ලදි.

**ප්‍රධාන අරමුණු:**

- මහවැලි අධිකාරියේ ප්‍රධාන ඉදිකිරීම් හා අවශේෂිත ගොඩනැගිලි පද්ධති ආරක්ෂා කිරීම.
- මහවැලි අධිකාරියට අයත් කාර්යාල සංකීර්ණ හා බඩුබාහිරාදිය , උපකරණ ආරක්ෂා කිරීම.
- මහවැලි අධිකාරියට අයත් කාර්ය මණ්ඩල හා ජනපදිකයින්ට අවශ්‍ය ආරක්ෂාව ලබා දීම.

### 4.4.1 2018 වර්ෂයේ අත්පත් කර ගත් ඉලක්ක

- මඩකලපු ප්‍රදේශයේ පැවැත් වූ 2018 මැයි දින උත්සවයේ අප බලකායට පැවරවූ රාජකාරි නිළයන් 400 කට ආසන්න ප්‍රමාණයක් යොදවමින් සාර්ථකව ඉටු කරන ලදි.
- මෙම බලකායේ පුරප්පාඩු වූ ආරක්ෂක නියාමක තනතුරු සඳහා නිළයන් 53 දෙනෙක් ආධුනිකයන් වශයෙන් බඳවා ගත් අතර ඔවුනගේ මූලික පුහුණුව 2018-07-02 දින සිට 2018-08-07 දින තෙක් කොත්මලේ වාරිමාර්ග හා ජල කළමණාකරන පුහුණු පාසලේ දී සාර්ථකව සිදු කළ අතර එහි විසිර යාමේ පෙළපාලිය අතිගරු ජනාධිපති තුමන්ගේ දියණියගේ හා අධ්‍යක්ෂ ජනරාල් (ශ්‍රී.ල.ම.අ.) ගේ සහභාගිත්වයෙන් අදාළ පුහුණු පාසලේ දි 2018-08-08 දින අති උත්කර්ෂවත් ලෙස සිදු කරන ලදි.
- 2018 වර්ෂයේ මහවැලි ක්‍රීඩා උත්සවයට සමගාමීව එහි ඔලිම්පික් පහන 2018-09-05 දින කොළඹින් ආරම්භ කර 2018-09-15 දින තෙක් සමස්ථ මහවැලි කලාපයන් ආවරණය වන සේ ඇඹිලිපිටිය මහවැලි ක්‍රීඩාංගනය වෙත ගමනාවාර පෙළපාලියේ රැගෙන යාමේ දී මෙම බලකායට පවරන ලද යතුරුපැදි ධාවකයින් යෙදවීම සහ සෙසු රාජකාරි සාර්ථකව ඉටු කරන ලදි.
- 2018-09-15 ,16 දෙදින තුළ ඇඹිලිපිටිය මහවැලි ක්‍රීඩාංගනයේ දි පැවැත් වූ මහවැලි ක්‍රීඩා උත්සවයේ උත්තමාචාර සම්මාන රාජකාරි මෙන්ම අනෙකුත් ආරක්ෂක රාජකාරීන් මෙම බලකාය වෙතින් සාර්ථකව ඉටු කරන ලදි.
- තව ද 2018-12-05 දින සිට 2018-12-12 දින දක්වා රංටැඹේ වන ජීවී පුහුණු ආයතනයේ දි මෙම බලකායේ ආරක්ෂක නිළයින් 43 දෙනෙකු උදෙසා විශේෂ සේවා සංස්කරණ පුහුණු පාඨමාලාවක් සිදු කළ අතර මෙහි දේශන සහ උපදේශකත්වය ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිළධාරි/ උපදේශකයින් යොදවා සිදු කිරීම විශේෂයෙන් සඳහන් කරමි.

## 2018 අත්පත් කර ගත් මූල්‍ය හා භෞතික ප්‍රගතිය

### මූල්‍ය ප්‍රගතිය

| ගිණුම් අංකය | වෙන් වූ මුදල<br>මිලියන | වියදම් වූ මුදල<br>මිලියන |
|---|---|---|
| 2385 - ගොඩනැගිලි | 16.00 | 14.5 |
| 2383 - වාහන නඩත්තු | 02.00 | 0.80 |
| 2705 - කාර්යාල උපකරණ | 01.00 | 2.7 |
| 2822 - මහවැලි ක්‍රීඩා | 01.00 | 1.5 |
| | 20.00 | 19.5 |

### භෞතික ප්‍රගතිය

| ගිණුම් අංකය | වෙන් කළ ගණන | භෞතික ප්‍රගතිය |
|---|---|---|
| 2385 ගොඩනැගිලි | 13 | 11 |
| 2383 වාහන | 03 | 02 |
| 2705 කාර්යාල උපකරණ | 60 | 60 |
| 2822 මහවැලි ක්‍රීඩා | 01 | 01 |
| | 77 | 74 |

# 4.5 මහවැලි කේන්ද්‍රය

වාර්ෂික වැඩ සැලැස්මට අනුව මහවැලි කේන්ද්‍රයේ කාර්යභාරය ප්‍රධාන අංශ හතරක් ඔස්සේ ඉටුකරනු ලබන අතර, සංස්කෘතික අංශය මගින් මහවැලි ජානපදික දරු දැරියන්ගේ සෞන්දර්ය හා සංස්කෘතික කෞෂල්‍යයන් ඔප් නංවමින් ජාතික හා ජාත්‍යන්තර තලයට ගෙනයාමත්, ක්‍රීඩා කෞෂල්‍යයන් ඔප් නංවමින් ජාතික හා ජාත්‍යන්තර තලයට ක්‍රීඩක ක්‍රීඩිකාවන් රැගෙන යාම ක්‍රීඩා අංශයේ කාර්යයභාරයත් වන අතර මෙම අංශ දෙක මගින් මහවැලි ජානපදික හතරවන පරම්පරාවේ දරු දැරියන්ගේ ආර්ථික, සාමාජීය හා සංස්කෘතික තත්වය ගොඩනැංවීමෙහිලා කටයුතු කරනු ලබයි. අධ්‍යාපන හා ප්‍රකාශන අංශය මගින් මහවැලි කලාපයන්හි වර්තමාන කටයුතු පිළිබඳ ප්‍රචාරාත්මක ප්‍රකාශන නිකුත් කිරීමට කටයුතු කරනු ලබන අතර, ජාතික වාරි කෞතුකාගාරය මහවැලි කේන්ද්‍රයේ ස්ථාපනයකර තිබීම මහවැලි ප්‍රෞඪත්වය පිළිබඳ මෙන්ම වාරි ශිෂ්ඨාචාරය සම්බන්ධ හෙළිදරව්වක් ජාතික ජාත්‍යන්තර තලයට එක් කරනු ලබයි. තාක්ෂණ හා නඩත්තු අංශය මගින් මහවැලි කේන්ද්‍රය හා සම්බන්ධ සියළු ඉදිකිරීම් නවීකරණ කටයුතු මෙන්ම එදිනෙදා නඩත්තු කටයුතු මෙහෙයවනු ලබයි.

## 4.5.1 ක්‍රීඩා අංශය

මහවැලි ජානපදික ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ ක්‍රීඩා කෞෂල්‍යයන් ඔප් නංවමින් ජාතික හා ජාත්‍යන්තර තලයට ක්‍රීඩක ක්‍රීඩිකාවන් රැගෙන යාම ක්‍රීඩා අංශයේ කාර්යය භාරය වන අතර, මෙහි කටයුතු පහත පරිදි වේ.

- මහවැලි ප්‍රදේශවල ක්‍රීඩා කුසලතා ඇති තරුණ තරුණියන් හඳුනා ගැනීම සහ දැනට ක්‍රීඩාවල නියැලෙන ක්‍රීඩකයින්ගේ තොරතුරු ලබාගෙන දීර්ඝකාලීන හා කෙටි කාලීන සැලසුම් සකස් කිරීම.
- ක්‍රීඩකයින් පුහුණු කිරීමේ සංචිතයක් ඇති කිරීම සහ ඒ මගින් ක්‍රීඩකයින් පුහුණු කිරීම.
- ක්‍රීඩා අමාත්‍යාංශයේ හා පළාත් ක්‍රීඩා අමාත්‍යාංශයේ නිර්ණායකයන් අනුව විවිධ තරග සඳහා ක්‍රීඩකයින් තෝරා ගැනීම සහ යොමු කිරීම.
- මහවැලි ක්‍රීඩා උළෙලේ කණ්ඩායම් තරග හා මලල ක්‍රීඩා ඉසව් සංවිධානය කිරීම හා ඊට අදාල සියළු කටයුතු.
- ක්‍රීඩකයින්ගේ සුභසාධනය සඳහා අවශ්‍ය කටයුතු සිදුකිරීම.
- ක්‍රීඩා උපකරණ හා ක්‍රීඩාංගන වැඩි දියුණු කිරීම සඳහා අවශ්‍ය කටයුතු කිරීම.
- ක්‍රීඩා සම්බන්ධ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන අතර, මා ආයතනයේ අංශ අතර, මනා සම්බන්ධතාවයක් පවත්වාගෙන යාම.
- ක්‍රීඩා ක්‍රියාකාරකම් පිළිබඳ ප්‍රගති වාර්තා ඉදිරිපත් කිරීම.
- ඒකක මට්ටමින් ක්‍රීඩක / ක්‍රීඩිකාවන් හඳුනා ගැනීමේ වැඩපිළිවෙලක් ඇති කිරීම. (සියලු කලාපවල)
- මහවැලි ක්‍රීඩා සමාජ පිහිටුවීම සඳදහා ක්‍රීඩක /ක්‍රීඩිකාවන් ඉදිරිපත් කිරීම.

## 4.5.2 2018 වර්ෂයේ තැබූ නව තරග වාර්තා

- ෆාතිමා සහීන් යමීන් ක්‍රීඩිකාව මීටර් 100 තරග වාර්තාවක් බිහිකිරීම තත්පර 12.24
- වයි.එම්. ජනිත සෞම්‍ය යාපා බණ්ඩාර දුරපැනීම තරග වාර්තාවක් බිහිකිරීම

## 4.5.3 සංස්කෘතික අංශය - මහවැලි කේන්ද්‍රය

මහවැලි ජානපදික දරුවන්ගේ කලා කුසලතා ඔප් නංවමින් ජාතික හා ජාත්‍යන්තර තලයට එම දරුවන් රැගෙන යාම සංස්කෘති අංශයේ කාර්යය භාරය වන අතර, මෙහි කටයුතු පහත පරිදි වේ.

- සංස්කෘතික සහ සෞන්දර්ය අංග ගණනාවක් යටතේ තරගාවලි පැවැත්වීම මගින් කලාපීය හා කොට්ඨාශ මට්ටමින් විවිධ දක්ෂතා සහිත දරුවන් හදුනා ගැනීම (ගායන, වාදන, නර්තන, නිවේදන, ආදී මෙන්ම කෙටිකතා, රචන, නාට්‍ය නිර්මාණ හා චිත්‍ර ආදී වශයෙන් )
- හඳුනාගන්නා ලද දරු දැරියන් මගින් මහවැලි ප්‍රතිභා කළා උත්සවය සංවිධානය කර පැවැත්වීම
- ඉහළ කලා කෞෂල්‍යයන් සහිත දරු දැරියන් ජාතික හා ජාත්‍යන්තර තලයේ තරග සඳහා සහභාගී කරවීමට අවස්ථාව ලබා දීම
- 2018 වර්ෂයේ අන්තර් කොට්ඨාශ සියළුම තරගාවලි පවත්වා අවසන් කර ඇතත්, මහවැලි ප්‍රතිභා 2018 කළා උළෙල නොපවත්වන ලදී.

## 4.5.4 අධ්‍යාපන හා ප්‍රකාශන අංශය

- 2018 වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ වාරි ශිෂ්ඨාචාරයේ ආරම්භයේ පටන් වාරි කර්මාන්තයේ විකාශනය පිළිබද සියළු තොරතුරු ඇතුලත් හෙළ වාරි පුරාවත ග්‍රන්ථය ප්‍රකාශයට පත් කිරීම
- මහවැලි ක්‍රීඩා 2018 සමරු කළඹ සකස්කර නිර්මාණය කිරීම, පුවත්පත් අතිරේකය සහ පුවත්පත් දැන්වීම් සකස් කිරීම ඇතුළු සියළු ප්‍රචාරක කටයුතු සිදුකිරීම.

## 4.5.5 කෞතුකාගාරය

රාජ්‍ය ආයතනයන්හි නිලධාරින් දැනුවත් කිරීමේ වැඩසටහනක් 2018 වර්ෂයේ පවත්වා ඇති අතර, කුඩා පුස්තකාලය සඳහා වාරි ශිෂ්ඨාචාරය හා සම්බන්ධ පොත් මිළදී ගැනීමේ කටයුතු සිදුකර ඇත.

## 4.5.6 නඩත්තු හා පාලන අංශය

2018 වර්ෂය තුලදී වාහන රථගාල ඉන්ටලොක් ගල් අල්ලා නවීකරණය කිරීම, වායු සමීකරණ යන්ත්‍ර සියල්ලක්ම නවීකරණය කිරීම, සියළුම දොරවල් අලුත්වැඩියාකර නවීකරණය කිරීම, සහ කාර්යාලිය උපකරණ රාශියක් මිළදී ගැනීමේ කටයුතු සිදුකර ඇත.

### 2018 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය

| අනු අංකය | අංශය | වෙන්කළ ප්‍රතිපාදනය රු. මිලියන | වැයවූ මුදල රු. මිලියන |
|---|---|---|---|
| 01 | මල්ටිමීඩියා සහ ලී බඩු මිළදී ගැනිම් | 6.250 | 3.747 |
| 02 | ඉදිකිරීම් සහ නවීකරණ | 0.557 | 0.298 |
| 03 | ක්‍රීඩා | 11.859 | 9.900 |
| 04 | අධ්‍යාපන හා ප්‍රකාශන | 0.725 | 0.356 |
| 05 | සංස්කෘතික | 2.568 | 1.851 |
| 06 | කෞතුකාගාරය | 0.860 | 0.089 |
| | එකතුව | **24.800** | **18.010** |

# 4.6 ප්‍රවාහන අංශය

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ වාර්ෂික වැඩ සැළැස්මට අනුව එන අරමුණු හා ඉලක්ක ලඟා කර ගැනිම සඳහා අත්‍යවශ්‍යම සේවාවන් අතර කඩිනම් කාර්යක්ෂම ප්‍රවාහන සේවාවක් ලබා දිම ප්‍රවාහන අංශය වෙත පැවරෙන විශේෂිත වගකිමක් වන අතර එය අංශය සතු මූලික අරමුණ වේ.

මේ සඳහා අධිකාරිය සතුව වාහන 723 ක සංචිතයක් පවතින අතර, ඒවා සැහැල්ලු වාහන 666, බර වාහන හා යන්ත්‍රෝපකරණ 57 ක් වශයෙන් වෙන් කොට දැක්විය හැකිය.

එම වාහන මෙහෙයුම්, නඩත්තු හා කළමනාකරණ කටයුතු ඉටු කිරිම ප්‍රවාහන අංශය සතු වගකිම වේ. එම වගකිම් අතර,

- වාහන අළුත්වැඩියාව/නඩත්තුව.
- අදායම් බලපත්‍ර සහ රක්ෂණ සහතික යාවත්කාලින කිරිම.
- ප්‍රධාන කාර්යාලයේ සිටින අදාල නිලධාරින්ට වාහන වෙන් කිරිම.
- වාහන නඩත්තුව හා ඉන්ධන සඳහා වාර්ෂික වියදම් ඇස්තමේන්තු සැකසිම.
- වාහන වලට ඉන්ධන ලබා දිම, වාර්තා තබා ගැනිම හා ධාවන සටහන් පරික්ෂා කිරිම.
- අධිකාරියට අයත් වාහන ලැයිස්තුව සකස් කිරිම හා යාවත්කාලින කිරිම.
- වාහන වලට සිදුවන හදිසි අනතුරු අවස්ථාවලදි ගතයුතු පියවර ගැනිම, රක්ෂණ වන්දි ලබා ගැනිම හා අදාල විෂය සම්බන්ධිකරණ කටයුතු පවත්වාගෙන යාම ආදිය වේ.

කලාප කාර්යාලයන් තුළ මෙම කාර්යයන් ප්‍රවාහන නිලධාරිවරයෙකු/ ප්‍රවාහන අංශය භාර නිලධාරියෙකු මඟින් ඉටුකරනු ලබන අතර, වාහන අළුත්වැඩියා කටයුතු සඳහා තඹුත්තේගම යාන්ත්‍රික වැඩපල ප්‍රමුඛ යාන්ත්‍රික වැඩපල 06 ක් යාන්ත්‍රික ඉංජිනේරුවරයෙකුගේ අධික්ෂණය යටතේ පවත්වාගෙන යනු ලබයි.

2018 වසර සඳහා වෙන් කරන ලද ඉලක්ක ගත ප්‍රාග්ධන වියදම මිලියන 08 ක් වු අතර, වසර අවසානය වන විට එම ඉලක්කය වෙත ලගා විමට හැකියාව ලැබුණි.

එම වසර තුල අළුත්වැඩියාවන් 290 ක් හා වාර සේවාවන් 148 සිදු කර ඇති අතර, ඒ සඳහා රු. 14,746,713.39ක වියදමක් දරා ඇත. තවද එකි වසර තුළ ක්ෂේත්‍ර චාරිකා 680 ක් සංවිධානය කර ඇති අතර ඒ සඳහා ඉන්ධන වියදම් ලෙස රු. 5,064,888.75 ක් ද වැය වි ඇත.

ප්‍රධාන කාර්යාලයට අනුයුක්ත වාහන අතරින් 10 ක් සම්පූර්ණ රක්ෂණය කර ඇති අතර අනෙකුත් සියළුම වාහන තුන්වන පාර්ශවයේ රක්ෂණය කර ඇත. ඒ සඳහා රු. 857,655.37 ක්ද, ආදායම් බලපත්‍ර වෙනුවෙන් රු. 349,552.00 ක මුදලක් ද වැය වි ඇත.මෙම වසර තුළ වාහන අනතුරු 15 ක විමර්ෂන කටයුතු සම්පූර්ණ කර අවශ්‍ය විනය ක්‍රියාමාර්ගයන් ගෙන ඇත.

ප්‍රවාහන අංශයේ සමස්ථ කාර්යය මණ්ඩලය නියෝජ්‍ය අධ්‍යක්ෂ (ප්‍රවාහන) ප්‍රමුඛ තාක්ෂණ ඉංජිනේරු, ඉංජිනේරු සහකාරවරු, වැඩමුලික, කළමනාකර සහකාරවරුන් ඇතුළු 13 දෙනෙකු හා රියදුරු මහතුන් 62 ක් මෙම සේවාවන් ඉටු කිරිමට උර දෙනු ලබයි.

# පස්වන පරිච්ඡේදය

## ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතේ පිහිටුවනු ලැබ ඇති සමාගම්

සමාගම් පනතේ යටතේ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් සිදුකළ ව්‍යාපාරික කටයුතු වලින් කොටසක් කළමනාකරණ සඳහා පහත සඳහන් පෞද්ගලික සමාගම් වෙත පවරා දී ඇත.

- සී/ස මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යාපාර (පුද්ගලික)සමාගම
  Mahaweli Livestock & Agro Enterprises (Pvt) Ltd
- සී/ස මහවැලි උපදේශන සේවා කාර්යංශය (පුද්ගලික)සමාගම (MCB)
  Mahaweli Consultancy Bureau (Pvt) Ltd
- ස්වභාවික සම්පත් කළමනාකරණ සේවා (පුද්ගලික)සමාගම(NRMS)
  Natural Resources Management Services (Pvt) Ltd

### 2018 වර්ෂය තුළ සමාගම් වල කාර්යය සාධනය

| අ/අ | සමාගම | වර්ෂය තුළ ඉටුකළ කාර්යය /තත්වය |
|---|---|---|
| 01 | සී/ස මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යාපාර (පුද්ගලික) සමාගම | ❖ පළාතේ කිරි ගොවීන්ගෙන් කිරි එකතු කිරීම හා ඔවුන්ට එමඟින් සේවාවන් සැපයීම.<br>❖ කිරි ආශ්‍රිත නිෂ්පාදන කටයුතු සිදු කිරීම හා ඒ නිෂ්පාදන මහවැලි කලාප සහ අවට ප්‍රදේශවල අලෙවි කිරීම.<br>❖ ගම් කුකුල් ව්‍යාපෘතියක් මඟින් ගොවීන් වෙත පැටවුන් ලබා දීම.<br>❖ පුං ගවයන් ලෙස යොදා ගැනීම සඳහා මීගවයන් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත ලබා දීම.<br>❖ තත්වයෙන් උසස් බ්‍රොයිලර් මස් නිෂ්පාදනය කර අලෙවිය. |
| 02 | සී/ස මහවැලි උපදේශන සේවා කාර්යංශ (පුද්ගලික) සමාගම | ශක්‍යතා අධ්‍යනයන්ගෙන් හා කොන්ත්‍රාත් කටයුතු වලින් 2018 වසරේ මෙහෙයුම් ආදායම් උත්පාදනය කර ඇත. |
| 03 | ස්වභාවික සම්පත් කළමනාකරණ සේවා (පුද්ගලික) සේවා සමාගම | පහත කටයුතු වලින් 2014 වසරේ මෙහෙයුම් ආදායම් උත්පාදනය කර ඇත.<br>• වික්ටෝරියා හා කොත්මලේ කලාපයේ ඉඩම් මිනුම්කරනය සහ සැලසුම් සකස් කිරීම - රු.213,800.00<br>• පාංශු පර්යේෂණ ව්‍යාපෘතිය - රු.1,018,479.01<br>• H-Q measurement of Nanuoya & Coledoniya gauging station -රු.437,472.00<br>• මාතලේ දිස්ත්‍රික්කයේ පුවක්පිටිය සහ ඉලුක්කුඹුර කාබනික ගොවිපළ ව්‍යාපෘතිය- රු.200,000.00<br>• හපුතලේ ප්ලාන්ටේෂන් ව්‍යාපෘතිය ව්‍යාපෘතිය - .160,000.00<br>• අමර ලෙෂර් හොටෙල් මූලික පාරිසරික ඇගයීම් වාර්තාව සකස් කිරීම. - රු.300,000.00 |

# වාර්ෂික ගිණුම්

## II කොටස

## මූලාශ්‍ර ප්‍රකාශ සඳහා සටහන්

### 1. වාර්තාකරණ ව්‍යුහය

1979 අංක 23 දරණ පනත යටතේ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය ස්ථාපිත කරන ලදී. 1979 අංක 23 දරණ පනත යටතේ කාර්යයන් ස්ථාපිත කෙරිණ. ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ කාර්යයන් එම පනතේ 12 වගන්තියෙහි දක්වා ඇති අතර මහවැලි සංවර්ධන වැඩ පිළිවෙල ක්‍රියාත්මක කිරීමේ කාර්යභාරය එමගින් පැවරී ඇත.

මහවැලි පනත අනුව යම් විශේෂ ප්‍රදේශයක හෝ විශේෂ ප්‍රදේශයක් සම්බන්ධයෙන් අධිකාරියෙහි කර්තව්‍ය පහත දැක්වෙන කර්තව්‍ය විය යුතුය.

(අ) ජලාශ, වාරිමාර්ග බෙදාහැරීමේ ක්‍රම සහ විදුලිබලය නිපදවීම සහ සැපයීම සඳහා වූ යන්ත්‍රස්ථාන ඉදිකිරීම සහ මෙහෙයවීම ඇතුළු මහවැලි ගඟ සංවර්ධන යෝජනා ක්‍රමය සැලසුම් කිරීම හා ක්‍රියාවට නැගීම.

(ආ) එසේ වුවද විදුලි බලය බෙදා හැරීමට අදාල කර්තව්‍යය වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ එසේ කිරීමට බලය ඇති වෙනත් යම් අධිකාරියක් විසින් ද කරනු ලැබිය හැකිය.

(ඇ) යම් විශේෂ ප්‍රදේශයක පූර්ණ සහ ඒකාග්‍ර සංවර්ධනයට ප්‍රතිෂ්ඨාධාර වීම සහ ඒ සංවර්ධනය සුරක්ෂිත කිරීම;

(ඈ) යම් විශේෂ ප්‍රදේශයක් තුළ කෘෂිකාර්මික ඵලදා වර්ධනය සහ සේවා නියුක්ති හැකියාවන් උපරිම ත්ත්තවයට පත් කිරීම සහ ආර්ථික සහ කෘෂිකාර්මික සංවර්ධනය ඇති කිරීම සහ ඒ සංවර්ධනය සුරක්ෂිත කිරීම;

(ඉ) යම් විශේෂ ප්‍රදේශයක් තුළ භෞතික පරිසරය සංරක්ෂණය කිරීම සහ එය පවත්වා ගෙන යාම;

(ඊ) යම් විශේෂ ප්‍රදේශයක් තුළ ප්‍රජාවගේ පොදු සුබ සාධනය සහ සංස්කෘතික ප්‍රගතිය දියුණු කරලීම සහ එම ප්‍රදේශයේ පරිපාලනය කිරීම;

(උ) අභ්‍යන්තර වූ සහ බාහිර වූ උභය පෞද්ගලික / ප්‍රාග්ධනය යම් විශේෂ ප්‍රදේශයක ආර්ථික සහ කෘෂිකාර්මික සංවර්ධනයෙහි යෙදවීම නංවාලීම කිරීම සහ සුරක්ෂිත කිරීම; සහ

(ඌ) මහවැලි ගඟ සංවර්ධන යෝජනා ක්‍රමය සැලසුම් කිරීමෙහි සහ ක්‍රියාවට නැගීමෙහි දී ද යම් විශේෂ ප්‍රදේශයක් සංවර්ධනය කිරීමෙහි දී ද ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවල, රාජ්‍ය ආයතනවල, පළාත් පාලන ආයතනවල, රජයේ සංස්ථාවල සහ පෞද්ගලික හෝ රජයේ වූ වෙනත් තැනැත්තන්ගේ සහයෝගය ලබා ගැනීම සහ එය නංවාලීම හා සුරක්ෂිත කිරීම. ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පරිපාලිත සමාගම් හතරකින් සහ ආශ්‍රිත සමාගමකින් සමන්විත වේ. එනම් මහවැලි වෙන්චර් කැපිටල් පුද්ගලික සමාගම, සීමාසහිත ස්වාභාවික සම්පත් කළමනාකරණ සේවා (පුද්ගලික) සමාගම, සීමාසහිත මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යවසාය (පුද්ගලික) සමාගම, සීමාසහිත මහවැලි

උපදේශක කාර්යංශ (පුද්ගලික) සමාගම සහ සීමාසහිත මහවැලි පශු සම්පත් ව්‍යවසාය සමාගම වේ.

සමාගම් සියල්ල 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ නීතිගත කරන ලද අතර පහත සඳහන් ප්‍රධාන කාර්යයන් ඉටු කරනු ලබයි.

සමාගමේ කොටස් ප්‍රාග්ධනය පිළිබඳ විස්තර පහත පරිදි වේ.

| | සමාගම | වටිනාකම කොටස් | සම්පූර්ණයෙන් ගෙවන ලද ප්‍රාග්ධන කොටස් ගණන | මහවැලි අධිකාරියට නිකුත් කළ කොටස් ගණන |
|---|---|---|---|---|
| 1) | එම්.සී.බී (පුද්ගලික) සමාගම | රු 10.00 | 6385 | 6384 |
| 2) | එන්.ආර්.එම්.එස් (පුද්ගලික) සමාගම | රු 10.00 | 1502 | 1500 |
| 3) | වෙන්චර් කැපිටල් (පුද්ගලික) සමාගම | රු. 10.00 | 1,039,803 | 1,039,800 |
| 4) | එම්.එල්.ඒ.ඊ. | රු 10.00 | 3 | - |

## මහවැලි සමාගම්වල මූලික ක්‍රියාකාරකම්

## පරිපාලිත සමාගම්

**අ. සී/ස. මහවැලි වෙන්චර් කැපිටල් (පුද්.) සමාගම.**

i. මහවැලි ව්‍යවසායකයින් හට ණය පහසුකම් සැපයීම හා ඒ සඳහා මඟපෙන්වීම් ලබාදීම.

ii. සමාගමට අරමුදල් උපයාගත හැකි වානිජ ව්‍යවසාය ආයෝජන ඉටුකර දීම.

**ආ. සී/ස. ස්වභාවික සම්පත් කළමනාකරණ සේවා (පුද්.) සමාගම.**

i. ස්වභාවික සම්පත් කළමනාකරණ ක්ෂේත්‍රය යටතේ එන නිර්මාණ සැලසුම, පුහුණුකිරීම්, ද්‍රව විද්‍යාත්මක අධීක්ෂණය, ඉඩම් භාවිතා සිතියම්කරණය, ජලාධාර ප්‍රදේශ සංරක්ෂණය සහ වනය ආශ්‍රිත කටයුතු පිළිබඳව වෘත්තීයමය උපදෙස් හා සේවා සැපයීම.

ii. තොරතුරු හා දත්ත සැපයීම, ශක්‍යතා අධ්‍යයන සැකසීම, පරිසර බලපෑම් තක්සේරු අධ්‍යයන හා මූලික පාරිසරික ඇගැයුම් වාර්තා සැකසීම ආදිය.

**ඇ. සී/ස. මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යවසාය (පුද්.) සමාගම.**

i. මහවැලි ගොවීන්හට උසස් ගුණාත්මකතාවින් යුත් සතුන් සැපයීම.

ii. කිරි හා මස් නිෂ්පාදනය සහ අලෙවිකරණය.

**ඈ. සී/ස. මහවැලි උපදේශන සේවා කාර්යාංශය (පුද්.) සමාගම**

i. ගොඩනැගිලි, වාරිමාර්ග, ඉඩම් ජලාපවාහන හා මාර්ග ආදී ඉදිකිරීම් ක්ෂේත්‍රයන්හි උපදේශන සේවා සැපයීම.

ii. ගොඩනැගිලි, වාරිමාර්ග, ඉඩම් ජලාපවාහන හා මාර්ග ආදී ඉදිකිරීම් කොන්ත්‍රාත් භාරගැනීම.

**ආශ්‍රිත සමාගම්**

**අ.) සී/ස. මහවැලි පශු සම්පත් ව්‍යවසාය (පුද්.) සමාගම**

i. කුකුල් මස් (බ්‍රොයිලර්) නිෂ්පාදනය හා අලෙවිය

ii. මහවැලි ගොවීන් බ්‍රොයිලර් නිෂ්පාදන කළ පසු මිලදී ගැනීමේ ගිවිසුම්වලට එළැඹීම.

කෙසේ වෙතත් මහවැලි වෙන්චර් කැපිටල් පුද්ගලික සමාගම විසුරුවා හැරීමට 2012 වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇත. එම නිසා එම සමාගමේ ගිණුම් ඒකාබද්ධ ගිණුමට ඇතු ලත් කර නොමැත. වත්කම් හා වගකීම් සටහන් මගින් හෙළිදරව් කර ඇත.

## 2. ගිණුම්කරණ පදනම

**2.1. අනුකූලතා ප්‍රකාශය :**
මුල්‍යතාවය පිළිබද ප්‍රකාශය, මෙහෙයුම් ප්‍රකාශනයල ශුද්ධ වත්කම් හා හිමිකම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශනය, අරමුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්වලින් මෙම මූල්‍ය ප්‍රකාශන සමන්විත වේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් සම්පාදිත ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මෙකී ගිණුම් ප්‍රකාශන සකසා ඇත. මෙම ගිණුම් ප්‍රකාශනයන් ඉකුත් මූල්‍ය වසරේ අනුගමනය කරන ලද ප්‍රමිතීන්ට අනුකූල වේ.

**2.2 ගණනය කිරීමේ පදනම**
දේපළ හා යන්ත්‍රෝපකරණ පිළිබඳ හෙළිකිරීම්වලදී හැර මෙම මූල්‍ය ප්‍රකාශන, ඓතිහාසික පිරිවැය පදනමින් සකසන ලදී.

**2.3 ක්‍රියාත්මක වන සහ ඉදිරිපත් කෙරෙන මුදල් වර්ගය**
මෙම මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇත. මෙහි එන සෑම මූල්‍ය තොරතුරක්ම ආසන්නතම දහස දක්වා පූර්ණ කර ඇත.

**2.4 ඇස්තමේන්තු සහ තීන්දු භාවිතය**
ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වත්කම්, වගකීම්, ආදායම් හා වියදම්වල ප්‍රකාශිත වටිනාකම්වලට බලපෑමක් ඇති කරන සුළු තීන්දු, ඇස්තමේන්තු හා උපකල්පන වලට එළැඹීමට කළමනාකාරීත්වයට සිදු වේ. ඓතිහාසික අත්දැකීම් සහ පවත්නා සංසිද්ධීන්ට අනුව සාධාරණ යැයි විශ්වාස කළ හැකි අපේක්ෂිතයන් ද ඇතුළත් වන පරිදි, තීන්දු හා ඇස්තමේන්තු පදනම් වේ. කරුණු එසේ හෙයින් තත්‍ය අත්දැකීම් හා ප්‍රතිඵල, එකී තීන්දු හා ඇස්තමේන්තු වලින් විතැන් විය හැකිය.

මෙකී ඇස්තමේන්තු හා පාදක උපකල්පන, අඛණ්ඩ පදනමකින් විචාරිය යුතු වේ. ගිණුම්කරණ ඇස්තමේන්තුවල ප්‍රතිශෝධනයක් සිදු කළේ නම්, එකී ප්‍රතිශෝධනයන් එකී කාලසීමාවට පමණක් බලපාන්නේ නම් පමණි.

**2.5 ගිණුම්කරණ ප්‍රතිපත්තීන්හි වෙනස්වීම්**
පහත සඳහන් කරුණු හැර පෙර වර්ෂයේ අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති ඒ ආකාරයෙන්ම ප්‍රවර්ථන වර්ෂය සඳහාද අනුගමනය කර ඇත.

2.5.1 විශේෂිත මහවැලි කලාප යටතේ තනි ගොවිපල, පැල තවාන් සහ සංචාරක බංගලාවල වෙන වෙනම ආදායම් හා වියදම් ගිණුම් ලෙස ගණන් ගනු ලැබේ.

2.5.2 ජීව විද්‍යාත්මක වත්කම් සාධාරණ වටිනාකම මත ගණන් ගනු ඇත. ගොවිපල ගිණුමෙන් ලාභ හෝ අලාභ හඳුනා ගැනේ.

2.5.3 වත්මන් මූල්‍ය වර්ෂය තුළ ගෘහ භාණ්ඩ හා සවිකෘත නැවත ඇගයීම හේතුවෙන් නැවත ඇගයීමේ අතිරික්තය රුපියල් මිලියන 861.469 කින් වැඩි වී ඇත.

## 3. සුවිශේෂී ගිණුම්කරණ ප්‍රතිපත්ති

මෙම ගිණුම්කරණ ප්‍රකාශන බලපාන සමස්ත කාලසීමාවටම පහත දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති අඛණ්ඩව අනුකූල විය.

### 3.1 ඒකාබද්ධ කිරීමේ පදනම

3.1.1 අධිකාරියේ සහ පරිපාලන සමාගම්වල මූල්‍ය ප්‍රකාශන සමායෝජනය කිරීම ද ඇතුළත්ව, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන, සකසා ඇත්තේ ඒකාබද්ධ ක්‍රමවේදයන් අඛණ්ඩව යොදාගනිමිනි, ඒ අනුව පැහැදිලි වන්නේ, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය තනි ආර්ථික ව්‍යුහයක් පරිද්දෙන්ම මෙකී ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනයන්හි නිරූපණය වන මූල්‍යමය තොරතුරුවලින් පිළිබිඹු වන බවයි.

### 3.2 දේපළ හා යන්ත්‍රෝපකරණ

3.2.1 වත්කම් නැවත ඇගයීමේ මිල, එහි ගැනුම් මිල, හෝ ඉදිකිරීම් පිරිවැය සහ එම වත්කම භාවිතාවට අපේක්ෂිත කාර්ය උදෙසා ක්‍රියාත්මක ස්වරූපයට පත්කිරීමට සෘජුවම යෙදුණු පිරිවැය යනාදී වියදම්, "වත්කම්වල පිරිවැය" යන්නෙන් අදහස් වේ. සියලුම ගෘහ භාණ්ඩ හා සවිකෘත නැවත තක්සේරු කර 2018.12.31 දින සිට බලපැවැත්වෙන පරිදි ගිණුම් ගත කරනු ලැබේ.

3.2.2 සින්නක්කර ඉඩම් හැර අනෙකුත් සියළු දේපළ හා යන්ත්‍රෝපකරණ පිරිවැය මත හෝ ප්‍රත්‍යාගණන වටිනාකම මත, සරල රේඛීය ක්‍රමයට ක්‍ෂය ප්‍රතිපාදන සපයා ඇති අතර එකී වත්කමේ පිරිවැය, එකී වත්කම් වර්ගයේ ජීව කාලය අනුව ගලපා ක්‍රමක්‍ෂය කෙරේ. වත්කම භාවිතය සඳහා ලබාගත් දින සිට ක්‍ෂයවීම ගණනය කරන අතර විකිණීම සඳහා වත්කම් පැහැදිලි කර ඇති දිනට පෙර ක්‍ෂයවීම ගණනය නතර කෙරේ. මෝටර් වාහන සම්බන්ධයෙන් පහත සඳහන් ක්ෂයවීම් අනුපාතයන් යෙදීමට පෙර 10% ක සීරීම් වටිනාකමක් ලබා දෙනු ලැබේ.

| | | | වාර්ෂිකව |
|---|---|---|---|
| 1. | ගොඩනැගිලි | - කාර්යාල | 2 $^1/_2$% |
| | | - අනෙකුත් | 5% |
| 2. | මෝටර් රථ | | 20% |
| 3. | යන්ත්‍රෝපකරණ | - කාර්යාලයීය උපකරණ හා සුභසාධන භාණ්ඩ | 15% |
| 4. | යන්ත්‍රෝපකරණ | - විදුලි ජනක යන්ත්‍ර | 15% |
| 5. | යන්ත්‍රෝපකරණ | - ඉදිකිරීම් | 15% |
| 6. | යන්ත්‍රෝපකරණ | - සාමාන්‍ය | 15% |
| 7. | ගෘහභාණ්ඩ හා සවිකිරීම් | | 10% |
| 8. | පරිගණක හා උපාංග | | 20% |

## 3.3 ආයෝජන

### 3.3.1 ආශ්‍රිත සමාගමේ සිදුකළ ආයෝජන

ආශ්‍රිත සමාගමේ සිදුකළ ආයෝජනය පිරිවැයට ගණන් බලා, ශේෂ පත්‍රයේ දිගු කාලීන ආයෝජන යටතේ වෙන්කර දක්වා ඇත. මෙම ආයෝජන සමාගමේ මූල්‍ය හා මෙහෙයුම් ප්‍රතිපත්තිමය තීරණ කෙරෙහි, අධිකාරියට කිසිදු සැලකියයුතු මට්ටමේ බලපෑමක් කළ නොහැකි බැවින් ඒකීය ව්‍යුහයක් වශයෙන් ගිණුම්කරණය යොදාගැනීම අනුචිත වේ.

### 3.3.2 අනෙකුත් ආයෝජන

අනෙකුත් ආයෝජන, දිගුකාලීන ආයෝජන වශයෙන් සලකා පිරිවැයට ගණනය කර ශේෂ පත්‍රයේ දක්වා ඇත.

## 3.4 භාණ්ඩ තොග වාර්තා

භාණ්ඩ තොග තක්සේරු කර ඇත්තේ අඩු පිරිවැය හා නිෂ්කාශණය කරගත හැකි ශුද්ධ වටිනාකම මත වේ. අවශ්‍ය තැන්හී නිතර නිකුත් නොවන, දෝෂ සහිත සහ යල්පැනගිය භාණ්ඩ සඳහා ප්‍රතිපාදන වෙන් කර ඇත.

## 3.5 වෙළෙඳ හා අනෙකුත් ලැබිය යුතු ආදායම්

වෙළෙඳ හා අනෙකුත් ලැබිය යුතු ආදායම් දක්වා තිබෙන්නේ බොල් හා අඩමාන ණය පසුව ලැබීම් සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමෙන් පසු නිශ්කාෂණය කරගත හැකි වෙතැයි උපකල්පිත වටිනාකම මත වේ.

## 3.6 මුදල් හා මුදල් සමාන දෑ

මුදල් හා මුදල් සමාන දෑ යනුවෙන් දක්වා ඇත්තේ මුදල් ශේෂයන් හා ඉල්ලූ විට ගෙවිය යුතු බැංකු අයිරා ද ඇතුළත් වටිනාකම වන අතර ශ්‍රී ලංකා මහවැල අධිකාරියේ මුදල් කළමනාකරණය ද එක් මුදල් සංඝඨකයක් ලෙසින් දක්වා ඇත්තේ අරමුදල් ප්‍රවාහය ප්‍රකාශ කිරීම සඳහා වේ.

## 3.7 විදේශ ආධාර

2012 දෙසැම්බර් 31 දක්වා කාලය තුළ ආධාර දෙන ආයතන විසින් සිදු කරන ලද සමුච්චිත ගෙවීම්වල වාර්තා වූ විදේශ ආධාර භාවිතා කිරීම. ගෙවීම් දිනයන්හි පවත්නා විනිමය අනුපාත මත විදේශ මුදල්වලින් පවතින වියදම රුපියල් බවට පරිවර්තනය කරන ලදී.

## 3.8 වගකීම් හා ප්‍රතිපාදන

ශේෂ පත්‍රයේ ජංගම වගකීම් යටතේ වෙන්කර දක්වා ඇති වගකීම්, ඉල්ලූවිට ගෙවිය යුතු බැඳීම් සහ ශේෂ පත්‍ර දිනයේ සිට වර්ෂයක් ඇතුළත ගෙවා නිමකළ යුතු ඒවාය. ජංගම නොවන වගකීම් යනුවෙන් වෙන්කර දක්වා ඇති සියල්ල, ශේෂ පත්‍ර දිනයේ සිට වසරක් ඉක්ම වූ පසුවත් පවතින බැඳීම් වේ.

මූල්‍ය ප්‍රකාශන සැකසීමේදී දැන සිටි සියළු වගකීම් ගිණුම්ගත කර ඉදිරිපත් කර ඇත.

## 3.10 විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම

සියළු සේවකයින්ට විශ්‍රාම පාරිතෝෂිත ගෙවීමට ප්‍රතිපාදන සලසා තිබේ. පාරිතෝෂිත සඳහා සුදුසුකම් ලබන අඩමසක වැටුප, පළමු සේවා වසරේ පටන් සෑම වසර අගකදීම ගණනය කර මෙම ප්‍රතිපාදනය වෙන්කර ඇත.

### 3.11 ආදායම් ප්‍රකාශනය

3.11.1 මහා භාණ්ඩාගාරයෙන් ලැබෙන ප්‍රදානය, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පරිපාලනය යටතේ පවතින ඉඩම් බදු දීමෙන් ලබන බදු කුලිය, නිල නිවාස වල රාජ්‍යභාගය, ආයෝජන වලින් ලබන ආදායම සහ පොලිය යනාදී අංගයන්ගෙන් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අයභාරය සමන්විත වේ.

3.11.2 ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට ආර්ථික ප්‍රතිලාභ ලැබීමේ වැඩි සම්භාවිතාව අනුව මෙන්ම විශ්වාසනීය අන්දමකින් එය මැනිය හැකිවීම මත අයභාරය ගණනය කර ඇත. බදු කුලී, අනෙකුත් කුලී, රාජ්‍ය භාගය, පොලී ආදායම ගණනය කරන ලද්දේ උපචිත පදනමිනි.

### 3.12 වියදම

ආයතනයේ දෛනික වියදම්, දේපළ හා යන්ත්‍රෝපකරණ කාර්යක්‍ෂමතාවයෙන් පවත්වාගෙන යෑමට යන වියදම් ද ඇතුළු සියලු වියදම් සැලකිල්ලට ගෙන ආදායම් ප්‍රකාශනයේ සඳහන් වසරේ ලාභය/පාඩුව ගණනය කර ඇති අතර බොල් හා අඩමාන ණය, දන්නා සියළු වගකීම් මෙන්ම දේපළ හා යන්ත්‍රෝපකරණ ආදියේ ක්‍ෂයවීම්වලට ද ප්‍රතිපාදන වෙන්කර තිබේ.

### 3.13 ශේෂ පත්‍ර දිනයෙන් පසුව සිදු කළ ගනු දෙනු

ශේෂ පත්‍ර දිනයෙන් පසුව සිදු වූ සියළු භෞතික කාර්යයන් අවශ්‍ය පරිදි ගලපා ඇත.

### 3.14 අසම්භාව්‍යතා

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට එරෙහිව පවරා ඇති නඩු වලදී 2018.12.31 දිනට පැවැති අසම්භාව්‍ය වගකීම රු. මිලි. 42, 800 ක් විය.

සී/ස මහවැලි වෙන්චර් කැපිටල් (පුද්.) සමාගම
2018.12.31 දිනට වත්කම් සහ වගකීම්
(ණය හිමියන්ගේ ස්වේච්ඡා අවසන් කිරීම යටතේ)

| | සටහන රු. | 2018 රු. | 2017 රු. |
|---|---|---|---|
| <u>වත්කම්</u> | | | |
| <u>ජංගම නොවන වත්කම්</u> | | | |
| දේපල යන්ත්‍රෝපකරණ හා උපකරණ | 02 | 3 | 3 |
| ආයෝජන | 03 | 2,794,671 | 2,794,671 |
| | | 2,794,671 | 2,794,671 |
| <u>ජංගම වත්කම්</u> | | | |
| සිංගර් මැෂින් තොගය | | 29,480 | 29,480 |
| ලැබිය යුතු පොළිය | 04 | 380,726 | 380,726 |
| පුපුරණ ද්‍රව්‍ය පාලන ගිණුම | | 28,336 | 28,336 |
| ආදායම් බදු ආපසු ගෙවීම් | 09 | 62,008 | 51,414 |
| අනෙකුත් ලැබිය යුතු දෑ | 05 | 25,000 | 25,000 |
| භාණ්ඩාගාර බිල්පත් | | 9,455,896 | 9,831,457 |
| බැංකුවේ ඇති මුදල් | 06 | 2,817,589 | 3,463,810 |
| අතේ ඇති මුදල් | | 2,521 | 2,521 |
| | | 12,801,556 | 13,812,744 |
| **මුළු වත්කම්වල එකතුව** | | 15,596,230 | 16,607,418 |
| <u>හිමිකම් සහ වගකීම්</u> | | | |
| <u>හිමිකම් සහ සංචිත</u> | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 07 | 10,398,000 | 10,398,000 |
| ලැබූ අරමුදල් | 08 | 10,150,325 | 10,150,325 |
| ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ දායකත්වය | | 432,000 | 432,000 |
| රඳවා ගත් ලාභය/ (පාඩුව) | | (5,765,303) | (4,833,615) |
| **මුළු හිමිකම** | | 15,215,022 | 16,146,710 |
| <u>ජංගම වගකීම්</u> | | | |
| උපචිත වියදම් | 10 | 381,208 | 460,708 |
| **මුළු වගකීම්** | | 381,208 | 460,708 |
| **මුළු හිමිකම් සහ වගකීම්** | | 15,596,230 | 16,607,418 |

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය
අංක 500, ටී.බී. ජායා මාවත

කොළඹ 10

## 2018.12.31 දිනට මූල්‍යමය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

| | | සමූහය | | මහවැලි අධිකාරිය | |
|---|---|---|---|---|---|
| | | රු'000 | රු'000 | රු'000 | රු'000 |
| | | 2018 | 2017 | 2018 | 2017 |
| | සටහන | | | | |
| **වත්කම්** | | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| දේපල යන්ත්‍රෝපකරණ හා උපකරණ | (1) | 4,675,657 | 4,120,943 | 4,614,637 | 4,056,757 |
| ආයෝජන | (2) | 171,313 | 187,531 | 529,876 | 526,316 |
| නොනිමි වැඩ | | 84,947 | 78,552 | 84,947 | 78,552 |
| ජංගම නොවන වත්කම්වල එකතුව | | 4,931,917 | 4,387,026 | 5,229,460 | 4,661,625 |
| | | | | | |
| ජෛව වත්කම් - ප්‍රාග්ධන | (3) | 167,027 | 134,578 | 156,572 | 127,444 |
| ෙ◌ා්ජිත ලියා හැරීම් | | - | 859 | - | - |
| **ජංගම වත්කම්** | | | | | |
| ගබඩා තොග | (4) | 180,342 | 184,799 | 175,874 | 181,505 |
| ජෛව වත්කම් -වෙළෙඳ | (3) | 26,312 | 10,360 | 24,852 | 9,276 |
| වෙළඳ සහ අනෙකුත් ලැබිය යුතු දෑ | (5) | 2,032,715 | 2,231,515 | 1,954,466 | 2,110,549 |
| කලින් ගෙවීම් | | 4,767 | 3,896 | 4,767 | 3,896 |
| බැංකු ඇපකර | | 6,292 | 6,164 | - | - |
| මුදල් සහ මුදල් සමායනයන් | (6) | 312,702 | 343,312 | 304,528 | 325,612 |
| ජංගම වත්කම් එකතුව | | 2,563,129 | 2,780,045 | 2,464,487 | 2,630,837 |
| **මුළු වත්කම්වල එකතුව** | | **7,662,074** | **7,302,508** | **7,850,519** | **7,419,906** |
| | | | | | |
| **වගකීම්** | | | | | |
| **ජංගම වගකීම්** | | | | | |
| ණයහිමියන්ට ගෙවියයුතු දෑ | (7) | 651,986 | 886,098 | 609,866 | 770,536 |
| කල්බදූ ජීලයන්ස් මූල්‍ය සමාගම | | - | 2,153 | - | - |
| උපචිත වියදම් | (8) | 102,067 | 175,190 | 68,075 | 148,407 |
| **ජංගම වගකීම් එකතුව** | | 754,053 | 1,063,441 | 677,941 | 918,943 |
| | | | | | |
| **ජංගම නොවන වගකීම්** | | | | | |
| පාරිතෝෂිත දීමනා සඳහා වෙන්කිරීම් | (9) | 1,379,494 | 1,389,477 | 1,367,485 | 1,376,517 |
| කල්බදූ | | 219 | 271 | - | - |
| විලම්බිත බදු | | 612 | 612 | - | - |
| **ජංගම නොවන වගකීම් වල එකතුව** | | 1,380,325 | 1,390,360 | 1,367,485 | 1,376,517 |
| **මුළු වගකීම්** | | 2,134,378 | 2,453,801 | 2,045,427 | 2,295,460 |
| | | | | | |
| **ශුද්ධ වත්කම් එකතුව** | | 5,527,696 | 4,848,708 | 5,805,092 | 5,124,444 |
| | | | | | |
| **ශුද්ධ වත්කම්/හිමිකම්** | | | | | |
| සමුච්චිත අරමුදල | (10) | 24,649,830 | 24,407,260 | 24,646,826 | 24,404,255 |
| සංචිත : ඉ/ගෙනා අදායම් වියදම් ගිණුමේ ශේෂය | | (24,040,551) | (23,615,502) | (23,709,285) | (23,285,893) |
| ආදායම් සංචිත - සමාගම්වල | | 50,865 | 50,865 | - | - |
| ප්‍රත්‍යාගන ලාභය | | 4,867,551 | 4,006,082 | 4,867,551 | 4,006,082 |
| **ශුද්ධ වත්කම්/හිමිකම් එකතුව** | | 5,527,696 | 4,848,708 | 5,805,092 | 5,124,444 |

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය
අංක 500, ටී.බී. ඡායා මාවත
කොළඹ 10

## 2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

| | | සමූහය (රු'000) | මහවැලි අධිකාරිය (රු'000) |
|---|---|---|---|
| මෙහෙයුම් කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහය | | (414,206) | (413,201) |
| | බදු ගෙවීම් | (79) | - |
| | ලාභාංශ | (573) | - |
| මුදලින් නොවූ ගනුදෙනු | | | |
| | ක්ෂයවීම | 530,517 | 526,636 |
| | පාරිතෝෂික දීමනා සඳහා වෙන්කිරීම් | (9,983) | (9,032) |
| | වැඩිවූ ජෛව වත්කම් වලින් උපයා ගැනීම් - | (32,449) | (29,128) |
| | වත්කම් මාරු කිරීම් | (30,655) | (30,655) |
| | වත්කම් භාර දීම් | 5,865 | 5,865 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්** | | | |
| | තොගයේ වැඩිවීම / අඩුවීම | 4,457 | 5,631 |
| | ජෛව වත්කම් වැඩිවීම / අඩුවීම - වෙළෙඳාම | (15,952) | (15,576) |
| | ලියාහැරීම් වැඩිවීම/අඩුවීම | 859 | - |
| | අනෙකුත් ලැබියයුතු දෑ වැඩිවීම | 198,800 | 156,083 |
| | ගෙවීම් වැඩිවීම/අඩුවීම | (871) | (871) |
| | බැංකු ඇපකර වැඩිවීම/අඩුවීම | (129) | |
| | ගෙවියයුතු දෑ වැඩිවීම/අඩුවීම | (236,265) | (160,670) |
| | උපචිත වියදම් වැඩිවීම/අඩුවීම | (73,123) | (80,332) |
| **මෙහෙයුම් ක්‍රියාකාරීත්වයෙන් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **(73,786)** | **(45,249)** |
| **ආයෝජන ක්‍රියාකාරකම්** | | | |
| | දේපල, යන්ත්‍රඋපකරණ හා උපකරණවල සංචලනයන් | (212,356) | (211,641) |
| | වත්කම් විකිණීමෙන් | 4,131 | 4,131 |
| | ආයෝජන වැඩිවීම/අඩුවීම | 16,218 | (3,560) |
| | නොනිමි වැඩ වැඩිවීම/අඩුවීම | (6,396) | (6,396) |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **(198,403)** | **(217,465)** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්** | | | |
| | මූල්‍ය අයකිරීම් වැඩිවීම/අඩුවීම | (52) | - |
| | සමුච්චිත අරමුදල් සහ සංචිත වැඩිවීම/අඩුවීම | 241,631 | 241,631 |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය** | | **241,579** | **241,631** |
| **මුදල් සහ මුදල් සමායයන්හි ශුද්ධ වැඩිවීම/අඩුවීම** | | **(30,610)** | **(21,083)** |
| 2018.01.01 දිනට මුදල් සහ මුදල් සමායයන්හි ශේෂය | | 343,312 | 325,612 |
| **2018.12.31 දිනට මුදල් සහ මුදල් සමායයන්හි ශේෂය** | | **312,702** | **304,528** |

**ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය**

**අංක 500, ටී.බී. ජායා මාවත**

**කොළඹ 10**

# 2018.12.31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ක්‍රියාකාරිත්වය පිළිබඳ වාර්තාව

| සමූහය | මහවැලි | | | සමූහය | මහවැලි |
|---|---|---|---|---|---|
| **රු'000** | **රු'000** | | | **රු'000** | **රු'000** |
| **2017** | **2017** | | | **2018** | **2018** |
| | | | <u>උපලේඛන</u> | | |
| | | **<u>අදායම්</u>** | **(01)** | | |
| 197,530 | 197,530 | බදු | | 257,680 | 257,680 |
| 159,984 | 159,984 | පුරස්කාරක | | 365,938 | 365,938 |
| 32,367 | 8 | කොන්ත්‍රාත් සේවා | | 33,822 | - |
| 5,012 | - | ගොවිපල නිශ්පාදන විකුණුම් | | 6,655 | 915 |
| 206 | 206 | චක්‍රීය ආදායම් | | - | - |
| 9,098 | - | ආයෝජන අදායම් (සමාගම්) | | 15,380 | 8,654 |
| 214,967 | 214,876 | වෙනත් ආදායම් | | 53,335 | 51,264 |
| 619,165 | 572,603 | **උත්පාදිත ආදායම** | | 732,809 | 684,450 |
| - | - | | | - | - |
| 2,630,010 | 2,630,010 | භාණ්ඩාගාර ප්‍රදාන - පුනරාවර්තන | **(02)** | 2,694,384 | 2,694,384 |
| 2,345,477 | 2,345,477 | -ප්‍රාග්ධන | | 1,976,359 | 1,976,359 |
| 5,594,652 | 5,548,090 | | | 5,403,552 | 5,355,193 |
| | | **<u>අඩුකලා : වියදම්</u>** | **(03)** | | |
| 2,502,206 | 2,474,372 | පුද්ගලික පඩි නඩි | | 2,619,433 | 2,591,043 |
| 42,932 | 42,606 | ගමන් වියදම් හා යැපුම් දීමනා | | 64,448 | 64,189 |
| 129,398 | 126,347 | සැපයුම්/ප්‍රවාහන | | 134,324 | 128,924 |
| 60,504 | 58,706 | නඩත්තු වියදම් | | 51,374 | 51,158 |
| 122,924 | 121,705 | ගිවිසුම්ගත සේවා | | 127,387 | 125,010 |
| 293 | 293 | රක්ෂණ | | 323 | 323 |
| 80,311 | 69,278 | වෙනත් වියදම් | | 78,533 | 69,018 |
| 502,703 | 499,339 | ක්ෂයවීම | | 525,827 | 522,620 |
| - | - | ආදායම් ලියාහැරීම් | | - | - |
| 2,557,832 | 2,557,832 | පුනුත්ථාපන, වැඩිදියුණු කිරීම්, නෙකුත් නඩත්තු, | **(04)** | 2,182,666 | 2,182,666 |
| | | ප්‍රජා සංවර්ධන සහ ජනපදික | | | |
| 13,810 | 13,810 | සංචාරක බංගලා අලාභ | **(05)** | 12,296 | 12,296 |
| 8,469 | 8,469 | සංවර්ධන මධ්‍යස්ථාන අලාභ | | 7,002 | 7,002 |
| 2,267 | 2,267 | ජල ව්‍යාපෘති කළමනාකරණ අලාභ | | 3,124 | 3,124 |
| 9,168 | 9,168 | වැඩමුේ අලාභ | | 366 | 366 |
| 9,779 | 9,779 | පැළ තවාන් අලාභ | **(06)** | 6,371 | 6,371 |
| (349) | (349) | ගොවිපල අලාභ/ ලාභ | **(07)** | 361 | 361 |
| | | හෙළ ොජුන් අලාභ | | 3,924 | 3,924 |
| | | | | | |
| 6,042,246 | 5,993,621 | **මෙහෙයුම් වියදම් එකතුව** | | 5,817,759 | 5,768,394 |
| (447,594) | (445,531) | **මෙහෙයුම් ක්‍රියාකාරීත්වයෙන් ලැබූ අතිරික්තය/(ඌනතාවය)** | | (414,206) | (413,201) |
| 11,685 | 11,685 | එකතුකලා : වත්කම් විකිණීමෙන් ලද ලාභය/(පාඩුව) | **(08)** | (10,191) | (10,191) |
| 1,569 | - | අඩුකළා; බදු | | 79 | - |
| | | ලාභාංශ | | 573 | - |
| (437,478) | (433,846) | **බදුවලට පසු ලාභය** | | (425,049) | (423,392) |
| | - | | | | - |
| (23,178,024) | (22,852,047) | 2018.01.01 දිනට ඉදිරියට ගෙනා ශේෂය | | (23,615,502) | (23,285,893) |
| **(23,615,502)** | **(23,285,893)** | **අතිරික්තය/(ඌනතාවය)** | | **(24,040,551)** | **(23,709,285)** |

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය
අංක 500, ටී.බී. ජායා මාවත
කොළඹ 10

**හිමිකම් වෙනස්වීම් දක්වන ප්‍රකාශය**

| විස්තරය | රු.'000<br>සමුච්චිත අරමුදල | රු.'000<br>සංචිත | රු.'000<br>ආදායම් සහ වියදම් | රු.'000<br>එකතුව |
|---|---|---|---|---|
| 2017.01.01 දිනට ශේෂය | 24,076,159 | 4,058,203 | (23,178,024) | 4,956,338 |
| | | | | - |
| වර්ෂය තුල | 331,101 | (1,256) | (437,478) | (107,633) |
| **2017.12.31 දිනට ශේෂය** | **24,407,260** | **4,056,947** | **(23,615,502)** | **4,848,705** |
| 2018.01.01 දිනට ශේෂය | **24,407,260** | **4,056,947** | **(23,615,502)** | **4,848,705** |
| | | | | - |
| වර්ෂය තුල | 242,570 | - | (425,049) | **(182,479)** |
| | | | | - |
| **2018.12.31 දිනට ශේෂය** | **24,649,830** | **4,056,947** | **(24,040,551)** | **4,666,226** |

**හිමිකම් වෙනස්වීම් දක්වන ප්‍රකාශය** මහවැලි අධිකාරිය

| | රු.'000<br>සමුච්චිත අරමුදල | රු.'000<br>සංචිත | රු.'000<br>ආදායම් සහ වියදම් | රු.'000<br>එකතුව |
|---|---|---|---|---|
| 2017.01.01 දිනට ශේෂය | 24,073,154 | 4,006,082 | (22,852,047) | 5,227,189 |
| වර්ෂය තුල | 331,101 | - | (433,846) | (102,745) |
| **2017.12.31 දිනට ශේෂය** | **24,404,255** | **4,006,082** | **(23,285,893)** | **5,124,444** |
| 2018.01.01 දිනට ශේෂය | 24,404,255 | 4,006,082 | (23,285,893) | 5,124,444 |
| වර්ෂය තුල | 242,570 | 861,469 | (423,392) | 680,647 |
| **2018.12.31 දිනට ශේෂය** | **24,646,825** | **4,867,551** | **(23,709,285)** | **5,805,091** |

# විගණකාධිපති වාර්තාව

## III කොටස

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE


මගේ අංකය / எனது இல. / My No. } අයිඑන්/බී/එම්ජිඑස්එල්/01/18/41 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2019 නොවැම්බර් 22 දින

අධ්‍යක්ෂ ජනරාල්

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය.

**ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සහ එහි පරිපාලිත සමාගම් ඇතුලත් සමූහයේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සහ එහි පරිපාලිත සමාගම් ඇතුලත් සමූහයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශන, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශන සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථාකාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ හා එහි පරිපාලිත සමාගම් ඇතුලත් සමූහයේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.




අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------

(අ) අධිකාරිය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත හා එහි පරිපාලිත සමාගම් කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර සඳහා වූ ගිණුම්කරණ ප්‍රමිතද අනුගමනය කර තිබුණද සමාගම් විසින් අනුගමනය කරන ලද පදනම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවලට වූ බලපෑම හෙළිදරව්කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව මහවැලි උපදේශක සේවා කාර්යාංශය (පුද්ගලික) සමාගමේ සහ මහවැලි පශු සම්පත් සහ කෘෂි ව්‍යාපාර (පුද්ගලික) සමාගමේ ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය පිළිවෙලින් රු. 3,058,326 ක් හා රු. 20,713,263 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත්, තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇතිවූ ඇස්තමේන්තුගත දෝෂය ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) මහවැලි පශු සම්පත් සහ කෘෂි ව්‍යාපාර (පුද්ගලික) සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් රු.14,117,550 අවිනිශ්චිත ගිණුම පිළිබඳ පරීක්ෂා කිරීමෙන් තොරව ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල ණයගැතියන් ලෙස දක්වා තිබුණි.

(ඈ) අධිකාරියට හිමිකාරීත්වය නොවුණු ඉඩම් දෙකක් රු. 466,325,000 කට අගය කර ගිණුම්ගත කර තිබුණි. තවද අධිකාරිය විසින් 1984-1989 කාලයේදී මිලදීගෙන තිබුණු පිරිවැය රු. 64,320,853 ක් වූ ඉඩම් කට්ටි 02 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) 2016 වර්ෂයේ අරලගංවිල බීජ ගොවිපලේ අවසන් තොගය වැඩියෙන් දැක්වීම 2017 වර්ෂයේදී නිවැරදිකර තිබුණි. එසේ වුවත් සමාලෝචිත වර්ෂයේදී නැවත එම වැඩියෙන් දැක්වීම ගිණුම්වල ගැලපීම නිසා සමාලොචිත වර්ෂයේ ලාභය රු. 5,286,227 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) ජනපදිකයින් වෙත ණයදීම සඳහා භාණ්ඩාගාරයෙන් ලැබී බැංකු වෙත ලබා දී තිබුණු රු. 147,750,000 ක මුදලින් ණය ලබා දී ඇති ප්‍රමාණය ණයගැති ශේෂයක් ලෙසත් ඉතිරිය බැංකු මුදල් ශේෂයක් ලෙසත් ගිණුම්ගත කර නොතිබුණි. එම අරමුදලින් දුන් ණය ප්‍රමාණය, අයකල ණය ප්‍රමාණය සහ උපයන ලද පොළී ආදායම් සම්බන්ධයෙන් හෙළිදරව්කිරීම්ද සටහනක් මඟින් දක්වා නොතිබුණි.

(ඨ) වෙලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතියෙන් අධිකාරිය වෙත පවරා තිබුණු පිරිවැය රු. 671,503,748 ක් වූ ස්ථාවර වත්කම්වලින් කොටසක් රු. 201,640,037 කට ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කර තිබුණද, ඉතිරි වත්කම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කර නොතිබුණි. තවද එම ව්‍යාපෘතියේ ව්‍යාපෘති කළමනාකරණ පහසුකම් යටතේ විවිධ කොන්ත්‍රාත්වලින් අධිකාරියට ලැබී තිබුණු රු. 4,369,384 වත්කම්ද ගිණුම්ගත කර නොතිබුණි.

(ඩ) සමාලෝචිත වර්ෂයේ සී කලාපයේ ලැබිය යුතු භිහ බදු මුදල ගණනය කර ගැලපීම් කර නොතිබුණි.

(ඪ) සමාලෝචිත වර්ෂයේ අධිකාරියට රු. මිලියන 2,188 ක ප්‍රාග්ධන ප්‍රදාන ලැබී තිබුණද එම ප්‍රදාන ගිණුම්ගත කිරීම සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්තියක් සකස්කර ගෙන නොතිබීම හේතුවෙන් විලම්භිත ආදායම ක්‍රමානුකූලව ආදායමට හඳුනාගෙන නොතිබුණි. මේ හේතුවෙන් සමුච්චිත අරමුදල වර්ධනය වී සමාලෝචිත වර්ෂය අවසානයට රු. මිලියන 24,647 ක් වී තිබුණි.

(ණ) පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීමේ වියදම්වලින් ජනිත වන ප්‍රාග්ධන ස්වභාවයේ වත්කම් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්තියක් හඳුන්වාදී නොතිබුණි. සමාලෝචිත වර්ෂය තුල සිදුකර තිබුණු පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීමේ වියදම රු. මිලියන 2,182 ක් විය.

(ත) අධිකාරිය විසින් පරිපාලනය කරනු ලබන කලාප 10 ක රජයේ ඉඩම් හෙක්ටයාර් 637,810 ක්, ජලාශ 12 ක්, ඇලමාර්ග කි.මී 8708 ක්, වැව් 463 ක්, පාරවල් කි.මී 1127.5 ක් සහ විවිධ ජල සම්පාදන මූලාශ්‍ර 1046 ක් නඩත්තු සහ නවීකරණ කටයුතු සිදුකරන අතර එම වත්කම් අධිකාරියේ පාලනයට හිමිකර දී තිබුණි. එසේ වුවත් එම වත්කම්වල විස්තර සටහනක් මගින් හෝ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

(ථ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ප්‍රකාරව ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් රු. 156,572,000 ක් වටිනා කෘෂි හා පශු සම්පත් තොගයේ වටිනාකම තක්සේරු කළ ආකාරය සටහනක් මගින් හෙළිදරව්කර නොතිබුණි.

(ද) 2016 වර්ෂයේදී ඉකුත් වර්ෂ වෙනුවෙන් ලැබී තිබුණු රු.20,960,226 ක් භිහ බදු ආදායම, වර්ෂයේ ආදායමට ගෙන තිබීමේ වරද නිවැරදි කිරීමේදී සමුච්චිත අලාභ ගිණුමට හර කර ලැබියයුතු බදුකුලී ගිණුම බැරකළ යුතු වුවද ඉකුත් වර්ෂයේ සහ සමාලෝචිත වර්ෂයේදී සමුච්චිත අලාභ ගිණුම බැර කර ලැබියයුතු බදුකුලී ගිණුම හර කිරීම නිසා වර්ෂ අවසානයේ සමුච්චිත අලාභය රු.83,840,904 න් අඩු වී ලැබියයුතු බදුකුලී ගිණුම එම ප්‍රමාණයෙන් වැඩි වී තිබුණි.

(ග) සමාලෝචිත වර්ෂයේදී සුළු පරිමාණ ජල විදුලි බලාගාරවලින් ලැබිය යුතු රු. 5,373,634 ක රාජ්‍යභාග ගිණුම්ගත කර නොතිබුණි.

(ඝ) 2009 සහ 2010 වර්ෂවල රු. 500,000 බැගින් රු 1,000,000 ක් සත්දින තැන්පතු දෙකක පිළිවෙලින් සියයට 3 ක හා සියයට 10.5 ක වාර්ෂික පොළී අනුපාතයකට ආයෝජනය කර තිබුණි. එහි පොළී ආදායම ආයෝජනය කල දින සිට 2018 වර්ෂය දක්වාම ගිණුම්ගත කර නොතිබුණි.

(ඞ) ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් මහවැලි පශු සම්පත් සමාගමේ ආයෝජන වටිනාකම එම සමාගමේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති වටිනාකම සමඟ සැසඳීමේදී රු. 2,694,781 ක වෙනසක් පැවතුණි.

(ච) රු. 20,477,000 ක ආයෝජනවලට අදාල කොටස් සහතික, රු. 2,632,908 ක ඉතිරිකිරීම් ගිණුමකට සහ රු. 727,481 ක ස්ථාවර තැන්පතුවකට අදාල ශේෂ සනාථකිරීම්, බැංකු පාස්පොත සහ තැන්පතු සහතික විගණනය වෙත ඉදිරිපත් නොවීම හේතුවෙන් ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උපවගන්තිය ප්‍රකාරව අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළයුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන්වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගැයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියළු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය පවත්වාගෙන ගොස් තිබුණි.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(i)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත නිර්දේශයන් හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

(අ) උඩවලව කලාපයට අයත් නිවාස 03 ක්, සයනාගාර 02 ක්, නිවාඩු නිකේතනයක් හා ගොඩනැගිල්ලක පිරිවැය හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) නිරාවිය ගොවිපල වෙත මොරගහකන්ද ව්‍යාපෘතියෙන් හා ගංගාද්‍රෝණි කාර්යාලයෙන් 2010 – 2016 කාලය තුළ ලබාදී තිබුණු යතුරු පැදි 12 ක්, මල්ටි චොපර් යන්ත්‍ර 02 ක්, කිරි ප්‍රවාහන ලොරියක්, ට්‍රැක්ටර් 03 ක්, කුකුළු පාලන ගොඩනැගිලි 04 ක්, විද්‍යුත් බර මැනුම් උපකරණ 02 ක් හා බේලින් මැෂින් 01 ක් යන වත්කම් ගිණුම්ගත කර නොතිබුණි.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබාගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම් තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අධිකාරිය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනාහාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියාකර ඇති බව.

| නීතිරීති/විධානයට යොමුව | විස්තරය |
|---|---|
| (අ) 2013 අංක 17 දරන එකතු කල අගය මත බදු (සංශෝධිත) පනතේ 10 (ආ) වගන්තිය | මාස 12 කාලසීමාවකදී භාණ්ඩ හා සේවා සැපයුම්වල මුළු වටිනාකම රු.මිලියන 12 ඉක්මවන්නේ නම් පනත යටතේ එකතුකල අගය මත බදු සඳහා ලියාපදිංචි වියයුතුය. නමුත් අධිකාරිය ආදායම් ප්‍රභවයන්ගෙන් ඉකුත් වර්ෂයේදී රු.මිලියන 93 ක් හා සමාලෝචිත වර්ෂයේ රු. මිලියන 152 ක් |

| | |
|---|---|
| | රැස්කර තිබුණද එකතු කල අගය මත බදු සඳහා ලියාපදිංචිවීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය | මූල්‍ය වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන හා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය. සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මාස 05 ක් ප්‍රමාදව 2019 ජූලි 31 දින විගණනයට ඉදිරිපත් කර තිබුණි. ඒ සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. |
| (ඇ) 2016 මාර්තු 24 දිනැති අංක 01/2016 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 2.3.3 ඡේදය | නිලධාරියෙක් ව්‍යාපෘතියකට නිදහස් කළ හැක්කේ රජයේ අවශ්‍යතාවය මත පූර්ණකාලීන පදනමින් අවුරුදු 05 ක් හෝ වැටුප් රහිත පදනම මත සේවකයාගේ ඉල්ලීම අනුව අවුරුදු 05 ක් සඳහා පමණි. නමුත් නිළධාරීන් 03 දෙනෙකු වසර 10 කටත් අධික කාලයක් තිස්සේ වෙළි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතියේ සේවය සඳහා නිදහස්කර තිබුණි. |
| (ඈ) අධිකාරියේ මූල්‍ය කාර්යපරිපාටි සංග්‍රහයේ 1.5.1 ඡේදය හා අධ්‍යක්ෂ ජනරාල්ගේ 02/2012 හා 2012 මාර්තු 15 දිනැති අභ්‍යන්තර චක්‍රලේඛයේ 05 වගන්තිය | අත්තිකාරම් මුදල ලබාගත් කාර්යය අවසන් වී දින 7 ක් ඇතුලත පියවියයුතු වුවද කලාප 10 ක හා අංශ දෙකකට අදාල වර්ෂ එකකට වඩා වැඩි නොපියවූ රු. 175,963,000 ක සැපයුම් අත්තිකාරම් විය. |

| | | |
|---|---|---|
| (ඉ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (ආ) සහ (ඇ) වගන්තිය | ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් අවම වශයෙන් වසර තුනක කාලයක් සඳහා අපේක්ෂිත ප්‍රසම්පාදන කටයුතු ඇතුලත්ව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කල යුතුය. ඊළඟ එළඹෙන වර්ෂය සඳහා වූ ප්‍රසම්පාදන කටයුතු විස්තරාත්මකව පිළියෙල කරනු ලැබිය යුතු වුවත් අධිකාරිය එසේ සිදුකර නොතිබුණි. ඉදිරි වර්ෂයට අදාල ප්‍රසම්පාදන සැලැස්ම එම වර්ෂය ආරම්භවීමට ප්‍රථම සකස්කර අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි. |
| (ඊ) | ප්‍රසම්පාදන අත්පොතේ මාර්ගෝපදේශ 4.1 (ඇ) | මුල් ප්‍රසම්පාදන සැලැස්ම නිරන්තරයෙන් නියාමනය සහ යාවත්කාලීන කළයුතු වුවත් අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම එලෙස යාවත්කාලීන කර නොතිබුණු අතර ක්‍රියකාරී සැලැස්මේ ඇතුළත් කාර්යයන් සමඟ ප්‍රසම්පාදන සැලැස්මේ ඇතුළත් කාර්යයන්වල වෙනස්කම් පැවතුණි. |

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර අධිකාරියේ සම්පත් සකසුරුම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාල නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

(අ) 2017 වර්ෂයේ රු. 8,550,788 ක් වැයකර අළුත්වැඩියා කර තිබුණු කොත්මලේ කාර්යභාර ඉංජිනේරු කාර්යාලය සතු දොඹකර යන්ත්‍රයක් නිසි පරිදි අළුත්වැඩියා කර නොතිබීම හේතුවෙන් 2017 දෙසැම්බර් 29 දින සිට 2019 මැයි දක්වා නිශ්කාර්යව පැවතුණි.

(ආ) කොත්මලේ කාර්යභාර ඉංජිනේරු කාර්යාලයේ පැරණි වේලි ආදර්ශනය ඉවත්කර තිබුණු අතර නව වේලි ආදර්ශනයක් සැකසීම සහ පවතින නැරඹුම් මැදිරිය ප්‍රතිසංස්කරණය කිරීම සඳහා 2017 වර්ෂයේ රු. 6,990,000 කට කොන්ත්‍රාත්තුවක් පිරිනමා තිබුණද රු. 2,060,000 ක් වැය කර ඉදිකිරීමට සැලසුම් කර තිබුණු වේලි ආදර්ශනය 2019 මැයි වන විටත් අවසන් කර නොතිබුණි.

(ඇ) අධිකාරියේ වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්මේ හා මොරගහකන්ද ව්‍යාපෘතියේ අනුමත සැලැස්මේ ඇතුලත් නොවූ අධිකාරියේ ප්‍රධාන කාර්යාලය ඉදිරිපිට මොරගහකන්ද ජලාශයේ ආකෘතියක් ඉදිකිරීමට රු. 2,580,000 ක් වැයකර තිබුණි. ඊට අදාලව ඇස්තමේන්තුවක් සකස් කර නොතිබුණු අතර මෙම කාර්යය සඳහා ප්‍රතිපාදන ලබාදීමට අමාත්‍යාංශ ලේකම් විසින් දළ ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා තිබුණද එය සිදුකර නොතිබුණි. මොරගහකන්ද ව්‍යාපෘතියෙන් ප්‍රතිපූරණය කරගැනීමට සැලසුම් කර තිබුණද දළ ඇස්තමේන්තුවක් අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත්කර නොතිබීම නිසා ව්‍යාපෘතිය විසින් ප්‍රතිපූරණය කර නොතිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.5.1 (අ) ඡේදයට පටහැනිව හා අනුමත වැය ඇස්තමේන්තුවකින් තොරව 2018 ජූලි 10 දින ප්‍රසම්පාදන කමිටුව විසින් උක්ත ප්‍රසම්පාදන කටයුත්ත සඳහා අනුමැතිය ලබාදී තිබුණු අතර අධිකාරිය විසින් ගෙවීම් සිදුකර තිබුණි.

## 3 වෙනත් නිරීක්ෂණ

---------------------

(අ) සූරියවැව කොට්ඨාශ කළමනාකරණ බලප්‍රදේශයේ පිහිටි අංක 6758 දරන ඉඩමේ බලපත්‍රලාභියා බදු මුදල් නොගෙවීම මත ඉඩම් සංවර්ධන ආඥා පනතේ 107 සිට 112 දක්වා වගන්ති ප්‍රකාරව අවසර පත්‍රය විධිමත්ව අවලංගු නොකර නැවත පුද්ගලයන් දෙදෙනෙකුට ලබා දී තිබුණි. ඉන් එක් අයෙකු 2013 වර්ෂයේ සිට දළ තක්සේරුව මත බදු ගෙවා තිබුණද අනෙක් පුද්ගලයාගෙන් රු. 53,600 ක් අයවිය යුතුව පැවතුණි.

(ආ) අංක 6438 දරන ඉඩමට සූරියවැව කොට්ඨාශ කළමනාකරු ලබා දී තිබුණු අවසර පත්‍රය වලව නේවාසික ව්‍යාපාර කළමනාකාර විසින් එය ව්‍යාජ අවසර පත්‍රයක් බව දක්වා තිබුණි. මෙම ඉඩමෙන් පර්චස් 80 ක් අනවසර ඉඩම් නියමානුකූල කිරීම යටතේ වෙනත් අයෙකු වෙත ලබා දී තිබුණද ලබාගත් දින සිට බදු ගෙවා නොතිබුණු අතර දළ තක්සේරුව මත අයවිය යුතු හිඟ බදු මුදල රු. 111,680 ක් විය. බදු ගෙවා නොතිබුණද ඉඩම අවලංගු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඈ) සූරියවැව කොට්ඨාශ කළමනාකරණ බලප්‍රදේශයේ පිහිටි අංක 6407 දරන ඉඩම පුද්ගලයෙකු විසින් අනවසරයෙන් භුක්ති විඳින අතර ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට 2019 වර්ෂය දක්වා අධිකාරිය කටයුතු කර නොතිබුණි.

(ඇ) 2002 වර්ෂයේදී ණය ලබාදීමට චක්‍රීය අරමුදලක් ඇති කිරීමට රු.මිලියන 48 ක් ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ තැන්පත් කර තිබුණද ණය ලබාදීමට 2019 වර්ෂය දක්වාම කටයුතු කර නොතිබුණි. සමාලෝචිත වර්ෂය අවසානයට තැන්පතු වටිනාකම රු මිලියන 88.2 ක් වූ අතර සාමාන්‍ය ඉතුරුම් පොලියටත් වඩා අඩු සියයට 4 ක පොලියක් යටතේ මෙම අරමුදල් දීර්ඝකාලයක් බැංකුවේ රඳවා තැබීම අනාර්ථික කටයුත්තක් වී තිබුණු අතර, ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඉ) සී කලාපයේ කෘෂිකාර්මික කළමනාකරණ මධ්‍යස්ථානයේ ආදායම මාසිකව ප්‍රධාන කාර්යාලට ප්‍රේෂණය කර නොතිබුණු අතර බැංකු ගිණුමේ 2018 දෙසැම්බර් 31 දිනට රු. 87,856,695 ක් පැවතුණි. එම මුදල් ආයෝජනය කිරීමක් හෝ සිදු නොකර නිශ්ක්‍රියව පැවතුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේදී අධිකාරිය විසින් රු. 1,193,155,190 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබුණද සත්‍ය වශයෙන් උපයා තිබුණේ ඉන් සියයට 63 ක් වූ රු. 753,493,183 ක් පමණි. ඉන් එච්, උඩවලව සහ සී කලාපවල ඇස්තමේන්තුගත ආදායමින් ආදායම් ඉපයීමේ ප්‍රගතිය සියයට 50 ට වඩා අඩු විය.

(උ) සමාලෝචිත වර්ෂයේදී සුළු පරිමාණ ජල විදුලිබලාගාරවලින් මහවැලි අධිකාරිය රු. මිලියන 330 ක ආදායමක් ඉපයීමට ඇස්තමේන්තු කර තිබුණද ඉන් සියයට 60 ක් උපයා තිබුණි. පූර්ව විගණන විමසුම් මඟින් නිරීක්ෂණය කළ ඉහළ මහවැලි ජලාධාර ප්‍රදේශයේ පිහිටි 70 ක් වන සුළු පරිමාණ ජල විදුලි බලාගාර කිසිවක් සහ මොරගහකන්ද බලාගාර තුන ආදායම් ඇස්තමේන්තු සඳහා යොදාගෙන නොතිබුණු අතර විගණිත දිනය දක්වා එම බලාගාරවලින් කිසිදු ආදායමක් ඉපයීමට මහවැලි අධිකාරිය අපොහොසත් වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ මැයි සිට දෙසැම්බර් දක්වා කාලය තුල මොරගහකන්ද සුළු පරිමාණ ජල විදුලි බලාගාර තුන මඟින් උත්පාදනය කළ කි.වොට් 28,566,405 ක විදුලි බලය සඳහා රු. මිලියන 496.8 ක මුදලක් විදුලි බල මණ්ඩලයෙන් අයවිය යුතු වුවත් විගණිත දිනය දක්වා එම මුදල් අයකරගෙන නොතිබුණි. 2018 වර්ෂයට අයවිය යුතු මුදල්ද ඇතුළුව 2019 වර්ෂයේ මැයි වන විට අයවිය යුතු සමස්ත මුදල රු. මිලියන 964.1 ක් වී තිබුණි.

(ඖ) මාදුරුඔය දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපෘතිය (බී කලාපය) සඳහා වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් මුදල් වෙන්කරගෙන තිබුණද එහි කටයුතු සිදුකල බවට තොරතුරු නොවුණි. එම මුදල් උපයෝජනය කර 2014 වර්ෂයේ සිට රු. මිලියන 935 ක ඇස්තමේන්තුවකට මාදුරු ඔය වම් ඉවුර (බී කලාපයේ) සිංහපුර කොට්ඨාශයේ මහවැලිතැන්න සහ මල්වැන්න ඒකකවල නැවත පදිංචිකිරීමේ ව්‍යාපෘතිය සිදුකර තිබුණි. මෙම ව්‍යාපෘතිය සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලැබී නොතිබුණි. ව්‍යාපෘති කාලය 2016 වර්ෂයෙන් අවසන් වී තිබුණද කාලය දීර්ඝකරගෙන නොතිබුණු අතර 2018 වර්ෂයේදී 2019 දක්වා කාලය දීර්ඝකිරීම සඳහා අමාත්‍යාංශ ලේකම්ගෙන් ඉල්ලීමක් සිදු කර තිබුණි. 2018 වර්ෂයේදී මාදුරු ඔය දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපෘතිය නැවත දේශීය සහ චීන විදේශ අරමුදල් ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කිරීම සඳහා වාර්ෂික ඇස්තමේන්තුවෙන් රු. 5,145,000 ක් වෙන්කරවාගෙන තිබුණි.

(ක) වැලිඔය ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය 2013 වර්ෂයේ සිට 2018 වර්ෂය සඳහා රු. මිලියන 3,957 ඇස්තමේන්තුවකට අනුමත වී තිබුණු අතර ව්‍යාපෘති කාලය අවසන් වී තිබුණද එහි කාලය දීර්ඝ කිරීම සඳහා රේඛීය අමාත්‍යාංශයේ සහ භාණ්ඩාගාරයේ අනුමැතීන් ලද බවට සාක්ෂි නොවුනි. 2021 දක්වා කාලය දීර්ඝකිරීම සඳහා අමාත්‍යාංශ ලේකම්ගෙන් ඉල්ලීමක් පමණක් සිදු කර තිබුණි. 2018 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ සමුච්චිත වියදම රු. මිලියන 2018.2 ක් සහ භෞතික ප්‍රගතිය සියයට 66 ක අවමයක විය. මෙම ව්‍යාපෘතියේ අරමුණු වූ යුද්ධය නිසා අවතැන් වූ ඉඩම් අහිමි පවුල් 6,963 ක් නැවත පදිංචිකිරීම, හෙක්ටයාර් 6,258 ක ඉඩම් සංවර්ධනය කිරීම සහ කි. මී. 150 ක පාරවල් හා කි. මී. 132 අතු මාර්ග සංවර්ධනය කිරීමේ ප්‍රගතිය පරීක්ෂාකිරීමට හැකි පරිදි ව්‍යාපෘති ප්‍රගති වාර්තා හෝ කාර්යසාධන වාර්තා සකස් කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේ මුල්‍ය ප්‍රකාශන අනුව රු. 12,800,000 ක් භාණ්ඩාගාරය විසින් ප්‍රතිපාදන අනුමත කර නොතිබුණු කිවුල් ඔය ජලාශ ව්‍යාපෘතිය සඳහා වැය කර තිබුණි.

(ඛ) වැලිකන්ද නේවාසික ව්‍යාපාර කළමනාකරණ බලප්‍රදේශයේ ආයෝජන ව්‍යාපෘති සඳහා බැහැර කර තිබුණු ඉඩම් අටකින් ඉඩම් හයක කිසිදු සංවර්ධන කටයුත්තක් සිදුකර නොතිබුණි. ඒ අනුව ඉඩම් ලබාදීමෙන් අධිකාරිය අපේක්ෂා කල අරමුණු ඉටු වී නොතිබුණි. ඉඩම් බැහැරකිරීමේදී 1947 අංක 08 දරන රජයේ ඉඩම් ආඥා පනතේ 199 (3) ඡේදය ප්‍රකාරව මහජන විරෝධතා සඳහා අවකාශ ලබාදෙමින් බදුදීමේ යෝජනාව ගැසට් නිවේදන මඟින් ප්‍රසිද්ධ කර නොතිබුණු අතර ඉඩම් බැහැර කිරීමට පෙර මහවැලි මූලික සැලසුම්වල යෝජිත ඉඩම් පිහිටි ස්ථානයන් හා ඉඩම් පරිහරණ රටාවන් පිළිබඳ අධ්‍යයනයක් සිදුකර එම ඉඩම් අපේක්ෂිත ආයෝජන කාර්යය සඳහා බැහැර කිරීම යෝග්‍යයද යන්න තීරණය කිරීම සඳහා ප්‍රධාන කාර්යාලයේ ඉඩම් පරිහරණ සැලසුම් අංශයේ නිර්දේශ ලබාගෙන නොතිබුණි. මෙම ඉඩම්වලින් ඉඩම් හතරක් මූලික

සැලසුම්වල රිදීතැන්න සහ ජයන්තියාය ඒකකවල ජනපදිකයින්ගේ ජනාවාස වෙනුවෙන් ගොඩ ඉඩම් ලෙස වෙන්කර තිබුණද එම අරමුණට පටහැනිව ආයෝජන ව්‍යාපෘති සඳහා බැහැර කර තිබුණි. ඉඩම් කැබලි 3 ක් නියමිත පරිදි සංවර්ධනය නොකිරීම මත අවස්ථා කිහිපයකදී තේරීම්ලාභීත්වය නැවත සලකා බැලීමේ පරීක්ෂණ සිදුකර තිබුණද විගණිත දිනය දක්වා තේරීම්ලාභීත්වය විධිමත්ව අවලංගු කර නොතිබුණි.

(ඔ) 2013 වර්ෂයේදී එවකට විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතිය මත වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයක් ඉදිකිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා හිරා පදනම වෙත ලබා දී තිබුණු අක්කර 35 ක ඉඩම පසුව 2016 වර්ෂයේදී ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් විෂයභාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතියකින් තොරව පෞද්ගලික සමාගමක් වූ බැටිකලෝ කැම්පස් ( ප්‍රයිවට් ) ලිමිටඩ් වශයෙන් වෙනස් කර දීර්ඝකාලීන බදු ඔප්පුව එම සමාගමේ සභාපති නමින් නිකුත් කර තිබුණි. ලබා දී තිබුණු අක්කර 35 ට වඩා අනවසරයෙන් භුක්ති විඳින් බව ක්ෂේත්‍ර පරීක්ෂාවේදී අනාවරණය වුවත් එම කොටස මේ දක්වා අධිකාරිය වෙත පවරාගෙන නොතිබුණි. 2017 වර්ෂයේ තවත් අක්කර 45 ක් හිරා පදනම නමින් ඉල්ලා තිබුණු අතර ඒ සම්බන්ධයෙන් ඉදිරි කටයුතු කිරීම සඳහා අමාත්‍යාංශ ලේකම් විසින් විෂයභාර අමාත්‍යවරයාගෙන් පූර්ව අනුමැතිය ඉල්ලා තිබුණි. අමාත්‍යවරයා විසින් සිය අත්සන පමණක් යොදා තිබුණු අතර ඒ අනුව එම අක්කර 45 ලබාදීමට අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී තිබුණි.

(ඕ) වැලිකන්ද කලාපය තුළ ඉඩම් ලබාදී ඇති ආයෝජන ව්‍යාපෘතිවලින් 2018 දෙසැම්බර් 31 දිනට රු. 31,114,866 ක මුදලක් අයවියයුතුව පැවතුණි.

(ක) 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් භාවිතාකරන රත්මලාන, කල්දෙමුල්ල පිහිටි ඉඩම, ගොඩනැගිලි හා යන්ත්‍රෝපකරණ වෙනුවෙන් අයකර ගතයුතු රු. 9,450,000 ක බදු කුලිය අයකරගෙන නොතිබුණු අතර භාවිතා කරන විදුලිය සහ ජලය සඳහා ගාස්තු ගණනය කර අයකිරීම සඳහා සුදුසු වැඩපිළිවෙලක්ද ක්‍රියාත්මක කර නොතිබුණි.

(ග) ජාවත්ත පරිශ්‍රයේ පිහිටි බාහිර පාර්ශවයන් විසින් භාවිතා කරනු ලබන ගොඩනැගිලි 13 ක් සඳහා තක්සේරු වාර්තා අනුව අයකර ගතයුතු කුළිය අයකර ගන්නා ලෙස දන්වා තිබුණද,රු.35,112,000 ක් 2019 වර්ෂයේ සැප්තැම්බර් දක්වා අයකරගෙන නොතිබුණි. අධිකාරිය විසින් එම ගොඩනැගිලි වෙනුවෙන් විදුලි හා ජල බිල්පත් ලෙස ගෙවා තිබුණු රු. 10,616,946 ක් අදාල පාර්ශව වෙතින් ප්‍රතිපූරණය කරගෙන නොතිබුණි.

(ච) අධිකාරිය විසින් ගිවිසුම් ගතවීමකින් තොරව බී කලාපයේ ගොඩනැගිලි 19 ක්, ප්‍රධාන කාර්යාලයේ ගොඩනැගිලි 11 ක්, වලව කලාපයේ ගොඩනැගිලි 07 ක් හා මූලික වැඩපාලන ක්‍රියාකාරවුම් හා නඩත්තු අංශයේ ගොඩනැගිලි 49 ක් බාහිර පාර්ශව වෙත ලබාදී තිබුණි.

(ජ) සමාලෝචිත වර්ෂය අවසානයට රු. 896,499,000 ක ලැබිය යුතු බදු කුලී ආදායමක් වූ අතර, ඉන් රු. 428,065,000 ක් වර්ෂ 05 ක්ද, රු. 157,225,000 ක් වර්ෂ 03 සිට 05 දක්වා කාලයක්ද ඉක්මවා තිබුණි. බදු ආදායම් රැස්කිරීමට අදාල නියමයන් හා කොන්දේසි ක්‍රියාත්මක නොකිරීම හිඟ බදු ආදායම් වාර්ෂිකව වැඩිවීමට හේතු වී තිබුණි.

(ට) සමාලෝචිත වර්ෂය අවසානයට රු. 454,398,000 ක වැඩපූර්ව අත්තිකාරම් වූ අතර, ඉන් රු. 3,467,000 ක් වර්ෂ 05 ඉක්මවා තිබුණද, අයකර ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඩ) 2018 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ශේෂය රු. 651,986,000 ක් වූ අතර, ඉන් රු. 46,443,000 ක් වසර 05 ඉක්මවා තිබුණි. එම ශේෂවල ඇතුළත් රු. 7,747,000 ක රැඳවුම් මුදල්වලට අදාල කොන්ත්‍රාත් වැඩවල සම්පූර්ණත්වය තහවුරු කරගෙන රැඳවුම් මුදල් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ත) මූලික වැඩපාලන ක්‍රියාකරවුම් හා නඩත්තු අංශයේ ජංගම වත්කම් යටතේ දක්වා ඇති රු. 780,070 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් හා රු. 460,701 ක ශේෂ වසර 05 කට වැඩි කාලයක් තිස්සේ හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ද) අධිකාරියට අයත් මහවැලි ආරක්ෂක බළකායේ සේවය කරන ලද සේවකයින් 44 දෙනෙකු 2015 වර්ෂයේ සිට විවිධ රාජ්‍ය ආයතන වෙත නිදහස් කර තිබුණු අතර, ඉන් 12 දෙනෙකු 2018 වර්ෂය තුළදී නැවත ආරක්ෂක බළකායේ සේවයට වාර්තා කර තිබුණි. උක්ත නිලධාරින්ට 2018 දෙසැම්බර් 31 දින වන විට ගෙවූ වැටුප් රු. 66,141,532 ක්, හා අතිකාල හා ගමන් වියදම් රු. 31,448,940 ක් අදාල ආයතනවලින් ප්‍රතිපූරණය කර ගැනීමට 2019 පෙබරවාරි 13 දින වනවිටත් අධිකාරිය අපොහොසත්වී තිබුණි.

(න) අධිකාරියට අයත් ප්‍රධාන කාර්යාලයේ නිලධාරීන් 28 දෙනෙකුද, මොරගහකන්ද කලාපයේ එක් නිලධාරියෙකුද, බී කලාපයේ නිලධාරීන් 03 දෙනෙකුද හුරුළුවැව කලාපයේ එක් නිලධාරියෙකු ඇතුළුව නිලධාරීන් 33 දෙනෙකු රේඛීය අමාත්‍යාංශය හා වෙනත් බාහිර ආයතන වෙත නිදහස් කර තිබුණි. රේඛීය අමාත්‍යාංශයට හා බාහිර

ආයතනවලට පිළිවෙලින් නිදහස් කරන ලද නිලධාරීන් 19 කු හා 14 කු වෙනුවෙන් ගෙවන ලද රු. 22,732,617 ක හා රු. 12,761,670 ක වැටුප්, අතිකාල හා ගමන් වියදම් 2018 දෙසැම්බර් 31 දින වනවිටත් ප්‍රතිපූරණය කරගැනීමට කටයුතු කර නොතිබුණි.

(ප) තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 න්‍යාය පත්‍රය ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාලව අධිකාරිය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් කෙසේ ක්‍රියාත්මක කර තිබේද යන්න පිළිබඳව පරීක්ෂා කිරීම සඳහා අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

ඩබ්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති

# විගණකාධිපති වාර්තාව පිළිබඳව අධ්‍යක්ෂ ජනරාල්වරයා කරුණු ඉදිරිපත් කිරීම

## IV කොටස

**<u>ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ සහ එහි පරිපාලිත සමාගම්වල 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්ති ප්‍රකාරව විගණකාධිපති වාර්තාව</u>**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබ විසින් මා වෙත යොමු කරන ලද අංක අයිඊඑන්/බී/එම්ඒඑස්එල්/ 01/18/41 හා 2019.11.22 දිනැති 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්ති ප්‍රකාරව විගණකාධිපති වාර්තාව සම්බන්ධයෙන් මාගේ පිළිතුරු පහත සඳහන් පරිදි වේ.

### 1.2 තත්වාගණනය කල මතය සඳහා පදනම

අ)පරිපාලිත සමාගම් විසින් කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාර සඳහා වූ ගිණුම්කරණ ප්‍රමිතිය අනුගමනය කිරිම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන වලට වූ බලපෑම, 2019 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනය මගින් හා ඉදිරි වර්ෂවලදී ද හෙලිදරව් කිරිමට කටයුතු කරමි.

ආ)පිරිවැය රු.3,058,326.00 ක් හා රු.20,713,263.00 ක වටිනාකමින් යුත් ස්ථාවර වත්කම් වල වටිනාකම සම්පූර්ණ වශයෙන් ක්ෂය කර අවසන් කර ඇත්තේ 2017.12.31 දිනෙන් වසරේදී වන අතර 2019 වසර සඳහා ඵලදායි ජීවිත කාලය සමාලෝචනය කර එම ස්ථාවර වත්කම් 2019 වසරේ සිට ප්‍රත්‍යාගනනය කර ගිණුම් වලට ගැලපිමට කටයුතු කරන ලෙස අදාල සමාගම් වෙත උපදෙස් ලබා දි ඇත.

ඇ)මහවැලි පශු සම්පත් සහ කෘෂි ව්‍යාපාර (පුද්) සමාගමේ මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් රු.14,117,550.00 ක අවිනිශ්චිත ගිණුම නිරවුල් කිරිමට අවශ්‍ය කරුණු සොයා බලා ජර්නල් සටහනක් මගින් නිවැරිදි කිරිමට කටයුතු කර ඇත.

(අ)රත්මලාන කල්දෙමුල්ල පාර, අංක 100 දරණ ස්ථානයේ පිහිටි පර්චස් 34.70 වන ඉඩම, මහවැලි අධිකාරිය විසින් ඉදි කරන ලද ගොඩනැඟිලි සමඟ 2018 වර්ෂයේ ගිණුම් ගත කර ඇත. එසේ වුවද එම ඉඩමේ අයිතිය රත්මලාන ප්‍රාදේශීය ලේකම් සතුව ඇත. 1993 මාර්තු මාසයේ මැෂින් ලීසිං සමාගමෙන් යන්ත්‍ර සූත්‍රද සමඟ මහවැලි අධිකාරිය වෙත මෙම ඉඩම භාර දී ඇත. මෙම ඉඩමෙන් කොටසක් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ යාන්ත්‍රික වැඩපල සඳහා වසර 05 කට බදු පදනම මත ලබා දීමට තක්සේරු දෙපාර්තුමේන්තුවෙන් ලබාගත් තක්සේරු වටිනාකම ගිණුම් ගත කර ඇත. මෙම ඉඩමේ අයිතිය රජය (රත්මලාන ප්‍රාදේශීය ලේකම්) සතු බැවින් ස්ථාවර වත්කම් ලේඛනය හා ගිණුම් ගත කර තිබූ රු.15,80,00,000.00 ක වටිනාකම 2019 වර්ෂයේ දී ගිණුම් පොත්වලින් ඉවත් කර නිවැරදි කිරීමට කටයුතු කර ඇත.

එමෙන්ම අංක 04, ජාවත්ත ස්ථානයේ පිහිටි දැනට මහවැලි ආරක්ෂක බලකා කාර්යාලය පවත්වාගෙන යනු ලබන රූඩ් 01 පර්චස් 1.11 ක ප්‍රමාණය, 1980.06.16 දින අති විශේෂ ගැසට් පත්‍රය මඟින් නෙලුම්කුලිය වතු සමාගමෙන් දිසාපති, කොළඹ විසින් පවරා ගෙන ඇති අතර මෙම ඉඩම ද රජය සතු වේ. එමෙන්ම මහවැලි ඉංජිනේරු හා නිර්මාණ ඒජන්සිය මගින් එහි ගොඩනැගිලි ඉදි කර ඇත. ආසියානු සංවර්ධන බැංකුව වෙත මෙම ඉඩම බදු පදනම මත ලබා දීම පිණිස ලබා ගත් ඉඩමේ තක්සේරු වාර්තාව

අනුව රු.30,83,25,000.00 ක වටිනාකම ගිණුම්ගත කර ඇත. මෙම ඉඩම ද රජය විසින් පවරා ගත් ඉඩමක් නිසා ගිණුම්ගත කර ඇති රු.30,83,25,000.00 ක වටිනාකම 2019 වර්ෂයේ ගිණුම් පොත්වලින් ඉවත් කර නිවැරදි කිරීමට කටයුතු කර ඇත.

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට අයත් 1984 හා 1989 කාලයේ දී මිල දී ගෙන තිබූ පිරිවැය රු.64,320,853.00 ක් වූ කොළඹ 10, ටී.බී.ජයා මාවතේ අංක 493 සහ අංක 500 යන ඉඩම් කට්ටි දෙක ගිණුම්ගත කිරීම සඳහා තක්සේරු වටිනාකම ලබාගැනීමට පිළිවෙලින් 2015.12.21, 2016.03.02, 2018.09.18 සහ 2018.09.20 යන දින වලදී ප්‍රධාන තක්සේරුකරු, තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ලිපි යොමු කර තිබුණ ද මෙතෙක් තක්සේරු වටිනාකම ලැබී නොමැත. අදාල තක්සේරු වටිනාකම් ලද වහාම ගිණුම්ගත කිරීමට කටයුතු කරමි.

(ඉ)ජර්නල් සටහන් මගින් 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල නිවැරදි කිරීම් සිදු කර ඇත.

(ඊ)ජනපදිකයින් වෙත ණය ලබාදීම සඳහා භාණ්ඩාගාරයෙන් අරමුදල් ලැබුණු විට මුදල් පොතේ හා "ප්‍රාග්ධන ප්‍රදාන" යටතේ ගිණුම් වල සටහන් කර ගිණුම් ගත කර ඇත. එම මුදල, බැංකුව වෙත යැවීමේදී ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ කරන ලද ආයෝජනයක් හෙයින් මුදල් පොත මඟින් ගැලපීම් කර ආයෝජනය හා ප්‍රාග්ධන ප්‍රදාන ලෙස ගිණුම් ගත කල යුතු වුව ද එසේ සිදු කර නොතිබුණි. එය නිවැරදි කිරීමේ දි 2018 වර්ෂයේ දි "ආයෝජන " ලෙස නොව ජංගම වත්කමක් ලෙස සටහන් වීම 2019 වර්ෂයේ ජර්නල් සටහන් (JE) මඟින් "බැංකු හා මුදල් ශේෂය " ලෙස මුදල් හා මුදල් සමාන දෑ යටතේ නිවැරදි කර ඇත.

තවද රු.165,747.00 පොලී ආදායම පෙර වර්ෂ ගැලපීමක් ලෙස 2019 වර්ෂයේ දී ජර්නල් (JE) මඟින් නිවැරදි කර ඇත**.**

(උ)වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතියේ පළමු අදියර යටතේ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත ලැබි තිබූ රු.671,503,748.00 ක ස්ථාවර වත්කම්වලින් 2018.12.31 දින වන විට තක්සේරු දෙපාර්තමේන්තුව වෙතින් තක්සේරු වටිනාකම ලැබී තිබූ රු. 201,640,037.00 ක වටිනාකමින් යුත් ස්ථාවර වත්කම් ප්‍රමාණයක් 2018 වර්ෂය වන විට ගිණුම් ගත කර ඇත. ඉතිරි වත්කම් වලට අදාල පහත දක්වා ඇති සාරාංශයට අනුව තක්සේරු වාර්තා, තක්සේරු දෙපාර්තමේන්තුව වෙතින් 2019 වර්ෂයේදි ලැබී එම වටිනාකම් 2019 වර්ෂයේ ගිණුම්වලට ගැලපීමට කටයුතු කර ඇත.

<u>කලාපයතක්සේරු වටිනාකම (රු.)තක්සේරු වාර්තාව ලද දිනය</u>

බී කලාපය61,896,500.002019.05.09 එල් කලාපය19,750,000.002019.05.09

ඉහත ව්‍යාපෘතිය යටතේ මහවැලි අධිකාරිය වෙත ලැබී ඇති ඉතිරි ස්ථාවර වත්කම් ද තක්සේරු කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යවා ඇති නමුදු මෙතෙක් තක්සේරු වාර්තා ලැබී නොමැති බැවින් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් අංක CGO/ASM/Cir/2018 හා 2018.12.31 දිනැතිව නිකුත් කරන ලද "වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 04/2018" චක්‍රලේඛයේ අංක 06 සහ 07 ඡේද අනුව

ඉහත ව්‍යාපෘතියෙන් ලද වත්කම් තක්සේරු කිරීමට මේ වන විට කටයුතු කර ඇත. එහිදි "වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක " 04/2018" හි කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය මඟින් නිකුත් කරන ලද "මූල්‍ය නොවන වත්කම් තක්සේරුකිරීම් මාර්ගෝපදේශය" පදනම වශයෙන් භාවිතා කරනු ලැබේ. ඒ අනුව ඉහත ක්‍රමවේදය අනුව වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතියෙන් ලද සියලු වත්කම් තක්සේරු කර එම තක්සේරු වටිනාකම් ලද වහාම අදාල වටිනාකම් ගිණුම්වලට ගැලපීමට කටයුතු කරමි.

තවද බී කලාපය වෙත ඉහත ව්‍යාපෘතියෙන් ලැබී ඇති වත්කම්වලින්, තක්සේරු දෙපාර්තමේන්තුවෙන් තක්සේරු වාර්තාව නොලැබුණු පරිගණක වල වටිනාකම "වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක "04/2018" හි උපදෙස් අනුව තක්සේරු කර එවා ඇත. එහි වටිනාකම ද 2019 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන වල ගැලපුම් කිරීමට කටයුතු කර ඇත.

"වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක "04/2018" හි උපදෙස් පරිදි ඉහත සඳහන් කර ඇති ක්‍රමවේදයම අනුගමනය කරමින් වේලි ආරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතියේ ව්‍යාපෘති කළමනාකරණ පහසුකම් යටතේ ලද සියලු වත්කම් ද මේ වන විට තක්සේරු කරමින් පවතින අතර එම කටයුතු අවසන් වූ වහාම ගිණුම්වලට ගැලපීමට කටයුතු කරනු ලැබේ.

ඌ)සි කලාපයේ අදාල කොට්ඨාශ කළමනාකරණ කාර්යාල, කලාප කාර්යාලයේ ඉඩම් අංශය සහ මුදල් අංශය යන අංශ කිහිපයේම බදු වාර්තා එකිනෙක සැසඳිම් කර 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන මගින් නිවැරදි කිරිමට කටයුතු කර ඇත.

( එ සහ ඒ)

ස්ථාවර වත්කමක් මිල දි ගැනීමට හෝ පවතින වත්කමට දරණ ලද එම වියදම නිසා පවතින වත්කමේ අගය, ජීව කාලය හා ආර්ථික ප්‍රතිලාභ අත්වන්නේනම් එම වියදම් ප්‍රාග්ධනිත කර ඇති අතර යම් වත්කමක් පවතින තත්වයේම ක්‍රියා කිරිමට දරණ ලද වියදම් අයභාර ලෙස පෙන්වා ඇති අතර 2018.12.31 දිනට ඒකාබද්ධ මූල්‍ය ප්‍රාකාශනයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේ එනම් 3.2.1 උප ශිර්ෂය යටතේ හෙළිදරව් කර ඇත.

(ඔ)මෙම කරුණු 03 ට අදාල තොරතුරු සටහනත් මගින් ඉදිරිපත් කිරිමට 2019.11.11 දින පැවති 316 වන අධ්‍යක්ෂ මණ්ඩලය තීරණයෙන් අනුමත කර ඇත. ඒ අනුව 2019.12.31 දිනෙන් අවසන් වන ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කිරිමට කටයුතු කරනු ලැබේ.

(ඕ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 01 ප්‍රකාරව ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල රු. 156,572,000.00 ක් වටිනා කෘෂි හා පශු සම්පත් තොගයේ වටිනාකම සහ තක්සේරු කල ආකාරය සටහනක් මගින් 2019 වර්ෂයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන මගින් හෙළිදරව් කිරිමට කටයුතු කරමි.

(ක)   2019 වර්ෂයේ සිට අදාල බදු මුදල් නිවරදිව හදුනාගෙන ඒ අනුව ගිණුම් ගත කරන ලෙස උපදෙස් ලබා දී ඇත.

(ග)   සමාලෝචිත වර්ෂයේ දී සුලු පරිමාණ ජලවිදුලි බලාගාරවලින් ලැබිය යුතු රු.5,373,634.00 ක මුදල ජර්නල් සටහන් මගින් 2019 වර්ෂයේ දී නිවැරදි කර ඇත.

(ච)   2009 සහ 2010 වර්ෂවල රු.500,000.00 බැගින් රු.1,000,000.00 ක් සත්දින තැම්පතු දෙකට අදාල වාර්ෂික පොළි ආදායම MASL/FIN/BANK/RE/2019 2019.10.02 දිනැති ලිපිය මගින් බැංකුවෙන් ඉල්ලුම් කිරිමට කටයුතු කර ඇත. ඒ අනුව සත් දින තැම්පතු සඳහා අදාල පොලිය එම තැම්පතු ඉවත් කර ගන්නා අවස්ථාවේ දී, (withdraw) පමණක් ගෙවීම් කරන බව ලංකා බැංකුවේ හයිඩ්පාර්ක් ශාඛාවේ කළමණාකාර - පාරිභෝගිකසේවා ගේ අංක PBU/RLR/AU හා 2019.10.08 දිනැති ලිපිය මගින් දැනුම් දී ඇත.

(ක)(i) <u>මහවැලි පශු සම්පත් සමාගමේ ආයෝජන</u>

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ගිණුම් වල හා සී/ස මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යාපාර (පුද්) සමාගමේ ගිණුම් වල "ආයෝජන" සම්බන්ධව පවතින ශේෂයන් වල වෙනස්කම් වලට හේතු මේ වන විට සොයා ගෙන ඇත. ඒවා පහත පදිරි වේ.

(1)   සී/ස මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යාපාර (පුද්) සමාගම විසින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට නැවත භාර දී ඇති ස්ථාවර වත්කම්වල වටිනාකම වූ රු. 8,967,600.00 ක මුදල ප්‍රධාන කාර්යාලය , " සී " කලාපය හා "එච්" කලාපයේ ගිණුම්වල නිවැරදි කර නොමැත.

(11)   ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යාපාර සමාගම වෙත ලබා දී ඇති මහවැලි " සී " කලාපයේ ගිරාදුරුකෝට්ටේ සත්වපාලන ගොවිපල භාරදීම සම්බන්ධ වූ රු. 628,000.00 ක වටිනාකම් " සී " කලාපය විසින් ගිණුම්ගත නොකිරිම.

(111)   සී/ස මහවැලි පශු සම්පත් හා කෘෂි ව්‍යාපාර (පුද්) සමාගම විසින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට නැවත භාර දී ඇති ස්ථාවර වත්කම් වල වටිනාකම වූ රු. 1,256,000.00 ක මුදල ප්‍රධාන කාර්යාලය විසින් ගිණුම් ගත නොකිරිම.

උක්ත කරුණු සම්බන්ධ සංඛ්‍යාත්මක අගයන් පහත පරිදි ඉදිරිපත් කල හැක.

වත්කම් හුවමාරුවිම් (2016)(රු.)

| | |
|---|---|
| ○ ප්‍රධාන කාර්යාලය | (2,441,808.00) |
| ○ සී කලාපය | (628,000.00) |
| ○ එච් කලාපය | (7,336,850.00) |
| වත්කම් පවරා ගැනීම | <u>8,967,600.00</u> |
| | (1,439,058.00) |

වත්කම් හුවමාරුවිම් (2017)

| | |
|---|---|
| • ප්‍රධාන කාර්යාලය | <u>(1,256,000.00)</u> |
| | <u>2,695,058.00</u> |

ඒ අනුව 2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමග මෙය නිවැරදි කිරිමට කටයුතු කරමි.

(ග)**<u>ආයෝජන – මහවැලි සත්ව ව්‍යාපාරික සමාගම</u>**

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් මහවැලි සත්ව ව්‍යාපාරික සමාගමේ ආයෝජනය කරන ලද මිලි: 10 ට අදාල "ශේෂය සනාථ කිරීමේ " ලිපියක් එම සමාගමේ ලේකම්වරුන්ගෙන් ලබාගෙන ඇත.

වත්කම්- ඉතිරිකිරිමේ ගිණුම්- සොයාබලා ඉදිරිපත් කිරිමට කටයුතු කරමි.

වත්කම්- ස්ථාවර තැන්පතු- සොයාබලා ඉදිරිපත් කිරිමට කටයුතු කරමි.

## 2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

(අ)උඩවලව කලාපයට අයත් අදාල ගොඩනැගිලිවල වටිනාකම තක්සේරු කර ගැනීම සඳහා අංක MA/ASSET/2019/09 හා 2019.01.31 දිනැති ලිපිය මගින් තක්සේරු දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. ඉන් කිහිපයක තක්සේරු වාර්තා 2019 වර්ෂය තුල ලැබී ඇත. ඒ අනුව මේ වන විට තක්සේරු වටිනාකම ලැබී ඇති ගොඩනැගිලි 2019 වර්ෂයේ ගිණුම්වලට ගැලපීමට කටයුතු කර ඇත. ඉතිරි තක්සේරු වාර්තා ද කඩිනමින් ගෙන්වා ගැනීමටත් එය ලද විගස අධිකාරියේ ගිණුම්වලට ගැලපීමට ද කටයුතු කරමි.

(ආ)යතුරු පැදි 12, කිරි ප්‍රවාහන ලොරිය, ට්‍රැක්ටර් 02 ක් ( 36-7113 සහ RD-8619 ) විද්‍යුත් බර මැනුම් උපකරණ 02 ක් සහ කුකුළු පාලන ගොඩනැගිලි 04 විධිමත්ව පවරාගෙන ප්‍රත්‍යාගණනය කර ගිණුම් ගත කර ඇත. මල්ටි චොපර් යන්ත්‍ර 02, ඩේලින් මැෂින් 01, සහ ට්‍රැක්ටරය ( 37-5740 ) ඉදිරි වර්ෂයේ දී ගිණුම්ගත කිරිමට කටයුතු කරමි.

**<u>ලිඛිත නිතියකට හෝ අධිකාරියේ පාලන මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධිවිධාන වලට අනුකුල නොවන ලෙස ක්‍රියාත්මක කර ඇති බව</u>**

(අ)එකතු කල අගය මත බදු සඳහා ලියාපදිංචි කිරීමට ඉදිරි කටයුතු සිදු කරමි.

(ආ)ලි බඩු හා සවි කිරිම් සඳහා වාර්ෂිකව 10% ක් ක්ෂය වෙන් කිරිම් සිදු කර ඇත. ඒ අනුව ලි බඩු හා සවි කිරිම් 2008 වර්ෂයේ දි අවසන් වරට ප්‍රත්‍යාගණනය සිදු කර තිබුණි. ඒ අනුව 2018.01.01 දින වන විට 2008 දි ප්‍රත්‍යාගණනය කර ගිණුම් ගත කර තිබු ලීබඩු හා සවි කිරිම් වල අගය "0" ලෙස ගිණුම් වල පෙන්නුම් කෙරෙණි.(2008 ප්‍රත්‍යාගණනය කල අයිතම) ඒ අනුව 2018.01.01 දිනට එම ලී බඩු හා සවි කිරිම් ප්‍රත්‍යාගණනය කර ගිණුම්වලට ගැලපීම් සිදු කල යුතුව තිබුණි.

ඒ අනුව කලාප 10 ක අංශ 06 ක හා ප්‍රධාන කාර්යාලයද ඇතුළුව ලී බඩු හා සවි කිරිම් අයිතම 703 ක පමණ සහ උප අයිතම් 68,000 කට වඩා වැඩි සංඛ්‍යාවක් ප්‍රත්‍යාගණනය කල යුතු විම මත එම අගයන්

ගිණුම් වලට ගැලපීම  සිදු කිරීම මෙන්ම අධිකාරිය මේ වන තෙක් පරිගණක ගත ගිණුම් පද්ධතියක් ක්‍රියාත්මක නොවීම යන හේතු මත මූල්‍ය ප්‍රකාශන පිලියෙල කර ඉදිරිපත් කිරිම ප්‍රමාද විය.

(ඇ)ව්‍යාපෘති සඳහා මුල් කාලයේ අධිකාරියේ නිලධාරින් නිදහස් කිරීමේදි යම් යම් ගැටළුකාරි තත්ත්වයන් පැවතියද ඔබගේ විගණන විමසුම් අංක LP/H/MASL/01/14/40 හා 2015-10-16 දිනැති විගණන විමසුම මගින් පෙන්වා දී තිබූ කරුණු සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ග ලෙස ව්‍යාපෘති වෙත පූර්ණකාලීන පදනමින් (කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2016 හි වගන්ති අංක 2.3.3(a) යටතේ) නිදහස් කල හැකි උපරිම සේවා කාලය වසර 05 ඉක්මවා ඇති නිලධාරින් නැවත අධිකාරි සේවයට  කැඳවීමට කටයුතු කරන ලදි. නමුත් අවසන් අදියරේ පැවති වේලි අරක්ෂණ හා ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතියට නව නිලධාරින් බඳවා ගැනිම තුලින් අපේක්ෂිත ප්‍රතිඵල ළඟා කරගැනිමට අපහසු බව ව්‍යාපෘති අධ්‍යක්ෂ විසින් දන්වා තිබුණි.  ඒ අනුව වසර දෙකක් සඳහා වන ඉදිරි කාලය වෙනුවෙන් නව නිලධාරින් බඳවා ගැනිම ප්‍රායෝගික නොවන බැවින් එම නිලධාරින් කළමනාකරණ සේවා චක්‍රලේඛ 01/2016 හි වගන්ති අංක 2.3.3(b) අනුව වැටුප් රහිතව ඉතිරි කාලය සඳහා නිදහස් කරන ලදි.  මේ අකාරයෙන් 2015 වර්ෂයේ සිට ව්‍යාපෘති සඳහා නිදහස් කර ඇති අධිකාරි කාර්ය මණ්ඩලය කළමනාකරණ සේවා චක්‍රලේඛ 33 (නව චක්‍රලේඛ 01/2016) ට අනුකූල වනසේ නිවැරදි කිරීමේ කටයුතු සිදු කර ඇත.

කෙසේ නමුත් ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක වු වේලි ආරක්ෂණ සහ ජල සම්පත් සැලසුම්කරණ ව්‍යාපෘතිය සඳහා ශ්‍රී ලංකා මහවැලි අධිකාරියෙන්  නිදහස් කර තිබූ කාර්ය මණ්ඩල, එකී ව්‍යාපෘති සම්බන්ධව ලබා දී තිබු අත්දැකිම්  ලෝක බැංකු නියෝජිතයන් සමග සම්බන්ධිකරණයේදි  වඩා පහසු වන බැවින්  එම කාර්ය මණ්ඩලය ලෝක බැංකු ආධාර යටතේ ආරම්භ කර ඇති  ඒකාබද්ධ ජලාධාර හා ජල සම්පත් කළමනාකරණ ව්‍යාපෘතියේ  සේවය සඳහා යොදවා ගැනීමට අනුමැතිය ඉල්ලා මාගේ අංක MA/APM/24/SWRMP/Staff  හා 2019.07.04 දිනැති ලිපිය අධ්‍යක්ෂ ජනරාල් - කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.

(ඈ)මෙම අත්තිකාරම් මේ වන විට නිරවුල් කර ඇත.  ඉදිරියේදි දෙනු ලබන අත්තිකාරම් දින 07 ක් ඇතුලත පියවන ලෙස දැඩි අවධානයෙන් යුක්තව  අභ්‍යන්තර චක්‍රල්ඛයක් මගින් දනුම් දී ඇත.

(ඉ) සහ (ඊ)

පිළිගනිමි.  රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශන  සංග්‍රහයේ විධිවිධාන පරිදි  කටයුතු   කිරිමට අදාල නිලධාරින්ට උපදෙස් ලබා දී ඇත.

**<u>අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස,කාර්යක්ෂම ලෙස සහ ඵලදායි ලෙස කාලසිමාවන් තුල අදාල නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව</u>**

(අ) 2017.12.29 දින ගෙන්වන ලද එන්ජිම ,යන්ත්‍රයට සවි කිරිමෙන් අනතුරුව මෙහෙයුම ක්‍රියාත්මක කරන ලද බවත් ,පසුව හයිඩ්‍රොලික් පද්ධතියට සවි කර එන්ජිම ක්‍රියාත්මක කර ඇත.එම අවස්ථාවන් වල කිසිදු දෝෂයකින් තොරව ක්‍රියාත්මක වු අතර ,දොඹකරයෙහි BOOM එක ක්‍රියාක්මක කිරීමට යාමේදී එහි ප්‍රධාන නල (Main Hydrolic hose) 02 ක් අවස්ථා 02 කදී පුපුරා යන ලද බවත් හයිඩ්‍රොලික් මෙහෙයුම් පද්ධතියේ සියලුම කොටස් (Actuator, Hoses,Jacks,seals etc) නැවත සේවා අළුත්වැඩියාවන් සහ අමතර කොටස් දමා නැවත සකස් කිරීම යෝග්‍යා බව එම අවස්ථාවේදී නිරීක්ෂනය වු බවත් එබැවින් ඒජන්වරුන් මගින් තත්ව වාර්තාවක් ලබා ගැනීමට කටයුතු කළ බවත් දැනුම් දී ඇත.

ඒජන්වරුන්ගේ නිර්දේශයන් මත එජන්තවරුන් මගින් ධාවනයට යොද ගන්නා ප්‍රධාන එන්ජිම සේවා කිරීම ,සියලුම හයිඩ්‍රොලික් නල අළුතින් සපයා සවි කිරීම හා හයිඩ්‍රොලික් මෙහෙයුම් පද්ධතියට අදාල සියලු කොටස් (Swing Controal Unite, Outrigger Jack, Controal Unite , Elecrtrical System,Valves, Actuator etc) සේවාවන් සිදු කිරීමට දළ ඇස්තමේන්තුවක් 2018.08.18 දින ලබා ගන්නා ලදී.

තවද දළ ඇස්තමේන්තුව අනුව 2018 වර්ෂයේදී වැඩ අනුමැතිය බලාපොරොත්තු වුවද මුදල් ප්‍රතිපාදන වෙන් කර ගැනීමට නොහැකි වු බැවින් වැඩ අනුමැතිය ලබා ගත නොහැකි විම මත 2019 වර්ෂයේදී මුදල් ප්‍රතිපාදන වෙන් කරවා ගැනීම සඳහා ඉදිරිපත් කර ඇති බව වැඩිදුරටත් දැනුම් දී ඇත.

(ආ) මෙම නිර්මාණමය කටයුත්ත, විශේෂ කලාත්මක නිර්මාණශීලි කලාකෘති ඉදිකිරීමක් බැවින් දළ ඇස්තමේන්තුවක් පිලියෙල කිරිමේ ප්‍රයෝගික ගැටළුවක් පැවති අතර ඒ සඳහා අවශ්‍යා නිර්මිතයන් හා විස්තර ඉදිරිපත් කර කුසලතා සහිත ආයතන 06 කින් මිල ගණන් කැදවිමට කටයුතු කර ඇත.

(ඇ)මෙම කාර්යය පිළිබදව අමාත්‍යාංශය විසින් නම් කරන සාමාජිකයෙකු ඇතුලත්ව සාමාජිකයන් 5 දෙනෙකුගෙන් යුත් තාක්ෂණ ඇගයීම් කමිටුවක් පත් කර එම කමිටුවේ සාමාජිකයන්ගේ නිර්දේශය මත අවම මිල ගණන ඉදිරිපත් කල “Livework Creation “ ආයතනය වෙත අදාල ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව ප්‍රදාන කර ඇත. මෙම කාර්යය සඳහා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් 2018.07.01 වන දින පැවති රැස්වීම් පත්‍රිකා අංක 2018/09.12 යටතේ අනුමත කර ඇත. එම ව්‍යාපෘතියට අදාල සම්පූර්ණ මුදල වන රු. 2,580,000 ප්‍රතිපූර්ණය කරන ලෙස සමාංක MA/HO/PM/B/47 හා 2019.04.25 දිනැති ලිපිය මගින් මොරගහකන්ද කළුගග ව්‍යාපෘතියේ ව්‍යාපෘති අධ්‍යක්ෂ දැනුවත් කර ඇත. එම ලැබිය යුතු මුල්‍යා වටිනාකම ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත ප්‍රතිපූර්ණය කරන ලෙස මගේ අංක MASL/FIN/ACC/2019 හා 2019.08.02 දිනැති ලිපිය මගින් දැනුවත් කර ලැබිය යුතු ශේෂයක් ලෙස 2018.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වු මුල්‍යා ප්‍රකාශන වලට ඇතුලත් කර ඇත.

## 3.වෙනත් නිරීක්ෂණ

(අ)මෙම 6758 දරණ වාණිජ ඉඩම හෙක්.0.0065 හා හෙක්.0.0064 බැගින් කොටස් දෙකට වෙන් කර සුදුසිංහ විජේකාන්ති නයනා හා හෙට්ටිආරච්චි සන්ධ්‍යා කාන්ති වෙහෙරගොඩ යන අයට නිත්‍යානුකූලව තේරීම් කර ලබා දි ඇති බවත් හිග බදු මුදල් ගෙවන ලෙස දන්වා තිබූ අතර බදු මුදල් නොගෙවීම හේතුවෙන් ඉදිරි නිතිමය පියවර ගැනිමට කටයුතු කරන බවත් නේවාසික ව්‍යාපාර කළමනාකාර (වලව කලාපය) විසින් දැනුම් දි ඇත.

ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය මගින් රජයේ ඉඩම් ආඥා පනත යටතේ බැහැර කර ඇති ඉඩම් මැනුම් කටයුතු මෙතෙක් සිදු නොකල අතර එවැන්නක් කට්ටිකරුගේ වියදමින් සිදු කල යුතුව ඇති බව නේවාසික ව්‍යාපාර කළමනාකර (වලව කලාපය) වැඩිදුරටත් දැනුම් දි ඇති අතර එය කට්ටිකරු පැහැරහැරීම නිසා දීර්ඝකාලීන බදු ඔප්පුව ලබා දීමට නොහැකි වී ඇති බවද දැනුම් දී ඇත.

(ආ) හා (ඇ)

ඉඩම් නියමානුකුල පරීක්ෂණයේදී රත්නායක වීරකොන් ජයවීර මහතා තේරීම්ලාභිත්වයක් ලබා දී තිබූ අතර ඔහුට මේ වන තෙක් ඉඩම භාරදීමක් හෝ ඒ සම්බන්ධ අවසර පත්‍රයක් හෝ නිකුත් කර නොමැති බවත් මෙම ඉඩම සම්බන්ධයෙන් පාර්ශව දෙකක් අතර කලක පටන් ආරවුලක් පවතින අතර ඒ හේතුව මත බදු අය කර ගැනීමට නොහැකි වී ඇති බවත් අදාල නිලධාරින් මේ වන විට ක්ෂේත්‍රය පරීක්ෂා කර ඉදිරි ක්‍රියාමාර්ග සඳහා යොමු කිරිමට කටයුතු කරගෙන යන බවත් නේවාසික ව්‍යාපාර කළමනාකාර (වලව කලාපය) විසින් දැනුම් දි ඇත. නීතිමය පියවර ගැනීමට කටයුතු කරන ලෙස නේවාසික ව්‍යාපාර කළමනාකාර (වලව කලාපය) වෙත දැනුම් දී ඇත.

(ඈ)2019.02.12 දින පැවති ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ 304 වැනි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ තීරණ අංක 2019/304/4550 දරණ තීරණ ප්‍රකාරව මෙම මුදල් ප්‍රාදේශිය සංවර්ධන බැංකුවෙන් ඉවත් කර ගෙන (Withdrow) ඵලදායි කාර්යයක් සඳහා යෙදවීමට කටයුතු කරන ලෙස දන්වා තිබුණි. ඒ අනුව මාගේ අංක MASL/ENT.Dev/71 හා 2019.03.13 දිනැති ලිපිය මගින් මෙම මුදල් කඩිනමින් අධිකාරිය වෙත ලබා දීමට කටයුතු කරන ලෙස ප්‍රාදේශිය සංවර්ධන බැංකුවේ සාමාන්‍යාධිකාරී වෙත දැනුම් දී ඇත. එයට සාර්ථක පිළිතුරු නොලැබීම මත නැවත එම තැම්පතු මුදල් අධිකාරිය වෙත කඩිනමින් ලබා දෙන ලෙස මාගේ සමාංක හා 2019.06.28 දිනැති ලිපිය මගින්ද දැනුම් දී ඇත. ඒ අනුව සහකාර සාමාන්‍යාධිකාරි /ක්ෂුද්‍ර මුල්‍ය හා විශේෂ ව්‍යපෘති විසින් 2019.08.15 දිනැති ලිපිය මගින් උක්ත මුදල් හා ඊට අදාල පොලිය ලබා දිම පිනිස එම බැංකුවේ ''වත්කම් හා වගකීම් කළමණාකරණ කමිටුව'' වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇති බව දැනුම් දී ඇත.

(ඉ)සී කාලපයේ කෘෂිකාර්මික කළමනාකරණ මධ්‍යස්ථානයේ ආදායම එකී මධ්‍යස්ථානයේ සංවර්ධන කටයුතු වෙනුවෙන් යොදා ගැනීමට කලින් තීරණය කර තිබුණි. ඒ අනුව එම අදායම් මුදල් තැන්පතු ලෙස තැබීමට කටයුතු කලද, කෙසේ නමුත් මෙම මුදල් අදායම් මුදල් ලෙස ප්‍රධාන කාර්යාලයේ ආදායම් ගිණුමට බැර කර ඇත.

(ඊ)පිළිගනිමි. අධිකාරියේ අදායම් ඉපයීම් ඉහළ නංවා ගැනිම සම්බන්ධව ප්‍රගති සමාලෝචන රැස්වීම් වලදී මෙන්ම ලිඛිතවද අදාල නිළධාරීන් වෙත ඉලක්ක ලබා දී ඒ පිළිබදව ප්‍රගතිය නිරන්තරව සමාලෝචනය කිරීමට කටයුතු කර ඇත. කෙසේ නමුත් 2019 වර්ෂයේ අධිකාරියේ අදායම රු.903,712, 048.23 දක්වා වර්ධනය වී ඇත.

(උ)මොරගහකන්ද සුලු පරිමාණ ජල විදුලි බලාගාර 03 මගින් උත්පාදිත විදුලිය වෙනුවෙන් 2018 හා 2019 වර්ෂය සඳහා ලැබිය යුතුව තිබූ සියලුම මුදල් මේ වන විට ලංකා විදුලිබල මණ්ඩලයෙන් අය වී ඇත.

(ඌ) මාදුරු ඔය දකුණු ඉවුර සංවර්ධන ව්‍යාපෘතිය (බී කලාපය)

බී කලාපයේ,මාදුරු ඔය වම් ඉවුර මල්වැන්න හා මහවැලිතැන්න ඒකකයන් අයත් ප්‍රදේශයේ සංවර්ධන සඳහා රුපියල් මිලියන 935.5 ක පිරිවැයක් යටතේ සංවර්ධන යෝජනාවක් 2013 වර්ෂයේදී ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ අනුමැතිය සඳහා ඉල්ලුම් කරනු ලැබීය. එම ව්‍යාපෘතිය සඳහා ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවේ නිර්දේශ යටතේ මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලැබූවත් එම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේදී එය මාදුරු ඔය දකුණ ඉවුර ව්‍යාපෘතියේ උප අංශයක් ලෙස ක්‍රියාත්මක කරන ලෙස උපදෙස් ලබා දෙනු ලැබීය. ඒ අනුව එම ව්‍යාපෘති මාදුරු ඔය දකුණ ඉවුර සංවර්ධන ව්‍යාපෘතිය නමින් ප්‍රතිපාදන වැය ශීර්ෂ 162-5-8-2506 යටතේ මහ භාණ්ඩාගාරය විසින් ජාතික අයවැය ලේඛණය තුලින් වෙන්කර තිබුණි.

(එ) උක්ත ව්‍යාපෘතියේ කාලය දීර්ඝ කිරිම සඳහා අමාත්‍යාංශ ලේකම්වරයා ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවට 2018.12.31 දින අදාල ඉල්ලීම් යොමු කොට ඇති අතර එම ඉල්ලීම් ජාතික ක්‍රම සම්පාදන දෙපාර්තමේන්තුවෙන් අනුමත කොට භාණ්ඩාගාරය වෙත යවා ඇති බව අධ්‍යක්ෂ (ප්‍රතිපත්ති සැලසුම්) මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය විසින් දුරකථන මාර්ගයෙන් දන්වා ඇති අතර 2019 වර්ෂය සඳහා ප්‍රතිපාදන ද අනුමත වී ඇත.

ව්‍යාපෘතියේ ප්‍රගතියට අදාල තොරතුරු මාස හා කාර්තු පදනමින් අමාත්‍යාංශයට හා අනෙකුත් ආයතන වලට ඒ ඒ ආකෘති යටතේ වාර්තා කොට ඇති අතර කාර්ය සාධන වාර්තා ඉදිරිපත් කර ඇත.

රුපියල් මිලියන 12.8 ක ප්‍රතිපාදන වැලිඔය ඒකාබද්ධ ව්‍යාපෘතිය යටතේ වෙන් කරනු ලැබුවේ කිවුල් ඔය ජලාශයේ කටයුතු වලට නොවන අතර එම ප්‍රතිපාදන වෙන් කරනු ලැබුවේ එල් කලාපයේ පිහිටා ඇති " වැලි ඇලෙහි " සංවර්ධන කටයුතු හා එම වැඩ කටයුතු සිදු කිරීමේදී අවශ්‍යා වු කාර්යාල නඩත්තු හා මෙහෙයුම් කටයුතු වෙනුවෙන් බව දන්වමි. කිවුල් ඔය ජලාශය, එල් කලාපයේ ජල ගැටළුව සඳහා යෝජිත ව්‍යාපෘතියක් වන අතර පරිසර ගැටලු නිසා ජලාශයේ කටයුතු ආරම්භ නොකල අතර එම කාලය තුල නියෝජ්‍ය අධ්‍යක්ෂ (කිවුල් ඔය) විසින් පරිසර ඇගයීම් වාර්තාව නිරවුල් කර ගැනීම සඳහා වැඩ කටයුතු සිදු කෙරුණු අතරතුර කාර්ය මණ්ඩලය යොදවා ඉහත සංවර්ධන කටයුතු සිදු කෙරිණි. කෙසේ නමුත් මේ වන විට මෙම ව්‍යාපෘතිය සඳහා පරිසර අනුමතිය ද ලැබී අදාල ව්‍යාපෘතිය සඳහා අයවැය ලේඛණය තුලින් මුදල් ප්‍රතිපාදනය ද වෙන් කර ඇත.

(ඒ)ආයෝජන ව්‍යාපෘති ලෙස සලකනු ලබන්නේ ආයෝජකයින් විසින් විශාල මුදලක් ආයෝජනය කිරීම සහ ග්‍රාමීය රැකියා උත්පාදනය සඳහා සැලකිය යුතු දායකත්වයක් ලබා දෙනු ලබන ව්‍යාපෘති වේ. මෙවැනි විශේෂ හේතු මත ලබා දෙනු ලබන ඉඩම් සඳහා මහජන විරෝධතා සඳහා ගැසට් කිරීමකින් තොරව විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය මත රජයේ ඉඩම් ආඥා පනත යටතේ ඉඩම් කොටස් ලබා දීම සිදුකරනු ලබයි. ඒ අනුව උක්ත ඉඩම් කොටස් සඳහා මහජන විරෝධතා කැඳවීමකින් තොරව ඉඩම් බදු දී ඇත.

ආයෝජන ව්‍යාපාති සඳහා බැහැර කර ඇති ඉඩම් කෙටස් 8 කින් ඉඩම් කොටස් 3 ක් සඳහා සංවර්ධනය නොකිරීම මත අවලංගු කිරීමේ පරීක්ෂණ පවත්වා ඇති අතර එහි ප්‍රගතිය පහත පරිදිය.

1.එම්.එම්. ඉන්ද්‍රානි මල්ලිකා මිය - අක්කර 05 ජයන්තියාය :- 2019.07.30 දින පැවති පරීක්ෂණයේ දී සංවර්ධනය කිරීම සඳහා මාස 6ක කාලයක් ඉල්ලා ඇති අතර පරීක්ෂණ මණ්ඩලයේ තීරණය අනුව මාස 06ක කාලයක් සංවර්ධනය කිරීමට කල් ලබා දී ඇත. සියළුම බදු මුදල් 2019 දක්වා ගෙවා ඇත.

2.එච්.එම්. මුත්තු - අක්කර ½ පලතුරු වගාව :- සංවර්ධනය නොකිරීම මත 2019.07.30 පැවති අවලංගු කිරීමේ පරීක්ෂණයේ තීරණය අනුව සංවර්ධනය නොකිරීම මත අවලංගු කිරීමට කටයුතු කරමින් පවතී. සම්පූර්ණ බදු මුදල් ගෙවා ඇත.

3. එස්.එච්. රහුමාන් - පර්චස් 40 :- අවලංගු කිරීමට කටයුතු කරමින් පවතී.

මෙම ආයෝජන ඉඩම් සඳහා කලාපීය භෞතික සැලසුම් කමිටුවේ නිර්දේශ මත ඉඩම් බැහැර කිරීමට කටයුතු කර ඇත.

මූලික සැලසුම් වල ගෙවතු ඉඩම් සඳහා වෙන් කරන ලද භූමිය තුල පදිංචිය සඳහා ඉඩම් ලබා දී තිබුණද ත්‍රස්තවාදී ප්‍රහාර හේතුවෙන් ප්‍රධාන මාර්ගය අසල බෝග වගාවට වෙන්කල භූමිය ගම්මානයේ පවුල් පදිංචි කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව ජන ශූණ්‍ය වූ ගෙවතු ඉඩම් පැවති ප්‍රදේශ ආයෝජන ව්‍යාපෘති වගාවන් සඳහා යොදා ගැනීමට කටයුතු කර ඇත.

(ඕ)ශ්‍රී ලංකා හීරා පදනම විසින් ආයෝජන ව්‍යාපෘතියක් ලෙස වෘත්තීය පුහුණු ඉංජිනේරු විශ්ව විද්‍යාලයක් ස්ථාපනය කිරීම සඳහා මහවැලි බී කලාපයෙන් අක්කර 35 ක බිම් ප්‍රමාණයක් ඉල්ලුම් කරමින් 2013.05.02 වන දින ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කර ඇත.

එම ඉල්ලීම අනුව 2013.07.12 දින පැවති 245 වෙනි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී අදාල ව්‍යාපෘතිය සඳහා අක්කර 35ක බිම් ප්‍රමාණයක් මහවැලි බී කලාපයෙන් ලබා දීමට අනුමැතිය ලබා දී ඇත.

ශ්‍රී ලංකා හීරා පදනම මගින් ආරම්භ කරන ලද ඉහත ව්‍යපෘතිය විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලියාපදිංචි කිරීමේ අවශ්‍යතාවය මත ආයෝජක නාමය “බැටිකලෝ කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් “වශයෙන් වෙනස් කිරීමට ඉල්ලුම් කර ඇති අතර ඒ සඳහා 2016.10.27 දින පැවති 278 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී අනුමැතිය ලබා දී ඇත.

ඒ අනුව බැටිකලෝ කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය වෙත හෙක්ටයාර් 14.1646 ක බිම් ප්‍රමාණයක් බදු පදනම මත ලබා දීම සඳහා 2017.12.08 දින ගරු විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගෙන ඇත. එම අනුමැතිය පදනම් කර ගනිමින් බැටිකලෝ කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයේ සභාපති වෙත බදුකර හතරක් මගින් අදාල ඉඩම් ප්‍රමාණය බදු පදනම මත ලබා දීමට ක්‍රියා කර ඇති අතර එම බදු කර ජනාධිපති කාර්යාලය මගින් 2018.02.01 දින සහතික කර ඇත.

මීට අමතරව හීරා පදනම වෙත තවත් අක්කර 45ක ප්‍රමාණයක් විශ්ව විද්‍යාලයේ නේවාසික පහසුකම් හා අනෙකුත් අවශ්‍යතා සඳහා ලබා දෙන ලෙස ඉල්ලුම් කර ඇති අතර එම ඉඩම් ප්‍රමාණය ලබා දීම සම්බන්ධයෙන් විෂය භාර අමාත්‍යවරයාගේ එකඟතාවය ලබා ගැනිම සඳහා 2017.04.18 දින අධ්‍යක්ෂ ජනරාල් විසින් ලිපියක් ඉදිරිපත් කර ඇත.

2017.05.25 දින පැවති 285 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී හීරා පදනම වෙත හෙක්ටයාර් 18.2109 ක බිම් ප්‍රමාණයක් බදු පදනම මත ලබා දීම සඳහා මූලික අනුමැතිය ලබා දී ඇති අතර අදාල ඉඩම ලබා දීමට පෙර ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අනුමැතිය, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ අනුමැතිය හා විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගත යුතු බවටද සඳහන් කර ඇත.

බැටිකලෝ කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනය විසින් දළ වශයෙන් අක්කර 08 ක පමණ බිම් ප්‍රමාණයක් අනුමැතියකින් තොරව පරිහරණය කරන බව වාර්තා වි ඇති අතර එම ප්‍රමාණය නිවැරදිව හඳුනා ගැනීම හා නැවත පවරා ගැනිම සඳහා අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමට 2019.08.13 දින පැවති 311 වෙනි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී අනුමැතිය ලබා දී ඇත.

(ඕ)බී කලාපය තුල ආයෝජන ව්‍යාපෘති 411 ක් සඳහා ඉඩම් කොටස් ලබා දී ඇති අතර ඒ අතුරින් ව්‍යාපෘති ආරම්භ නොකිරීම හා බදු මුදල් නොගෙවීම යන කරුණු මත ව්‍යපෘති 96ක් අවලංගු කිරීමට කටයුතු ආරම්භ කර ඇත.

ඒ අනුව ව්‍යපෘති 41ක් අවලංගු කිරීමට ක්‍රියා කර ඇත. එමෙන්ම ව්‍යාපෘති 77ක් සඳහා හිඟ බදු අයකිරීම වෙනුවෙන් එන්තර වාසි යවා ඇති අතර ඒ අතුරින් ව්‍යපෘති යෝජකයන් 7 දෙනෙකුට එරෙහිව නඩු පැවරීමට ක්‍රියා කර ඇත.

බී කලාපය තුල ඉඩම් ලබා දී ඇති ආයෝජන ව්‍යපෘති වලින් 2018.12.31 දින වන විට රු. 31,114,866.59 ක මුදලක් හිඟ බදු ලෙස අයවීමට ඇත. එම හිඟ බදු මුදලින් රු. 20,557,691.80 ක මුදලක් 2019.08.31 දින වන විට අය කර ගැනීමට ක්‍රියා කර ඇත. ඒ අනුව තව දුරටත් අයවිය යුතු හිඟ බදු මුදල රු. 10,557,174.79 ක් වේ.

එම හිඟ බදු මුදල අයකර ගැනීම සඳහා ඉහත සඳහන් පරිදි එන්තර වාසි යැවීමටත් නඩු පැවරීමටත් ක්‍රියා කර ඇත.

(ක)2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා හිඟ කුලී මුදල් ගෙවීම සම්බන්ධව සාකච්ඡා කර ගැනීම සඳහා ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව අතර 2019.07.04 දින සාකච්ඡාවක්

පැවැත්විණ. එහිදී වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් පවසා සිටියේ තක්සේරුගත කුලී මුදල ගෙවීමට වාරිමාර්ග දෙපාර්තමේන්තුවට මේ වන විට අරමුදල් හා ප්‍රතිපාදන නොමැත, තවද වාරිමාර්ග දෙපාර්තමේන්තුවට අරමුදල් ලැබෙන්නේ ද මහ භාණ්ඩාගාරයෙන් බවත් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට මෙම කුලී මුදල් ගෙවූ පසු එම මුදල් නැවත ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් මහ භාණ්ඩාගාරයට ගෙවන බැවින් තක්සේරුගත කුලී (රු.31,50,000.00 න්) මුදලෙන් 50% ක් (එනම් රු.15,75,000.00 ක්) ගෙවීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙසත් ඉල්ලා සිටින ලදි. ඒ වෙනුවෙන් ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ කලාපවල අලුත්වැඩියා කෙරෙන වාරි පද්ධති සඳහා වාරි ජල ගේට්ටු අනුග්‍රාහක (සහනදායි) මිලකට නිෂ්පාදනය කර දීමටත් මහවැලි “ඊ” කලාපයේ හසලක ඉදිකිරීමට බලාපොරොත්තු වන තෙමහල් කාර්යාලීය ගොඩනැගිල්ල යකඩවලින් අනුග්‍රාහක (සහනදායි) මිලකට ඉදි කර දීමටත් එකඟ විය.

ඉහත කරුණු සඳහා අනුමැතිය ලබා ගැනීමට අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් පිළියෙල කර 2019.08.13 දින පැවති 311 වන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම වෙත ඉදිරිපත් කරන ලදි. එහිදී තක්සේරුගත කුලී මුදලෙන් 50% ක් ගෙවීමට අනුමැතිය ඉල්ලා ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙත ලිඛිත ඉල්ලීමක් කරන මෙන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් වෙත දන්වා ඇති අතර එම ඉල්ලීම ලද පසු ඒ සඳහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගන්නා ලෙස ශ්‍රී ලංකා මහවැලි අධිකාරියට උපදෙස් දී ඇත. තවද වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල් විසින් අදාල කුලී මුදල් ගෙවීමට අරමුදල් හා ප්‍රතිපාදන 2019 වර්ෂය සඳහා වෙන් කර නොමැති බැවින් 2020 වර්ෂයේදී ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කරවා ගෙන ගෙවීමට කටයුතු කරන බව දන්වා ඇත.

(ග)අධිකාරිය විසින් ජාවත්ත පරිශ්‍රයේ ගොඩනැගිලි වෙනුවෙන් විදුලි හා ජල බිල්පත් ලෙස ගෙවා නොතිබුණු රු.10,616,946 ක මුදලින් රු.1,815,490.55 ක මුදලක් අධිකාරිය විසින් ප්‍රතිපූර්ණය කරගෙන ඇති අතර .ඉතිරිය වූ රු.8,801,455.45 ක මුදල ප්‍රතිපූර්ණය කර ගැනිමට අදාල ආයතන වෙත ලිඛිතව දැනුම් දි ඇත.

(ඩ)**ප්‍රධාන කාර්යාලයේ ගොඩනැගිලි 11**

| අනු අංකය | | කුලියට දුන් පාර්ශවය | දැනට ගෙන ඇති පියවර |
|---|---|---|---|
| | ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ | | |
| 1 | **8** වන මහල | | මෙම සියලු ගොඩනැගිලිවල බදු කුලී වටිනාකම තක්සේරු කර ගැනීම සඳහා අංක MA/MT/08-03 B හා 2017.08.09 දිනැති ලිපිය ප්‍රධාන තක්සේරුකරු |
| 2 | **10** වන මහල | මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය | |
| 3 | **11** වන මහල | | |
| 4 | **12** වන මහල | | |
| 5 | **493** | | |

| | | | |
|---|---|---|---|
| | 493 / 1 | මහවැලි ජල සුරක්ෂිතතා ආයෝජන ව්‍යාපෘතිය | වෙත යවා ඇත. මෙම ගොඩනැගිලිවලට අදාල බදු කුලී තක්සේරු වටිනාකම මෙතෙක් ලැබී නොමැති අතර එබැවින් කුලී ගිවිසුම් අත්සන් කිරීම ප්‍රමාදව පවතී. අදාල තක්සේරු වටිනාකම් ලද විගස කුලී ගිවිසුම් අත්සන් කර හිඟ කුලී ද සමඟ සියලු කුලී අය කර ගැනීමට කටයුතු කරනු ලැබේ. |
| 6 | **ජාවත්ත** | මහවැලි උපදේශන කාර්යාංශය | 2018.01.01 දින සිට හිඟ කුලී සමඟ කුලී මුදල් ගෙවන ලෙස දන්වා අංක MA/MT/08/03-B හා 2019.06.24 දිනැති ලිපිය යොමු කර ඇත. මෙතෙක් කුලී ගෙවා නොමැත. |
| 7 | **ජාවත්ත** | වාරි මාර්ග හා ජල සම්පත් කළමණාකරන අමාත්‍යාංශය | 2018.05.01 දින සිට හිඟ කුලී සමඟ කුලී මුදල් ගෙවන ලෙස දන්වා අංක MA/MT/08/03-B හා 2019.02.05 දිනැති ලිපිය යොමු කර ඇත. මෙතෙක් කුලී ගෙවා නොමැත. |
| 8 | **ජාවත්ත** | ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය (CECB) | 2018.01.01 දින සිට හිඟ කුලී සමඟ කුලී මුදල් ගෙවන ලෙස දන්වා අංක MA/MT/08/03-B හා 2019.06.24 දිනැති ලිපිය යොමු කර ඇත. මෙතෙක් කුලී ගෙවා නොමැත. |
| 9 | **ජාවත්ත** | දේශගුණික බලපෑම් අවම කිරීමේ ව්‍යාපෘතිය (CRIP ) | 2018.05.01 දින සිට හිඟ කුලී සමඟ කුලී මුදල් ගෙවන ලෙස |

| | | | |
|---|---|---|---|
| | | | දන්වා අංක MA/MT/08/03-B හා 2019.02.05 දිනැති ලිපිය යොමු කර ඇත. මෙතෙක් කුලී ගෙවා නොමැත. |
| 10 | ජාවත්ත | මොරගහකන්ද කළුගඟ සංවර්ධන ව්‍යාපෘතිය | 2018.01.01 දින සිට හිඟ කුලී සමඟ කුලී මුදල් ගෙවන ලෙස දන්වා අංක MA/MT/08/03-B හා 2019.06.24 දිනැති ලිපිය යොමු කර ඇත. මෙතෙක් කුලී ගෙවා නොමැත. |
| 11 | **දෙමටගොඩ, බේස්ලයින් පාර** (206/20) | සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය | මෙම ඉඩම සහ ගොඩනැගිල්ලේ කොටසක් වෙරල සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පැවරීමට සහ අනෙක් කොටස සමුද්‍රීය සහ පරිසර ආරක්ෂණ අධිකාරිය වෙත දීර්ඝ කාලීන බදු පදනම මත ලබාදීමට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලැබී ඇත. ඒ අනුව ඉදිරි කටයුතු සිදුකෙරෙමින් පැවතුනි.පසුව නැවත වරක් උක්ත අමාත්‍යාංශයේ දී තිරණය අවලංගු කර නැවත එම ඉඩම් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය වෙතට ලබා දීමට අමාත්‍යාංශයේ දී තිරණයක් ලැබී ඇත. |

## බී කලාපයේ ගොඩනැගිලි

බී කලාපයේ ගොඩනැගිලි 39 ක් සඳහා ගිවිසුම් අත්සන් කර නොමැති බව දන්වා තිබුණ ද ලබා දුන් ලේඛනය අනුව ගිවිසුම් අත්සන් කර නොමැති ගොඩනැගිලි සංඛ්‍යාව 19 කි. එම ගොඩනැගිලි 19 ට අදාලව 2019 වර්ෂය වන විට ගෙන ඇති පියවර පහත පරිදි වේ.

| අ.අං | ගොඩනැගිලි අංකය | ගොඩනැගිලි වර්ගය | කුලියට දුන් පාර්ශවය | 2019 වර්ෂය වන විට ගෙන ඇති ක්‍රියා මාර්ග |
|---|---|---|---|---|
| 1 | SB/PO/RQ/08/BD/Q4/242 | A02 | ඒස්.ඒච්.තුෂාර ප්‍රේමලාල් මයා | නිල නිවාසයෙන් ඉවත් කිරිමට නීතිමය කටයුතු ඉටු කර ඇත. |
| 2 | SB/PO/RQ/08/BD/Q4/246 | A06 | සභාපති, ශ්‍රී ලංකා ටෙලිකොම් අයතනය ප්‍රධාන කාර්යාලය, ලෝටස් පාර, කොළඹ 01 | ගිවිසුම් අත්සන් කර ඇත. |
| 3 | SB/SE/BM/08/BD/QS/577 | II ශ්‍රේණිය | එම්.පී.කේ.ජයසිංහ මයා | ගිවිසුම් අත්සන් කිරිමට පදිංචි අය දැනුවත් කර ඇත.අත්සන් කිරීමේ කටයුතු කරමින් පවති |
| 4 | SB/SE/BM/08/BD/QS/581 | - | බී.ක්‍රිංස්ලි සිරිරත්න මයා | |
| 5 | SB/SE/SU/08/BD/Q3/549 | III ශ්‍රේණිය | එච්.ඒ.ඩී.සුසිලාවතී මිය | |
| 6 | SB/SE/BM/08/BD/QS/577 | සාද නිවාස | පී.ආර්.බී.නවරත්න මයා | |
| 7 | SB/SE/BM/08/BD/QS/581 | සාද නිවාස | ඩබ්.එම්.වීරසේකර මයා | |
| 8 | SB/SI/BM/08/BD/SQ/136 | තාවකාලික නිවාස | කේ.බී.එස්.රුවන් කුමාර මයා | |
| 9 | SB/SI/BM/08/BD/SQ/137 | තාවකාලික නිවාස | ඒ.ඒ.සමන් කුමාර මයා | |
| 10 | SB/SI/BM/08/BD/SQ/138 | තාවකාලික නිවාස | එම්.ඒ.පියදිකා කරුණාරත්න මයා | |
| 11 | SB/SI/BM/08/BD/SQ/141 | තාවකාලික නිවාස | එස්.ලසන්ති ප්‍රියදර්ශනි මිය | |
| 12 | SB/SI/BM/08/BD/SQ/143 | තාවකාලික නිවාස | ඒ.ඒ.තරිදු ලක්ෂමන් මයා | |
| 13 | SB/WJ/08/BD/Q3/ | iv ශ්‍රේණිය | නාවික හමුදාව | |
| 14 | SB/EL/PA/08/BD/Q2/811 | II ශ්‍රේණිය | අර්.ඒම් .ජයරත්න මයා | |

| | | | | |
|---|---|---|---|---|
| 15 | SB/EL/PA/08/BD/Q2/820 | II ශ්‍රේණිය | පී.වී.මහීපාල මයා | |
| 16 | SB/EL/PA/08/BD/Q3/810 | III ශ්‍රේණිය | අර්.විජේරත්න මයා | |
| 17 | SB/EL/PA/08/BD/Q3/812 | III ශ්‍රේණිය | ඒච්.ජී.නිලන්ති ප්‍රියංගිකා මිය | |
| 18 | SB/EL/PA/08/BD/Q4/826 | IV ශ්‍රේණිය | අර්.ඒ.සෙනවිරත්න මයා | |
| 19 | SB/EL/PA/08/BD/Q4/828 | IV ශ්‍රේණිය | ඩබ්.ඒ.සුසන්ත කුමාර මයා | |

## මූලික වැඩපාලන ක්‍රියාකරවුම් හා නඩත්තු අංශය (ගොඩනැගිලි 49)

ඉහත ගොඩනැගිලිවලින් ගොඩනැගිලි 13 ක් ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය වෙත ලබා දී ඇති ගොඩනැගිලි වන අතර එම ගොඩනැගිලි ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය(CECB) වෙත පවරාදීම සඳහා කටයුතු කෙරෙමින් පවති.

ඉතිරි සියලු ගොඩනැගිලි වලින් 09 ක් සඳහා නැවත ගිවිසුම් අත්සන්කර ඇති බවත් ඉතිරි ගොඩනැගිලි සඳහා ගිවිසුම් අත්සන් කිරීමට පැමිණෙන ලෙස අදාල පාර්ශවයන් දැනුවත් කල ද මෙතෙක් නොපැමිණි බැවින් මේ වන විට ඔවුන් වෙනුවෙන් නීතිමය පියවර ගැනීමට කටයුතු කර ඇත.

වලව කලාපය (ගොඩනැගිලි 07)

අදාල පාර්ශව සමඟ ගිවිසුම් අත්සන් කිරීමට කටයුතු කෙරෙමින් පවති.
(ජ)පිළිගනිමි. නිවැරදි කිරිමට කටයුතු කරමි.

(ච)පිළිගනිමි. නිවැරදි කිරිමට කටයුතු කරමි.

(ඩ)අවුරුදු 05 ඉක්මවු වැඩ සම්පූර්ණ වු කොන්ත්‍රාත් වල රැඳවුම් මුදල් 7,747.000 ක් පවතින අතර එම මුදල් අදාල අය විසින් මෙතෙක් ඉල්ලුම් කර නැත. එහෙයින් ඊට අදාල රැඳවුම් මුදල් ආදායම් ලෙස ගිණුම් නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු කිරීමට නියමිතය.

(ත) මෙම කොන්ත්‍රාත්තුව 2018 වර්ෂයේ දී කොන්ත්‍රාත්කරු අත් හැර දමා ගොස් තිබු අතර 2019 වර්ෂයේ දි එම කොන්ත්‍රාත්කරු නැවත වැඩ ආරම්භ කිරීම නිසා 2020 වර්ෂයේ දී නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ.

(ද)2018.12.31 දිනට මහවැලි ආරක්ෂක බලකායේ සේවය කරන ලද රාජය ආයතන වෙත නිදහස් කර ඇති නිලධාරීන්ට ගෙවන ලද අතිකාල හා ගමන් වියදම් රු.31,448,940.00 ක මුදල ප්‍රතිපූර්ණ කරන ලෙස ජනාධිපති ලේකම් කාර්යාලයට හා ආරක්ෂක අමාත්‍යාංශය වෙත ලිපි මගින් දන්වා ඇත.

(න)අධිකාරියේ ප්‍රධාන කාර්යාලයේ  නිලධාරීන් 28 දෙනෙකු රේඛීය අමාත්‍යාංශය හා ව්‍යාපෘතිය වෙත නිදහස් කර ඇති නිලධාරීන්ගෙන් 2018.12.31 දිනට වැටුප් ප්‍රතිපූර්ණය වී ඇති අතර රේඛීය අමාත්‍යාංශය හා වෙනත් අමාත්‍යාංශ වෙත නිදහස් කර ඇති නිලධාරීන්ගේ  වැටුප් . අතිකාල ගමන් වියදම් ප්‍රතිපූර්ණය කරන ලෙස අංශය වෙත ලිපි මගින් දන්වා ඇත.

(ප)අදාල තොරතුරු අධ්‍යක්ෂ (සැලසුම් හා නියාමන) සතුව පවතී.

**ඉංජි. බී. ඒ. සුනිල් එස්. පෙරේරා**
**අධ්‍යක්ෂ ජනරාල්**
**ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය**

# ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ කාර්යසාධන වාර්තාව

# ආයෝජන සැලැස්ම 2018

# 2018 වසර තුළ සිදු කරන ලද සංවර්ධන ක්‍රියාකාරකම්

## 1.1 මූල්‍ය ප්‍රගතිය

2018 වසර සඳහා වර්ෂය සඳහා මුලු ඇස්තමේන්තු ගත ආයෝජනය රු.මි. **2,733.50**. මූල්‍ය ප්‍රගතිය පහතින් දක්වා ඇත.

රු.මිලි

| විස්තරය | අය වැය ප්‍රතිපාදන (රු.මි.) 2018 | වියදම (රු.මි.) (2018.12.31) |
|---|---|---|
| **මහවැලි ව්‍යාපෘති** | **1,158.00** | **1,109.18** |
| මහවැලි ඒකාබද්ධ ව්‍යාපෘතිය (ඒ.අ ) | 290.00 | 290.00 |
| බී කලාපයේ මාදුරුඔය දකුණු ඉවුරු සංවර්ධන ව්‍යාපෘතිය (ඒ.අ ) | 60.00 | 60.00 |
| රිදීමාලියද්ද ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය (ඒ.අ ) | 76.00 | 64.00 |
| රඹකැන් ඔය ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය (ඒ.අ ) | 108.00 | 94.00 |
| වැලිඔය ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය - එල් කලාපය (ඒ.අ ) | 260.00 | 260.00 |
| හදිසි යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය ඇතුළු විශාල හා මධ්‍යම වාරිමාර්ග ව්‍යාපෘති ප්‍රතිසංස්කරණය කිරීම (ඒ.අ ) | 150.00 | 142.50 |
| කෘෂිකර්ම හා පශු සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය (ඒ.අ ) | 214.00 | 198.67 |
| **පරිපාලන හා නඩත්තු (ඒ.අ )** | **1,575.50** | **1,498.18** |
| **එකතුව** | **2,733.50** | **2,607.34** |

## 1.2 මහවැලි ව්‍යාපෘති

### 1.2.1 මහවැලි ඒකාබද්ධ ව්‍යාපෘතිය

මූල්‍ය ප්‍රතිපාදන: දේශීය අරමුදල්

ඇස්තමේන්තු පිරිවැය: රු.මි. 4,910 (සංශෝධිත අයවැය)

ව්‍යාපෘති කාලසීමාව: 2007-2018

මහවැලි ඒකාබද්ධ ව්‍යාපෘතිය වාරි ජල සැපයුම සුරක්ෂිත කරමින් කෘෂි ආර්ථිකය නැංවීම හරහා මාදුරුඔය වම් ඉවුර ප්‍රදේශයේ වෙසෙන ග්‍රාමීය ප්‍රජාවගේ ආර්ථිකය සංවර්ධනය කිරීම අරමුණු කර ආරම්භ කරන ලදි .ව්‍යාපෘති ක්‍රියාකාරකම් යටතට 1982- 1986 කාලයේ ඉදිකරන ලද වාරිමාර්ග පද්ධති ප්‍රතිසංස්කරණය කිරීම ඇතුළත් වේ. (අ) මාදුරු ඔය දකුණු ඉවුර වාරිමාර්ග ප්‍රතිසංස්කරණය යටතේ යටතේ කි.මි. 52 ක් වන ප්‍රධාන ඇල, කි.මි. 65ක් වන ශාඛා ඇලවල්, කි.මි. 459 ක් වන බෙදාහැරීමේ ඇලවල්, කි.මි. 138 ක් වන කෙත් ඇලවල්, කි.මි. 54 ක් වන පරිවහන ඇලවල්, කි.මි. 80 ක් ග්‍රාමීය මාර්ග මෙහෙයුම් හා නඩත්තු කටයුතු, හා කුඩා වැව් ප්‍රතිසංස්කරණ කටයුතු ඇතුළුව ජල කළමනාකරණය සඳහා මාදුරුඔය වම් ඉවුරේ 1986 – 1981 කාලය තුල ඉදිකරන ලද වාරිමාර්ග ජාලය ප්‍රතිසංස්කරණය

කිරීම. (ආ) ග්‍රාමීය ස්වයං ආධාරක ව්‍යාපෘති යටතේ ගොඩනගන ලද තෝරාගත් ජල සැපයුම් සේවා විධිමත් කර ප්‍රවර්ධනය කිරීම (ඇ) කෘෂිකාර්මික සංවර්ධනය උදෙසා සහය ලබා දීම මෙන්ම ගොවි සංවිධාන ශක්තිමත් කිරීම හා (ඈ) යෝග්‍ය පාරිසරික සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ඇතුළත් වේ.

2018 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිපාදන රු. මි. 290 (සංශෝධිත) ක් වේ. වසර අවසන් වන විට සියලුම මුදල් ඵලදායී ලෙස යොදවා ඇත.

| අංකය. | විස්තරය | භෞතික ප්‍රගතිය 2018.12.31 |
|---|---|---|
| 01 | බෙදාහැරීමේ ඇලවල් ඉදි කිරීම/ප්‍රතිසංස්කරණය | 13.2 කි.මී |
| 02 | කෙත් ඇල ඉදි කිරීම/ප්‍රතිසංස්කරණය | 70.4 කි.මී. |
| 03 | දියමංකඩ ප්‍රතිසංස්කරණය කිරීම | 03 |
| 06 | ගොඩනැගිලි අළුත්වැඩියාව | 2.5 |
| 09 | සහභාගිත්ව කෙත් ඇල ප්‍රතිසංස්කරණ | 2.1 කි.මී. |



## 1.2.2 බී කලාපයේ මාදුරුඔය දකුණු ඉවුරු සංවර්ධන ව්‍යාපෘතිය (මල්වැන්න සහ මහවැලිතැන්න)

මූල්‍ය ප්‍රතිපාදන: දේශීය අරමුදල්

ඇස්තමේන්තු පිරිවැය: රු.මි.935.49

ව්‍යාපෘති කාලසීමාව: 2014-2018

පොලොන්නරුව හා මඩකලපුව පරිපාලන දිස්ත්‍රික්කයන්හි මහවැලි බී කලාපය ආවරණය කරන සිංහපුර ඉහළ කොටසේ මහවැලිතැන්න සහ මල්වැන්න මහවැලි කලාප පිහිටා ඇති අතර ව්‍යාපෘතිය යටතේ සංවර්ධනය කරනු ලැබේ. මෙම ප්‍රදේශයන්හි ඉකුත් දශක කිහිපයේ පැවති අභ්‍යන්තර අර්බුදකාරී වාතාවරණය හේතුවෙන් නැවත පදිංචිකරුවන් බොහෝමයක් අභ්‍යන්තරික වශයෙන් අවතැන් විය. එහි ප්‍රතිපලයක් ලෙස දළ වශයෙන් නැවත පදිංචි කරවූ පවුල් 1200 ක් පමණ නැවත ඔවුන්ගේ මුල් ගම් බිම් වෙත ගියහ.

අර්බුදකාරී වාතාවරණය සමනය වීමත් සමගම 2014 වර්ෂයේදී මෙම විශේෂ ව්‍යාපෘතිය යටතේ නැවත පදිංචි කිරීම සහ පුනරුත්ථාපන කටයුතු ආරම්භ කරන ලදී. මෙහිදී සිංහපුර කොට්ඨාසයේ මල්වැන්න හා මහවැලිතැන්න ඒකකවල ගෙවතු ඉඩම් 859 ක් හා වාරි ඉඩම් 859 සංවර්ධනය කිරීමට යෝජනා විය. ව්‍යාපෘතියේ ප්‍රධාන කාර්යයන් වශයෙන් (අ) අවතැන් වූ පවුල් 859 ක් සිංහපුර කොට්ඨාසයේ නැවත පදිංචි කිරීම හා පදිංචිය නැවත ස්ථාපිත කිරීම (ආ) දැනට පවත්නා වාරි පදනම් වූ හෙක්ටයාර 521ක් කෘෂිකර්මාන්තය සඳහා සංවර්ධනය කිරීම හා හෙක්ටයාර 174ක් වූ ගෙවතු ඉඩම් සංවර්ධනය කිරීම සහ (ඇ) මහවැලිතැන්න වැව හා අනෙකුත් වාරි පද්ධතිය ඉදි කිරීම දක්වා ඇත. 2018 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිපාදන රු.මි. 60 (සංශෝධිත) ක් වේ. වසර අවසන් වන විට සියලුම මුදල් ඵලදායී ලෙස යොදවා ඇත.

| අංකය. | විස්තරය | භෞතික ප්‍රගතිය 2018.12.31 |
|---|---|---|
| 01 | බෙදාහැරීමේ ඇලවල් ඉදි කිරීම | 6.8 කි.මී. |
| 02 | කෙත් ඇල ඉදි කිරීම | 3 කි.මී. |
| 03 | වෙළඳපොළ හා ගම්මාන මාර්ග ඉදි කිරීම | 4 කි.මී. |
| 04 | ප්‍රතිරෝපණය-පැල | 2000 පැල |





## 1.2.3 රිදීමාලියද්ද ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය

මූල්‍ය ප්‍රතිපාදන: දේශීය අරමුදල්

ඇස්තමේන්තු පිරිවැය: රු.මි. 1,100

ව්‍යාපෘති කාලසීමාව: 2012-2018

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද ගෘහස්ථ ආදායම් හා වියදම් සමීක්ෂණයට අනුව බදුල්ල පරිපාලන දිස්ත්‍රික්කයේ රිදීමාලියද්ද ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය ඉතා දුර බැහැර පිහිටි මෙන්ම වඩාත් දරිද්‍රතාවයෙන් යුත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් වශයෙන් හඳුනාගෙන ඇත. එබැවින් ඉහත ප්‍රදේශය සංවර්ධනය කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් පස් අවුරුදු ආයෝජන සැලැස්මක් සකස් කරන ලදී. මෙම ප්‍රදේශයේ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම හා මෙම ප්‍රදේශයේ වෙසෙන පවුල්වලට කෘෂිකර්මය මත පදනම් වූ ඵලදායී මෙන්ම තිරසාර ආර්ථික ප්‍රවේශයන් විවර කරදීම මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණු වේ. මේ යටතේ (අ) වාණිජ බෝග නිෂ්පාදනය වැඩිදියුණු කිරීම (ආ) පශු සම්පත් සංවර්ධනය (ඇ) ව්‍යවසායකත්ව සංවර්ධනය කෙරෙහි මූලික වශයෙන් අවධානය යොමු කෙරේ.

2018 වර්ෂය සඳහා වූ මූලා‍ය ප්‍රතිපාදන රු. මි. 76 (සංශෝධිත) ක් වේ. 2018 දෙසැම්බර් මස අවසන් වන විට එයින් රු. මි. 64 ක් ඵලදායී ලෙස යොදවා ඇත.

| අංකය. | විස්තරය | භෞතික ප්‍රගතිය<br>2017 ජුලි සිට ජුනි – 2018 |
|---|---|---|
| 01 | වාරි මාර්ග පද්ධති ප්‍රතිසංස්කරණය කිරීම | 2 අමුණු |
| | | 3.3 කි.මි. වාරි ඇල මාර්ග |
| 02 | මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම | 5.2 කි.මි. ගල්තාර මාර්ග |
| | | 150 මි. කොන්ක්‍රීට් මාර්ග |
| 03 | ගොඩනැගිලි ඉදිකිරිම | 09 |
| 04 | පුහුණු වැඩසටහන් | 74 වැඩසටහන් |
| 05 | කෘෂිකර්ම හා සත්වපාලන වැඩසටහන | 1,439 පවුල් |

**1.2.4 රඹකැන් ඔය ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය**

මූලා‍ය ප්‍රතිපාදන: දේශීය අරමුදල්

ඇස්තමේන්තු පිරිවැය: රු.මි. 1,086

ව්‍යාපෘති කාලසීමාව: 2012-2019

රඹකැන් ඔය ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය මගින් අම්පාර දිස්ත්‍රික්කයේ මහ ඔය සහ පදියතලාව ප්‍රදේශීය ලේකම් කොට්ඨාශයන්හි ජලාශ සහ වාරිමාර්ග සංවර්ධනය පිළිබඳ මූලික අවධානය යොමු කෙරේ.මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණු වනුයේ (අ) කුඩා හා මධ්‍යම වැව් හා අමුණු පුනරුත්තාපනය කිරීම (ආ) ග්‍රාමීය මාර්ග කිලෝමීටර් 70 ක් පුනරුත්තාපනය කිරීම (ඇ) කෘෂිකාර්මික නිෂ්පාදනය 50 % වැඩි කිරීම (ඇ) පානීය ජල ළිං ඉදි කිරීම තුළින් ජල සැපයුම (ඉ) ළිං සහ සනීපාරක්ෂක සෞඛ්‍ය ආරක්ෂණ වැඩපිළිවෙල (වැසිකිළි ඉදිකිරීම ).

2018 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිපාදන රු. මි. 108 (සංශෝධිත) ක් වේ. 2018 දෙසැම්බර් මස අවසන් වන විට එයින් රු. මි. 94 ක් ඵලදායී ලෙස යොදවා ඇත.

| අංකය. | විස්තරය | භෞතික ප්‍රගතිය 2018.12.31 |
|---|---|---|
| 01 | වාරි මාර්ග පද්ධති ප්‍රතිසංස්කරණය කිරීම | 2 අමුණු |
| | | 1.925 කි.මී. වාරි ඇල මාර්ග |
| 02 | මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම | 0.55 කි.මී. ඇස්පර මාර්ග |
| | | 4 කි.මී. ගල්තාර මාර්ග |
| 03 | ගොඩනැගිලි ඉදිකිරීම | 06 |
| 04 | ඉඩම් සහ ඉඩම් සංවර්ධනය ( වන්දි ගෙවීම්) | 22 කට්ටි |
| 05 | කෘෂිකර්ම හා සත්වපාලන වැඩසටහන | 1,557 පවුල් |








## 1.2.5 වැලිඔය ඒකාබද්ධ සංවර්ධන ව්‍යාපෘතිය - එල් කලාපය

මූල්‍ය ප්‍රතිපාදන: දේශීය අරමුදල්

ඇස්තමේන්තු පිරිවැය: රු.මි. 3,957

ව්‍යාපෘති කාලසීමාව: 2012-2018

අනුරාධපුරය , වව්නියාව, මුලතිව් හා ත්‍රිකුණාමලය යන පරිපාලන දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි මහවැලි කලාපයේ සංවර්ධනය සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ. අවතැන් පවුල් 6,788 ක් සඳහා ගෙවතු වගාව, වාරි ඉඩම් හා අවශ්‍ය භෞතික හා සමාජ යටිතල පහසුකම් සැපයීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ. මේ යටතේ (අ ) ගම්මාන 11 ක් තුල ගොවි පවුල් 6,788 ක් නැවත පදිංචි කරවීම (ආ ) හෙ.4,187 කෘෂිකාර්ම ඉඩම් සංවර්ධනය කිරීම (ඇ ) වෙළඳ පොල හා ගම්මාන මාර්ග ඉදිකිරීම හා වැඩි දියුණු කිරීම ( ඈ ) සමාජ යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම සිදු කෙරේ.

2018 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිපාදන රු. මි. 260 (සංශෝධිත) ක් වේ. 2018 වසර අවසන් වන විට සියලුම මුදල් ඵලදායී ලෙස යොදවා ඇත.

| අංකය. | විස්තරය | භෞතික ප්‍රගතිය 2018.12.31 |
|---|---|---|
| 01 | ඉඩම් ලකුණු කිරීම හා මැනීම | 2000 කට්ටි |
| 01 | වාරි ඇල ප්‍රතිසංස්කරණය කිරීම | 5 කි.මී. |
| 02 | ගොඩනැගිලි ඉදි කිරීම | 23 |
| 03 | මහා මාර්ග ඉදි කිරීම | 55 කි.මී. |
| 04 | කෘෂි ළිං ඉදි කිරීම | 19 |
| 05 | පානීය ජල සැපයුම් ව්‍යාපෘතිය | 80 ටැංකි |
| 06 | පුහුණු වැඩසටහන් | 157 වැඩසටහන් |
| 07 | කෘෂිකර්ම හා සත්වපාලන වැඩසටහන | 3000 පවුල් |








## 1.2.6 හදිසි යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය ඇතුළු විශාල හා මධ්‍යම වාරිමාර්ග ව්‍යාපෘති ප්‍රතිසංස්කරණය කිරීම

මූල්‍ය ප්‍රතිපාදන: දේශීය අරමුදල්

ඇස්තමේන්තු පිරිවැය: රු.මි.825

ව්‍යාපෘති කාලසීමාව: 2015-2018

(අ) මූලික වැඩ හා ජලාශ අළුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම (ආ) වාරි යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය කිරීම හා (ඇ) ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතේ වන හුරුළුවැව, උඩවලව, මහවැලි කලාප බී, සී, එච්, එල් හා මූලික වැඩ පාලන ක්‍රියා කරවුම් නඩත්තු හා මෙහෙයුම් අංශය යටතේ වන කාර්යය භාර ඉංජිනේරු අංශවල වාරි බෙදුම් ඇලවල් අතර මාර්ග ඉදි කිරීම් හා ප්‍රතිසංස්කරණය මෙම ව්‍යාපෘතිය මගින් අරමුණු කෙරේ. 2018 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිපාදන රු. මි. 150 (සංශෝධිත) ක් වේ.

2018 දෙසැම්බර් මස අවසන් වන විට එයින් රු. මි. 142.50 ක් එළදායී ලෙස යොදවා ඇත.

| අංකය. | විස්තරය | භෞතික ප්‍රගතිය 2017 ජුලි සිට ජුනි – 2018 |
|---|---|---|
| 01 | ප්‍රධාන ජලාශවලට හදිසි යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය | ප්‍රධාන ජලාශ 8 න් 95% |
| 01 | 2018 වර්ෂය සඳහා පහළ යටිතල වාරි පහසුකම් ප්‍රතිසංස්කරණය | 100 % |

### 1.2.7 කෘෂිකර්ම හා පශු සම්පත් සංවර්ධන ව්‍යාපෘතිය

මූල්‍ය ප්‍රතිපාදන: දේශීය අරමුදල්

ඇස්තමේන්තු පිරිවැය: රු.මි.220

ව්‍යාපෘති කාලසීමාව: වාර්ෂික (01.01.2018 - 31.12.2018 )

ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහනට සමගාමීව රටේ ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා දේශීය කෘෂි ආනයනය අඩු කිරීමට හේතු වන දේශීය ආහාර බෝග වගාව සහ පශු සම්පත් නිෂ්පාදනය පූර්ණ වශයෙන් වැඩිදියුණු කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය ආරම්භ කර ඇත.

2018 වර්ෂය සඳහා කෘෂිකාර්මික ප්‍රමුඛතා වනුයේ බෝග විවිධාංගීකරණය, මහවැලි එල් කලාපය සඳහා සුදුසු මිරිස් වර්ග හඳුනාගැනීම, ගුණාත්මක බීජ නිෂ්පාදනය සඳහා වැඩසටහන්, පළතුරු ගස් සඳහා පුනරුත්ථාපන වැඩසටහන්, කාබනික පොහොර භාවිතය වැඩි කිරීම, නියඟ සහිත කාලගුණයට ඔරොත්තු දීමට කෘෂිකාර්මික ළිං ඉදිකිරීම හා ප්‍රතිසංස්කරණය කිරීම, දේශීය ආර්ථික සංවර්ධනය සඳහා වන වැඩසටහන සහ ජල කාර්යක්ෂමතාව ඉහළ නැංවීම වේ. වැඩි දියුණු කරන ලද පශු සංවර්ධන වැඩපිළිවෙල, දියර කිරි නිෂ්පාදනය, කුකුළු නිෂ්පාදන, මිරිදිය හා විසිතුරු මත්ස්‍ය නිෂ්පාදන කටයුතු පිළිබඳ දැනුවත් කිරීමේ වැඩමුළු හා වැඩමුළු පැවැත්වීම සිදු කරන ලදී.

2018 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රතිපාදන රු. මි. 220 ක් වන අතර එයින් රු.මි. 75.5 ක් මෙම කාලය වන විට උපයෝජනය කර ඇත.

**කෘෂිකාර්මික භෝග වගාව**

2017/2018 මහ කන්නයේදී මහවැලි ප්‍රදේශවල වී වගාකර ඇති ඉඩම් ප්‍රමාණය හෙක්. 84,460 ක් වන අතර මහවැලි කලාපවල වී නිෂ්පාදනය දළ වශයෙන් මෙ. ටො. 469,176 ක් විය. 2018 යල කන්නයේ වී වගාකර ඇති භූමි ප්‍රමාණය හෙක්. 80,960 වන අතර වාර්තා වන වී නිෂ්පාදනය මෙ. ටො. 436,875 වේ. 2017/2018 මහ සහ 2018 යල කන්නයේ වාර්තා වී ඇති මුලු වී නිෂ්පාදනය මෙ.ටො. 906,052 වේ. මෙම වර්ෂයේදි මහවැලි කලාපවල සාමාන්‍ය වී අස්වැන්න හෙක්ටයාරයකට මෙ.ටො. 5.5 ක් වී ඇත.

අනෙකුත් බෝග වගා කිරීම (අනෙකුත් ක්ෂේත්‍ර භෝග, පළතුරු,එළවළු සහ නිත්‍ය භෝග) හෙක්. 36,164 ක් වූ අතර, එය සෝයා බෝංචි හෙක්. 1,510 ක්ද, බඩ ඉරිඟු හෙක්. 3,805 ක්ද, ලොකු ළූණු

හෙක්. 535 ක්ද මිරිස් හෙක්. 683 ක්ද, කළු කව්පි හෙක්. 137 ක්ද, කව්පි හෙක්. 443 ක් සහ රට කජු හෙක්. 704 වශයෙන් සමන්විත විය. තවද, හෙක්. 13,557 ක් පළතුරු ද හෙක්. 6,312 නිත්‍ය භෝග ද වගා කොට ඇත. කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ දත්තවලට අනුව මෙම කාලය තුළදී වී අස්වැන්න 24% , සෝයා බෝංචි 85 % , රට කජු 6 % හා මිරිස් 9 % ආදී වශයෙන් දේශීය කෘෂි නිෂ්පාදන හා සංවර්ධනය කාර්යයන් හිදී ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය ඉතා ඉහළ දායකත්වයක් දරයි.

**කිරිගව සංවර්ධන වැඩසටහන**

ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ පශු සම්පත් සංවර්ධන අංශය හරහා මහවැලි ප්‍රදේශ වල අතිරේක ආදායම් මාර්ග හඳුන්වාදීම හා මහවැලි ජනපදිකයින්ගේ පෝෂණ තත්වය ඉහළ නැංවීම අරමුණු කරගෙන කිරිගව පාලනය ප්‍රවර්ධනය කිරීමට ක්‍රියාකරනු ලැබේ . මහවැලි කලාපවල කිරි නිෂ්පාදනයේ සංවර්ධන කටයුතු සිදු කිරීම සහ මෙහෙයවීම ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ පශු සම්පත් සංවර්ධන අංශයේ වගකීම වේ .

2018 වර්ෂයේ ජූනි සිට දෙසැම්බර් කාලය තුළදී මහවැලි ප්‍රදේශවල 109, 060 ක මුළු ගව ගහනයක් වාර්තා වූ අතර එම කාලය තුළ දල වශයෙන් කිරි ලීටර් මිලියන 27.1 ක් පමණ නිෂ්පාදනය කර ඇත.

මෙම කාල පරිච්ඡේදය තුළදී ගව ගාල් 98 ක් ඉදි කරන ලද තවද සත්ව අභිජනන හැකියාව වැඩිදියුණු කිරීම යටතේ අභිජනනන මධ්‍යස්ථාන 02 ස්ථාපනය කරන ලදී. තව දුරටත් ආදර්ශ ගොවිපළ සඳහා ජංගම කිරි දෙවීමේ යන්ත්‍ර 22 ක් බෙදා දී අවසන් අතර සත්ව සායන හා එන්නත් වැඩසටහන් 42 ක් පවත්වා ඇත.

**මිරිදිය මත්ස්‍ය කර්මාන්තය හා විසිතුරු මත්ස්‍ය රෝපණය**

මහවැලි ජනපදිකයින්ගේ පෝෂණය හා ආර්ථික තත්වය නැංවීමෙහි ලා මහවැලි ජලාශවල මිරිදිය මත්ස්‍ය කර්මාන්තය සංවර්ධනය කිරීම ප්‍රධාන කාර්යයක් වේ. 2018 වර්ෂ අවසානයේදී මත්ස්‍ය නිෂ්පාදනය මෙ. ටො. 13.7 ක් ලෙස වාර්තා විය. මත්ස්‍ය නිෂ්පාදනය වැඩිකිරීම සඳහා අභිජනන මධ්‍යස්ථාන 20 ක් ඉදිකර කර ඇත. විසිතුරු මත්ස්‍ය නිෂ්පාදනය වැඩි දියුණු කිරීම අදාළ කාල පරිච්ඡේදය තුළ සඳහා මඩ පොකුණු 41 ක් හා සිමෙන්ති ටැංකි 26 ක් ඉදි කර ඇත. තව දුරටත් ධීවර ප්‍රජාව ශක්තිමත් කිරීම සඳහා පුහුණු වැඩසටහන් 36 ක් පවත්වා ඇත.

## 1.3 නඩත්තු සහ සංවර්ධනය

ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහනට සමගාමීව කෘෂි කර්මාන්තය සංවර්ධන කිරීමේ අරමුණ පෙරදැරිව ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය එහි කලාප 10 තුළ හෙක්. 106,971 ක් වන වාරි ඉඩම් සඳහා ජල සැපයුම තහවුරු කරනු වස් විශාල, මධ්‍යම හා කුඩා ප්‍රමාණයේ ජලාශ 484 කින් සමන්විත කි.මී. 10,202 ක් වූ වාරි මාර්ග ජාලයේ මෙහෙයුම් හා නඩත්තු කටයුතු සිදු කිරීම සම්බන්ධයෙන් වගකීම දරන ආයතනය වේ. මේ අතර පවුල් 330,000 කට වැඩි ප්‍රතිලාභ සපයනු වස් මහවැලි මාර්ග පද්ධතිය හා අනෙකුත් යටිතල පහසුකම් නඩත්තු කිරීම හා ප්‍රතිසංස්කරණය කිරීම ද ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතට ගැනෙන කාර්යයන් වේ.

තවද, ප්‍රදේශය තුළ දැනට වෙසෙන හා ඉදිරි පරම්පරාවේ උන්නතිය උදෙසා සඵලදායී අයුරින් ඉඩම් පරිපාලනය, ව්‍යවසායකත්ව සංවර්ධනය, පරිසර සංරක්ෂණය සහ ආයතනික සංවර්ධන කටයුතු මෙන්ම මහවැලි ජනපද ප්‍රදේශවල ක්‍රීඩා කටයුතු සංවර්ධනය කිරීම ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ප්‍රධාන කාර්යයන් වේ. මේ සඳහා 2018 වසරට අය වැය ප්‍රතිපාදන රු.මි. 1,575 .00 ක් වන අතර මෙම කාලපරිච්ඡේදය තුළදී එයින් රු. මි. 1,498.18 ඵලදායි ලෙස යොදවා ඇත.

### 1.3.1 වාරිමාර්ග පද්ධතිය නඩත්තුව

දෙවෙනි වර කැලෑ එළි කිරීම, වාරිමාර්ග ඇල පද්ධතියෙහි රොන්මඩ ඉවත් කිරීම, වාරි මාර්ග පද්ධතිය හා නිර්මිත අළුත්වැඩියාව සහ සංවර්ධනය, මාර්ග බොරළු ඇතිරීම ආදිය මහවැලි වාරිමාර්ග පද්ධතිය නඩත්තු කටයුතු යටතට ගැනේ. 2018 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිපාදන රු. මි. 482.65 ක් ක් වාරිමාර්ග පද්ධතිය නඩත්තු කටයුතු වෙනුවෙන් වෙන්කර ඇති අතර ඉහත කාර්යයන් සාක්ෂාත් කර ගනු වස් 2018 දෙසැම්බර් දක්වා ඉන් රු.මි. 430.31 ක් ඵලදායි අයුරින් වැය කර ඇත.

මහවැලි කලාප තුළ ගොවි සංවිධාන 1,014 ක් ක්‍රියාත්මකව පවතින අතර බෙදා හැරීමේ ඇළ පද්ධති නඩත්තු හා මෙහෙයුම් කටයුතු සිදු කර ඇත. තවද, ආයතනික සංවර්ධන අංශයේ උපදෙස් මත 2018 වර්ෂයේදී ගොවි සංවිධාන 16 ක් වාණිජ මට්ටමට ඉහළ නංවන ලදී.

### 1.3.2 ඉඩම් ඔප්පු ප්‍රදානය

ඉඩම් ඔප්පු ලබා දීමේ වැඩසටහනේ ප්‍රගතිය පහතින් දක්වා ඇත.

| කලාපය | ඉලක්කය (2018 ) | 2018.12.31 ප්‍රගතිය ප්‍රදාන පත්‍ර/බලපත්‍ර/දීර්ඝ කාලීන බදු |
|---|---|---|
| බී | 9,174 | 8,270 |
| සී | 8,440 | 8,440 |
| ඩී | 1,198 | 1,990 |
| එච් | 5,230 | 4,240 |
| එල් | 2,750 | 2,750 |
| මොරගහකන්ද | 1,857 | 1,857 |
| වික්ටෝරියා | 920 | 255 |
| හුරුළුවැව | 1,302 | 1,300 |
| වලව | 8,570 | 8,570 |
| රඹකැන්ඔය | 1,500 | 1,500 |
| **එකතුව** | **41,741** | **39,172** |



ඉඩම් ඔප්පු ප්‍රදානය

### 1.3.3 ආයතනික සංවර්ධනය

ව්‍යවසායකත්ව අවස්ථා, පුද්ගල සංවර්ධනය, ආයතනික සවිබල ගැන්වීම, කාන්තාව සවිබලගැන්වීම, සමාජ හා සංස්කෘතික සංවර්ධනය ජානපදිකයන් වෙත ලබා දෙමින් මහවැලි පදිංචි කරුවන්ගේ සමාජ ආර්ථික තත්ත්වය ඉහළ නැංවීම ඔවුන් පදිංචි කරවීමේ පශ්චාත් සමයේ ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ප්‍රධාන කාර්යන් වේ. ඒ අනුව, පදිංචිකරුවන්ගේ දෙවන හා තුන්වන පරම්පරාවල අභිවෘද්ධිය තකා ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ ආයතනික සංවර්ධන අංශය ඉහත ක්ෂේත්‍ර ආවරණය වන පරිදි විවිධ වැඩ සටහන් හා වැඩමුළු සංවිධානය කරන ලදි.

ඒ අනුව 2018 කාල පරිච්ඡේදය තුළ ආයතනික සංවර්ධන වැඩසටහන් 3,090 ප්‍රජා සංවර්ධන වැඩසටහන් 651 කාන්තා අභිවෘද්ධියට අදාළ වැඩසටහන් 88 ක් පැවැත්වීමට හැකියාව ලැබිණි.

### 1.3.4 වනාන්තර හා පරිසරය

**වනාන්තර හා පරිසර සංරක්ෂණය**

පාරිසරික අංශය විසින් මහවැලි ප්‍රදේශ වල පාරිසරික කටයුතු කළමනාකරණය හා සම්බන්ධීකරණය අඛණ්ඩව සිදු කරනු ලබයි. ජාතික පාරිසරික වැඩසටහන යටතේ වන "පුනරුදය" තුන් අවුරුදු ක්‍රියාකාරී සැලැස්ම සඳහා ප්‍රමුඛතා ලබා දෙමින් පරිසර අමාත්‍යාංශය මහවැලි ප්‍රදේශ තුළ හරිත සංකල්පය ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවීමට කටයුතු කරමින් සිටියි.

වනාන්තර හා පරිසර සංරක්ෂණ කටයුතු සඳහා 2018 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිපාදන රු. මි. 35 ක් වන අතර එයින් රු. මි. 30.66 ක් වසර අවසන් වන විට ඵලදායී ලෙස යොදවා ඇත.

ස්වාභාවික සම්පත් සංරක්ෂණය යටතේ 2018 දෙසැම්බර් මස දක්වා වගා පස් මීටර 15367 ක් සංරක්ෂණය කරන ලදී. තවද පැල තවාන් කළමනාකරණය හා පැල නිෂ්පාදන වැඩසටහන යටතේ පැල 357,934 ක් නිෂ්පාදනය කරන ලද අතර ප්‍රදේශයේ වන සණත්වය ඉහළ නැංවීමේ අරමුණින් පැල 33,595 ක් රෝපණය කරන ලදී. ජලයේ ගුණාත්මකභාවය මැනීමට හා වැඩි දියුණු කිරීමට මෙම වර්ෂය තුළදී ජලයේ ගුණාත්මක භාවය මැනීමේ මධ්‍යස්ථාන 19 ක් හා රොන් මඩ මැනීමේ මධ්‍යස්ථාන 07 ක් ස්ථාපනය කරන ලදී.

පාරිසරික අධ්‍යාපන හා දැනුවත් කිරීමේ වැඩසටහන් 23 ක් පාසල් ළමුන්ගේ සහභාගිත්වයෙන් මෙම කාලය තුලදී පවත්වා ඇති අතර මහවැලි ප්‍රදේශවල දැඩි ආක්‍රමණශීලී ශාක විශේෂ පාලනය කිරීමට හා කලමණාකරණය කිරීමට වැව් 24 ක වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. මහවැලි ප්‍රදේශවල අලි මිනිස් ගැටුම පාලනය කරනු වස් 2018 වර්ෂය තුළදී කි.මී. 18.6 ක අලි වැටක් ඉදි කරන ලද අතර කි.මී 666 (මොරගහකන්ද ව්‍යාපෘතියේ 299 කි.මි ඇතුළුව) ක අලි වැටක නඩත්තු කටයුතුද මෙම කාල පරිච්ඡේදය තුල සිදු කරන ලදී.

### පුනර්ජනනීය බල ශක්ති නිෂ්පාදනය වැඩි කිරීම (කුඩා ජල විදුලිබල ව්‍යාපෘති)

මහවැලි ප්‍රදේශයන්හි කුඩා පරිමාණ ජල විදුලි ව්‍යාපෘති 21 ක් ඉදි කිරීම තුළින් මෙ.වො. 56.03 ක් සමස්ථ ජල විදුලි ඒකක ප්‍රමාණයක් නිෂ්පාදන කිරීමට අපේක්ෂිත කෙරේ. 2018 දෙසැම්බර් මස අවසාන වන විට ඉන් ව්‍යාපෘති 12 ක් වාණිජ ක්‍රියාකාරකම් ආරම්භ කර ඇති අතර ඒවායේ ධාරිතාවය මෙ.වො. 39.85 කි.

### 1.3.5ව්‍යාපාර සංවර්ධනය

නවීන ගෘහ භාණ්ඩ සහිතව සංචාරක බංගලා 08 ක නවීකරණ කටයුතු මේ වන විට අවසන් කර ඇති අතර සංචාරක බංගලා 04 ක ගෘහ භාණ්ඩ නවීකරණය කර ඇත. සංචාරල බංගලා 12 ක් සඳහා අන්තර්ජාලය හරහා නවාතැන් පහසුකම් වෙන් කර ගැනීමේ හැකියාව පවතී.





කොත්මලේමාදුරු ඔය                    රුහුණුකෙත

### මහවැලි හෙළ බොජුන් හල

වැලිකන්ද, දෙහිඅත්තකණ්ඩිය සහ මොරගහකන්ද වෙළඳ අලෙවි මධ්‍යස්ථාන සහිතව "මහවැලි හෙළ බොජුන් හල් " 03 ක් ස්ථාපනය කරන ලදී.





### මහවැලි කලාපයන්හි පෞද්ගලික අංශයේ ආයෝජන සඳහා අවස්ථා

2018 වර්ෂයේ දෙසැම්බර් දක්වා මහවැලි කලාපයේ නව ආයෝජන සහ අනෙකුත් සංවර්ධන ව්‍යාපෘතීන් 36 ක් සඳහා අනුමැතිය ලබාදී ඇත.

| | |
|---|---|
| ආයෝජන ව්‍යාපෘති | 29 |
| පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතිය (සූරිය/ජෛව ස්කන්ධ) | 07 |

**සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ප්‍රවර්ධනය**

ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ සහයෝගය සංවිධානය කරන ලද ''මහවැලි සවිය'' වැඩසටහන යටතේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ප්‍රවර්ධන වැඩසටහන් මගින් කුඩා හා මධ්‍ය පරිමාණයේ ව්‍යවසායකයන් 1722 දෙනෙක් සඳහා රු. මි. 285 ක් ලබාදී ඇති අතර ''මොරගහකන්ද අත්වැල'' නව ණය යෝජනා ක්‍රමය යටතේ 2017 වර්ෂය තුළදී ''මහවැලි දිරිය'' විශේෂ ණය යෝජනා ක්‍රමය යටතේ වසායකයන් 33 දෙනෙක් සඳහා රු. මි. 9.6 2017 වර්ෂයේ සිට 2018 වර්ෂය අවසානය දක්වා ලබා දීමට හැකියාව ලැබිණ.

**බෝට්ටු සේවා**

පරිසර හිතකාමී බෝට්ටු සේවාවන් ව්‍යාපාර සංවර්ධනයේ තවත් ප්‍රධාන ආදායම් උත්පාදන ව්‍යාපෘතියකි. 2018 අවසන් වන විට මහවැලි අධිකාරිය යටතේ වික්ටෝරියා, පොල්ගොල්ල, දඹුලුඔය සහ ලොග්ගල්ඔය යන ප්‍රදේශවල බෝට්ටු සේවයන් 6 ක් ක්‍රියාත්මක වන අතර, වාර්ෂික බදු මත පදනම්ව රු.මි. 1.1 ආදායම ලබා දෙයි.

## 1.3.6 සුදුසු රාජකාරි පරිසරයක් සඳහා පහසුකම් සැලසීම

## I. මානව සම්පත් සංවර්ධනය/නව බඳවා ගැනීම්/කාර්ය මණ්ඩල උසස් වීම්

කාර්යක්ෂම මෙන්ම ඵලදායී සේවාවක් සැපයීම සඳහා සංශෝධනය කරන ලද බඳවා ගැනීම් පරිපාටිවලට අනුව නව බඳවා ගැනීම් බොහෝමයක් ඉටු කර ගැනීමට 2018 දෙසැම්බර් මස අවසන් වන විට අධිකාරියට හැකියාව ලැබී ඇත.

| පුරවන ලද පුරප්පාඩු සංඛ්‍යාව | | උසස්වීම් | |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ කළමනාකරණය (ජ්‍යෙ.ක.) | 1 | ජ්‍යෙෂ්ඨ කළමනාකරණය (ජ්‍යෙ.ක.) | 02 |
| මධ්‍යම කළමනාකරණය (ම.ක.) | 26 | මධ්‍යම කළමනාකරණය (ම.ක.) | 14 |
| කණිෂ්ඨ කළමනාකරණය (ක.ක.) | 5 | කණිෂ්ඨ කළමනාකරණය (ක.ක.) | 33 |
| කළමනාකරණ කාර්ය මණ්ඩලය (ක.ස. 3, ක.ස. 2-2, ක.ස. 1-2) | 109 | කළමනාකරණ කාර්ය මණ්ඩලය (ක.ස. 3, ක.ස. 2-2, ක.ස. 1-2) | 77 |
| ප්‍රාථමික මට්ටම (ප්‍රා.ම. ) | 70 | ප්‍රාථමික මට්ටම (ප්‍රා.ම. ) | 04 |
| එකතුව | **211** | එකතුව | **130** |

## iii. පුහුණු වැඩසටහන්

සේවකයන්ගේ හැකියාවන් හා දැනුම් මට්ටම ඉහළ තලයකට ගෙන එමින් ශක්තීන් වැඩි දියුණු කිරීම සඳහා අධිකාරියේ පුහුණු අංශය මගින් විවිධ විෂයයන් යටතේ පුහුණු වැඩ සටහන් පවත්වන ලදී.

| පවත්වන ලද පුහුණු වැඩ සටහන් 2018 ජනවාරි - දෙසැම්බර් | | |
|---|---|---|
| | වැඩ සටහන | සහභාගී වූවන් |
| ජ්‍යෙෂ්ඨ කළමනාකරණය (ජ්‍යෙ.ක) | 10 | 40 |
| මධ්‍යම කළමනාකරණය (ම.ක) | 27 | 151 |
| කණිෂ්ඨ කළමනාකරණය (ක.ක) | 24 | 218 |
| කළමනාකරණ කාර්ය මණ්ඩලය | 35 | 447 |
| ප්‍රාථමික මට්ටම (ප්‍රා.ම ) | 4 | 202 |
| **එකතුව** | **100** | **1058** |

## 1.3.7 නෛතික බලාත්මක කිරීම

වර්ෂයේ මෙම කාලය තුළ නීතිපති දෙපාර්තමේන්තුවේ උපදෙස් යටතේ නිති අංශය මගින් නඩු 160 ක් සම්බන්ධ කටයුතුවල නිරත වූ අතර වැඩ මූලික අංශය නඩු වාර 32 ක් සඳහා සහභාගී විය. තවද, අළුතින් නඩු 03 පනවා ඇත.

## 1.3.8 ජල කළමනාකරණය

ලං.වි.ම, ජල සම්පාදන මණ්ඩලය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව හා කාලගුණික විද්‍යා දෙපාර්තමේන්තුව සමග අවශ්‍ය සම්බන්ධීකරණය කටයුතු කරමින් කෘෂි කර්මාන්තය, ජල විදුලිය හා පානීය මෙන්ම අනෙකුත් ජල අවශ්‍යතා සඳහා මහවැලි ජලාශවල ජල සම්පත් ඵලදායී අයුරින් භාවිත කරන බවට ජල කළමනාකරණ ලේකම් කාර්යාලය සහතික වේ. එමෙන්ම ජල කලමනාකරණ මණ්ඩලයේ මෙහෙයුම් ප්‍රතිපත්ති තීරණ ගැනීමේදී ජල කළමනාකරණ ලේකම් කාර්යාලය ඒ සඳහා තොරතුරු හා නිර්දේශ ලබා දේ.

**මහවැලි ජලාශවල ජලය ගබඩා කර තැබීමේ ධාරිතාව**

| ජලාශ | සජීව ධාරිතාවය ( ස.මී.මි) (2018.12.31) | ක්‍රියාකාරී ධාරිතාවය ( ස.මී.මි ) (2018.12.31) |
|---|---|---|
| කොත්මලේ | 143.5 | 121.3 |
| වික්ටෝරියා | 593.8 | 559.8 |
| රන්දෙණිගල | 770.1 | 376.7 |
| රන්ටැඹේ | 5.2 | 0.8 |
| බෝවතැන්න | 17.2 | 14.9 |
| උඩ වලව | 266.2 | 237.9 |
| මොරගහකන්ද | 556.3 | 503.7 |
| දඹුලු ඔය | 10.8 | 5.4 |

| | | |
|---|---|---|
| කණ්ඩලම | 31.4 | 27.6 |
| කලාවැව | 116.9 | 101.9 |
| උල්හිටිය/රත්කිඳ | 124.6 | 61.2 |
| මාදුරුඔය | 521.3 | 402.3 |
| **එකතුව** | **3,157.3** | **2,413.5** |

### 1.3.9 අභ්‍යන්තර විගණනය

අධිකාරියේ කාර්යයන් සම්බන්ධයෙන් කාර්යක්ෂමතාව තහවුරු කරනු වස් අභ්‍යන්තර විගනණ අංශය මගින් මෙම වර්ෂය තුළදී විගනණ වාර්තා 17 ක් හා විගණන විමසුම් වාර්තා 17 ක් නිකුත් කර ඇත.

## 2. මහවැලි ජලාශවල බල ශක්ති උත්පාදන ධාරිතාව

| ජලාශය | මුළු ධාරිතාව (දල වශයෙන්) (MCM) | මුළු බල ශක්ති ධාරිතාව (MW) | බල ශක්ති උත්පාදනය 2017 | බල ශක්ති උත්පාදනය ජන.- ජුනි 2018 |
|---|---|---|---|---|
| කොත්මලේ | 174 | 201 (67 x 3) | 230.44 | 208.79 |
| වික්ටෝරියා | 722 | 210 (70x3) | 193.59 | 250.48 |
| රන්දෙණිගල | 860 | 126 (63x2) | 53.53 | 118.36 |
| රන්ටැඹේ | 7.001 | 49 (24.5x2) | 38.37 | 66.26 |
| උල්හිටිය/රත්කිඳ | 146 | - | - | - |
| මාදුරුඔය | 596 | - | - | - |
| බෝවතැන්න | 23.5 | 40 (40x1) | 47.21 | 23.13 |
| උඩවලව | 268.65 | 6 (LB- 2x2+RB- 2x1) | 1.25 | 8.98 |
| උකුවෙල | - | 40 (20x2) | 99.36 | 84.44 |
| පොල්ගොල්ල | 4.112 | - | | |
| මොරගහකන්ද | 570 | 25 | - | 28.57 |
| **එකතුව** | **3,371** | **697** | **664** | **789** |

# 3 . පුනරුදය පරිසර සංරක්ෂණ ජාතික වැඩසටහනට ( 2016-2018)

**ආයතනයේ/අංශයේ නම:-පරිසර හා වන සංරක්ෂණ අංශය, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය**

| ක්ෂේත්‍රය | | ක්ෂෙත්‍රයන්ට අදාල වැඩසටහන් හා උපාය මාර්ග | දර්ශක | පසුගිය වසර වල ළගාකරගත් අගයන් | | | අපේක්ෂිත ඉලක්කය |
|---|---|---|---|---|---|---|---|
| | | | | 2016 | 2017 | 2018 | 2019 |
| තිරසර භූමි කළමනාකරණ ක්ෂේත්‍රයේ සාරාංශ සටහන | 1 | ස්වභාවික සම්පත් සංරක්ෂණය හා ඉහළ ජලාධාර පෝෂක ප්‍රදේශ කළමනාකරණය | සෝල්ට්, වැට්වර්, සමෝච්ච රේඛා බැම්. නේත්ති කාණු. චෙක් ඩැම්. | 16574m 19.36m³ | 14754m 30.48m³ | 15367m, 176.17m3 (අක්.80) | 16000m 100m³ |
| | | | පැල නිෂ්පාදනය (පැල) | 332705 | 169178 | 143619 | 240000 |
| | | | අධ්‍යාපනය හා දැනුවත් කිරීම වැඩසටහන් | 68 | 29 | 23 | 80 |
| | | | රුක් රෝපණ (පැල) | 118701 | 13360 | 33595 | 25000 |
| | 2 | ජෛව විවිධත්වය, පෝෂක ප්‍රදේශයේ ගුණාත්මක බව සහ ජල මූලාශ්‍රවල තිරසරභාවය වැඩි දියුණු කිරීම | පටක රෝපණ, උණ පැල නිෂ්පාදනය | 387574 | 114813 | 166558+ රෝපණ බහාලුම් 25275 | 100000 |
| | | | ජල විද්‍යා, අවසාදිත හා ජල තත්ව මිණුම් වාර්තා | මිනුම් ස්ථාන 7ක් වාර්තාක ර ඇත. | මිනුම් ස්ථාන 7ක් වාර්තාකර ඇත. | මහවැලි ගඟ ඉහළ ජලාධාරයේ නිර්දේශිත ස්ථාන 19ක ජල තත්ව අධ්‍යයනය කරනු ලබයි. | මිනුම් ස්ථාන 7 යි |
| | | | ආක්‍රමනික ශාක ඉවත් කිරීම (යෝධ නිදිකුම්බා) | හෙක් 2.5 | - | හෙක් 10.75 | හෙක් 15 |
| | 3 | වැව්/ජලාශ ආශ්‍රිත ප්‍රදේශවල ආක්‍රමණශීලී ශාක ව්‍යාප්තවීම වැලැක්වීම සඳහා ඒකාබද්ධ වැඩසටහන (පහළ නිම්න) | වැව්/ජලාශ | 15 | 26 | ජලාශ-24, යෝධ නිදිකුම්බා - හෙක් 6.8 | 50 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | 4 | මහවැලි කලාපවල ශාක ගහණය වැඩිකිරීම සඳහා පැල සිටුවීමේ වැඩසටහන (පැල ලක්ෂ 50 වැඩසටහන) | පැල නිෂ්පාදනය (පැල) | 279369 | 325383 | 214315 (පරිසර අංශය යටතේ මුදල් වෙන් කිරීම එක් කලාපයක පමණි) අනෙකුත් පැල නිෂ්පාදනය කෘෂි අංශය යටතේ සිදුවේ. | 300000 |
| | | | රුක් රෝපණ (පැල) | 61320 | 35563 | 352590 | 200000 |
| | 5 | අලි මිනිස් ගැටුම සමනය කිරීම සඳහා වූ වැඩසටහන | විදුලි වැට ඉදිකිරීම(කි මී.) | 2.5 | 7 | 1.6 | 10 |
| | | | පවත්නා විදුලි වැට නඩත්තු කිරීම - කි මී. | 55 | 75 | කි.මී. 666 (මොරගහකන්ද ව්‍යාපෘතිය- කි.මී. 299 ද ඇතුළුව | 350 |
| | | | ජීව වැට ඉදිකිරීම හා නඩත්තුව- කි.මී. | 12 | 7 | 17 | 50 |